319 වන කාණ්ඩය - 17වන කලාපය
தொகுதி 319 - இல. 17
Volume 319 - No. 17

2025 ජූනි 20වන සිකුරාදා
2025 யூன் 20, வெள்ளிக்கிழமை
Friday, 20th June, 2025

පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:
කථානායකතුමාගේ සහතිකය [තීරුව 2799]
සමාගම් (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් [තීරුව 2799]
විගණකාධිපතිවරයාගේ වාර්තාව [තීරුව 2800]
අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා[තීරුව 2801]
ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තීරු 2803-2844]
පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:
අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ අරමුණු සහ ප්‍රතිලාභ [තීරුව 2845]
ස්වාධීන කොමිෂන් සභාවල පරිපාලන රාමුව සහ වගවීම [තීරුව 2850]
මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත:
නියෝගය [තීරු 2853-2955]
ආනයන හා අපනයන (පාලන) පනත:
රෙගුලාසි [තීරුව 2956]
කල්තැබීමේ යෝජනාව:
දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු තීරණවල කාර්යක්ෂමතාව, වගවීම සහ නෛතිකභාවය [තීරු 2957-2968]

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:
சபாநாயகரது சான்றுரை [ப: 2799]
கம்பெனிகள் (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு [ப: 2799]
கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை [ப: 2800]
அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள் [ப: 2801]
வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 2803-2844]
தனி அறிவித்தல் மூல வினா:
அஸ்வெசும நலன்புரித் திட்டத்தின் நோக்கங்கள் மற்றும் நன்மைகள் [ப: 2845]
சுயாதீன ஆணைக்குழுக்களின் நிர்வாக கட்டமைப்பு மற்றும் பொறுப்புக்கூறல் [ப: 2850]
முத்திரைத் தீர்வை (விசேட ஏற்பாடுகள்) சட்டம்:
கட்டளை [ப: 2853 - 2955]
இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாட்டு) சட்டம்:
ஒழுங்குவிதிகள் [ப: 2956]
ஒத்திவைப்புப் பிரேரணை:
மாவட்ட ஒருங்கிணைப்புக் குழுக்களின் தீர்மானங்களின் செயற்றிறன், பொறுப்புக்கூறல் மற்றும் சட்டபூர்வத்தன்மை [ப: 2957-2968]

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Speaker's Certificate [Col. 2799]
Companies (Amendment) Bill: Petition to the Supreme Court [Col. 2799]
AUDITOR-GENERAL'S REPORT [Col. 2800]
MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS [Col. 2801]
ORAL ANSWERS TO QUESTIONS [Cols. 2803-2844]
QUESTION BY PRIVATE NOTICE:
Objectives and Benefits of Aswesuma Welfare Benefit Scheme [Col. 2845]
Administrative Framework and Accountability of Independent Commissions [Col. 2850]
STAMP DUTY (SPECIAL PROVISIONS) ACT:
Order [Cols. 2853-2955]
IMPORTS AND EXPORTS (CONTROL) ACT:
Regulations [Col. 2956]
ADJOURNMENT MOTION:
Effectiveness, Accountability and Legal Clarity of Decisions of District Co-ordinating Committees [Cols. 2957-2968]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2025 ජූනි 20වන සිකුරාදා
2025 யூன் 20, வெள்ளிக்கிழமை
Friday, 20th June, 2025

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

නිවේදන
அறிவிப்புகள்
ANNOUNCEMENTS

කථානායකතුමාගේ සහතිකය
சபாநாயகரது சான்றுரை
SPEAKER'S CERTIFICATE

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව, මවිසින් 2025 ජූනි 19 දින "ජාතික ගමනාගමන කොමිෂන් සභා (සංශෝධන)" නමැති පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

II

සමාගම් (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක්
கம்பெனிகள் (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு
COMPANIES (AMENDMENT) BILL: PETITION TO THE SUPREME COURT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2025 ජූනි 19 දින මාගේ නිවේදනයෙහි සඳහන් පෙත්සමට අමතරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, "සමාගම් (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද තවත් පෙත්සමක පිටපතක් 2025 ජූනි 19 දින මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි.

III

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2025 ජූනි 20 සිකුරාදා, එනම් අද දින පූර්ව භාග 11.30 ට කාරක සභා කාමර අංක 2හි දී පැවැත්වීමට නියමිත බැවින්, ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සාමාජික මන්ත්‍රීවරයන් සියලු දෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

විගණකාධිපතිවරයාගේ වාර්තාව
கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
AUDITOR-GENERAL'S REPORT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව,

- 2020 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ LXI කොටස;
- 2023 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XLVI කොටස; සහ
- 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ නවවැනි කාණ්ඩයේ XXVII කොටස

මම ඉදිරිපත් කරමි.

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Reports be printed.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා
அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்
MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

ගරු ටී.කේ. ජයසුන්දර මහතා
(மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர)
(The Hon. T.K. Jayasundara)

ගරු කථානායකතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම, එම කාරක සභාව වෙත යොමු කරන ලද 2023 වර්ෂය සඳහා පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු අසෝක සපුමල් රන්වල මහතා
(மாண்புமிகு அசோக சபுமல் ரன்வல)
(The Hon. Asoka Sapumal Ranwala)

ගරු කථානායකතුමනි, පානදුර, මිනුවන්පිටිය පාර, අංක 47 දරන ස්ථානයෙහි පදිංචි ඩී.එස්.ඒ.පී. ගුණවර්ධන මහතාගෙන් සහ වෙනත් නව දෙනෙකුගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

ගරු කථානායකතුමනි, අනුරාධපුර, විජයපුර, මහසෙන් මාවත, අංක 218 දරන ස්ථානයෙහි පදිංචි යූ.එම්. අනුර කුමාර බණ්ඩාර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හතර පිළිගන්වමි.

(1) පොල්ගස්ඕවිට, සියඹලාගොඩ, 'සොමිනස', අංක 138 දරන ස්ථානයෙහි පදිංචි ඒ. හෙට්ටිආරච්චි මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) ඉඹුල්ගොඩ, පහළ ඉඹුල්ගොඩ, රැනගල පාර, අංක 54/15 දරන ස්ථානයෙහි පදිංචි එම්.ජී. පුංචි බණ්ඩා මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) ලුණුගම්වෙහෙර, දකුණු ඉවුර, කුඩාගම 05, ඉඩම් අංක 212 දරන ස්ථානයෙහි පදිංචි රේණුකා මානගේ මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(4) උඩුගම්පොල, අස්ගිරිවල්පොල, අංක 95 දරන ස්ථානයෙහි පදිංචි සුසන්ත උදය කුමාර මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු තිළිණ සමරකෝන් මහතා
(மாண்புமிகு திலின சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)

ගරු කථානායකතුමනි, කැකිරාව, ඕපෝව පාර - 11 දරන ස්ථානයෙහි පදිංචි ටී.එම්. නයනා පත්මා කුමාරි මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය: සමත් වූ සිසුන්
ஐந்தாம் தர புலமைப்பரிசில் பரீட்சை: சித்தியெய்திய மாணவர்கள்
GRADE FIVE SCHOLARSHIP EXAMINATION: SUCCESSFUL CANDIDATES

159/2024

1. ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2022 වර්ෂයේ සිට මේ දක්වා පහ ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය සමත් වූ සිසුන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම සිසුන් අතරින් අඩු ආදායම්ලාභී සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iii) දරුවන්ට සහ දෙමව්පියන්ට අගතියක් නොවන ආකාරයට ශිෂ්‍යත්ව විභාගය පැවැත්වීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඊට අදාළ වැඩ පිළිවෙළ කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉදිරියේදී පහ ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය අත්හිටුවීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එය අත්හිටුවනු ලබන දිනය කවරේද;

(iii) එම විභාගය අත්හිටුවීමට හේතු කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 2022ஆம் ஆண்டு தொடக்கம் தற்போது வரை ஐந்தாம் தர புலமைப்பரிசில் பரீட்சையில் சித்தியெய்திய மாணவர்களின் எண்ணிக்கை, ஆண்டுவாரியாக வெவ்வேறாக யாதென்பதையும்;

(ii) மேற்படி மாணவர்களுள் குறைந்த வருமானம் பெறும் மாணவர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) பிள்ளைகளுக்கும் பெற்றோருக்கும் பாதிப்பு ஏற்படாத வகையில், புலமைப்பரிசில் பரீட்சையை நடாத்துவதற்கான நடவடிக்கைகள் மேற்கொள்ளப்படுமா என்பதையும்;

(iv) ஆமெனில், அதற்கு ஏற்புடைய வேலைத்திட்டம் யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) எதிர்காலத்தில் ஐந்தாம் தர புலமைப்பரிசில் பரீட்சையை இடைநிறுத்துவதற்கான நடவடிக்கைகள் மேற்கொள்ளப்படுமா என்பதையும்;

(ii) ஆமெனில், இடைநிறுத்தப்படும் திகதி யாதென்பதையும்;

(iii) அப்பரீட்சை இடைநிறுத்தப்படுவதற்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) the number of students who passed the Grade Five Scholarship Examination in each year from 2022 up to now, separately;

(ii) the number of students from low-income families, out of the aforesaid number of students;

(iii) whether steps will be taken to conduct the Scholarship Examination without causing prejudice to children and parents; and

(iv) if so, the relevant course of action for that?

(b) Will she also inform this House -

(i) whether steps will be taken to put a stop to the Grade Five Scholarship Examination in future;

(ii) if so, the date on which it will be done; and

(iii) the reasons for putting an end to the said Examination?

(c) If not, why?

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i)

වර්ෂය	සමත් සංඛ්‍යාව
2022	48,403
2023	50,843
2024	51,443

(ii)

වර්ෂය	අඩු ආදායම්ලාභී සිසුන් සංඛ්‍යාව
2022	19,851
2023	19,866
2024	19,848

[ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා]

(iii) 2029 වර්ෂය දක්වා ශිෂ්‍යත්ව විභාගය මේ ආකාරයෙන්ම නොවෙනස්ව පවත්වන අතර, 2029 වර්ෂයෙන් පසු ශිෂ්‍යත්ව විභාගය පැවැත්වීම සම්බන්ධව 2028 වර්ෂයේදී සලකා බැලීම සඳහා කමිටුවක් පත් කිරීමට සැලසුම් කර ඇත. තවද, ශිෂ්‍යත්ව විභාගය පැවැත්වීම හා දරුවන්ට පීඩනයක් නොවන පරිදි විභාග ප්‍රශ්න පත්‍ර සකස් කිරීම සම්බන්ධව අධ්‍යයනයක් සිදු කිරීමට විභාග දෙපාර්තමේන්තුව වෙත උපදෙස් ලබා දී ඇති අතර 2028 වර්ෂයෙන් පසුව ශිෂ්‍යත්ව විභාගය පැවැත්වීම සම්බන්ධව ඉහත කමිටු වාර්තා හා විභාග දෙපාර්තමේන්තුවේ අධ්‍යයන හා යෝජනා සැලකිල්ලට ගෙන කටයුතු කරනු ලැබේ.

ගරු කථානායකතුමනි, ඒ සම්බන්ධව මම පැහැදිලි කිරීමක් කරන්නම්. මේ අතරතුර කාලය සම්බන්ධයෙන් විභාග දෙපාර්තමේන්තුව විසින් - විභාග සංයුතිය සම්බන්ධව තිබෙන පීඩනය අඩු කිරීම සඳහා- යම් කිසි නිර්දේශ මාලාවක් සකස් කරමින් පවතිනවා, 2028 වර්ෂය දක්වා.

(iv) ඉහත (අ) (iii)හි පිළිතුරම අදාළ වේ.

(ආ) (i) 5 වසර ශිෂ්‍යත්ව විභාගය එකවර අත්හිටුවීමට කටයුතු නොකරන අතර, දැනට පාසල් අතර පවතින විෂමතා ක්‍රමානුකූලව අඩු කිරීමටත්, ශිෂ්‍යත්ව විභාගය මඟින් දරුවන් වෙත ඇති වන පීඩනය අඩු කිරීමටත් කටයුතු කරමින් පවතී. දැනට ශිෂ්‍යත්වය සමත් දරුවන් සඳහා ලබා දෙන පාසල් හා ශිෂ්‍යාධාර දීමනා සඳහා ද විකල්ප යෝජනා හඳුන්වා දෙමින් 2028 වර්ෂයෙන් පසු ශිෂ්‍යත්ව විභාගය අත්හිටුවීම ගැන ඉහත (අ) (iii) මඟින් දක්වා ඇති ක්‍රමය තුළ සලකා බලනු ලැබේ.

(ii) ඉහත (ආ) (i) හි පිළිතුරම අදාළ වේ.

(iii) ඉහත (අ) (iii) හා (i) හි පිළිතුරම අදාළ වේ.

(ඇ) අදාළ නොවේ.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මේ ශිෂ්‍යත්ව විභාගයත් එක්කම විෂය මාලා වෙනස්වීම් පිළිබඳවත් දිගින් දිගටම කථා කරලා තිබුණා. මේක ඔබතුමන්ලාගේ ප්‍රශ්නයකුත් නොවෙයි, ගරු අගමැතිතුමියගේ ප්‍රශ්නයකුත් නොවෙයි. නමුත්, 2016දී තමයි අවසානයට විෂය මාලා සම්පූර්ණයෙන් සංශෝධනය කරලා තිබෙන්නේ. 2023දී විෂයය මාලා වෙනස් වෙන්න තිබුණා. නමුත්, වෙනස් වෙලා නැහැ. ඒ නිසා ඔබතුමාත් දන්නවා එකම විෂය මාලාව අවුරුදු 10ක් විතර දැන් ක්‍රියාත්මක කරනවා කියලා. ඔබතුමන්ලා හය වසරට අදාළව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කටයුතු ක්‍රියාත්මක කරන්න හදන්නේ, 2026දී. ඒ කියන්නේ, ලබන අවුරුද්දේ. හැබැයි, අපොස සාමාන්‍ය පෙළ - O/L - සඳහා 2029දී තමයි ඔබතුමන්ලා විෂය මාලා සංශෝධනයක් ගෙනෙන්න හදන්නේ. අපොස උසස් පෙළට 2033දී. තොරතුරු තාක්ෂණ සන්නිවේදන විෂයය සඳහා තවමත් මේ විෂයමාලා වෙනස් කරලා නැහැ. ඒ නිසා මේ පිළිබඳව විශේෂයෙන් දැන් ADB එකෙන් වුණත්, ඇගයීම් කරන module systems ගැන බොහෝ ප්‍රශ්න ගණනාවක් මතු කරලා තිබෙනවා. ඒ නිසා මම විශේෂයෙන්ම මේ කාරණය අහන්න කැමතියි. දැන් මේ විධියට 2029 සිට 2033 දක්වා විෂය මාලා සංශෝධනයක් කරා යන්න තිබෙනවා.

ඇත්තටම 2016දී ප්‍රතිසංස්කරණය කරපු එක තමයි තවම මේ යන්නේ. මේ කටයුත්ත ඉක්මන් කිරීම සඳහා ඔබතුමන්ලා මොකක් හරි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවාද? මේ විධියට ගියොත් 2033 වෙනකම්ම අපට මේක ක්‍රියාත්මක කරන්න ලැබෙන්නේ නැහැ. එතකොට ලෝකය වේගයෙන් ඉදිරියට ගිහිල්ලා. අපි තවම එක තැනක හිර වෙලා ඉන්නවා. මේක ඉක්මන් කරන ක්‍රමයක් ගැන ඔබතුමන්ලා කල්පනා කරනවාද?

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු මන්ත්‍රීතුමා, ස්තුතියි, ඒ ප්‍රශ්නය ඇසීම ගැන. ඔබතුමා මතු කරපු කාරණාවට අපි එකඟ වෙනවා. මුලින්ම අවුරුදු අටෙන් අටට විෂයය මාලා ප්‍රතිසංස්කරණය සිද්ධ වුණාට, ඒ ක්‍රියාවලියට යම් කිසි කාලයක් ගත වෙනවා; ස්වාභාවික කාලයක් ගත වෙනවා. විශේෂයෙන් තොරතුරු තාක්ෂණය විෂයය ගත්තොත්, අවුරුදු 15ක් විතර ලොකු කාලයකින් යාවත්කාලීන වීමක් සිද්ධ වෙලා නැහැ. 2026දී පළමුවැනි වසර, හය වසර සහ ඉතිරි වසර සම්බන්ධයෙන් අපි කරන විෂය මාලා සංවර්ධනයට කොටස් පහක් අයත් වෙනවා. ඒ කියන්නේ, විෂය මාලා සංවර්ධනය පමණක් නොවෙයි. විෂය මාලා සංවර්ධනයට කොටස් පහක් අයත් වෙනවා. අපි මේ වනවිට කලින් වෙච්ච කාරණාවල දුර්වලතා හඳුනා ගනිමින්, මෙම ප්‍රතිසංස්කරණ කඩිනම් කිරීම සහ කාර්යක්ෂම කිරීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා, ව්‍යාපෘති ආකෘතියට අනුව. මේක සම්පූර්ණ ව්‍යාපෘති කිහිපයකට බෙදලා වැඩසටහනක්, programme එකක් විධියට ව්‍යාපෘති කොටස් ගණනාවක් යටතේ සලකා බලමින් කටයුතු කරනවා. ඒකේ විෂය මාලා සංවර්ධනය තිබෙනවා. ඇගයීම් සංවර්ධනය තිබෙනවා. ව්‍යුහාත්මක වෙනස්කම් තිබෙනවා. මේ සියලු දේවල් එක තැනකට අරගෙන, වගවීම් සඳහා නිලධාරින් පත් කරලා සම්පූර්ණ ක්‍රියාවලියම අපි කාල වකවානුවකට අරගෙන තිබෙනවා, වැඩසටහනක් විධියට. මේ කාරණා පහම එකට අරගෙන තිබෙනවා.

මේක timeframe එකක් ඇතිව ව්‍යාපෘති කිහිපයක් හැටියටයි ක්‍රියාත්මක වෙන්නේ. අදාළ දුර්වලතා, gaps හඳුනා ගනිමින් මේ කාලය ඇතුළත මේ කටයුත්ත කර ගන්න පුළුවන් වෙයි කියලා අපි හිතනවා. ඒක තමයි, මෙවර ක්‍රියාවලිය හැටියට වෙන්නේ.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ජාතික පාසල්වල teachersලාගේ අර්බුදයක් නැතුව ඇති කියලා අපි හිතුවා. මට විස්තර වගයක් ලැබුණා. කොළඹ ඉසිපතන විද්‍යාලයේ ගුරුවරුන් 52ක් අඩුයි. ඒ කියන්නේ සියයට 25කට, 30කට වැඩිය ගුරුවරුන් නැහැ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, කොළඹ අනෙක් පාසල්වලත් තත්ත්වය ඔබතුමා බලන්න. මමත් මහ ඇමතිවරයෙක් හැටියට හිටපු නිසා දන්නවා. අපි සාමාන්‍යයෙන් තුලනයක් කරනවා. කොළඹ සමහර ජාතික පාසල්වල වැඩි ප්‍රමාණයක් ඉන්නවා. මේ වාගේ පාසල්වල විශාල හිඟයක් තිබෙනවා. විශේෂයෙන්ම ඉංග්‍රීසි මාධ්‍යය ගත්තොත්, ඉසිපතන විද්‍යාලයේ maths විෂයටවත් ගුරුවරයෙක් නැහැ. ඒක විශාල අර්බුදයක් බවට පත් වෙලා තිබෙනවා.

අනෙක් කාරණය තමයි, ඔබතුමන්ලා පෝෂණ ව්‍යාපෘතිය යටතේ දරුවන්ට දෙන්න කියලා තිබෙන කෑම එකට බිත්තරයක් හා කුකුළු මස් දෙන්න කියලා තිබෙනවා. හැබැයි, ඒකේ ප්‍රමාණය අනුව ඒ ගණනට ඒක දෙන්න බැහැ කියන මැසිවිල්ල හැම තැනකින්ම එනවා. ඒ ගැන ඔබතුමන්ලා කල්පනා කරලා බලන්න කියලා මම විශේෂයෙන් ඉල්ලනවා. මේ ප්‍රශ්නය හා ගුරු හිඟය පිළිබඳව ඔබතුමාගේ අදහස දැන ගන්න මම කැමැතියි.

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු කථානායකතුමනි, ගුරු හිඟය සම්බන්ධයෙන් අපට අදහසක් තිබෙනවා. එකක් තමයි, ප්‍රධාන ගුරු හිඟය. ඊට අමතරව ගුරුවරුන් විසිර යෑමේ ප්‍රශ්නයක් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සඳහන් කරන කාරණාව සම්බන්ධයෙන් නිවැරදි දත්ත අපට ලැබිලා තිබෙනවා. ඒ කියන්නේ, නගරබද පාසල්වල නැහැ කියලා අපි හිතුවාට, නගරබද පාසල්වලත් විෂයානුබද්ධව ගුරු හිඟය තිබෙනවා.

මේ සම්බන්ධයෙන් පිළිතුරු කිහිපයක් තිබෙනවා. එකක් තමයි, මින් පසුව බඳවා ගැනීම් සිද්ධ කරද්දී විෂයානුබද්ධ බඳවා ගැනීම් තමයි සිද්ධ කරන්නේ. විශේෂයෙන්ම ඉදිරියේදී කරන උපාධිධාරි බඳවා ගැනීම් සහ විද්‍යාපීඨ සඳහා බඳවා ගැනීම්වලදී. ඊළඟට, ගුරු තුලනය. මෙහිදී දත්ත පද්ධතියේ ගැටලුවක් තිබෙනවා. මේ දත්ත පද්ධතියත් එක්ක, විසිර යාම සම්බන්ධයෙන් අපට හරියටම අදහසක් ගන්න අමාරු වෙනවා. ඒ නිසා අලුත් දත්ත පද්ධතියක් යාවත්කාලීන කිරීම අවශ්‍යයි. එතකොට ගුරුවරයා කොතැනද ඉන්නේ, කවදාද යන්නේ කියන එක ගැන අදහසක් ගන්න අපට පුළුවන්. දැන් මේ කාරණාවේදී එකක් තමයි, ජාතික පාසල්වලින් පළාත් පාසල්වලට විසිර යාම. ජාතික පාසල්වලත් දත්ත පද්ධතිය හරියටම යාවත්කාලීන වෙලා නැහැ. එතකොට දත්ත පද්ධතිය සහ ගුරුවරු බඳවා ගැනීමේදී නිසි විද්‍යානුකූල ප්‍රතිපත්තියක් අවශ්‍යයි. ඒ කියන්නේ, විෂයානුබද්ධ අය සහ පුරප්පාඩු පිරවීම සඳහා කියන ක්‍රම දෙකම මඟින් තමයි අපි ඒ සම්බන්ධයෙන් තීරණයක් ගන්න බලාපොරොත්තු වෙලා ඉන්නේ. දැන් ඒක සිද්ධ වෙමින් තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, දෙවැනි කාරණාව ගත්තොත්, පෝෂණය සම්බන්ධයෙන් අපට පාසල්වලින් විවිධාකාර පැමිණිලි ලැබෙනවා. අපි මෙවර පෝෂණ අංශයත් එක්ක සාකච්ඡා කළා, මුලින්ම පාසල්වලට ලැබෙන ආහාර වගුව හරියට ක්‍රියාත්මක වෙනවාද කියලා. ඒ සම්බන්ධයෙන් අදාළ පාර්ශ්වකරුවන් සමඟ අපි සාකච්ඡාවක් කළා. එතකොට ඒ ආහාර වගුව හරියට ක්‍රියාත්මක වෙන්නේ නැත්නම්, අපි නැවත වතාවක් මේවා සම්බන්ධයෙන් කටයුතු කළ යුත්තේ කොහොමද කියන එක සම්බන්ධයෙන් තාක්ෂණික වාර්තාවක් ගන්නවා. එතැනදී පෝෂණ අංශයත් සම්බන්ධ වෙනවා; සෞඛ්‍ය අංශයත් සම්බන්ධ වෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

සෞඛ්‍ය අමාත්‍යාංශය සහ අනුබද්ධ ආයතන: ලැබුණු මූල්‍ය හා මූල්‍ය නොවන ආධාර
சுகாதார அமைச்சு மற்றும் இணை நிறுவனங்கள்: கிடைக்கப்பெற்ற நிதியுதவிகள் மற்றும் நிதியல்லாத உதவிகள்
MINISTRY OF HEALTH AND AFFILIATED INSTITUTES: FINANCIAL AND NON-FINANCIAL ASSISTANCE RECEIVED

192/2024

2. ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා සෞඛ්‍ය අමාත්‍යාංශයට හා ඒ යටතේ ඇති ආයතනවලට ලැබුණු මූල්‍ය ආධාර හා මූල්‍ය නොවන ආධාර ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ජාතික විගණන කාර්යාලයේ වාර්තාවට අනුව ඒවා නිවැරදි ලෙස ගිණුම්ගත කර නොමැති බව දන්නේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டு தொடக்கம் இற்றைவரை சுகாதார அமைச்சுக்கும் அதன் கீழுள்ள நிறுவனங்களுக்கும் கிடைக்கப்பெற்ற நிதியுதவிகள் மற்றும் நிதியல்லாத உதவிகளின் அளவு ஆண்டுவாரியாக வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(ii) தேசிய கணக்காய்வு அலுவலகத்தின் அறிக்கையின்படி, அவை சரியான முறையில் கணக்கு வைக்கப்படவில்லை என்பதை அறிவாரா என்பதையும்;

(iii) ஆமெனில், அது தொடர்பாக மேற்கொள்ளப் படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House -

(i) the amount of financial and non-financial assistance received by the Ministry of Health and the institutes under it from the year 2015 until now, separately for each year;

(ii) whether he is aware that the above assistance has not been accounted for correctly according to the report of the National Audit Office; and

(iii) if so, the actions that will be taken regarding the matter?

(b) If not, why?

ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி - சுகாதாரம் மற்றும் வெகுசன ஊடகப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Hansaka Wijemuni - Deputy Minister of Health and Mass Media)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) සෞඛ්‍ය අමාත්‍යාංශයට ලැබෙන මූල්‍ය ආධාර සෞඛ්‍ය සංවර්ධන අරමුදල හරහා ගිණුම්ගත වීමක් සිදු වන අතර, ඒ අනුව 2015 වර්ෂයේ සිට 2024.12.31 දින දක්වා ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලට ලැබුණු මූල්‍ය ආධාර ප්‍රමාණය රුපියල් 3,111,258,902.89කි. එය ඇමුණුම 01 මඟින් ඉදිරිපත් කර ඇත.

[ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා]

මීට අමතරව විවිධ ව්‍යාපෘති සඳහා ලැබුණු මූල්‍ය ආධාර පිළිබඳ තොරතුරු ඇමුණුම 02 සහ 03 මඟින් දක්වා ඇත.

මූල්‍ය නොවන ආධාර එක් එක් රෝහල් හා සෞඛ්‍ය ආයතන වෙත විශාල වශයෙන් ලැබෙන අතර ඒවා ඒ ඒ ආයතනයන් විසින් ලේඛනගත කර භාරගනු ලැබේ. එසේ 2015 වර්ෂයේ සිට මේ දක්වා සියලු ආයතනයන්ට ලද ආධාර ද්‍රව්‍ය, උදාහරණයක් විධියට ඖෂධ, පරිභෝජන ද්‍රව්‍ය (තුවා, සබන්, දන්තාලේප, කුඩා භාජන) ආදී වශයෙන් ඉතා විශාල ප්‍රමාණයක් වන බැවින්, එම ලේඛන සියල්ල ඉදිරිපත් කිරීම ප්‍රායෝගිකව අපහසු බවද, එමෙන්ම එම ද්‍රව්‍ය විවිධ ආකාරයේ වන බැවින් සාරාංශගත කිරීම ප්‍රායෝගික නොවන බව ද සඳහන් කරමි.

ඇමුණුම් 01, 02, 03 **සභාගත*** කරමි.

(ii) සෞඛ්‍ය සංවර්ධන අරමුදල හරහා ලැබෙන මූල්‍ය ආධාර නිවැරදිව ගිණුම්ගත කර ඇත.

මීට අමතරව සෞඛ්‍ය අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති රෝහල් සඳහා මූල්‍යමය නොවන ආධාර වශයෙන් විවිධ පුද්ගලයන්ගෙන් හා ආයතන මඟින් ඖෂධ, ආහාර, රෝගීන් සඳහා වන පරිභෝජන ද්‍රව්‍ය, ගොඩනැඟිලි සඳහා වන ආධාර, විවිධ උපකරණ ආදී ලෙස පුළුල් පරාසයක ද්‍රව්‍ය විවිධ ප්‍රමාණයන්ගෙන් ආධාර වශයෙන් ලැබේ.

එබැවින් එම ආධාර අතුරින් ඇතැම් ද්‍රව්‍ය ලේඛනගත නොවී පැවතිය හැකි අතර බොහොමයක් ආධාර, විශේෂයෙන්ම විශාල තොග වශයෙන් ලැබෙන ආධාර විධිමත් පරිදි ලේඛනගත කෙරෙනවා.

ඇතැම් මූල්‍ය නොවන ආධාර රෝහල් ඇතුළු අනෙකුත් සෞඛ්‍ය ආයතන වෙත සෘජුවම ලැබෙන බැවින් ඒවා සියල්ලක්ම ගිණුම්ගත කිරීම ප්‍රායෝගිකව අපහසු වෙලා තිබෙනවා.

(iii) පරිත්‍යාග වශයෙන් ලැබෙන ආධාර විධිමත් පරිදි ලබා ගැනීම හා බෙදා හැරීම ආශ්‍රිත සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම සඳහා "ප්‍රදාන වශයෙන් ලැබෙන වෛද්‍ය සැපයුම්/උපකරණ/ ගොඩනැඟිලි ආධාර සම්බන්ධීකරණ කමිටුව" නමින් කමිටුවක් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ස්ථාපිත කර ඇත.

ඊට අදාළ මෙහෙයුම් කටයුතු විධිමත් පරිදි මේ වන විටත් සිදු කරනු ලබනවා.

(ආ) පැන නොනඟී.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, සෞඛ්‍ය ගැන කථා කරද්දි අපි අද උදේත්, ඊයේත් දැකපු දේ තමයි, පසුගිය කාලයේ මතභේදයට තුඩු දුන් ඉමියුනොග්ලොබියුලින් ඖෂධයෙහි බැක්ටීරියා සහ ලුණු වතුර තිබුණා කියලා ලෝක සෞඛ්‍ය සංවිධානයේ පරීක්ෂණ අනුව ඔප්පු වෙලා තිබෙනවාය කියන එක. මේක ඉතාම බරපතළ තත්ත්වයක්. මම හිතන විධියට, මේ පිළිබඳව අධිකරණයේ නඩුත් විභාග වනවා. ඒ වාගේම මේ සම්බන්ධයෙන් නිලධාරින්ට එරෙහිව නීතියත් ක්‍රියාත්මක වෙනවා. අපි දන්නවා, නිදහස් සෞඛ්‍ය සේවාව ගත්තාම ඉතිහාසයේ දකුණු ආසියාවේ විතරක් නොවෙයි, ලෝකයේ උසස්ම සෞඛ්‍ය පහසුකම් තිබුණු රටක් වෙලා තිබුණු අපේ රටට ඉතාම දරුණු කළු පැල්ලමක් ඇති වුණු බව, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

ඒ නිසා එක පැත්තකින් අපි අපේ ගුණාත්මක ඖෂධ පිළිබඳව රටේ ජනතාවට තිබුණු අවිශ්වාසය දුරු කරන්න කටයුතු කරන්න ඕනෑ. ඒ සම්බන්ධව ලොකු වගකීමක් සෞඛ්‍ය ඇමතිතුමාටත්, ඔබතුමාටත්, රජයටත් තිබෙනවා.

මම මේ වෙලාවේ මතක් කළ යුතු තවත් කාරණයක් තිබෙනවා. ගරු කථානායකතුමනි, අපි 2019දී බිංගිරිය අපනයන සැකසුම් කලාපය හැදුවා. ඒකේ දකුණු ආසියාවේ ලොකුම ඖෂධ නිෂ්පාදනය කරන කර්මාන්තශාලාව හදන්න වැඩ පටන් ගත්තා. මීට දින කිහිපයකට කලින් ගරු සෞඛ්‍ය ඇමතිතුමා එතැන visit කළා. ඒ පිළිබඳව ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා. බිංගිරිය අපනයන සැකසුම් කලාපයේ වැඩ නිම වීමට තව මාස කිහිපයයි තිබෙන්නේ. එම අපනයන සැකසුම් කලාපයේ තිබෙන Synergy Pharmaceuticals Corporation Private Limited එක ඩොලර් මිලියන 100කට ආසන්න ආයෝජනයක්. මේකට මුදල් අමාත්‍යාංශයෙන් දෙන්න ඕනෑ යම් සහයෝගයක් තිබෙනවා, tax benefits තිබෙනවා. ඒවා ලබා දීම හරහා මේ කටයුතු කඩිනම් කර ගන්න පුළුවන්. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ පැවති ඖෂධ ප්‍රශ්නයට විසඳුමක් හොයපු කෙනෙක්, මම. එවකට සෞඛ්‍ය ඇමතිතුමාටත් මේ ගෞරවය හිමි වෙන්න ඕනෑ. බිංගිරිය අපනයන සැකසුම් කලාපය හදලා, ඒකේ වැඩ ආරම්භ කිරීමට එතුමාත් කටයුතු කළා. අනාගතයේදී බිංගිරියේ බෙහෙත් අපේ රටේ ජනතාවගෙන් අතිබහුතරයකට බොන්න අවස්ථාව උදා වෙනවා. ඒ සඳහා ඉතාම උසස් තත්ත්වයේ තිබෙන කර්මාන්තශාලාවක් අපනයන සැකසුම් කලාපය තුළ ආරම්භ කර තිබෙනවා. සෞඛ්‍ය ඇමතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා, එහි කටයුතු වේගවත් කරන්න, ඒකට අවශ්‍ය පහසුකම් දෙන්න, ඒකට අවශ්‍ය tax පහසුකම් දෙන්න කටයුතු කිරීම පිළිබඳව සොයා බැලීමට එතැනට යාම සම්බන්ධයෙන්. ඔබතුමාටත් ඒ ගැන මතක් කරන ගමන්, මෑතක ඒමට නියමිත ඖෂධ පිළිබඳව රටේ ජනතාව තුළ තිබෙන සැකය දුරු කරන්න, මේ ආපු report එකත් එක්ක ලෝකයේ රටවල් තුළ අපේ රට කෙරෙහි ඇති වුණු කළු පැල්ලම මකන්න රජයක් විධියට ඔබතුමන්ලා යම් ක්‍රියාමාර්ගයක් ගන්නවාද කියලා මම අහනවා.

ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)

ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම අපි ලංකාවේ ඖෂධ කර්මාන්තශාලා ඇති කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීමට සහ කලාප විධියට ඒවා සංවර්ධනය කිරීමට අවශ්‍ය වැඩ කටයුතු කරනවා.

බිංගිරිය කලාපයත් අපි එසේ හඳුනා ගත් කලාපයක්. ඒ වාගේම ආයෝජකයන් විශාල පිරිසක් එහි ආයෝජනය කිරීමට බලාපොරොත්තු වෙනවා. අපේ එක අරමුණක් තමයි, ඖෂධ දේශීය වශයෙන් නිපදවා ගැනීම සහ අපනයනය කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් රජයක් විධියට සැලසීම. අපි ඒකට අවශ්‍ය ප්‍රතිකර්ම යොදලා තිබෙන්නේ.

ඖෂධ සම්බන්ධ ප්‍රශ්නය ගත්තාම, මේ රටට ඖෂධ ගෙන්වීමේ යම් ක්‍රමවේදයක් තිබෙනවා, දේශීය ඖෂධ මිලදී ගැනීමේ

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ක්‍රමවේදයක් තිබෙනවා. ඒ වාගේම ඒ හැම ඖෂධයක්ම අපි ගන්න ඉස්සෙල්ලා පරීක්ෂණාගාර තත්ත්වයන් යටතේ පරීක්ෂා කරලා තමයි ගන්නේ. මේ නිවැරදි ක්‍රමවේදය අනුගමනය කරනවා නම් ඉමියුනොග්ලොබියුලින් ඖෂධය සම්බන්ධයෙන් ඇති වූ ප්‍රශ්න වාගේ ඒවා එන්නේ නැහැ. නමුත් ඒ අවස්ථාවේ නිවැරදි ක්‍රමවේදයෙන් බැහැරව කටයුතු කළ නිසා තමයි ඒ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ. එවැනි තත්ත්වයක් අපේ රටේ යළි ඇති නොවෙයි කියලා අපි විශ්වාස කරනවා. එහෙම ඇති නොවෙන්න රජය විධියට අපි ගන්න පුළුවන් ක්‍රියාමාර්ග සහ විධිවිධාන අරගෙනයි තිබෙන්නේ.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ඇසීමේ අවස්ථාව මා හිතවත් ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමාට - මගේ best friendට - ලබා දෙනවා.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Thank you, Hon. Speaker and Hon. Nalin Bandara Jayamaha.

ගරු කථානායකතුමනි, මම දෙවැනි අතුරු ප්‍රශ්නය අහනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා සඳහන් කරපු ප්‍රමාණය වැරදියි කියලා මම කියනවා. හේතුව, 2019දී Tellippalai Trail Cancer Hospital එකට විතරක් අපේ ඩයස්පෝරාවෙන් දීපු සල්ලි ප්‍රමාණය පවුම්වලින් 31,234ක්. ඒක රුපියල් ලක්ෂ 1,200ක් වෙනවා. ඒ, Tellippalai Trail Cancer Hospital එකට විතරක් දීපු සල්ලි. Jaffna Teaching Hospital එකේ Deputy Administrative Grade එකේ Medical Administrative Officer කෙනෙක් විධියට in-service training එකේ මමත් හිටියා.

සාමාන්‍යයෙන් දකුණේ වෙන්නේ මෙහෙමයි. කවුරු හෝ donation එකක් දෙනවා නම් අපි ඒ donation එක අරගෙන, ඒක ගබඩාවලට යවනවා. ඊට පස්සේ donation එක register කරනවා. එතකොට thanking letter එකක් දෙනවා. ඒකේ අපි registration number එකක් දානවා. ඒ වාගේ දේවල් හරියටම වෙනවා. හැබැයි, උතුරේ මේ කිසි දෙයක් වෙන්නේ නැහැ. උතුරේ Trail Cancer Hospital එකට එක පවුලකින් විතරක් දීලා තිබෙනවා, පවුම්වලින් 2,300 ගාණක්. එහෙම පවුල් කිහිපයක් දීලා තිබෙනවා. හැබැයි, මම ඔබතුමාගෙන් ඉල්ලුවේ welfare society එක audit කරලා පාර්ලිමේන්තුවට වාර්තාවක් දෙන්න පුළුවන්ද කියායි. නමුත්, ඔබතුමා ලියුමක් ගහලා තිබෙනවා, සියලුම PDsලාට, Internal Audit report එක පාර්ලිමේන්තුවට භාර දෙන්න කියලා. ඒ කියන්නේ, ඇතුළේ තිබෙන welfare society එකේ audit එක නොවෙයි. මම ඒක නොවෙයි, ඉල්ලුවේ. ඒ question එකෙන් මම ඉල්ලුවේ,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න. දැන් විනාඩි දෙකක් ගත වෙලා තිබෙනවා.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම ප්‍රශ්නය අහනවා, ගරු කථානායකතුමනි. 2015 ඉඳන් අද වෙනතුරු හැම hospital එකකම තිබෙන welfare societies DS office එකේ register කරන්න ඕනෑ. ඒ වාගේම Inland Revenue Department එකේ අනිවාර්යයෙන් non-profit organization එකක් විධියට register කරන්න ඕනෑ. Audit report එක අපි හදන්න ඕනෑ. Audit report එක පාර්ලිමේන්තුවට යවන්න ඕනෑ. හැබැයි, Tellippalai Trail Cancer Hospital එක -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නය අහන්න.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඒක තමයි මම අහන්නේ, ගරු කථානායකතුමනි. Tellippalai Trail Cancer Hospital එක සම්බන්ධයෙන් දැනට මම වංචා හා දූෂණ සම්බන්ධයෙන් තිබෙන කමිටුවට complain කරලා තිබෙනවා. නමුත්, ඔබතුමන්ලා තවම ඒ ගැන කිසිම inquiry එකක් පටන්ගෙන නැහැ. DG හම්බ වුණා; Secretary හම්බ වුණා. ඒගොල්ලන් කියන්නේ අපි මේ ගැන සොයා බලනවා කියායි. මේ සම්බන්ධයෙන් කරලා තිබෙන කටයුතු මොනවාද, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි?

ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)
ගරු මන්ත්‍රීතුමනි මෙතැනදී මම දැක්වුයේ ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල සඳහා ලැබුණු පරිත්‍යාග පිළිබඳවයි. ඇත්තටම ඊට අමතරව මම කිව්වේ, එක් එක් රෝහල්වලත් ඒ විධියේ අරමුදල් පිහිටුවා ගන්න අපි අවසර දීලා තිබෙනවා කියලායි. නමුත්, ඒ හැම එකක්ම යම් විධිමත් රාමුවක් යටතේ ක්‍රියාත්මක වීම අවශ්‍යයි. විශේෂයෙන්, එහෙම මුදල් ලබා ගැනීමේ හැකියාවක් නැහැ.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඔහුගේ පෞද්ගලික බැංකු,- *[බාධා කිරීමක්]*

ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)
මම ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නයට උත්තර දෙන්නම්. කිසිම කෙනෙකුට එහෙම පෞද්ගලික accountsවලට ඒ විධියට ලැබෙන සල්ලි දමා ගැනීමට හැකියාවක් නැහැ. එහෙම තත්ත්වයක් ඇති වුණා නම් ඒක ඉතාම වැරැදියි. ඒ සඳහා වූ පැමිණිල්ලක් ලැබුණා නම් ඒක විභාග කිරීම අනිවාර්යයෙන්ම සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා මම හිතන විධියට සාමාන්‍ය නීතිය අනුව සිදු විය යුතුයි. මේ දිනවල රටේ ඒ සම්බන්ධයෙන් ලොකු කථා බහක් ඇති වෙලා තිබෙන නිසා මම කියන්න ඕනෑ, ඖෂධ හා උපකරණ රෝහලකට emergency එකක් විධියට අවශ්‍ය වූ වෙලාවේදී ඒවා සැපයීම හෝ ලබා ගැනීම වරදක් නොවෙයි කියන එක. එහෙම ඒවා ලබා ගැනීමට හැකියාව තිබෙනවා. නමුත් එලෙස ලබා ගන්නා දේවල් නිසි පරිදි ලේඛනගත කිරීම තමයි අවශ්‍ය වන්නේ. විශේෂයෙන්ම මුදල් ආධාර ලබා ගැනීමේදී ඒ අදාළ රෝහල් පරිපාලනය විසින් ඒ සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයට දැනුම් දිය යුතුයි කියාත් අපි කියලා තිබෙනවා. නිසි පරිදි ලේඛන නඩත්තු කර ගැනීමේ අවශ්‍යතාව සහ ගිණුම් නිසි පරිදි පවත්වාගෙන යෑමේ අවශ්‍යතාවත් මම මෙතැනදී අවධාරණය කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 3 -224/2024- (1), ගරු අජිත් පී. පෙරේරා මහතා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා. මක් නිසාද, පටන් අරගෙන තිබෙන කමිටුවල වාර්තා කැඳවලා ඒ තොරතුරු ලබා ගන්න ඕනෑ. අර්ජුන අබේසේකර වාර්තාවේ කටයුතු දැන් සිදු කෙරීගෙන යනවා. ඒ තොරතුරුත් ලබා ගැනීමට අවශ්‍ය නිසා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීමට සති දෙකක කාලයක් මා ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

කොළොන්නාව ප්‍රා.ලේ. කොට්ඨාසයේ නිවාස නොමැති පවුල්: නිවාස ලබාදීම
கொலன்னாவ பிரதேச செயலாளர் பிரிவிலுள்ள வீடற்ற குடும்பங்கள்: வீடுகளை வழங்குதல்
HOMELESS FAMILIES IN KOLONNAWA DS DIVISION: PROVISION OF HOUSES

280/2024

4. ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නිවාස නොමැති පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පවුල්වලට නිවාස ලබා දීම සඳහා වැඩ පිළිවෙළක් යෝජනා වී තිබේද;

(iii) එසේ නම්, එම වැඩ පිළිවෙළ කවරේද;

(iv) එම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කාල වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கொலன்னாவ பிரதேச செயலாளர் பிரிவிலுள்ள வீடற்ற குடும்பங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) அத்தகைய குடும்பங்களுக்கு வீடுகளை வழங்குவதற்கான ஒரு வேலைத்திட்டம் முன்மொழியப்பட்டுள்ளதா என்பதையும்;

(iii) அவ்வாறாயின், அந்த வேலைத்திட்டம் யாது என்பதையும்;

(iv) மேற்படி வேலைத்திட்டத்தைச் செயற்படுத்த உத்தேசித்துள்ள காலப்பகுதி யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Urban Development, Construction and Housing:

(a) Will he inform this House -

(i) the number of homeless families in the Kolonnawa Divisional Secretary's Division;

(ii) whether a course of action has been proposed to provide housing to the above-mentioned families;

(iii) if so, the course of action concerned; and

(iv) the timeframe within which the course of action is expected to be implemented?

(b) If not, why?

ගරු අනුර කරුණාතිලක මහතා (නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා)
(மாண்புமிகு அனுர கருணாதிலக்க - நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Urban Development, Construction and Housing)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) නිවාස නොමැති පවුල් සංඛ්‍යාව 1,035කි.

(ii) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ව්‍යාපෘති 3ක් ප්‍රධාන වශයෙන් ක්‍රියාත්මක කරනවා. ඒ අනුව 2025 අවුරුද්ද තුළදී ලංකාව පුරාම නිවාස නොමැති දුගී පවුල් 3,000කට නිවාස ලබා දෙන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා. ඒ යටතේ කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඉන්න නිවාස නොමැති දුගී පවුල්වල අය සඳහාත් ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙනවා. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වන අතරේ, තවත් ණය යෝජනා ක්‍රම දෙකක් ක්‍රියාත්මක වෙනවා. ඒ ණය යෝජනා ක්‍රම හරහාත් නිවාස ණය ලබා දෙන්න කටයුතු කරනවා. ඊට අමතරව විශේෂයෙන්ම වතු ආශ්‍රිතව ඉන්න කණ්ඩායම් සඳහා දැනටමත් "සංහිඳ සෙවණ" මහල් නිවාස සංකීර්ණයේ නිවාස ඉදිකරලා තිබෙනවා; 696ක් ඉන්නවා. ඒ වාගේම, "ලක්සඳ සෙවණ" මහල් නිවාස සංකීර්ණයේ නිවාස 1,008ක් තිබෙනවා.

ඊට අමතරව කොළොන්නාව ගංවතුර පාලන ව්‍යාපෘතිය පිළිබඳව ගරු අගමැතිතුමියගේ ප්‍රධානත්වයෙන් මේ වනවිටත් සාකච්ඡා වෙමින් පවතිනවා. ඒ සාකච්ඡාවේදීත් ඉල්ලීමක් කර තිබෙනවා, ගංවතුරින් යට වන නිවාස සඳහාත් නිවාස ලබා දෙන වැඩ පිළිවෙළක් සම්බන්ධයෙන්. ඒ පිළිබඳව යෝජනාවක් ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒ අනුව ඒ සඳහා වැඩ පිළිවෙළකුත් යෝජනා වෙලා තිබෙනවා. සමහර ඒවා ක්‍රියාත්මකත් වෙනවා. මම කලින් කියපු ආකාරයට, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන මේ වැඩ පිළිවෙළ, ලංකාව පුරාම ක්‍රියාත්මක වන වැඩ පිළිවෙළක්.

(iii) රාජ්‍ය සේවකයන් වෙනුවෙන් නිවාස ණය ලබා දීම සඳහා "ස්වාභිමානී" නිවාස ණය වැඩසටහන, අඩු ආදායම් හා මධ්‍යම ආදායම්ලාභීන්ගේ නිවාස අවශ්‍යතාව සපුරාලීම සඳහා "සැමට නිවහන" නිවාස ණය වැඩසටහන, දිළිඳුම අයගේ නිවාස අවශ්‍යතාව සපුරාලීම සඳහා වෙනමම වැඩ පිළිවෙළක්, මිලියන 30ක ආධාර මුදලක් අදියර කිහිපයකින් ලබා දෙන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වනවා.

(iv) එම වැඩ පිළිවෙළ 2025 ඉඳලා ආරම්භ වෙලා තිබෙනවා.

(ආ) අදාළ නැත.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, දැන් ඇමතිතුමා කිව්වා, එක්දහස් ගණනකට තමයි ගෙවල් නැත්තේ කියලා. මම හිතන විධියට, ඒ ගෙවල් නැති සම්පූර්ණ පවුල් සංඛ්‍යාව තමයි අරගෙන ඇත්තේ. අනුපවුල්, එක ගෙදර පවුල් තුන හතර ඉන්න ඒවා ගැන විස්තර අරගෙන නැතුව ඇති. කමක් නැහැ. අනික, ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා ලක්සඳ සෙවනයි, සංහිඳ සෙවනයි ගැන. ඒ යටතේ දැනටමත් පදිංචි කරලා ඉවරයි. එම නිසා ඒ උත්තරය වැරදියි. මොකද, මම ප්‍රශ්නයෙන් අහලා තිබෙන්නේ දැනට නිවාස නොමැති අය සම්බන්ධව. දැනට පදිංචි කරපු අය ගැන අහලා නැහැ.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුර අනුව පැන නඟින තුන්වන කාරණය මෙයයි. මා මෙය ඔබතුමාගේ අවධානය සඳහා යොමු කරනවා. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පිළිබඳව තමයි ඔබතුමා සඳහන් කළේ. දැන් ණය ලබා දීමෙන් බලාපොරොත්තු වෙන්නේ නැහැ, ගෙයක් නැති අයට ගෙයක් ලබා දෙන්න; තිබෙන නිවසක් අලුත්වැඩියා කර ගන්න. එම නිසා නාගරික සංවර්ධන අධිකාරියේ වැඩ පිළිවෙළක් මේ සඳහා ක්‍රියාත්මක කරන්න කියලා මම ඔබතුමාට යෝජනා කරනවා.

මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන් ලංකාව පුරාම ක්‍රියාත්මක කරන නිවාස 3,000 programme එකක් ගැන කිව්වා. ඒකෙන් කොච්චර ගෙවල් ප්‍රමාණයක් කොළොන්නාවට ලැබෙනවාද, කොහේද ඉදි කිරීම් කරන්නේ කියා විස්තරයක් දෙන්න පුළුවන්ද?

ගරු අනුර කරුණාතිලක මහතා
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
මම "ලක්සඳ සෙවන" සහ "සංහිඳ සෙවන" නිවාස යෝජනා ක්‍රම ගැන කිව්වේ, ඒ වාගේ නිවාස ව්‍යාපෘති අවසන් කර දැනටමත් ඒවායේ පදිංචි වෙලා ඉන්නවාය කියන එකට. දැනටමත් නිවාස ලබා දීලා තිබෙනවා කියන එකයි කිව්වේ. ඒ යටතේ අලුතෙන් නිවාස ලබා දෙනවා කියලා මම සඳහන් කළේ නැහැ. ඒ වාගේ ව්‍යාපෘති කිහිපයක් ගැන කොළොන්නාව නගරයේ ගංවතුර පාලන ව්‍යාපෘතිය යටතේ මේ වනකොට සාකච්ඡා කරමින් පවතිනවා. හැබැයි, දින වකවානු කියන්න බැහැ, අහවල් කාලයේ ඒක කරනවා කියලා. ඒකයි මම උදාහරණයක් හැටියට පැහැදිලි කළේ.

ඔබතුමා ඇහුවා ලංකාව පුරාම ක්‍රියාත්මක කරන නිවාස 3,000 වැඩසටහනෙන් කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට කොච්චරක් ලැබෙනවාද කියලා. මට මේ වෙලාවේ එය සඳහන් කරන්න බැහැ. සාමාන්‍යයෙන් ගත්තොත්, ලංකාව පුරාම 3,000ක් කියලා නේ තිබෙන්නේ. ආසන්න වශයෙන් 40ක්, 50ක් වාගේ ප්‍රමාණයක් වෙන්න පුළුවන්. හැබැයි, මම ඒ සංඛ්‍යාලේඛන තහවුරු කරගෙන කියන්න ඕනෑ.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, අගමැතිතුමියගේ ප්‍රධානත්වයෙන් ගංවතුර පාලන වැඩසටහනක් ගෙනෙනවා කියලා. ඇත්තවශයෙන්ම තව සියයට 20ක් විතර වාගේ තමයි එහි අවසන් වන්න තිබෙන්නේ. මම අගමැතිතුමියට ස්තුතිවන්ත වනවා, ඒකට මැදිහත් වීම පිළිබඳව. හැබැයි, ගංවතුර පාලන වැඩසටහන හරහා නිවාස හදන්නේ කොහොමද කියන එක මට තේරෙන්නේ නැහැ.

නමුත්, මම ඔබතුමාට යෝජනාවක් කරනවා. ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන් ගෙවල් 50යි නේ, ලැබෙනවා කිව්වේ. ඒක කරන්න. නමුත්, "සංහිඳ සෙවණ" සහ සාලමුල්ලේ ගොඩක් ඉන්නේ කොළොන්නාවේ අය නොවෙයි. කොම්පඤ්ඤවීදියෙන්, අරහෙන්, මෙහෙන් ගෙනැල්ලා relocate කරපු අය තමයි ඉන්නේ. යම් ප්‍රමාණයක් තමයි, elevated highway එක නිසා ඉවත් වුණු අය සහ කුණු කන්ද ළඟ හිටපු අය ඉන්නේ. එම නිසා මම ඔබතුමාට යෝජනාවක් කරන්න කැමැතියි. ඔබතුමා කිව්වේ ගෙවල් එක්දහස් ගණනක් හදනවා කියලා නේ. ගරු ඇමතිතුමනි, UDA එක හරහා එක් නිවාස යෝජනා ක්‍රමයක් ගේන්න. අතුරු ප්‍රශ්නයක් නොවෙයි මම මේ යෝජනාවක් කරන්නේ. එක නිවාස යෝජනා ක්‍රමයක් ගෙනාවොත් මේ ප්‍රශ්නය සම්පූර්ණයෙන්ම අවසන් කරන්න පුළුවන්. ඔබතුමා ඒකට මැදිහත් වෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ගරු අනුර කරුණාතිලක මහතා
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
Elevated highway එක නිසා ඉවත් වූ අය තවම එතැන පදිංචි කරලා නැහැ. ඒ වෙනුවෙන් නිවාස 349ක් වෙන් කරලා තිබෙනවා. නමුත්, ඒ අය තවම පදිංචි කරලා නැහැ.

ඔබතුමා කරපු යෝජනාව සම්බන්ධයෙන් කිව්වොත්, නාගරික සංවර්ධන අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන නිවාස ව්‍යාපෘති ප්‍රධාන වශයෙන් අනවසර පදිංචිකරුවන් සහ වතු ආශ්‍රිතව සිටින අනවසර පදිංචිකරුවන් සඳහා තමයි යෝජනා වෙන්නේ. කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා දැනට එවැන්නක් යෝජනා වෙලා නැහැ. අපට ඉදිරියේදී ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න පුළුවන්.

වී අලෙවි මණ්ඩලය: වී මිලදී ගැනීම
நெல் சந்தைப்படுத்தல் சபை: நெல் கொள்வனவு
PADDY MARKETING BOARD: PURCHASE OF PADDY

310/2024

5. **ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
`(The Hon. Ravi Karunanayake)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වී අලෙවි මණ්ඩලය ස්ථාපිත කරන ලද දිනය කවරේද;

(ii) එම මණ්ඩලය විසින් පසුගිය වර්ෂ 3 තුළ එක් එක් දිස්ත්‍රික්කයෙන් මිලට ගන්නා ලද වී තොග ප්‍රමාණය සහ වටිනාකම වෙන් වෙන් වශයෙන් කවරේද;

[ගරු රවි කරුණානායක මහතා]

(iii) එක් එක් දිස්ත්‍රික්කය තුළ වී මිලට ගැනීම සඳහා ස්ථාපිත කර ඇති මධ්‍යස්ථාන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එක් එක් දිස්ත්‍රික්කය තුළ ඇති වී ගබඩා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එක් එක් දිස්ත්‍රික්කයේ මුළු වී අස්වැන්නෙන් රජය විසින් වාර්ෂිකව මිලට ගනු ලබන වී ප්‍රමාණයෙහි ප්‍රතිශතය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) පසුගිය වර්ෂ 3 මුළුල්ලේ රාජ්‍ය බැංකු විසින් කුඩා හා මහා පරිමාණ වී මෝල් හිමියන් වෙත සපයා ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) අදාළ කාල පරිච්ඡේදය තුළ එම මෝල් හිමියන් විසින් මිලට ගන්නා ලද වී ප්‍රමාණය කොපමණද;

(iii) එම මෝල් හිමියන්ගේ නම් සහ ඔවුන් විසින් ඉහත දක්වන ලද කාල පරිච්ඡේදය තුළ මිලට ගන්නා ලද වී තොගවල ප්‍රමාණය හා වටිනාකම කොපමණද;

(iv) වී සහල් බවට පත්කර බෙදා හරිනු පිණිස ක්‍රමවේදයක් දිස්ත්‍රික් මට්ටමින් ස්ථාපිත කරන්නේද;

යන්නත් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நெல் சந்தைப்படுத்தல் சபை நிறுவப்பட்ட திகதியையும்;

(ii) கடந்த 3 வருடங்களில் அச்சபையால் ஒவ்வொரு மாவட்டத்திலும் கொள்வனவு செய்யப்பட்ட நெல்லின் அளவு மற்றும் பெறுமதி வெவ்வேறாக யாவை என்பதையும்;

(iii) நெல் கொள்வனவுக்காக ஒவ்வொரு மாவட்டத்திலும் நிறுவப்பட்டுள்ள நிலையங்களின் எண்ணிக்கை வெவ்வேறாக எத்தனை என்பதையும்;

(iv) ஒவ்வொரு மாவட்டத்திலும் உள்ள நெல் களஞ்சியப்படுத்தல் சாலைகளின் எண்ணிக்கை வெவ்வேறாக எத்தனை என்பதையும்;

(v) ஒவ்வொரு மாவட்டத்திலும் அறுவடை செய்யப்பட்ட மொத்த நெல்லிலிருந்து அரசாங்கத்தால் வருடாந்தம் கொள்வனவு செய்யப்படும் நெல்லின் சதவீதம் வெவ்வேறாக யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) சிறிய மற்றும் பாரிய அளவிலான நெல் ஆலை உரிமையாளர்களுக்கு அரச வங்கிகளால் கடந்த 3 வருடங்களில் வழங்கப்பட்ட நிதியின் அளவு எவ்வளவு என்பதையும்;

(ii) மேற்கூறப்பட்ட ஆலை உரிமையாளர்களால் அக்காலப்பகுதியில் கொள்வனவு செய்யப்பட்ட நெல்லின் அளவு எவ்வளவு என்பதையும்;

(iii) அந்த ஆலை உரிமையாளர்களின் பெயர்களையும் மேற்கூறப்பட்ட காலப்பகுதியில் அவர்கள் கொள்வனவு செய்த நெல்லின் அளவு மற்றும் பெறுமதி யாதென்பதையும்;

(iv) நெல்லை அரிசியாக மாற்றி, அதனை மாவட்ட மட்டத்தில் விநியோகிப்பதற்கான முறைமையொன்று நிறுவப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு வெவ்வேறாக அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House the -

(i) date on which the Paddy Marketing Board was established;

(ii) quantity and the value of paddy purchased by the Board over the past three years per district, separately;

(iii) number of centres established for purchasing paddy per district, separately;

(iv) number of paddy storage facilities per district, separately; and

(v) percentage of paddy purchased by the Government annually, out of the total paddy harvest per district, separately?

(b) Will he also inform this House, separately -

(i) the amount of money provided by State banks to small and large-scale paddy mill owners over the past three years;

(ii) the quantity of paddy purchased by those mill owners during that period;

(iii) the names of the mill owners, along with the quantity and value of paddy they purchased during the above period; and

(iv) whether a system will be established to convert paddy into rice and distribute it at district level?

(c) If not, why?

ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)

(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) 1971 මාර්තු 17වන දින.

(ii)

අනු අංකය	දිස්ත්‍රික්කය	පසුගිය වර්ෂ 3 සඳහා මිලදී ගත් වී ප්‍රමාණය (මෙ.ටො)		
		2022	2023	2024
1	අම්පාර	13,783.90	248.464	1,396.443
2	මහනුවර	65.80	-	-
3	බදුල්ල	-	-	-
4	පොළොන්නරුව	-	-	5,305.94

අනු අංකය	දිස්ත්‍රික්කය	පසුගිය වර්ෂ 3 සඳහා මිලදී ගත් වී ප්‍රමාණය (මෙ.ටො)		
		2022	2023	2024
5	අනුරාධපුරය	7,326.78	-	-
6	කුරුණෑගල	12,958.73	-	-
7	පුත්තලම	2,148.09	-	-
8	ගම්පහ	1,122.76	-	-
9	මාතලේ	3,084.34	-	-
10	හම්බන්තොට	1,142.38	1,716.73	1,011.593
11	මොනරාගල	378.84	-	165.262
12	රත්නපුර	222.25	94.97	184.227
13	මාතර	-	-	-
14	ගාල්ල	3.04	-	-
15	කිළිනොච්චිය	6,389.43	-	-
16	මුලතිව්	5,617.11	7.4	-
17	වව්නියාව	7,446.51	-	-
18	යාපනය	1,926.58	-	-
19	මන්නාරම	2,551.68	-	-
20	මඩකලපුව	3,738.33	86.36	-
21	ත්‍රිකුණාමලය	3,148.32	-	-
ප්‍රමාණය (මෙ.ටො.)		78,360.81	2,153.924	2,757.525
මුළු වටිනාකම (මිලියන)		6,747.23	204.635	292.636

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

2025දී කොච්චරද, ගරු නියෝජ්‍ය ඇමතිතුමා? 2025 ඒවාත් කියන්න ඕනෑ.

ගරු නාමල් කරුණාරත්න මහතා
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

2025 දත්ත තවම ඇවිල්ලා නැහැ. අදාළ මන්ත්‍රීතුමා ප්‍රශ්න කළොත් මම ඒකට උත්තර දෙන්නම්.

(iii) 2024/25 මහ කන්නයේ වී මිල දී ගැනීම සඳහා විවෘත කර ඇති, ස්ථාපිත කර ඇති ගබඩා පිළිබඳව කලාප මට්ටමින් මා කියන්නම්, ගරු මන්ත්‍රීතුමා.

	කලාපය	දිස්ත්‍රික්කය	වී මිල දී ගැනීම සඳහා විවෘත කර ඇති ගබඩා සංඛ්‍යාව
01	පොළොන්නරුව	පොළොන්නරුව	20
02	දකුණ	හම්බන්තොට, රත්නපුර, මොනරාගල	19
03	නැඟෙනහිර	මඩකලපුව, ත්‍රිකුණාමලය	10
04	අනුරාධපුර	අනුරාධපුරය, මාතලේ	27
05	අම්පාර	නුවර, බදුල්ල, අම්පාර	26
06	උතුර	කිලිනොච්චි, වවුනියාව, මුලතිව්, යාපනය, මන්නාරම	12
07	වයඹ	කුරුණෑගල, පුත්තලම, මාතලේ, ගම්පහ	19
මුළු එකතුව			133

(iv)

	දිස්ත්‍රික්කය	ගබඩා සංඛ්‍යාව
1	කුරුණෑගල	19
2	පුත්තලම	7
3	මාතලේ	9
4	ගම්පහ	4
5	ත්‍රිකුණාමලය	25
6	මඩකලපුව	10
7	මොනරාගල	9
8	රත්නපුර	8
9	හම්බන්තොට	19
10	ගාල්ල	1
11	මාතර	1
12	අම්පාර	65
13	බදුල්ල	7
14	මහනුවර	9
15	අනුරාධපුරය	69
16	පොළොන්නරුව	57
17	කිලිනොච්චි	8
18	වවුනියාව	7
19	මුලතිව්	14
20	මන්නාරම	4
21	යාපනය	1
මුළු එකතුව		353

(v)

අනු අංකය	දිස්ත්‍රික්කය	2022 වසරේ මිල දී ගත් වී ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස (%)	2023 වසරේ මිල දී ගත් වී ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස (%)
1	කොළඹ	0.00	0.00
2	ගම්පහ	2.34	0.00
3	කළුතර	0.00	0.00
4	නුවර	0.12	0.00
5	මාතලේ	3.37	0.00
6	නුවරඑළිය	0.00	0.00
7	ගාල්ල	0.01	0.00
8	මාතර	0.00	0.00
9	හම්බන්තොට	0.44	0.53
10	යාපනය	12.83	0.00
11	මන්නාරම	4.35	0.00
12	වවුනියාව	11.51	0.00
13	මුලතිව්	8.48	0.01
14	කිලිනොච්චි	7.31	0.00
15	මඩකලපුව	2.21	0.03
16	අම්පාර	3.11	0.04
17	ත්‍රිකුණාමලය	1.66	0.00
18	කුරුණෑගල	0.00	0.00
19	පුත්තලම	3.02	0.00
20	අනුරාධපුර	1.76	0.00
21	පොළොන්නරුව	1.31	0.00
22	බදුල්ල	0.00	0.00
23	මොනරාගල	0.25	0.00
24	රත්නපුර	0.32	0.11
25	කෑගල්ල	0.00	0.00

[ගරු නාමල් කරුණාරත්න මහතා]

(ආ) (i) 2022 වර්ෂය සඳහා ඉහත ණය වැඩසටහන ක්‍රියාත්මක කර නැත. 2023 සහ 2024 වර්ෂවල තොරතුරු පහත පරිදි වේ.

කන්නය	ලංකා බැංකුව	මහජන බැංකුව	ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
	ලබා දී ඇති මුළු ණය මුදල (රුපියල් මිලියන)	ලබා දී ඇති මුළු ණය මුදල (රුපියල් මිලියන)	ලබා දී ඇති මුළු ණය මුදල (රුපියල් මිලියන)
2023 යල	329.7	137.5	-*
2023/24 මහ	1,042	348	37
2024 යල	2,389	480	42

* 2023 යල කන්නයේදී මෙම වැඩසටහන ලංකා බැංකුව හා මහජන බැංකුව හරහා පමණක් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව 2023 යල කන්නයේදී මෙම වැඩසටහන සඳහා සම්බන්ධ නොවීය.

(ii)

කන්නය	ලංකා බැංකුව	මහජන බැංකුව	ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
	මිල දී ගත් වී ප්‍රමාණය (මෙට්‍රික් ටොන්)	මිල දී ගත් වී ප්‍රමාණය (මෙට්‍රික් ටොන්)	මිල දී ගත් වී ප්‍රමාණය (මෙට්‍රික් ටොන්)
2023 යල	3,324	1,640	-*
2023/24 මහ	9,398	2,863	410
2024 යල	21,438	4,084	384

* 2023 යල කන්නයේදී මෙම වැඩසටහන ලංකා බැංකුව හා මහජන බැංකුව හරහා පමණක් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව 2023 යල කන්නයේදී මෙම වැඩසටහන සඳහා සම්බන්ධ නොවීය.

(iii) එම මෝල්හිමියන්ගේ නම් ඇමුණුම් මඟින් දක්වා ඇත:

2023 යල කන්නය - ඇමුණුම 01

2023/24 මහ කන්නය - ඇමුණුම 02

2024 යල කන්නය - ඇමුණුම 03

නමුත් ඔවුන් විසින් ඉහත දක්වන කාල පරිච්ඡේදය තුළ මිලට ගන්නා ලද වී තොගවල ප්‍රමාණය හා වටිනාකම පිළිබඳ තොරතුරු සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර නොමැත.

ඇමුණුම් 01, 02 සහ 03 **සභාගත*** කරනවා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, වැඩියෙන්ම වී මිල දී ගත්තු තුන්දෙනාගේ නම් කියන්න.

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

ගරු නාමල් කරුණාරත්න මහතා
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු මන්ත්‍රීතුමනි, මෙම ඇමුණුම්වල නම් වට්ටෝරුවක් තිබෙනවා. ඒවා සොයලා තමයි කියන්න වෙන්නේ. ඒ සියල්ල මා සභාගත කළ ඇමුණුම්වල සඳහන් වෙනවා.

(iv) ඔව්.

2021/22 මහ කන්නයේ සිට වී අලෙවි මණ්ඩලයේ කලාප හරහා ගොවීන්ගෙන් මිලට ගන්නා ලද වී තොග සුළු හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන් හරහා කෙටුම් කුලී ගෙවා සහල් බවට පත්කර සතොස හරහා දිස්ත්‍රික්ක වෙත බෙදා හැරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. එම වැඩසටහන ඉදිරියේදී රජයේ මැදිහත්වීමක් හරහා සිදු කළ හැකිය.

(ඇ) අදාළ නොවේ.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. ගරු කථානායකතුමනි, අවුරුදු ගණනාවක් තිස්සේ මේ ගැටලුව හොරිකඩයක් වාගේ ඉදිරියට ඇවිත් තිබෙන නිසා සහ එයට විසඳුමක් ලැබී නැති නිසා තමයි මම මේ ප්‍රශ්නය ඇහුවේ.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, වී අලෙවි මණ්ඩලය තමා සතු කාර්යභාරය 1971 සිට හරියාකාරව කළා නම් අපි අද වී අපනයනය කරනවා. නමුත් එහෙම වෙලා නැති නිසා, ඔබතුමාට දැන් ඒ ගැන අලුත් ආකාරයකට බලන්න බැරිද? ඔබතුමා ලබා දුන් පිළිතුර තුළින්ම පෙනී යනවා, බැංකු විසින් හැම අවස්ථාවකදීම - යල සහ මහ කන්නවලදී - ණය ලබා දෙන බව. සාමාන්‍යයෙන් මහ කන්නයකින් මෙට්‍රික්ටොන් 2,700ක් පමණ අස්වැන්නක් ලබා ගන්නා අවස්ථාවේදී වී අලෙවි මණ්ඩලය මිල දී ගන්නේ සියයට 3යි, ගරු කථානායකතුමනි. සියයට 3කින් මිලක් ස්ථාපිත කරන්න බැහැ.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් නම් තුනක් ගැන ඇහුවා නේ, වැඩියෙන්ම වී මිල දී ගත්තු තුන්දෙනෙකුගේ. මොකද, එක්කෙනෙකු සියයට 65ක්, 70ක් අරගෙන තිබෙනවා නම් එතැන විෂමතාවක් ඇති වෙනවා. ඇයි අපි තරුණයන් ව්‍යවසායකයන් බවට පරිවර්තනය කරන්නේ නැත්තේ?

කිලෝ 50,000 බැගින් 4,000කට දුන්නොත් සියයට 20ක විතර අභියෝගයක් කරන්න පුළුවන් තත්ත්වයක් ඇති වෙනවා. දැන් බැංකුවලින් දීලා තිබෙනවා, රුපියල් කෝටි 7,500ක් විතර. මේක ව්‍යවසායකත්වයකට පරිවර්තනය කළොත්, දිස්ත්‍රික්ක ගණනාවක අඩුම ගණනේ ව්‍යවසායකයන් 4,000ක්වත් බිහි කළොත් ඔබතුමාගේ ඔය ප්‍රශ්නයට සදාකල් විසඳුමක් ලැබෙනවා කියන මතය මා දරනවා. ඕනෑ නම් ප්‍රශ්න කරාවි, ඇයි අපේ කාලයේ ඒක කළේ නැත්තේ කියලා. ඒවා ආරම්භ කළා, 2016දී. නමුත් කුට විධියට යම් යම් අය එය විකෘති කරලා තරුණ ව්‍යවසායකයන්ට දෙපයින් හිටගන්න පුළුවන් අවස්ථාව නැති කළා. ඔබතුමන්ලා රැඩිකල් වෙනසක් ඇති කරනවා ලු. ගරු නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා එකක් කියනවා; ගරු ලාල් කාන්ත ඇමතිතුමා වෙනත් ආකාරයකින් කියනවා. මම අගය කරනවා, ඔය කියන රැඩිකල් ක්‍රමයට ව්‍යවසායකයන් 4,000ක් බිහි කරලා අර කියපු වෙනස ඇති කරනවා නම්. එම අභියෝගය භාර ගන්න පුළුවන්ද කියා මම අහනවා.

ගරු නාමල් කරුණාරත්න මහතා
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
පිළිතුර මේකයි, ගරු මන්ත්‍රීතුමා. "ලාල් කාන්ත එකක් කියනවා, ඔබතුමා එකක් කියනවා" කියලා ඔබතුමා කිව්වා. එහෙම නැහැ, දෙන්නම එකයි කියන්නේ. ඒක තමයි පළමුවෙනි පිළිතුර.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන කාරණය හරි. අපි මේ වගකීම භාර ගන්න කොට මහ කන්නයේ මහක් දුර ගිහිල්ලා. දැන් මේ යල කන්නයේ ඉඳන් තමයි අපි හරියාකාරව මේ කටයුත්තට ප්‍රවේශ වන්නේ. මේ තත්ත්වය වෙනස් කරන්න අපි අනිවාර්යයෙන් මැදිහත් වෙනවා. වවුලන් ඇතුළු සතුන්ට, කැලෑවට ඇරලා තිබුණු ගබඩා සියල්ල ප්‍රතිසංස්කරණය කිරීම අපි ආරම්භ කර තිබෙනවා. මේ වන විටත් ගබඩා ප්‍රතිසංස්කරණය කරමින් තිබෙනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා මට,-

ගරු නාමල් කරුණාරත්න මහතා
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
මගේ පිළිතුරයි දෙන්නේ. ඔබතුමා බාධා කරන්න එපා. ඔබතුමා මගෙන් ප්‍රශ්නයක් ඇහුවා. මට පිළිතුරු දෙන්න අවස්ථාව දෙන්න.

ඒ ගබඩා සියල්ල ප්‍රතිසංස්කරණය කරමින්, ඒ ගබඩා යථා තත්ත්වයට ගැනීමේ කටයුත්ත අපි මේ වනකොට ආරම්භ කර තිබෙනවා. ඒ කටයුත්ත සියයට 75ක් නිම කරලා තිබෙනවා. ඒ වාගේම තමයි, වහලා තිබුණු ගබඩා 133ක් පසුගිය කන්නයේ විවෘත කළා. මේ යල කන්නයේදී ඊට වඩා ගබඩා ප්‍රමාණයක් විවෘත කරනවා. ඒ වාගේම තමයි රජයේ ගබඩාවලට වී මිල දී ගැනීම සඳහා කලින් තිබුණාට වඩා විධිමත් වැඩ පිළිවෙළක් මේ යල කන්නයේ මේ වන විට අපි සකස් කරමින් යනවා. ඔබතුමා කියපු ආකාරයට ඒ ව්‍යවසායකයින්ට ඉඩ කඩ ලැබෙන විධියේ ක්‍රමවේද අපි අනිවාර්යයෙන් සකස් කරනවා. එපමණක් නොවෙයි, ඔබතුමන්ලාගේ ආණ්ඩු කාලයේ වී අළෙවි මණ්ඩලයේ හොරකම් සිදු කරලා එය නැති භංගස්ථාන කරලායි තිබෙන්නේ. ඒවාට අදාළවත් පරීක්ෂණ යනවා. ඒ වාගේම තමයි අය කර ගැනීමට මුදල් විශාල ප්‍රමාණයක් ද තිබෙනවා. ඒ මුදල් මේ වන විටත් අය කර ගනිමින් තිබෙනවා. ඒ වාගේම ගොඩක් අයට නඩු දාලා තිබෙනවා. සමහර විට කිහිප දෙනෙකු නීතිමය ක්‍රියාමාර්ග ඔස්සේ ඇතුළට යන්නත් ඉඩ තිබෙනවා. ඊට අදාළ තොරතුරුත් මේ වන විට එළියට ඇවිල්ලා තිබෙනවා. කොහොම නමුත්, අපි අනිවාර්යයෙන්ම වී අලෙවි මණ්ඩලය පිරිසිදු කරලා යථා තත්ත්වයට ගන්නවා. ඔබතුමාගේ ඉදිරිපත් කිරීම අපි පිළිගන්නවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

අස්වැන්න නෙළලා ඒක විකුණලා හාල් බවට පරිවර්තනය කිරීම එක කොටසක්. හැබැයි, අපේ රටේ තිබෙන ලොකුම ප්‍රශ්නය වන්නේ ඵලදාව අඩු වීමයි. කාම්බෝජය, තායිලන්තය වැනි රටවල හෙක්ටෙයාරයකට වී කිලෝග්‍රෑම් 7,000ක් විතර ලැබෙනකොට අපට ලැබෙන්නේ වී කිලෝග්‍රෑම් 4,500යි. මේක තමයි මිල වැඩිවීමට බලපාන ලොකුම ප්‍රශ්නය. ඇයි මීට වඩා වැඩි ඵලදාවක් තිබෙන බීජ වී ටිකක් පැළ කරන්න පුළුවන් අවස්ථාවක් මේ ගොවීන්ට ලබා දෙන්න බැරි?

ගරු නාමල් කරුණාරත්න මහතා
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
ඔබතුමා කියපු කාරණය හරි. ඇත්තටම අපි වී කිලෝග්‍රෑම් 4,500ක් ගන්නෙත් බොහොම අමාරුවෙන්, විශාල උත්සාහයක් දරලා. ඇත්තටම ඒ ප්‍රමාණයට යන්නත් අමාරුයි. හැබැයි, අපි වාගේ කිහිප ගුණයක වී අස්වැන්නක් ගන්න රටවල් තිබෙනවා. අපි අනිවාර්යයෙන් එතැනට යන්න ඕනෑ. මම හිතන විධියට ඔය තත්ත්ව එක්කම වෙන්න ඇති, ඔබතුමා වරක් ප්‍රකාශ කළේ, "ලංකාවේ වී වගාව වැඩක් නැහැ. වී ගොවිතැන වැඩක් නැහැ. ඊට වැඩිය හොඳයි රටින් හාල් ගෙනෙන එක" කියලා. හැබැයි, අපේ පිළිතුර ඒක නොවෙයි. අපි එතැනට ගියොත් -රටින් හාල් ගේන තැනටම ගියොත්- ඒ අය කියන ගණනකට අපට හාල් ගේන්න සිද්ධ වෙනවා. ඒ නිසා අනිවාර්යයෙන්ම අපේ නිෂ්පාදනය වැඩි කරන්න ඕනෑ. ඒකට අදාළව පස පරීක්ෂා කරලා පසට ගැළපෙන විධියට, භෝගයට ගැළපෙන විධියට පොටෑසියම්, පොස්පරස්, නයිට්‍රජන් යන මූලද්‍රව්‍ය ටික සපයන කටයුත්තට අතගහන්න අපි මේ වනවිට වැඩ පිළිවෙළ සකස් කරලා තිබෙනවා. අපි පස් පරීක්ෂා කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරලා තිබෙනවා. ඊට අනුව තමයි යෙදවුම්, පොහොර යන දේවල් සම්පූර්ණයෙන් ලැබෙන්නේ.

ඒ වාගේම හොඳ බීජ ලබා දෙන්නත් ඕනෑ. ඊට අදාළවත් අපි මේ වනවිට මූලික ප්‍රවේශයක් අරගෙන තිබෙනවා. විශේෂයෙන් අලුත් තාක්ෂණය වගා බිම්වලට යෙදවීමට පුළුවන් විධියට වගා බිම් සකසුරුවම් කරන්න ඕනෑ. ඒ පිළිබඳවත් අපේ අවධානය යොමු වෙලා තිබෙනවා. වෙලාවට කන්න වගා කිරීමත්, තාක්ෂණික පරිසරය වැඩිදියුණු කිරීමත් ඇතුළේ අපට ඇත්තටම අස්වැන්න වැඩිකරගන්න තැනට යන්න පුළුවන්කම තිබෙනවා. මේ වනවිට කෘෂිකර්ම අමාත්‍යාංශය ඊට අදාළ සැලැස්මක් එක්ක ඒ කටයුතු ඉදිරියට දියත් කරගෙන යනවා. තව කන්න කිහිපයක් යනකොට අපි අද අක්කරයකින් ගන්න අස්වනු ප්‍රමාණය වැඩි කරලා අපේ රටේ කෘෂි කර්මාන්තය අනිවාර්යයෙන්ම ඉහළට ඔසවනවා. ඊට අදාළ දැක්මක්, ඊට අදාළ වැඩ පිළිවෙළක් අපි සතුව තිබෙනවාය කියන එක මේ වෙලාවේ අපි මුළු රටටම ප්‍රකාශ කරනවා.

රජයේ පාසල්: වැඩබලන විදුහල්පතිවරු
அரச பாடசாலைகள்: பதில் அதிபர்கள்
GOVERNMENT SCHOOLS: ACTING PRINCIPALS

442/2025

6. ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වල සේවය කරනු ලබන වැඩබලන විදුහල්පතිවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැඩබලන විදුහල්පතිවරුන් සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) වැඩබලන විදුහල්පතිවරුන් උසස් කිරීමට පසුගිය රජය විසින් ආරම්භ කරන ලද ක්‍රියාමාර්ග වර්තමාන රජය විසින් ක්‍රියාත්මක කරන්නේද;

(iv) වැඩබලන විදුහල්පතිවරුන්ට ස්ථිර පත්වීම් ලබා දෙන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள அரச பாடசாலைகளில் பதில் கடமையாற்றும் அதிபர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) மேற்படி பதில் கடமையாற்றும் அதிபர்கள் தொடர்பில் மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iii) பதில் கடமையாற்றும் அதிபர்களுக்கு பதவி உயர்வு வழங்க கடந்த அரசாங்கத்தால் ஆரம்பிக்கப்பட்ட நடவடிக்கைகளை தற்போதைய அரசாங்கம் நடைமுறைப்படுத்துகின்றதா என்பதையும்;

(iv) பதில் கடமையாற்றும் அதிபர்களுக்கு நிரந்தர நியமனம் வழங்கப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) the number of acting principals serving in government schools in Sri Lanka;

(ii) the measures that have been taken regarding the acting principals concerned;

(iii) whether the present Government implements the measures initiated by the previous Government to promote acting principals; and

(iv) whether permanent appointments will be granted to acting principals?

(b) If not, why?

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) 2024.04.30 දිනට වැඩබලන විදුහල්පතිවරුන් සංඛ්‍යාව 2,994කි.

මෙම සංඛ්‍යාව ගැනෙන්නේ ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාවට අනුව බඳවා ගැනීමට යටත් නොවූ රාජකාරි ආවරණය හා වැඩ බලන පදනමින් පත් කරන ලද ගුරු සේවයේ නිලධාරින් සම්බන්ධයෙන්.

(ii) වැඩබලන විදුහල්පතිවරුන් සඳහා අධිසේවක පදනම මත ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියට පත්වීම් ලබා දීමට ගරු අමාත්‍ය මණ්ඩල අනුමැතිය විමසමින් අංක 23/2383/607/108 හා 2023.12.04 දිනැතිව අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් කර තිබුණද, ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හිමිව නොමැත.

මේ කාරණාව සිද්ධ වෙන්නේ, අධිසේවක පදනම මත පත් කිරීමක් සිද්ධ විය යුතු නම්, යම් කිසි පරිපාලන දුර්වලතාවක් හේතුවෙන් පුද්ගලයෙකුට හිමි විය යුතු තනතුරක් අහිමිවීම වැළැක්වීම සඳහා සිදු විය යුතුයි. මෙම රාජකාරි ආවරණ විදුහල්පති විෂයෙහි එවැනි අගතියක් සිදු වී නොමැති බැවින් අදාළ පත් කිරීම සඳහා එකඟතාව ලබා දිය නොහැකි බව දැනුම් දී තිබෙනවා.

(iii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(3) ව්‍යවස්ථාව මඟින් රජයේ නිලධරයන් පත්කිරීම, උසස් කිරීම හා ස්ථාන මාරු කිරීම සහ ඒ හා සම්බන්ධ ආනුෂංගික කරුණු පිළිබඳව විධිවිධාන සැලසීමේ බලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පවරා ඇත. ඒ අනුව වැඩබලන විදුහල්පතිවරුන් අධිසේවක පදනම මත විදුහල්පති සේවයට පත් කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය විමසන ලද අතර, අධිසේවක පත්වීම් ලබාදීමට එම කොමිෂන් සභාව එකඟ වී නොමැත. නව බඳවා ගැනීමක් මඟින් විදුහල්පති සේවයේ පුරප්පාඩු සම්පූර්ණ කරන ලෙස දන්වා ඇත.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟතාව ලැබී නොමැති බැවින් අධිසේවක පත්වීම් ලබා දීමේ හැකියාවක් නොමැත.

(ආ) අදාළ නොවේ.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

පසුගිය කාලයේත්, යුද්ධය කාලයේත් මොනරාගල දිස්ත්‍රික්කය වාගේ දුෂ්කර පාසල්වලත් වැඩබලන විදුහල්පතිවරු තමයි, පාසල්වල කටයුතු කරගෙන ගියේ. ඒ වාගේම, අපේ පැත්තේ වතු ආශ්‍රිතව, ඒ කියන්නේ බදුල්ල දිස්ත්‍රික්කයේ වතුවලත් වැඩබලන විදුහල්පතිවරු තමයි සම්පූර්ණයෙන් පාසල්වල කටයුතු කරගෙන ගියේ. විශේෂයෙන්ම හපුතලේ, නායබැද්ද, නමුණුකුල වැනි කඳු මුදුන්වල තිබෙන පාසල්වලට වැඩබලන විදුහල්පතිවරු තමයි ගිහිල්ලා වැඩ කළේ. පොළොන්නරුව දිස්ත්‍රික්කයේත් එහෙමයි. මායිම් ගම්මානවලත් එහෙමයි. ගරු අග්‍රාමාත්‍යතුමියනි, අවුරුදු 15, 20ක සිට අද වනතුරු වැඩබලන විදුහල්පතිවරු ඒ පාසල්වල කටයුතු කරගෙන ගියා.

අපි කිහිප විටකම ශ්‍රේණිධාරි විදුහල්පතිවරු බඳවා ගත්තා. හැබැයි බඳවා ගත්තාට, ශ්‍රේණිධාරි විදුහල්පතිවරු නගර ආශ්‍රිතව යන්න පුළුවන් පාසල් ටික අල්ලාගෙන ඉන්නවා. වැහෙන්න තිබෙන, ළමයි 100ට අඩු පොඩි පාසල් ටික අරගෙන වැඩ කරගෙන යන්නේ වැඩබලන විදුහල්පතිවරු. මේ සම්බන්ධව පසුගිය කාලයේ සුසිල් ප්‍රේමජයන්ත මහත්මයා අධ්‍යාපන ඇමති කාලයේත් මම දිගින් දිගටම ප්‍රශ්න කළා. Cabinet Paper එකක් දැම්මා කිව්වා, ඒ අය III වැනි ශ්‍රේණියේ ස්ථිර කරන්න. ඒකට කැබිනට් මණ්ඩල අනුමැතියක් දීලාත් නැහැ. දැන් මේ උත්තරය අනුව මට පෙනෙන විදියට වැඩබලන විදුහල්පතිවරුන්ට නිකම්ම ගෙදර යන්න වෙනවා. මෙතැනත් කෑගල්ල දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් ඉන්නවා වැඩබලන විදුහල්පතිවරයෙක් ලෙස සේවය කරන. කෑගල්ල දිස්ත්‍රික්කයේ වැඩබලන විදුහල්පතිවරයෙක් මේ පාර්ලිමේන්තුවේත් ඉන්නවා. ඇත්තවශයෙන්ම පසුගිය කාලයේ ඔබතුමන්ලාගේ unionsවල තමයි වැඩබලන විදුහල්පතිවරු වැඩි පිරිසක් හිටියේ. ඒගොල්ලන්ට ගිය ආණ්ඩුවෙන් සාධාරණය ඉෂ්ට වුණේත් නැහැ,

ඊට ඉස්සර වෙලා ආණ්ඩුවෙන් සාධාරණයක් ඉෂ්ට වුණේත් නැහැ. ඒ නිසා ඒ අය බලාගෙන ඉන්නවා, මේ ආණ්ඩුවෙන් හරි සාධාරණය ඉෂ්ට වෙයි කියලා. නමුත් ඒ අය ස්ථිර කරන්න දාපු Cabinet Paper එකත් reject වෙලා තිබෙනවා. ඒ වාගේම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙනුත් ඒකට අනුමැතිය දීලා නැහැ කියනවා. ඒ නිසා කෙළින් උත්තරයක් දෙන්න, බඳවා ගන්නවාද, එක්කෝ අයින් කරනවාද, වැඩබලන විදුහල්පතිවරුන්ගේ අනාගතයට, වැඩබලන විදුහල්පතිවරුන්ට මොකද වෙන්නේ කියලා. ඒකට කිසිම උත්තරයක් නැහැ. දැන් නියෝජ්‍ය ඇමතිතුමා දීපු උත්තරයේ තිබෙන්නේ ඒකට කැබිනට් අනුමැතිය දීලා නැහැ, ඊට අමතරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරලා නැහැ කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ප්‍රශ්නය කෙටි කරලා අහන්න. දැන් විනාඩි තුනක් අතුරු ප්‍රශ්නයට ගත කළා.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ඒක තමයි ප්‍රශ්නය, ගරු කථානායකතුමා. Cabinet Paper එක reject වෙලා තිබෙනවා. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් reject කරලා තිබෙනවා. එහෙම නම් ඉතින් වැඩබලන විදුහල්පතිවරු ටික අයින් කරන්න වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්නය කෙටි කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

අඩුම වශයෙන් III - I ශ්‍රේණියටවත් දාලා, ඒ ගොල්ලන් බලාපොරොත්තු වන කාරණය ඉෂ්ට කර දුන්නා නම් හොඳයි.

ඒ ගොල්ලන්ගේ නඩුවක් තිබුණා. ඒ නඩුව අයින් කර ගන්නත් එකඟ වුණා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ප්‍රශ්නය කෙටි කරන්න.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ප්‍රශ්නය කෙටි කරන්න බැහැ. මොකද, මෙතැන ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. වැඩබලන විදුහල්පතිවරුන්ට ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්නයක් අහද්දී විනාඩි ගණන් ගන්න බැහැ. විනාඩි දෙකයි උපරිම දෙන්න පුළුවන්. ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා-

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

මම මේ ප්‍රශ්නය ගැන දන්නවා නියෝජ්‍ය ඇමතිතුමාට වැඩිය අත්දැකීම් තිබෙන කෙනෙකු හැටියට. ඒකයි නියෝජ්‍ය ඇමතිතුමාට ප්‍රශ්නය ගැන වැඩියෙන් කියන්නේ.

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු කථානායකතුමනි, ඒ සම්බන්ධයෙන් අපට ඇගයීමක් තිබෙනවා. මොකද, යම්කිසි විදුහලක විදුහල්පතිවරයා විශ්‍රාම යාමේදී හෝ වෙනම ආකාරයකින් ඒ තනතුර පුරප්පාඩු වීමේදී ගුරු සේවයේ සිටින පිරිස -විදුහල්පති සේවයේ නොවෙයි- ඒ රාජකාරි ආවරණය කර තිබෙනවා, විශේෂයෙන් දුෂ්කර පාසල්වල. අපි ඒක දන්නවා. අපි ඒ කට්ටියත් එක්ක සාකච්ඡා කරලාත් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ගැටලුවක් නැහැ. එම ක්‍රියාවලියට ඒ කට්ටිය දුන් දායකත්වය සම්බන්ධයෙන් අපි සානුකම්පිත ඇගයීමක් කරනවා. ඒ සම්බන්ධයෙන් නිලධාරි මට්ටමේ සාකච්ඡාවකුත් පැවතෙනවා. මොකද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අනුකූලව විදුහල්පති සේවයට බඳවා ගැනීමට නොහැකි වුණත්, යම්කිසි විධියක -එක්කෝ වැටුප් වෙන්න පුළුවන්- සානුකම්පිත ඇගයීමක් සම්බන්ධ සාකච්ඡාවක අපි ඉන්නවා. ඒ නිසා ඔබතුමාගේ ප්‍රශ්නය අපි දන්නවා. ඒ පිළිබඳව සාකච්ඡා කර තිබෙනවා. ඇගයීමක් තිබෙනවා. හැබැයි, මෙන්න මෙහෙම කාරණාවක් තිබෙනවා. අපි විදුහල්පති සේවයේ හෝ අධ්‍යාපන පරිපාලන සේවයේ හෝ පත් කිරීම් සිදු කරන්නේ විද්‍යානුකූලව. හැබැයි මේ පිරිස ඉන්නේ, විදුහල්පති සේවයේ නොවෙයි. එතකොට අපට පත් කිරීම සිද්ධ කරන්න වෙන්නේ, අනිවාර්යයෙන් විදුහල්පති සේවයෙන්. ඒක තමයි අපේ දෙපාර්තමේන්තු ක්‍රියාවලිය. එතැනදී ඔබතුමා සඳහන් කරපු ඒ පුරප්පාඩු අපට කොහොමත් සම්පූර්ණ කරන්න වෙනවා.

දැනට පුරප්පාඩු 4,000ක් පමණ තිබෙනවා. බඳවා ගැනීම් 4,000ක් සිද්ධ කරනවා. බඳවා ගැනීම් සිද්ධ කළාට පසුව සමහර විද්‍යාලවලට විදුහල්පති සේවයෙනුත්, සමහර විද්‍යාලවලට අධ්‍යාපන පරිපාලන සේවයෙනුත් තමයි බඳවා ගන්න සිද්ධ වෙන්නේ. මේ පිරිස නිසා යම්කිසි ප්‍රමාදයකුත් සිද්ධ වුණා. නඩු කටයුත්තක් සිදු වුණා නේ. ඒ නිසා විදුහල්පතිවරු බඳවා ගැනීමේ ප්‍රමාදයකුත් සිද්ධ වුණා. නමුත්, අපට ඉදිරියට යන්න පුළුවන් කියලා නීතිපති දෙපාර්තමේන්තුවෙන් සඳහන් කර තිබෙනවා. ඒ නිසා සානුකම්පිත සොයා බැලීමක් තමයි අපට කරන්න සිද්ධ වෙන්නේ. මේ දෙපාර්තමේන්තු ක්‍රියාවලිය ඔස්සේම තමයි ඉදිරි බඳවා ගැනීම් කරන්න සිද්ධ වෙන්නේ.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. පසුගිය දවසේ COPA එකෙත් මේ ප්‍රශ්නය මතු වුණා. මුදල් කොමිෂන් සභාවේ නිලධාරිනුත් ඇවිත් හිටියා. මම එතැනදීත් මේ ප්‍රශ්නය කිව්වා. ගරු අගමැතිතුමියනි, දැන් පුරප්පාඩු 4,000ක් තිබෙනවා නම්, මේ වැඩබලන විදුහල්පතිවරු 2,900ට විශේෂ ලකුණක් දීලා හරි සාධාරණයක් කරන්න. නැත්නම් අධ්‍යාපන පරිපාලන සේවයේ අයම බඳවා ගත්තොත්, මේ වැඩබලන විදුහල්පතිවරු 2,900ට යන එන මං නැති වෙනවා. අපේ ආණ්ඩුවට වඩා මේ ආණ්ඩුව ගැන ඒගොල්ලන්ගේ විශ්වාසයක් තිබුණා. ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ වෘත්තිය සමිතිවල - unionsවල - වැඩබලන විදුහල්පතිවරු ඔබතුමන්ලාට ලොකු දායකත්වයක් දුන්නා.

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

ඒ නිසා, ඒ පුරප්පාඩු 4,000 තුළ මේ වැඩබලන විදුහල්පතිවරු 2,900ට සාධාරණය ඉෂ්ට කරන්න. ඒ අයට විශේෂ ලකුණක් හරි දීලා සාධාරණය ඉෂ්ට කරන්න. අධ්‍යාපන පරිපාලන සේවයේ අය බඳවා ගත්තොත්, ඒ අය ජාතික පාසල් ඉල්ලයි. එහෙම නැත්නම් ඒ අය තිබෙන ලොකුම පාසල් ටික ඉල්ලනවා, නගරයේ පාසල් ඉල්ලනවා. හැබැයි ළමයින් අඩු, ළමයින් 100ක් පමණ ඉන්න දුෂ්කර පාසල්වල වැඩබලන විදුහල්පතිවරු සේවයේ යෙදෙනවා. උදාහරණයක් වශයෙන් මහියංගනය, දඹාන ප්‍රදේශයේ පාසලක් ගත්තොත්, ඒ වාගේ පාසලක් වැඩබලන විදුහල්පතිවරයෙකුට තමයි කරගෙන යන්න සිදු වෙලා තිබෙන්නේ. පරිපාලන සේවයේ පත්වීම් ගත්තාම, ඒ අය ඒ වාගේ දුෂ්කර පාසල්වලට යන්නේ නැහැ. ඒ ගොල්ලෝ 1, 2, 3 කියලා ලොකු පාසල් අල්ලන් ඉන්නේ. මේක මේ රටේ මායිම් ගම්මානවල සාධාරණ ප්‍රශ්නයක්. අනෙක් පැත්තෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ පදවි ශ්‍රී පුර වැනි පැතිවලත් මේ ප්‍රශ්නය තිබෙනවා.

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
ඒ පැතිවල මායිම් ගම්මාන නැහැ.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මායිම් ගම්මාන නැති වුණාට ඒ ප්‍රදේශවල දුෂ්කර පාසල් තිබෙනවා නේ. ඒක පිළිගන්න. ඒ වාගේම, මොනරාගල දිස්ත්‍රික්කයේ සියඹලාණ්ඩුව, ඇතිමලේ වාගේ පළාත්වලත් පාසල්වල වැඩබලන විදුහල්පතිවරු ඉන්නවා. ඒ නිසා ඒ අයටත් සාධාරණයක් ඉෂ්ට වෙන්න ඕනෑ. අපිට කරන්න බැරි වෙච්ච මේ කටයුත්ත අපි බලාපොරොත්තු වුණු විධියට සුසිල් ප්‍රේමජයන්ත හිටපු ඇමතිතුමාගෙන් කර ගන්නත් බැරි වුණා. අපි ඒ කාලයේත් මේකට රණ්ඩු වුණා. වැඩබලන විදුහල්පතිවරු පාර්ලිමේන්තුවට ඇවිල්ලා පාර්ලිමේන්තුවේ සාකච්ඡාවකුත් තිබුණා. ඒත් ඒ අයට සාධාරණයක් වුණේ නැහැ. ගරු සභානායකතුමනි, වැඩබලන විදුහල්පතිවරුන්ට දීමනා දීපු ලංකාවේ පළමුවැනි පළාත් සභාව වන ඌව පළාත් සභාවෙන් පළමුවැනි දීමනාව දුන්නේ මම තමයි. හරිනම් මම ඒකටත් හිරේ යන්න ඕනෑ. හොඳ වෙලාවට සමන්ත විද්‍යාරත්න ඒකට පැමිණිල්ලක් දැම්මේ නැහැ. සමන්ත හොඳ වෙලාවට ඒකට පැමිණිල්ලක් දැම්මේ නැහැ.

හිටපු පළාත් සභා මහ ඇමතිවරු හැටියට අපිත් එක්ක ඒ අය බොහෝ කාලයක් වැඩ කළා, ගරු අග්‍රාමාත්‍යතුමියනි. ඒ නිසා මේක සංවේදී ප්‍රශ්නයක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු කථානායකතුමනි, මේකට පොඩි උදාහරණයක් කියන්න මට අවස්ථාව දෙන්න. නිමල් සිරිපාල ද සිල්වා හිටපු ඇමතිතුමාගේ තාත්තාගේ ඉස්කෝලේ තමයි, කඳන සිරිසීවලී මහා විද්‍යාලය. බදුල්ලේ ඉඳන් කඳන සිරිසීවලියට සැතැප්ම 6යි. ඒක නිමල් සිරිපාල ද සිල්වා හිටපු ඇමතිතුමාගේ තාත්තත් උගන්වපු ඉස්කෝලේ. ඒ ඉස්කෝලෙත් ඉන්නේ වැඩබලන විදුහල්පතිවරු. ඒක නිසා මේකට සාධාරණයක් ඉෂ්ට කරන්න. අන්න ඒකයි මම මේ කියන්නේ. මට මේක ප්‍රශ්නයක් නැහැ. මම වැඩබලන විදුහල්පතිවරයෙක් නොවෙයි. ඒ වුණාට වැඩබලන විදුහල්පතිවරු වෙනුවෙන් මම මේ කථා කරන්නේ. ඒ අය වෙනුවෙන් සාධාරණය ඉෂ්ට කරන්න. මේ අවස්ථාවේ මහජන ගැලරියේ සිටින පාසල් ළමයිනුත් මේක අහගෙන ඉන්නවා. මම හිතන්නේ නැහැ, Cabinet Paper එක reject වෙලා නම්, මුදල් කොමිෂන් සභාව ඉඩ දෙන්නේ නැත්නම්, නැවත -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අතුරු කථා, මේ කරන්නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මෙතුමා විදුහල්පතිවරයෙක් ගැන වැඩ බලනවා කියලා අපිට ආරංචියක් තිබෙනවා. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පිළිතුරු ලබා දෙන්න.

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
ගරු කථානායකතුමනි, - *[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, එතුමා නැවත වරක් මතු කරන කාරණාව සම්බන්ධයෙන් අපට ඇඟැයීමක් තිබෙනවා.

ඒ සම්බන්ධයෙන් අපට කිසිම ගැටලුවක් නැහැ. මොකද, පාසලක එවැනි පුරප්පාඩුවක් ඇතිවනකොට ගුරුවරයෙක් වැඩබලන විදුහල්පතිවරයෙක් බවට පත් වෙනවා. නමුත්, ගැටලුව වන්නේ අපට සේවා ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමේ හැකියාවක් නොමැතිකම. අපි මෙවර, මින් ඉදිරියට පත් කිරීම් සිද්ධ කරද්දී අධ්‍යාපන පරිපාලන සේවයේ නිසි නිර්ණායක අනුව තමයි පත් කිරීම් සිද්ධ කරන්නේ. විදුහල්පති සේවයේ නිසි නිර්ණායක අනුව තමයි පත් කිරීම් සිද්ධ කරන්නේ. ඒ අනුව නිශ්චිතව ස්ථානගත කිරීම්වලදී ඔය කියන කාරණාව සිද්ධ වෙන්නේ නැහැ කියන එක නැවත සභාවට මතක් කරන්න මම කැමැතියි.

පැල්පොල අන්තර් හුවමාරුවේ ඉදිකිරීම්: විස්තර
பெல்பொல இடமாறல் நிர்மாணம்: விபரம்
CONSTRUCTION OF PELPOLA INTERCHANGE: DETAILS

457/2025

7. ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) දක්ෂිණ අධිවේගී මාර්ගයේ පිහිටුවා ඇති අන්තර් හුවමාරු සංඛ්‍යාව කොපමණද;

(ii) එම මාර්ගයේ ගැලනිගම අන්තර් හුවමාරුවේ සිට දොඩන්ගොඩ අන්තර් හුවමාරුව දක්වා ඇති දුර කොපමණද;

(iii) පැල්පොල අන්තර් හුවමාරුව ඉදිකිරීම සඳහා මේ වනවිට ඉඩම් අත්පත් කර ගෙන තිබේද;

(iv) එසේ නම්, එම ඉඩම් සඳහා ගෙවිය යුතු වන්දි මුදල කොපමණද;

(v) පැල්පොල අන්තර් හුවමාරුව වෙනත් ස්ථානයක ඉදිකිරීමට අදහස් කර තිබේද;

(vi) එසේ නම්, ඊට හේතු කවරේද;

(vii) ඒ සම්බන්ධයෙන් රජයේ ස්ථාවරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தெற்கு அதிவேக நெடுஞ்சாலையில் அமைக்கப்பட்டுள்ள இடமாறல்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) மேற்படி நெடுஞ்சாலையில் கெலணிகம இடமாறலில் இருந்து தொடங்கொட இடமாறல் வரையுள்ள தூரம் எவ்வளவு என்பதையும்;

(iii) பெல்பொல இடமாறலை அமைப்பதற்காகத் தற்போது காணிகள் கையகப்படுத்தப்பட்டுள்ளனவா என்பதையும்;

(iv) அவ்வாறாயின், மேற்படி காணிகளுக்குச் செலுத்தவேண்டிய இழப்பீட்டுத் தொகை எவ்வளவு என்பதையும்;

(v) பெல்பொல இடமாறலை வேறோர் இடத்தில் நிர்மாணிப்பதற்கு உத்தேசிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(vi) அவ்வாறாயின், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(vii) அந்த விடயத்தில் அரசாங்கத்தின் நிலைப்பாடு யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways, Ports and Civil Aviation:

(a) Will he inform this House -

(i) the number of interchanges established on the Southern Expressway;

(ii) the distance between the Gelanigama Interchange and the Dodangoda Interchange on that Expressway;

(iii) whether lands have been acquired by now to construct the Pelpola Interchange;

(iv) if so, the amount that should be paid as compensation for those lands;

(v) whether there is a move to construct the Interchange of Pelpola in another location;

(vi) if so, the reasons for it; and

vii) the Government's position regarding this matter?

(b) If not, why?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) අන්තර් හුවමාරු සංඛ්‍යාව 21කි. (කොට්ටාව සිට මත්තල දක්වා)

(ii) කිලෝමීටර 21කි.

(iii) ඔව්.

ඉඩම් කැබැලි 115ක් අත්පත් කරගෙන ඇත.

(iv)
- ඉහත ඉඩම් කැබැලි 115න් කැබැලි 45ක් සඳහා වන්දි මුදල් ගෙවා ඇති අතර ඉන් කැබැලි 14ක් සඳහා පොලී මුදල් ද ගෙවා ඇත.
- ඉඩම් අත්කර ගැනීමේ වියදම් සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් වෙත 2017.12.06 දින රුපියල් 91,500,000.00ක අත්තිකාරම් මුදලක් ලබා දී ඇත. ඉන් රුපියල් 91,125,842.04ක මුදලක් අත්කර ගැනීමේ වියදම් සඳහා දැනට වැය වී ඇත.

(v) පැල්පොල අන්තර් හුවමාරුව වෙනත් ස්ථානයක ඉදිකිරීමට අදහස් කර නොමැත.

- මිල්ලනිය - පැල්පොල මාර්ගය සහ පැල්පොල අන්තර් හුවමාරුව ඉදිකිරීමට යෝජනා වූයේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ මැදිහත් වීම මත යෝජිත මිල්ලනිය කර්මාන්තපුරයට අධිවේගී මාර්ගයෙන් පිවිසුමක් ලබා ගැනීමේ අරමුණෙනි.
- එසේ වුවද, මිල්ලනිය කර්මාන්තපුරය පිහිටුවීමට යෝජනා වූ රබර් වගාව සහිත ඉඩම අත්පත් කර ගැනීමේදී අධිකරණයේ නඩුවක් ගොනු කෙරුණු බැවින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි මැදිහත් වීම මත සිදු කරන ලද මුදල් ප්‍රතිපාදන ලබා දීම සහ පැල්පොල අන්තර් හුවමාරුව ඉදිකිරීමට අදාළ කටයුතු අතරමග නවතා ඇත.

(vi) අදාළ නොවේ.

(vii) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

ගරු ඇමතිතුමනි, පිළිතුර ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඔබතුමා දුන් පිළිතුර අනුව දක්ෂිණ අධිවේගී මාර්ගයේ ගැලනිගම - දොඩන්ගොඩ තමයි වැඩිම දුර ප්‍රමාණයක් තිබෙන්නේ. එය කිලෝමීටර 21ක්. ඒක තමයි, වැඩිම දුර ප්‍රමාණයක් තිබෙන එකම අන්තර් හුවමාරුව.

ජනගහනය ගත්තත් ඒ වාගේම තමයි. කොට්ටාවේ ඉඳලා අවසන් අදියර දක්වා ගත්තත්, ඒ ප්‍රමාණය එක්ක ගත්තාම මේක ඒ ප්‍රදේශයේ ජනතාවට පිවිසුම් මාර්ගයකට යාමට තිබෙන ලොකුම බාධාවක් බවට පත් වුණා. ගරු ඇමතිතුමනි, යම් විධියකින් මේක ගැන කිව්වොත්, පසුගිය අපේ රජය කාලයේ එක දේශපාලන නායකයකුගේ වරදක් නිසා සිද්ධ වෙච්ච දෙයක්, මේක. මම ඒක

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

බොහොම නිහතමානීව කියනවා. මොකද හේතුව, දැන් මම ඉන්න ගමට ළඟ නම්, මම එතැනින් පිවිසුම අර ගත්ත එකක් තමයි මේ වුණේ.

පැල්පොල අන්තර් හුවමාරු මාර්ගය ගත්තොත්, විශේෂයෙන්ම එක පැත්තකින් කර්මාන්තපුරයක් තිබෙනවා. ඒ කර්මාන්තපුරය සහ ඒ ජනතාවගේ අවශ්‍යතාව වෙනුවෙන් තමයි මෙතැනින් මාර්ගයකට ඉල්ලීම කරලා, දැන් මුදලුත් වෙන් කරලා තිබෙන්නේ. ඉතින් අර වැරැද්ද නිවැරදි වෙන්න, ඒ කියන්නේ එක පැත්තකින් දුර ප්‍රමාණය කියන එක නිවැරදි වෙන්න, ඊළඟට මේ වන විට ඉඩම් අත්පත් කර ගැනීම ක්‍රියාත්මක කරලා මුදල් යොදවා තිබෙන නිසා පැල්පොලින්ම මේක ක්‍රියාත්මක කරන්නට ආයෝජන මණ්ඩලයේ අවශ්‍යතාව සහ කර්මාන්තපුරයේ අවශ්‍යතාව සඳහා ක්‍රියාත්මක වෙනවාද කියන එක ගැන විෂය භාර ඇමතිවරයා වන ඔබතුමාගෙන් මා දැන ගන්න කැමැතියි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා අහපු අතුරු ප්‍රශ්නයට අනුව එතුමා යම්කිසි සඳහනක් කරපු නිසා, ඒකට අමතරව කරුණක් ඉදිරිපත් කරන්නට මම හිතුවා. Southern Expressway එකේ original design එකේ නැති, මෙවැනි අන්තර් හුවමාරු - interchanges - සහ entrances දැනට දෙකක් හදලා තිබෙනවා, මේකට අමතරව. එකක්, මාතර-ගොඩගම ඉඳලා කිලෝමීටර 5ක් ඈතින් කපුදූව කියලා එකක් හදලා තිබෙනවා. ඒකත් දේශපාලන බලපෑමක් නිසා කළේ. ගරු කථානායකතුමනි, කපුදූවේ එක තිබෙන්නේ කොළඹට එන්නයි, කොළඹින් යන්නයි විතරයි. රණවක කියලා කෙනෙක් හිටියා කියලා තමයි මට දැනුම් දීලා තිබෙන්නේ. ඊට පස්සේ බෙලිඅත්තේ ඉඳලා කිලෝමීටර 6ක් ඈතින් බැදිගම හදලා තිබෙනවා. එක interchange එකක් කියන්නේ, කෝටි 100කට වැඩියෙන් වැය වෙන කටයුත්තක්. සාමාන්‍ය එකක් දැම්මත් මිලියන 600ක් විතර යනවා. මෙතැන ඇත්තටම අධිකරණ ක්‍රියාමාර්ගයක් නිසා ඉඩම ගන්න බැරි වුණා කියන එක තමයි වාර්තා වෙන්නේ. මා දන්නා තරමින් එතැන ඒ යෝජිත කර්මාන්තපුරය ඉදි කරලා නැහැ. ඒ නිසා මේ අවස්ථාවේ තිබෙන, -

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

ඉදිකරමින් පවතිනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

කොහොමත් දැනට අපේ සැලසුම්වල මේක නැහැ. මේ සඳහා අවම වශයෙන් බිලියන එකකට වැඩියෙන් යන්න ඉඩ තිබෙනවා කියලා අපි හිතනවා. එම නිසා මේ අවස්ථාවේදී අපි මේක අපේ සැලසුම්වලට ඉදිරිපත් කරලා නැහැ, මන්ත්‍රීතුමා.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

ගරු කථානායකතුමනි, දෙවන අතුරු ප්‍රශ්නය ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාට අහන්න අවස්ථාව ලබා දෙනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, සිද්ධ වුණේ මේකයි. ගරු ඇමතිතුමනි, පැල්පොල ආයෝජන කලාපය ඉදි කරන්න Section 38 ගහලා දැන් අක්කර 230ක් අත්පත් කරගෙන අවසන්. නඩුව පිළිබඳව සඳහන් කරන ඔය ප්‍රකාශය වැරදියි. ඔබතුමන්ලාට නිලධාරින් නිවැරදි තොරතුරු දෙන්නේ නැහැ. නඩුව තිබෙන්නේ රබර් වගාවේ තක්සේරුව ගැන. මොකද, Horana Plantations PLC එකට බිම් අයිතිය නැහැ, බදු අයිතියක් තිබෙන්නේ. එතකොට රබර් වගාවක් තිබෙනවා, අක්කර 200 ගණනක. ඒ රබර් වගාවේ තක්සේරුව ප්‍රමාණවත් නැහැ කියලා ධම්මික පෙරේරා මහත්මයාට අයිති Horana Plantations PLC සමාගම අභියාචනාධිකරණයට ගියා. අද වෙනකම් ඒ නඩුව අවසන් කර ගන්න කටයුතු කරලා නැහැ. අවුරුදු 8ක් වෙන නඩුව දැන් අත්හිටුවාගෙන තිබෙනවා.

ගරු ඇමතිතුමනි, මෙම ඉඩම ආයෝජන කලාපයකට ඉතාම සුදුසුයි. ඔබතුමන්ලාගේ ප්‍රතිපත්තිය අනුව ආයෝජන කලාපය පිහිටුවන්න ගැළපෙනම තැන, හරිම location එක. හොඳ ඉඩම්, ගංවතුරට යට වෙන්නේ නැති ඉස්තරම් ඉඩම් තිබෙනවා. අනෙකුත් පහසුකම් ටිකත් තිබෙනවා. ඔබතුමාට දැනගන්න කියන්නේ, මේ කලාපයට දැන් ජල නළ පද්ධති එළලා ඉවරයි, පොළොව යට ජල නළ පද්ධතිය තිබෙනවා. ඒ වාගේම විදුලිබල මණ්ඩලයට රුපියල් බිලියනයකට ආසන්න මුදලක් ලබා දීලා තිබෙනවා, විදුලිය සැපයීම සඳහා. ඒ වාගේම මේ ස්ථානයේ පස් කපලා, ඒ කියන්නේ අවශ්‍ය කරන පැති හතරක් තිබෙනවා, ඒ පැති හතරෙන් දෙකක දැන් පස් කපලා ඉවරයි. එතකොට ආයෝජන කලාපය තිබුණත්, නැතත් මේක අවශ්‍යයි. මොකද, කළුතර නගරයට වෙනත් පිවිසුමක් නැහැ. හිටපු ඇමතිතුමා කිව්ව ආකාරයට වෙනත් ස්ථානයක පිවිසුමක් හැදුවා. ඒක මම වැරදියි කියන්නේ නැහැ. හැබැයි මිල්ලනියට, මොරොන්තුඩුවට, වාද්දුවට, කළුතර නගරයට, බුලත්සිංහලට highway එකෙන් ප්‍රයෝජනයක් නැති වෙලා තිබෙනවා, ඒ ආසන්න ස්ථානයක highway entrance එකක් නැති නිසා. ඒ නිසා ඒ ප්‍රදේශයට highway entrance එකක් අවශ්‍යයි. ඇත්තටම එක තැනක් යෝජනා වෙලා තිබුණා. ඒ, හොරණ - කළුතර මාර්ගය යා වෙන තැන.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, මට අවස්ථාව දෙන්න, මේක ඉතාම වැදගත් දෙයක්. එතැන ගංවතුරට යටවීමත්, එතැන දේවාලයක් තිබෙනවා කියන කාරණයත් නිසා තමයි ඒ ඉදිකිරීම කරන්න බැරි වුණේ. ඒ ස්ථානයෙන් කිලෝමීටරයක් බණ්ඩාරගම පැත්තට, එහෙම නැත්නම් ගැලනිගම පැත්තට වෙන්න තමයි මේ ස්ථානය හඳුනාගෙන තිබෙන්නේ. අපි නොවෙයි ඉංජිනේරුවන් විසින් ඒක හඳුනාගෙන තිබෙනවා, මේ ප්‍රදේශයේ සංවර්ධනයටත්, ආයෝජන කලාපයටත් දෙකටම සුදුසු ස්ථානයක් ලෙස. දැන් අක්කර 100ක එක කර්මාන්ත කලාපයක් ගල්පාත ප්‍රදේශයේ ඉදි කරනවා, අපේ සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා. හඳුන්නෙත්ති ඇමතිතුමාගේ ගල්පාත, රයිගම්පුර ආයෝජන කලාපයට අවශ්‍ය ප්‍රවේශයත් මෙතැනින් ලැබෙන්නේ; ඒකත් හැදෙනවා දැන්. එතකොට ආයෝජන කලාපයට තමයි ප්‍රශ්නය තිබෙන්නේ. මම ඔබතුමාට කියන්නේ මෙයයි. ආයෝජන කලාපයක් වශයෙන් දියුණු කරන්න section 38 ගහලා ඉඩම් පවරාගෙන ඉවරයි. නඩුව තිබෙන්නේ රබර් වගාව ගැන. ඒ නිසා ඔබතුමන්ලාගේ රජය මේකට ප්‍රමුඛතාවක් දෙන්න. මම මීට කලින් මුදල්

ඇමතිතුමාගෙනුත් ඒ කාරණය ගැන ඇහුවා. දැනටමත් මේකේ වැඩ භාගයක් කරලා තිබෙන්නේ. ඒ කරපු වැඩ අපරාදේ. ඒ නිසා මේ සම්බන්ධව ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයට කිට්ටු ප්‍රශ්නයක් ගරු මන්ත්‍රීතුමා මීට මාස කිහිපයකට කලින් යොමු කරලා තිබුණා. ඒ නිසා මේ ප්‍රශ්නය පිළිබඳව මම කලින්ම අධ්‍යයනය කළා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට එදා මොකක් හරි කාරණයක් නිසා එන්න බැරි වුණා. ඒ නිසා ප්‍රශ්නයට උත්තර දෙන්න බැරි වුණා.

මම මේ පිළිබඳව නලින්ද ජයතිස්ස ඇමතිතුමා සමඟත්, මගේ අමාත්‍යාංශ ලේකම් මහාචාර්ය කපිල පෙරේරා මැතිතුමා සමඟත් ටිකක් වැඩිපුර සාකච්ඡා කළා. ගරු මන්ත්‍රීතුමනි, මම හිතන විධියට, එතුමා ඔබතුමා සමඟත් මීට පෙර මේ සම්බන්ධව නිරීක්ෂණ චාරිකාවක නියැළිලා තිබෙනවා. එතුමා කිව්වා, රබර් ඉඩමකට ගිහිල්ලාම මේ සම්බන්ධව සාකච්ඡා කළා කියලා. ගරු කථානායකතුමනි, මම කියන්නේ අමතර කරුණක්. දක්ෂිණ අධිවේගී මාර්ගය කියන්නේ අපේ රටේ පළමුවැනි අධිවේගී මාර්ගය නිසාම ඒකේ designsවලට, මූලික feasibility studiesවලට විරුද්ධව කරපු සැලකිය යුතු වැඩ රාශියක් තිබෙනවා. ඔබතුමාත් දන්නවා, මුළු දක්ෂිණ අධිවේගී මාර්ගයටම එකම එක rest area එකයි තිබෙන්නේ කියලා. ඒ rest area එක අවුරුදු 99කට රුපියල් 10,000කට රාජපක්ෂලා බදු දීලා තිබෙන්නේ. අද අපට බණ කියන්න එනවා. ඒ interchanges හදලා තිබෙනවා, තමන්ගේ ගෙවල්වලට යන්න. Declare කරලා තිබෙන rest areas හදන්න දුන්නේ නැහැ, රාජපක්ෂලාගේ හිටපු ගෝල නිලධාරින්. ඒ සඳහා රුපියල් බිලියන ගණනාවක් නාස්ති කරලා තිබෙනවා.

ඒ වාගේම මේ කියන දේ ගැනත් මම දන්නවා. ඔබතුමා කියන හන්දියේ නම මට මතක නැහැ. මේක originally තිබිච්ච තැන මොකක් හරි cross වෙන තැනක් තිබෙනවා. නලින්ද ජයතිස්ස ඇමතිතුමා මට ඒක පෙන්නුවා. මට ඒ ටවුන් එක මොකක්ද කියලා මතක නැහැ. එතැන තමයි ideal. නමුත් මේක හදලා තිබෙන්නේ වෙන තැනක. ගරු කථානායකතුමනි, මට දැනට කියන්න පුළුවන්කම තිබෙන්නේ මෙයයි. මේවා අතිවිශාල මුදලක් යන දේවල්. එම නිසා මේවා දැනට අපේ plansවල නැහැ. ගරු මන්ත්‍රීතුමනි, නමුත් කර්මාන්ත ඇමතිතුමන්ලා, ඔබතුමන්ලා සහ නලින්ද ඇමතිතුමා මේ සඳහා මැදිහත් වෙලා ඒක යෝජනා කරන්න. මේ සම්බන්ධ නඩුව විසඳා ගැනීමත් මෙහිදී අත්‍යවශ්‍යයි. ආයෝජන මණ්ඩලය මට්ටමින් ආවොත් ඔබතුමන්ලාගේ පැත්තෙන් එන යෝජනා සහ පවතින මුදල් එක්ක ඒක කරනවාද කියන එක පිළිබඳව අපට හිතන්න පුළුවන්.

ත්‍රිකුණාමලයේ නව තෙල් පිරිපහදුවක් ඉදිකිරීමේ යෝජනාව: වර්තමාන තත්ත්වය
திருகோணமலையில் புதிய எண்ணெய்ச் சுத்திகரிப்பு நிலையத்தைத் தாபிப்பதற்கான முன்மொழிவு: தற்போதைய நிலை
PROPOSAL TO ESTABLISH NEW OIL REFINERY IN TRINCOMALEE: CURRENT STATUS

620/2025

8. ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සපුගස්කන්ද තෙල් පිරිපහදුවේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම වෙනුවට සුදුසු ආයෝජකයෙකු සම්බන්ධ කර ගනිමින් ත්‍රිකුණාමලය ප්‍රදේශයේ නව තෙල් පිරිපහදුවක් පිහිටුවීමේ හැකියාව සොයා බලන ලෙසට අමාත්‍ය මණ්ඩලය විසින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට උපදෙස් ලබා දුන් දිනය කවරේද;

(ii) ත්‍රිකුණාමලය ප්‍රදේශයේ නව තෙල් පිරිපහදුවක් ඉදිකිරීම සම්බන්ධයෙන් මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග හා ඉදිරියේදී ගැනීමට නියමිත ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சபுகஸ்கந்த எண்ணெய்ச் சுத்திகரிப்பு நிலையத்தின் உட்கட்டமைப்பு வசதிகளை அபிவிருத்தி செய்வதற்குப் பதிலாக பொருத்தமான முதலீட்டாளர் ஒருவரைத் தொடர்புபடுத்திக்கொண்டு திருகோணமலை பிரதேசத்தில் புதிய எண்ணெய்ச் சுத்திகரிப்பு நிலையமொன்றைத் தாபிப்பதற்குள்ள வாய்ப்புகள் பற்றி ஆராயுமாறு இலங்கை பெற்றோலியக் கூட்டுத்தாபனத்துக்கு அமைச்சரவை ஆலோசனை வழங்கியுள்ள திகதி யாது;

(ii) திருகோணமலை பிரதேசத்தில் புதிய எண்ணெய்ச் சுத்திகரிப்பு நிலையமொன்றை நிர்மாணிப்பது தொடர்பாக ஏற்கனவே மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் மற்றும் எதிர்காலத்தில் மேற்கொள்ளப்படவுள்ள நடவடிக்கைகள் வெவ்வேறாக யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Energy:

(a) Will he inform this House the -

(i) date on which the Cabinet of Ministers issued instructions to the Ceylon Petroleum Corporation to explore the feasibility of establishing a new oil refinery in the Trincomalee area by engaging a suitable investor, instead of developing the infrastructure facilities of the Sapugaskanda Oil Refinery; and

(ii) measures that have been taken so far and the measures that are to be taken in the future, separately, towards the construction of a new oil refinery in the Trincomalee area?

(b) If not, why?

ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2024 මාර්තු මස 18වන දින.

[ගරු කුමාර ජයකොඩි මහතා]

(ii) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නිර්දේශය අනුව මීට පෙර ත්‍රිකුණාමලය ප්‍රදේශයේ නව ඉන්ධන පිරිපහදුවක් ඉදිකිරීම සඳහා ඉහත 2024 මාර්තු මස 18වන දින ලබා දුන් අමාත්‍ය මණ්ඩල තීරණය අවලංගු කිරීමට හා දැනට පවතින සපුගස්කන්ද ඉන්ධන පිරිපහදුව පුළුල් කර සංවර්ධනය කිරීම සඳහා නව අමාත්‍ය මණ්ඩල සන්දේශයක් 2025.01.29වන දින ඉදිරිපත් කර ඊට අනුමැතිය ලබාගෙන ඇත. තවද, මෙම අමාත්‍ය මණ්ඩල සන්දේශය මඟින් සුදුසු මූල්‍යකරුවෙකු/ ආයෝජකයෙකු සොයා ගනිමින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව යටතේ එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අනුමැතිය දී ඇත.

ඒ අනුව, 2025.02.09 දින උක්ත කරුණු සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. එම අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සපුගස්කන්ද තෙල් පිරිපහදුව පුළුල් කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අභිලාෂ කැඳවීමේ කටයුතු මේ වන විට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මඟින් ආරම්භ කර ඇත. ඊට අදාළ ව්‍යාපෘති කමිටුව - PC - හා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන සාකච්ඡා සම්මුති කමිටුව - CANC - දැනටමත් පත් කර ඇති අතර, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ඉදිරි කටයුතු සිදු කෙරෙමින් පවතී. මේ මස අවසානය වන විට එය ප්‍රසිද්ධ කර අවශ්‍ය යෝජනා ලබා ගැනීමට නියමිතයි.

(ඇ) අදාළ නොවේ.

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. සපුගස්කන්ද තෙල් පිරිපහදුවේ දෛනික නිෂ්පාදන ධාරිතාව බැරල් 50,000ක් කියලා තිබුණත්, දැනට බැරල් 30,000ක් වාගේ තමයි නිෂ්පාදනය කරන්නේ කියලා වාර්තා වෙනවා. මම හිතන විධියට, දෛනිකව බැරල් 30,000ක් නිෂ්පාදනය වනවා කියන්නේ අපේ අවශ්‍යතාවෙන් සියයට 30ක පමණ ප්‍රමාණයක්. එතකොට සියයට 70ක් පමණ ආනයනය කරනවා. ගරු ඇමතිතුමනි, මේ වන විට සපුගස්කන්ද තෙල් පිරිපහදුවේ දෛනිකව පිරිපහදු කරන ඩීසල්, පෙට්‍රල්, භූමිතෙල්, ගුවන්යානා ඉන්ධන සහ දැවිතෙල් වෙන් වෙන්ව කොච්චර නිෂ්පාදනය කරනවා ද කියලා ප්‍රතිශතයක් ලෙස ඔබතුමාට කියන්න පුළුවන් ද?

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

ඒක නම් වෙනම ප්‍රශ්නයක් විධියට ඇහුවොත් හොඳයි. ප්‍රතිශත විධියට ගත්තාම එතැන තිබෙන්නේ ඉලක්කම් දත්ත. එම ප්‍රතිශත නිවැරදිව මට දැන් ප්‍රකාශ කරන්න බැහැ. ඒ සම්බන්ධයෙන් වෙනම ප්‍රශ්නයක් යොමු කළොත් උත්තර ලබා දෙන්න පුළුවන්.

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

කමක් නැහැ. ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මම මේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්නේ ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කිරීම සඳහායි. ගරු ඇමතිතුමනි, පොළොන්නරුව දිස්ත්‍රික්කයට දුම්රියෙන් තෙල් ප්‍රවාහනය කරන කාලයේදී ඩීසල්, පෙට්‍රල් ලීටර් ලක්ෂයක් පමණ ගබඩා කරන්න පුළුවන් ස්ථානයක් කදුරුවෙල දුම්රිය පොළ අසල තිබුණා. මේ වෙනකොට ඒවා ටෙන්ඩර් කරලා තිබෙනවා. පොළොව මත තිබුණු ටැංකි විතරයි ටෙන්ඩර් කරලා තිබෙන්නේ. පොළොව යටත් මේ වාගේම ටැංකි තිබෙනවා. එතැන තෙල් ලීටර් ලක්ෂයක් පමණ ගබඩා කරන්න පුළුවන් ස්ථානයක්. මේ වන විට ඒවා සම්පූර්ණයෙන්ම ගලවලා තිබෙනවා. රුපියල් ලක්ෂ 25කට වැනි පොඩි මුදලකට තමයි මේක ටෙන්ඩර් වෙලා තිබෙන්නේ. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් කියනවා, ඒ අය දැනගෙන හිටියේ නැහැ කියලා පොළොව යටත් ටැංකි තිබෙන බව. ඔබතුමා මේ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරන්න. රජයට ලොකු මුදලක් සොයා ගන්න පුළුවන් අවස්ථාවක් තමයි මේ ගිලිහී ගිහිල්ලා තිබෙන්නේ. මේ වෙනකොට ඒවා සම්පූර්ණයෙන්ම ගලවාගෙන ගිහිල්ලා තිබෙනවා. බිල්ඩින්වල තිබුණු යකඩත් ගලවාගෙන ගිහිල්ලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඡායාරූප කිහිපයක් ඇතුළු විස්තර අඩංගු ලේඛනයක් මා ළඟ තිබෙනවා. ගරු කථානායකතුමනි, එම විස්තර ඇතුළත් ලේඛනයත්, ඡායාරූප දෙකකුත් මේ අවස්ථාවේදී මා **සභාගත*** කරනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරන්න. මොකද, රුපියල් ලක්ෂ 25ක් වැනි ඉතාම සුළු මුදලකට අනුරාධපුරයේ ආයතනයකට තමයි මේක දීලා තිබෙන්නේ. මේ සම්බන්ධයෙන් සොයා බලන්න කියලා මම මේ අවස්ථාවේදී මතක් කරනවා.

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

ගරු මන්ත්‍රීතුමනි, එම ප්‍රශ්නය මතු කිරීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. එහි ඇත්ත කථාව මේකයි. ඒ බිල්ඩින්, තෙල් ටැංකි ඔක්කෝම ඉවත් කරන්න පසුගිය රජය සමයේ තමයි ටෙන්ඩර් කැඳවලා තිබෙන්නේ. මම දන්න විධියට රුපියල් ලක්ෂ 13ක වාගේ මුදලක් තමයි ඒගොල්ලන් ගෙවලා තිබෙන්නේ. අපි බලයට පත් වෙන්න කලින්ම ඒවා ඉවත් කර ගැනීම කෙරිලා තිබෙනවා. මුදල් ගෙවලා නීතිමය කටයුතු ඔක්කෝම අවසන් කරලා තිබෙනවා. මන්ත්‍රීතුමා කිව්වා වාගේ පොළොව මතුපිට ටැංකි ටික විතරයි නිරීක්ෂණ මණ්ඩලය විසින් ඇස්තමේන්තු කරලා තිබෙන්නේ. හැබැයි, පොළොව යටත් තව ටැංකියක් තිබිලා ඒවා ඉවත් කර ගන්න කොම්පැනිය විසින් කටයුතු කරනකොට ඇත්තටම අපේ මන්ත්‍රීවරු ගොඩක් ඊට මැදිහත් වෙලා තිබෙනවා. ඔබතුමන්ලාත් ඒකට මැදිහත් වෙන්න ඇති, ප්‍රදේශවාසීන් විධියට. එම නිසා අපි දැන් ඒ කටයුත්ත නවත්වා තිබෙනවා. ඒ වාගේම අපි ඒ සම්බන්ධයෙන් පොලීසියට පැමිණිල්ලක් කරලා තිබෙනවා. මොකද, ඒක ඒගොල්ලන්ට ඉවත් කර ගන්න අවසර නැහැ. කොහොම වුණත්, වැරදි ක්‍රමවේදයට සහ වැරදි දත්තවලට තමයි ඒක විකුණා තිබෙන්නේ. ඒ පිළිබඳ පරීක්ෂණ කටයුතු අපි දැන් ආරම්භ කරලා තිබෙනවා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

පෞද්ගලික සහ ව්‍යාපාරික කටයුතු සඳහා පොලිස් ආරක්ෂාව සහ වාහන සැපයීම: ක්‍රමවේදය

தனிப்பட்ட மற்றும் வர்த்தகச் செயற்பாடுகளுக்காக பொலிஸ் பாதுகாப்பு மற்றும் வாகனங்கள் வழங்கல்: நடவடிக்கைமுறை

PROVISION OF POLICE PROTECTION AND VEHICLES FOR PRIVATE AND COMMERCIAL ACTIVITIES: PROCEDURE

924/2025

9. ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) මුදල් ගෙවීමේ පදනමින් පෞද්ගලික සහ ව්‍යාපාරික කටයුතුවල ආරක්ෂාව සඳහා ශ්‍රී ලංකා පොලීසියේ නිලධාරීන්, රථ වාහන සහ වෙනත් සම්පත් ලබා ගැනීමේ හැකියාවක් තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා අදාළ නීතිමය ප්‍රතිපාදනය කවරේද;

(iii) ඊට අදාළ කාර්ය පටිපාටිය කවරේද;

(iv) පොලිස් නිලධාරීන් සහ රථ වාහන ලබා දීමේදී උපරිම සීමාවක් පනවා තිබේද;

(v) ඉහත (i)හි සඳහන් සේවාවන් ලබා දීමේදී මුදල් අය කිරීමේ ක්‍රමවේදය කවරේද;

(vi) 2024 වර්ෂයේ සහ 2025 වර්ෂයේ මේ දක්වා එලෙස සේවා සැපයීමෙන් ශ්‍රී ලංකා පොලීසිය උපයන ලද ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත (අ) (i)හි සඳහන් සේවා ලබා ගැනීම සඳහා ඉල්ලුම් කරනු ලබන පාර්ශ්වය සම්බන්ධයෙන් සලකා බලනු ලබන නිර්ණායක කවරේද;

(ii) එම පාර්ශ්වයට යම් තර්ජනයක් තිබේ දැයි ආරක්ෂක විශ්ලේෂණ වාර්තා කැඳවන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கட்டணம் செலுத்துவதன் அடிப்படையில் தனிப்பட்ட மற்றும் வர்த்தகச் செயற்பாடுகளின் பாதுகாப்புக்கு நாட்டின் பொலிஸ் அலுவலர்கள், மோட்டார் வாகனங்கள் மற்றும் ஏனைய வளங்களைப் பெற்றுக்கொள்வதற்கு இயலுமை காணப்படுகின்றதா என்பதையும்;

(ii) ஆமெனில், அதற்கான சட்ட ஏற்பாடு யாது என்பதையும்;

(iii) அது தொடர்பான நடவடிக்கைமுறை யாது என்பதையும்;

(iv) பொலிஸ் அலுவலர்கள் மற்றும் மோட்டார் வாகனங்களை வழங்குகையில் உயர்ந்தபட்ச வரையறை விதிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(v) மேலே (i)இல் குறிப்பிட்டுள்ள சேவைகளை வழங்கும்போது கட்டணம் அறவிடும் வழிமுறை யாது என்பதையும்;

(vi) 2024ஆம் ஆண்டு மற்றும் 2025ஆம் ஆண்டில் இதுவரை அத்தகைய சேவைகளை வழங்கியதன் மூலமாக இலங்கை பொலிஸ் திணைக்களம் ஈட்டிய வருமானம் வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேலே (அ)(i)இல் குறிப்பிட்டுள்ள சேவைகளைப் பெற்றுக்கொள்வதற்காக கோரிக்கை விடுக்கும் தரப்பினர் தொடர்பில் கவனத்திற்கொள்ளப்படும் அளவுகோல்கள் யாவை என்பதையும்;

(ii) மேற்படி தரப்பினருக்கு யாதேனும் அச்சுறுத்தல் காணப்படுகின்றதா என்பது தொடர்பில் பாதுகாப்பு பகுப்பாய்வு அறிக்கை கோரப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Security and Parliamentary Affairs:

(a) Will he inform this House -

(i) whether there is a possibility of obtaining police officers, vehicles and other resources of the Sri Lanka Police for the security of private and commercial activities on paid basis;

(ii) if so, the legal provisions that are applicable to it;

(iii) the relevant procedure to be followed;

(iv) whether there is a maximum limit imposed on the provision of police officers and vehicles;

(v) the methodology for charging money for providing the services mentioned in (i) above; and

(vi) the revenue earned by the Sri Lanka Police from providing such services in the year 2024 and in the year 2025 to date, separately?

(b) Will he also inform this House-

(i) the criteria that are taken into consideration in relation to the party requesting to obtain the services mentioned in (a) (i) above; and

(ii) whether security analysis reports are called for in order to determine whether there is any threat to that party?

(c) If not, why?

ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

ව්‍යාපාරික අරමුණින් සිදු කරනු ලබන ඉල්ලීම්වලදී අදාළ ගාස්තු අය කෙරේ.

[ගරු ආනන්ද විජේපාල මහතා]

(ii)
- අංක ඊ 14 දරන ශ්‍රී ලංකා පොලිස් නියෝගය (ඇමුණුම 01)
- 2025.02.19 දිනැති පොලිස්පති චක්‍රලේඛ අංක 2791/2025 (ඇමුණුම 02)
- 2025.03.21 දිනැති පොලිස්පති චක්‍රලේඛ අංක 2791/2025 (i) (ඇමුණුම 03)

අංක අමප/25/0085/821/003 සහ 2025.01.27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට හා ඊට අදාළ අමාත්‍ය මණ්ඩල සන්දේශයට අනුකූලව මෙම පොලිස්පති චක්‍රලේඛ සකස් කර ඇත. (ඇමුණුම 04)

ඇමුණුම් 01, 02, 03 සහ 04 **සභාගත*** කරමි.

(iii)
- අදාළ නීතිමය ප්‍රතිපාදනයන්ට යටත්ව විධිමත් තක්සේරුවක් සිදු කිරීම.
- ඉල්ලීම සාධාරණ බව තහවුරු කර ගැනීම.
- පොලිස්පතිවරයාගේ හෝ රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගැනීම.
- විධිමත් ක්‍රමවේදයකට අනුව (ඉහත චක්‍රලේඛයන්හි සඳහන් පරිදි) ගාස්තු අය කිරීමකට යටත්ව පොලිස් නිලධරයන්ගේ සේවය හෝ ශ්‍රී ලංකා පොලීසිය සතු වාහන, යතුරු පැදි, යාත්‍රා ඇතුළු භෞතික සම්පත් ලබා දීමට කටයුතු කිරීම.

(iv) උපරිම සීමාවක් පනවා නැත.

ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම අනුව ලබා දිය යුතු සේවාව කොපමණද යන්න සම්බන්ධයෙන් විධිමත් තක්සේරු කිරීමකින් පසුව පවතින අවශ්‍යතාව සඳහා ප්‍රමාණවත් පරිදි පොලිස් නිලධාරින්ගේ සේවාව හෝ භෞතික සම්පත් ලබා දිය යුතු ප්‍රමාණය කොපමණ ද යන්න තීරණය කරනු ලබයි.

(v)
- 2025.02.19 දිනැති පොලිස්පති චක්‍රලේඛ අංක 2791/2025 (ඇමුණුම 02)
- 2025.03.21 දිනැති පොලිස්පති චක්‍රලේඛ අංක 2791/2025 (i) (ඇමුණුම 03) හි සඳහන් වන පරිදි ගාස්තු අය කරනු ලබයි.

(vi)

අනු අංකය	සපයන ලද සේවාවන්	2024 වර්ෂය (රුපියල්)	2025 වර්ෂයේ මැයි 31 දක්වා (රුපියල්)
01	පොලිස් නිලධාරින්ගේ සේවය ලබා දීම වෙනුවෙන් උපයන ලද මුදල	44,440,920.07	104,459,617.33
02	වාහන කුලියට ලබා දීම වෙනුවෙන් උපයන ලද මුදල	2,728,751.00	3,381,808.09
03	පොලීසිය සතු සතුන් (සුනඛයින් සහ අශ්වයින්) ලබා දීම වෙනුවෙන් උපයන ලද මුදල	181,560.00	477,506.63
04	බැංකු සහ ව්‍යාපාර කටයුතු සඳහා සයිරන් නළා හෝ නළා පද්ධති සවි කිරීම වෙනුවෙන් උපයන ලද මුදල *	-	1,073,330.00
එකතුව		**47,351,231.07**	**109,392,262.05**

***** **පුස්තකාලයේ තබා ඇත.**
* *நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

* බැංකු සහ ව්‍යාපාරික ආයතන මගින් පොලිස් ස්ථානවල හදිසි සංඥා (සයිරන් නළා පද්ධති) සවි කිරීම සඳහා 2025 වර්ෂයේ සිට ගාස්තු අය කිරීමට තීරණය කරන ලදී.

(ආ) (i)
- නීති විරෝධී කාර්යයන් හා සම්බන්ධ පාර්ශ්වයක් ද යන්න පිළිබඳව.
- සමාජ විරෝධී කාර්යයන් හා සම්බන්ධ පාර්ශ්වයක් ද යන්න පිළිබඳව.
- යහපත් සමාජ පසුබිමක් පවත්වාගෙන ගිය අයෙකු ද යන වග.
- අදාළ පාර්ශ්වය සම්බන්ධව කැඳවන ලද පසුබිම් වාර්තා හා බුද්ධි වාර්තා අනුව සේවය ලබා දීම නිර්දේශ කරන්නේද යන වග.

(ii) ඔව්

(ඇ) පැන නොනඟී.

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)

ගරු ඇමතිතුමනි, පිළිතුර ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු කථානායකතුමනි, ගැලරියේ මේ මොහොතේදී පාසල් යන කුඩා දරුවනුත් ඉන්නවා. මෙම ප්‍රශ්නය පැන නඟින්නේ, මෙම වයසේ දරුවන්ට උගන්වන එක්තරා ගුරුවරියක් නිසා. ඇය දරුවන් 8,000කුත්, දෙමව්පියන් 35,000කුත් එනවා කියලා පොලීසියට වැරදි තොරතුරු ඉදිරිපත් කරලා බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී කරපු එක සන්දර්ශනයක් නිසා තමයි ඇත්තටම මෙම ප්‍රශ්නය මතු වුණේ.

මේ කියන විධියට තර්ජන තිබෙනවාද කියලා මම හිතන විධියට ඒ වෙලාවේ බලලා තිබුණේ නැහැ. ඒ වාගේම ඉල්ලුම් කරනු ලබන නිර්ණායක මොනවාද කියාත් ඒ වෙලාවේ බලලා තිබුණේ නැහැ. හැබැයි, දරුවන් 8,000කුත්, දෙමව්පියන් 35,000කුත් එනවා, ඉතාම ලාභෙට, අඩුවට ඒ කටයුත්ත කරනවාය කිව්වා. කොහොම වුණත්, 119 පොලිස් මෝටර් රථයකුත්, පොලිස් යතුරුපැදි 4කුත් ලබා දීලා තිබෙනවා, ඒ සඳහා. හැබැයි, ඒ මුදලට. ඒක තමයි කිව්වේ. ඒ වාගේම නලින්ද ජයතිස්ස කැබිනට් ඇමතිවරයාත් ඒ වෙලාවේදී පිළිගත්තා, එතැන වැරැද්දක් සිද්ධවෙලා තිබෙනවාය කියලා. එමෙන්ම පොලිස් මාධ්‍ය ප්‍රකාශක බුද්ධික මනතුංග මහත්මයාත් ඒ කාරණය පිළිගෙන කිව්වා, ඒ පරීක්ෂණ සිද්ධ වෙනවා කියලා. මේ ක්‍රමවේදය ඒ වෙනකොට පිළිගෙන ක්‍රියාත්මක කරලා නැහැ කියන එක තමයි අපට පෙනෙන්නට තිබුණේ. මොකද, එතුමිය සම්මන්ත්‍රණ ශාලාව වෙත ඇතුළු වනවිට හෙලිකොප්ටරයකින් මල් පවා දැම්මා. ඒ විධියට හෙලිකොප්ටරයකින් මල් දැම්මේ ගුවන් හමුදාවෙන් නොවෙයි නේ. ඒ හෙලිකොප්ටරය පෞද්ගලිකව අරගෙන තමයි ඒ කටයුත්ත කළේ. පොලීසිය මේ වාගේ දේවල්වලට ලබා දෙන්නේ ඇයි කියලා ප්‍රශ්නයක් ඒ අවස්ථාවේදී මතු වුණා. ඒ පිළිබඳ විමර්ශන සිද්ධ වෙනවාද, ඒ විමර්ශනවලට මොකක්ද වුණේ, කැබිනට් මාධ්‍ය ප්‍රකාශකතුමාත් කිව්වා වාගේ එතැන වරදක් සිද්ධවෙලා තිබෙනවාද, එහි වර්තමාන තත්ත්වය මොකක්ද කියා මම ගරු ඇමතිතුමාගෙන් දැනගන්න කැමතියි.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

ඒ සම්බන්ධයෙන් විමර්ශනයක් සිද්ධ වෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
ඒ විමර්ශනයේ ප්‍රගතිය මොකක්ද? ගරු කථානායකතුමනි, මේක මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
විමර්ශනය අවසානයේ එහි ප්‍රගතිය දැනුම් දෙන්නම්.

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි.

පොලීසිය සම්බන්ධයෙන් කථා කරද්දී, 2025 මැයි මාසය වෙනකල් රුපියල් මිලියන 130 ගණනක ආදායමක් ශ්‍රී ලංකා පොලීසිය එලෙස සේවා සැපයීමෙන් ලබාගෙන තිබෙනවාය කියා ඔබතුමා පෙන්නුවා, ගරු ඇමතිතුමනි.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
රුපියල් මිලියන 109ක්.

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
එතකොට, ගිය අවුරුද්දටම හම්බවෙලා තිබුණේ, මිලියන හතළිස් ගණනක් නේද?

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
රුපියල් මිලියන 47යි.

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
දැන් මේ අවුරුද්දේ මුල් මාස 5ට රුපියල් මිලියන එකසිය ගණනක ආදායමක් හම්බවෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ අතුරු ප්‍රශ්නය යටතේ මම මේ කාරණයත් අහන්න කැමතියි.

අපේ රටේ තිබෙන විශාල ක්ෂේත්‍රයක් තමයි, සංගීත ප්‍රසංග, සැණකෙළි සහ විනෝදාස්වාදය සම්බන්ධයෙන් තිබෙන industry එක. සාමාන්‍යයෙන් මේ කර්මාන්තයෙන් වක්‍රව සහ සෘජුව මිනිසුන් ලක්ෂ 10ක් විතර යැපෙනවා. අපි දන්නවා, සංගීත ප්‍රසංගයක් කිව්වාම සමහර වෙලාවට 35,000ක්, 40,000ක් වාගේ පිරිසක් ඒ සඳහා එන්නත් පුළුවන් බව. ඒ වාගේ තැනකට පොලිස් ආරක්ෂාව දෙන එක ගැන අපට හිතා ගන්න පුළුවන්. මොකද, එහෙම කරන්න අවශ්‍යයි. ඒක දරුවන් 8,000ක් එනවා, දෙමව්පියන් 35,000ක් එනවා කියලා බොරු කියලා රවටන්න පුළුවන් එකක් නොවෙයි. හැබැයි, මම දන්නා තරමින් මාර්තු මාසයේදී චක්‍රලේඛයක් මඟින් පොලිසියේ කොස්තාපල්වරයෙකුට එක දවසකට ලැබෙන රුපියල් 900ක මුදල රුපියල් 4,800ක් දක්වා වැඩි කරලා තිබෙනවා. සැරයන්වරයෙකුට ලැබෙන රුපියල් 1,200ක මුදල රුපියල් 5,200ක් කරලා තිබෙනවා. මේ විධියට rate එක වැඩි කරලා තිබෙනවා. ගරු කථානායකතුමනි, මේ industry එකේ ඉන්න මිනිස්සු ඒ ප්‍රමාණයත් ගෙවනවා. විනෝද බද්ද විධියට එක් එක් ප්‍රාදේශීය සභාවලින්, පළාත් පාලන ආයතනවලින් කියන කියන ගණන් ගෙවන්න ඕනෑ. ඒ වාගේම, කිසිම පහසුකමක් නැති ක්‍රීඩාංගණවලට වෙන වෙනම ගෙවන්න ඕනෑ. මේ විධියට සැණකෙළියක් දවස් ගණනක් පැවැත්වුවොත්, එය රුපියල් ලක්ෂ ගණනක මුදලක් බවට පත් වෙනවා. දැක්කා නේ, මාස 5කට රුපියල් මිලියන එකසිය ගණනක ආදායමක් ලැබිලා තිබෙනවා. ගිය අවුරුද්දටම ලැබී තිබෙන්නේ රුපියල් මිලියන හතළිස් ගණනයි. එම නිසා මේ විධියට industry එකක් කඩා වට්ටන්න ඔබතුමන්ලා කටයුතු කරන්නේ ඇයි? විශේෂයෙන්ම මේ සම්බන්ධයෙන් යම්කිසි ක්‍රියාමාර්ගයක් ගන්නවාද, මේ කර්මාන්තය වෙනුවෙන් සැලකීමක් කරනවාද, ඔවුන්ටත් සහනයක් ලබා දෙනවාද කියාත් මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි, ගරු ඇමතිතුමනි.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු කථානායකතුමනි, මේ ක්ෂේත්‍රයේ නියැළී සිටින පිරිස් අධෛර්යයට පත් කරන්න හෝ එම කර්මාන්තය කඩා වට්ටන්න ආණ්ඩුව කිසිසේත්ම කටයුතු කරන්නේ නැහැ. මේ මුදල් වැඩි කිරීම සිද්ධ වුණා. ඒ මුදල් වැඩි කිරීම සිද්ධ වුණාට පස්සේ ප්‍රසංග සංවිධායකයින් සහ ශිල්පීන් ගරු ජනාධිපතිතුමාව හමු වුණා. ඒ පිළිබඳව කථා කරන්න මමත් එක් අවස්ථාවක ඔවුන්ව හමු වුණා. ඔවුන් සමඟ සාකච්ඡා කරලා මේ වෙනකොට අපි තීන්දුවකට ඇවිල්ලා තිබෙනවා, ඒ මිල ගණන් සියයට 50කින් පහළට ගේන්න. ඒ අනුව මම අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන්න කටයුතු සූදානම් කරලා තිබෙනවා. ඔබතුමා කිව්වා වාගේම මේ ක්ෂේත්‍රයේ නියැළී සිටින ශිල්පීන්, සංවිධායකයින් ඇතුළු සියලුදෙනා කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරලා, ඒ මිල ගණන් සියයට 50කින් පහළට ගේන්න කටයුතු කරලා තිබෙනවා.

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නයත් අහලා අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මට ගරු ඇමතිතුමාට ස්තුති කරන්න අවශ්‍යයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, කියන්න.

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
ගරු ඇමතිතුමනි, ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඔය වාගේ ඉතා ඉක්මන් පිළිතුරක් මම බලාපොරොත්තු වුණේ නැහැ. ලක්ෂ 10කට අධික පිරිසක් එම කර්මාන්තයේ නියැළෙනවා. එම පිරිස් සම්බන්ධයෙන් හොඳින් හිතලා කටයුතු කිරීම පිළිබඳව එම කර්මාන්තයේ නියුතු අය වෙනුවෙන් නැවතත් මගේ ස්තුතිය ඔබතුමාට පිරිනමනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මහතා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ අරමුණු සහ ප්‍රතිලාභ
அஸ்வெசும நலன்புரித் திட்டத்தின் நோக்கங்கள் மற்றும் நன்மைகள்
OBJECTIVES AND BENEFITS OF ASWESUMA WELFARE BENEFIT SCHEME

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු කථානායකතුමනි, මෙරට දුගී පවුල් සඳහා මූල්‍ය සහාය ලබා දීමේ අරමුණින් පසුගිය රජය විසින් අස්වැසුම වැඩසටහන ආරම්භ කෙරුණි. මෙමඟින් ප්‍රතිලාභීන්ගේ ජීවන තත්ත්වය සංවර්ධනය කිරීමට උත්සාහ දැරුව ද, එහි පැවති දුර්වලතා හේතුවෙන් සත්‍ය වශයෙන්ම ප්‍රතිලාභ හිමිවිය යුත්තන් සඳහා ප්‍රතිලාභ නොලැබුණු බවට පසුගිය දිනවලදී වාර්තා විය. එබැවින්, මෙම දුර්වලතා අවම කර ගැනීම සඳහා ප්‍රතිලාභ ලබා දීමේ ක්‍රමවේදය, ඔවුන්ගේ සුදුසුකම් සහ ඔවුන්ගේ ජීවන තත්ත්වයන් සංවර්ධනය කිරීමේ ක්‍රමවේදයන් පිළිබඳ නිරන්තර ඇගයීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම වඩාත් වැදගත් වේ.

ඒ වාගේම, ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම අපි ප්‍රශ්න කරන්නට ඕනෑ මේ ලබාදෙන ප්‍රතිලාභ මුදල ප්‍රමාණවත්ද කියලා. මොකද, අද බැලුවොත් මුරුංගා කිලෝවක් රුපියල් 1,200යි, කැරට් කිලෝවක් රුපියල් 800යි, බෝංචි කිලෝවක් රුපියල් 650යි, මිරිස් කිලෝවක් රුපියල් 800යි, කරවිල කිලෝවක් රුපියල් 450යි, වට්ටක්කා කිලෝවක් රුපියල් 320යි, වම්බටු කිලෝවක් රුපියල් 700යි, මැකරල් කිලෝවක් රුපියල් 500යි, ලීක්ස් කිලෝවක් රුපියල් 500යි, පතෝල කිලෝවක් රුපියල් 450යි යනාදී වශයෙන් එළවලුවල, ඒ වාගේම ආහාර පානවල මිල ගණන් ඉහළ මට්ටමකට ගිහින් තිබෙනවා. ඒ වාගේම, මේ සමහර ප්‍රතිලාභ ලබන ජනතාව ඇත්තවශයෙන්ම ධාන්‍ය වගාවේත් නිරත වෙනවා. තල, උඳු, මුංඇට වැනි ධාන්‍ය වගාවලට අද නියමිත මිලක් ලැබෙන්නේත් නැහැ. මේ තත්ත්වය තුළ විශේෂයෙන්ම අස්වැසුම වැඩසටහන පිළිබඳව ජාතික වැදගත්කමකින් යුක්ත වූ මේ ප්‍රශ්න මම අහන්න කැමැතියි.

01. අස්වැසුම වැඩසටහන ක්‍රියාත්මක වන්නේ කුමන අරමුණු අරබයාද?

02. අස්වැසුම වැඩසටහන තුළින් බලාපොරොත්තු වූ ඉලක්ක මේ වන විට සපුරාගෙන තිබේද? එසේනම්, එසේ සපුරාගත් ඉලක්ක කවරේද?

03. මෙම වැඩසටහන ආරම්භක දිනයේ සිට වසරක් වසරක් පාසා ප්‍රතිලාභ ලබා දුන් සංඛ්‍යාව කාණ්ඩ වශයෙන් වෙන් වෙන්ව දක්වන්නේද? ඒ සඳහා වාර්ෂිකව වැය කරන ලද මුළු මුදල කොපමණද?

04. අස්වැසුම ප්‍රතිලාභීන් කාණ්ඩ වශයෙන් වෙන් කිරීම සඳහා අනුගමනය කරන ලද නිර්ණායක කවරේද?

05. එසේ ප්‍රතිලාභීන් තෝරා ගැනීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය විද්‍යාත්මක වශයෙන් ශ්‍රී ලංකාවට ගැළපෙන ක්‍රමවේදයක්ද? මෙම ක්‍රමවේදය පිළිබඳව රජය සෑහීමට පත් වන්නේද?

විශේෂයෙන්ම, Centre for Poverty Analysis, ඒ වාගේම World Bank එක, ඒ වාගේම LIRNEasia Report එක අනුව අපේ රටේ දුප්පත්කම ඉතාම ඉහළ මට්ටමකයි තිබෙන්නේ. මෙවන් තත්ත්වයක් තුළ අපි අනුගමනය කරන ක්‍රමවේදය පිළිබඳව නිශ්චිත පිළිතුරක් අපි රජයෙන් බලාපොරොත්තු වෙනවා.

06. නව රජය යටතේ අස්වැසුම ප්‍රතිලාභ ලබා ගැනීමට ඉදිරිපත් වූ අයදුම්පත් ලක්ෂ 8 ඉහත කාණ්ඩ අනුව මේ වන විට වෙන් කර තිබේද?

07. 2025 වසරේ ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ලෝක බැංකුව විසින් ඉදිරිපත් කර ඇති වාර්තාව සහ දරිද්‍රතාව පිළිබඳ ඉදිරිපත්ව ඇති වෙනත් පිළිගත් පර්යේෂණ දත්ත පිළිබඳ රජයේ අවධානය යොමු කර තිබේද?

08. එසේ නම්, එම දත්ත අනුව අස්වැසුම වැඩසටහන සංශෝධනය කිරීමට රජය අපේක්ෂා කරන්නේද? නොඑසේ නම්, රජය සතු විකල්ප වැඩ පිළිවෙළ කුමක්ද?

ගරු අගමැතිතුමිය වුණත් දන්නවා, මේ සහනාධාර ලබා දීමට අමතරව, ඇත්තවශයෙන්ම ආයෝජන ප්‍රවර්ධනය කිරීම හරහා අපට දුප්පත්කම තුරන් කරන්නට පුළුවන් බව. නමුත්, මම ඔබතුමියගේ අවධානය යොමු කරවන්නට කැමැතියි, මේ වන විට සිංගප්පූරු රටේ මිලියන 8ක ආයෝජනයක්; විශේෂයෙන්ම foam mattresses ලක්ෂ 25ක් අපනයනය කරන්නට කටයුතු කරන ආයතනයක්; 500කට රැකියා දෙන ආයතනයක් දැන් මාස 6ක් තිස්සේ නිෂ්පාදනය ක්‍රියාත්මක කරන්නේ නැහැ කියන කාරණයට. ඒ මොකද? වාණිජ දෙපාර්තමේන්තුවයි, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයයි සීමාවක් දාලා තිබෙනවා 50,000ක quota එකක් පමණයි පිට රට යවන්න පුළුවන් කියලා. මේ වාගේ ප්‍රශ්නයක් තිබෙන නිසා මේ ආයෝජකයෝ -තායිලන්තය, කාම්බෝජය, මියන්මාරය වාගේ රටවල ලොකු factories තිබෙන ආයතන- දැන් මේ factory එක ගලවාගෙන යන්න හදනවා; මේ ආයෝජනයෙන් ඉවත් වෙන්න හදනවා.

ගරු අගමැතිතුමියනි, මම ඔබතුමියගේ අවධානයට යොමු කරනවා මේ කාරණයත්. විශේෂයෙන්ම මේ සිංගප්පූරු ආයතනය පසුගිය දවස්වල ප්‍රවෘත්ති සාකච්ඡාවකුත් සිදු කර තිබෙනවා. වහාම එම ආයතනය ගෙන්වා සාකච්ඡා කරන්න; foam mattresses ලක්ෂ 25ක් අපනයනය කරන්නට කටයුතු කරන ඒ ආයතනය මේ රටින් පිටව යන එක නතර කරන්නට කටයුතු කරන්න. මොකද, අපි කළ යුත්තේ ආයෝජකයෝ පලවා හැරීමට කටයුතු කිරීම නොවෙයි. ආයෝජකයෝ රඳවා ගැනීමටයි අප කටයුතු කළ යුත්තේ.

09. දුප්පත්කම තුරන් කිරීමට අදාළව රජය අනුගමනය කරන නිශ්චිත වැඩ පිළිවෙළක් තිබේ නම් එය කුමක්ද? එමඟින් රජයේ අපේක්ෂිත ඉලක්ක, සන්ධිස්ථාන මොනවාද?

ස්තුතියි.

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා (මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Harshana Suriyapperuma - Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ ඇසූ ප්‍රශ්නවලට පිළිතුරු මෙසේයි.

01. 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනතේ අරමුණු ළඟා කර ගැනීම සඳහා තමයි මෙම වැඩසටහන ක්‍රියාත්මක වෙන්නේ.

02. ළඟා කරගෙන ඇත. ඒ අනුව තෝරා ගත් පවුල්වලට, එනම් සියයට 94ක් වූ ප්‍රමාණයක් සඳහා ප්‍රතිලාභ අප්‍රේල් මස දක්වා අඛණ්ඩව ලබා දී ඇත.

03. සවිතරාත්මක පිළිතුර පහත දැක්වේ.

"අස්වැසුම" ආරම්භ කළ දින සිට 2025.06.18 දින දක්වා "අස්වැසුම" ප්‍රතිලාභය ලබාගෙන ඇති ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව

වසර	මාසය	ගෙවීම් ස්වභාවය	ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව				මුළු ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව
			අන්ත දිළිඳු	දිළිඳු	අවදානම්	සංක්‍රාන්ති	
2023	ජූලි	මාසික දීමනාව	303,718	604,273	289,673	209,133	1,406,797
	අගෝස්තු	මාසික දීමනාව	277,006	570,946	277,365	200,460	1,325,777
	සැප්තැම්බර්	මාසික දීමනාව	296,029	593,208	283,581	205,048	1,377,866
	ඔක්තෝම්බර්	මාසික දීමනාව	302,258	605,379	290,070	209,225	1,406,932
	නොවැම්බර්	මාසික දීමනාව	302,498	605,780	290,256	209,348	1,407,882
	දෙසැම්බර්	මාසික දීමනාව	303,199	606,496	290,624	209,745	1,410,064

වසර	මාසය	ගෙවීම් ස්වභාවය	ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව				මුළු ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව
			අන්ත දිළිඳු	දිළිඳු	අවදානම්	සංක්‍රාන්ති	
2024	ජනවාරි	මාසික දීමනාව	307,743	614,180	294,300	-	1,216,223
		හිඟ දීමනා	71,284	116,729	51,948	36,665	276,626
	පෙබරවාරි	මාසික දීමනාව	313,941	630,840	308,024	-	1,252,805
	මාර්තු	මාසික දීමනාව	325,884	660,067	329,651	-	1,315,602
	අප්‍රේල්	මාසික දීමනාව	314,986	653,048	-	-	968,034
		හිඟ දීමනා	136,300	324,442	240,957	38,106	739,805
	මැයි	මාසික දීමනාව	320,481	663,995	-	-	984,476
	ජුනි	මාසික දීමනාව	322,997	667,776	-	-	990,773
		හිඟ දීමනා	105,408	228,179	475,942	340,819	1,150,348
	ජූලි	මාසික දීමනාව	326,300	673,587	341,370	288,237	1,629,494
	අගෝස්තු	මාසික දීමනාව	332,185	684,920	348,244	295,676	1,661,025
		හිඟ දීමනා	141,139	283,679	142,268	124,098	691,184
	සැප්තැම්බර්	මාසික දීමනාව	335,363	690,420	351,237	299,324	1,676,344
		හිඟ දීමනා	27,082	47,270	23,591	22,255	120,198
	ඔක්තෝම්බර්	මාසික දීමනාව	337,749	694,207	353,196	301,488	1,686,640
		හිඟ දීමනා	23,843	38,374	19,392	17,826	99,435
	නොවැම්බර්	මාසික දීමනාව	339,018	696,436	354,311	302,716	1,692,481
		හිඟ දීමනා	32,406	65,037	35,213	37,151	169,807
	දෙසැම්බර්	මාසික දීමනාව	341,540	701,401	357,475	306,895	1,707,311
		හිඟ දීමනා	40,332	78,177	44,516	49,398	212,423

වසර	මාසය	ගෙවීම් ස්වභාවය	ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව				මුළු ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව
			අන්ත දිළිඳු	දිළිඳු	අවදානම්	සංක්‍රාන්ති	
2025	ජනවාරි	මාසික දීමනාව	344,505	706,642	360,734	311,041	1,722,922
	පෙබරවාරි	මාසික දීමනාව	345,101	707,695	361,281	311,718	1,725,795
		හිඟ දීමනා	71,592	107,421	47,613	45,113	271,739
	මාර්තු	මාසික දීමනාව	347,008	710,242	362,295	312,718	1,732,263
		හිඟ දීමනා	19,820	35,387	17,435	18,975	91,617
	අප්‍රේල්	මාසික දීමනාව	347,756	711,951	363,357	314,077	1,737,141
	මැයි	මාසික දීමනාව	348,189	712,909	364,115	-	1,425,213
	ජුනි	මාසික දීමනාව	349,692	715,525	365,558	-	1,430,775

එම කාලය තුල "අස්වැසුම" ප්‍රතිලාභ ලබාදීම සඳහා වැයකර ඇති සමස්ත මුදල

වසර	මාසය	ගෙවීම් ස්වභාවය	ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව	ගෙවන ලද මුදල රු.
2023	ජූලි	මාසික දීමනාව	1,406,797	8,764,679,250.00
	අගෝස්තු	මාසික දීමනාව	1,325,777	8,258,099,750.00
	සැප්තැම්බර්	මාසික දීමනාව	1,377,866	8,594,811,000.00
	ඔක්තෝම්බර්	මාසික දීමනාව	1,406,932	8,775,205,250.00
	නොවැම්බර්	මාසික දීමනාව	1,407,882	8,781,674,500.00
	දෙසැම්බර්	මාසික දීමනාව	1,410,064	8,792,887,750.00
			එකතුව	**51,967,357,500.00**

වසර	මාසය	ගෙවීම් ස්වභාවය	ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව	ගෙවන ලද මුදල රු.
2024	ජනවාරි	මාසික දීමනාව	1,216,223	8,457,002,750.00
		හිඟ දීමනා	276,626	1,765,146,500.00
	පෙබරවාරි	මාසික දීමනාව	1,252,805	8,700,580,750.00
	මාර්තු	මාසික දීමනාව	1,315,602	9,116,076,500.00
	අප්‍රේල්	මාසික දීමනාව	968,034	7,617,946,750.00
		හිඟ දීමනා	739,805	5,497,152,750.00
	මැයි	මාසික දීමනාව	984,476	7,749,240,250.00
	ජුනි	මාසික දීමනාව	990,773	7,799,484,250.00
		හිඟ දීමනා	1,150,348	14,934,844,750.00
	ජූලි	මාසික දීමනාව	1,629,494	10,547,285,000.00
	අගෝස්තු	මාසික දීමනාව	1,661,025	10,745,840,500.00
		හිඟ දීමනා	691,184	4,692,033,750.00
	සැප්තැම්බර්	මාසික දීමනාව	1,676,344	10,840,905,250.00
		හිඟ දීමනා	120,198	792,291,250.00
	ඔක්තෝම්බර්	මාසික දීමනාව	1,686,640	10,904,294,750.00
		හිඟ දීමනා	99,435	647,535,250.00
	නොවැම්බර්	මාසික දීමනාව	1,692,481	10,939,894,750.00
		හිඟ දීමනා	170,077	1,046,464,250.00
	දෙසැම්බර්	මාසික දීමනාව	1,707,311	11,024,310,500.00
		හිඟ දීමනා	212,423	1,314,007,750.00
			එකතුව	**145,132,338,250.00**

වසර	මාසය	ගෙවීම් ස්වභාවය	ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව	ගෙවන ලද මුදල රු.
2025	ජනවාරි	මාසික දීමනාව	1,722,922	12,536,422,500.00
	පෙබරවාරි	මාසික දීමනාව	1,725,795	12,555,651,250.00
		හිඟ දීමනා	271,739	1,693,804,250.00
	මාර්තු	මාසික දීමනාව	1,732,263	12,597,695,000.00
		හිඟ දීමනා	91,617	590,958,750.00
	අප්‍රේල්	මාසික දීමනාව	1,737,141	12,629,873,750.00
	මැයි	මාසික දීමනාව	1,425,213	11,293,277,500.00
	ජුනි	මාසික දීමනාව	1,430,775	11,339,507,500.00
			එකතුව	**75,288,023,750.00**

<u>අස්වැසුම ගෙවීම් සාරාංශය</u>

මුදල රු .

කාණ්ඩය	2023	2024	2025 (ජනවාරි-ජුනි)
අන්ත දිළිඳු	18,466,350,000.00	46,688,265,000.00	26,114,112,500.00
දිළිඳු	23,658,007,500.00	60,947,439,500.00	34,061,030,000.00
අවදානම්	7,182,790,000.00	20,086,075,000.00	9,411,115,000.00
සංක්‍රාන්ති	2,660,210,000.00	17,410,558,750.00	5,701,766,250.00
	51,967,357,500.00	**145,132,338,250.00**	**75,288,023,750.00**

04. 2022.10.20 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයට අනුව මේ නිර්ණායක ප්‍රකාශයට පත් කර තිබෙනවා. එයත් දීර්ඝ විස්තර සහිත ගැසට් පත්‍රයක්. දැනටත් මහජනතාවගේ පාවිච්චිය සඳහා එම තොරතුරු තිබෙනවා.

05. ප්‍රතිලාභීන් තෝරා ගැනීමට අනුගමනය කරනු ලබන ක්‍රමවේදය නියමු ව්‍යාපෘතියක් මඟින් තහවුරු කර ගැනීමෙන් අනතුරුව ක්‍රියාත්මක කරනු ලබන්නක්. මෙම ක්‍රමවේදය තවදුරටත් වැඩිදියුණු කිරීමට අවශ්‍ය කටයුතු සූදානම් කරනවා.

06. 2025 ජූලි මස අවසන්වීමට ප්‍රථම මේ පිළිබඳ විස්තර ප්‍රකාශයට පත් කිරීමට බලාපොරොත්තු වෙනවා.

07. මේ වනවිට ඉදිරිපත් කර ඇති පිළිගත් දත්ත වාර්තා පිළිබඳව රජය අවධානය යොමු කර ඇති අතර, අදාළ වැඩ කටයුතු සඳහා එවැනි දත්ත ඉදිරියේදී සුදුසු පරිදි භාවිත කරනු ඇත.

08. සමාජ සුබසාධන වැඩසටහන් තවදුරටත් ශක්තිමත් කරමින් ඉදිරියටත් අවශ්‍ය ක්‍රමවේද ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළ රජය සූදානම් කරමින් පවතිනවා.

09. දිළිඳුබව තුරන් කිරීම සඳහා බහුවිධ සංවර්ධන ප්‍රවේශයක් අවශ්‍ය බව හඳුනා ගෙන ඇත. ඒ සඳහා සියලු අවශ්‍යතා ඉටු කරගත හැකි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා. ඒ හරහා සමාජයේ අනිවාර්ය රැකවරණය ලැබිය යුතු සියලු

[ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා]

> කණ්ඩායම් වෙත සමාජ ආරක්ෂණ රැකවරණය ලබා දීමත්, ඔවුන් ආර්ථිකමය වශයෙන් සවිබලගැන්විය හැකි ක්‍රමවේදයක් තුළින් දිළිඳුබවින් මුදා ආර්ථිකයේ සක්‍රිය කොටස්කරුවන් බවට පත් කිරීමත් මේ තුළින් අපේක්ෂා කරනවා.

මීට අමතරව ප්‍රශ්නයක් විධියට අසා තිබුණේ නැති වුණත් ගරු විපක්ෂ නායකතුමා සඳහන් කරන්නට යෙදුණා, ආයෝජනයකට ආපු foam mattress නිෂ්පාදනය කරන ආයතනයක් ගැටලුවකට මුහුණ දී තිබෙනවා කියලා. ඔවුන් සමඟ ගිවිසුම්ගත වුණු අවස්ථාවේදී මේ පිළිබඳව ඉතා පැහැදිලිව සඳහන් කර තිබෙනවා. ශ්‍රී ලංකාව dumping yard එකක් විධියට හෝ ශ්‍රී ලංකාව හරහා වෙනත් රාජ්‍යයකට anti-dumping ක්‍රමවේදය හරහා සම්බන්ධ වෙන්නට විධියක් නැහැ. ඒ අනුව විශේෂයෙන්ම ඒ අදාළ පාර්ශ්ව විසින්ම එම ගිවිසුමේ සඳහන් කර තිබෙනවා, යම් යම් රටවලට අපනයනය කරන්නේ නැති බව. නමුත් දැන් එම ආයතනය එසේ මුලින් එකඟතාව පළ කර අපනයනය නොකරනවා යැයි කියපු රටට නැවත වතාවක් අපනයනය කරන්නට ඉල්ලනවා.

රජය එය අධෛර්යවත් කරන වැඩ පිළිවෙළක් නොවෙයි කරන්නේ. ඒ පාර්ශ්වයන්ට යම් යම් ගැටලු මතු වෙලා තිබෙනවා, පසුගිය කාලයේ සිදු වෙච්ච දේවල් සම්බන්ධයෙන්. එම නිසා ඒ පාර්ශ්ව ඉල්ලා සිටිනවා නැවත වතාවක් open කර දෙන්න කියලා. එතැනයි ගැටලුව මතු වෙලා තිබෙන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මට කරුණු දෙකක් පැහැදිලි කර ගන්නට අවස්ථාව දෙන්න.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අස්වැසුම වැඩසටහන සම්බන්ධයෙන් 2022 නිර්ණායක ගැන ඔබතුමා කථා කළා. මම ඔබතුමාට සඳහන් කරන්න කැමැතියි වර්තමාන ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා එවකට විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු හැටියට ඉන්න කොට, ඒ නිර්ණායක ගැන දරපු මතය. ඒ නිර්ණායක ඉතාම වැරැදියි කියන තර්කයේ අපිත් හිටියා; එතුමාත් හිටියා. දැන් ඔබතුමන්ලා කරන්නේ, 2022 නිර්ණායක අනුවම අස්වැසුම වැඩසටහන සම්බන්ධයෙන් කිසිම විද්‍යාත්මක පසුබිමකින් තොරව කටයුතු කිරීමයි. දුප්පත්කම තුරන් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරනවා නම් ඒකේ ආයෝජනය තිබෙන්න ඕනෑ, ඉතිරි කිරීම තිබෙන්න ඕනෑ, නිෂ්පාදනය තිබෙන්න ඕනෑ, අපනයනය තිබෙන්න ඕනෑ, පරිභෝජනය තිබෙන්න ඕනෑ. ඇත්තවශයෙන්ම කිව්වොත්, මෙහිදී යම් මුදලක් අතට ලබා දීම තුළ වෙන්නේ පරිභෝජනය පමණයි. ඒ නිසා මේ නිර්ණායක පිළිබඳව නැවත වරක් සොයා බලා ඒවායේ නිවැරැදිතාව සොයා බලා විශේෂයෙන් දත්ත කේන්ද්‍රීයව, විද්‍යාත්මකව, දරිද්‍රතා රේඛාව පිළිබඳව අවබෝධ කර ගනිමින් අස්වැසුම වැඩසටහන ක්‍රියාත්මක කිරීම යෝග්‍යයි කියන කාරණය මම ඔබතුමාට ප්‍රකාශ කරන්න කැමැතියි.

දෙවැනි කාරණාව මෙකයි. දැන් ඔබතුමා anti-dumping ගැන කථා කළා. ඇත්තවශයෙන්ම මේ රජයට, ඔබතුමන්ලාට වගකීමක් තිබෙනවා වෙළෙඳ ප්‍රවර්ධනය, trade facilitation සම්බන්ධයෙන්. ඒ කියන්නේ, වෙළෙඳාම ප්‍රවර්ධනය කිරීම. ඔය කොන්දේසිවල කෙසේ වෙතත් අපි යෝජනා කරනවා ශ්‍රී ලංකාවට trade representative කෙනෙකු, trade representative ආයතනයක් අවශ්‍යයි කියලා. රාජ්‍ය සේවයේ ඉන්න ඉතාම බුද්ධිමත් නිලධාරීන් උපයෝගී කරගෙන ඒ trade facilitation සැපයිය යුතුයි. ඒ කියන්නේ, වෙළෙඳාමට පහසුකම් සපයන්නා හැටියට වෙනමම trade representative කෙනෙකු පත් කරලා විශේෂයෙන්ම මේ වාගේ ආයෝජන රැක ගන්නට මූලපිරිය යුතුය කියා මම යෝජනා කරනවා.

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)
ගරු කථානායකතුමනි, එතුමා විසින් යෝජනා දෙකක් ඉදිරිපත් කරනු ලැබුවා. පළමුවන යෝජනාව සම්බන්ධයෙන් කියන්න තිබෙන්නේ මෙකයි. මම පිළිතුරේදීත් පැහැදිලි කළා. ඒවායෙහි තිබෙන අඩු පාඩු විසඳාගෙන, එය තවත් දියුණු කරලා ඒ ප්‍රජාවට ආර්ථික වැඩ පිළිවෙළට සම්බන්ධ වෙන්න පුළුවන් වන විධියේ සමස්ත කාර්යයක් නිර්මාණය කරන්නට අවශ්‍ය වැඩ පිළිවෙළ දැනටමත් ආරම්භ කර තිබෙනවා. ඒ පිළිබඳව රජය දැනටමත් හඳුනා ගෙන තිබෙනවා; ඒ සඳහා අවශ්‍ය වැඩ කටයුතු ආරම්භ කර තිබෙනවා; සක්‍රිය මට්ටමේ සාකච්ඡාත් පැවැත්වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27 (2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු රවී කරුණානායක මහතා.

II

ස්වාධීන කොමිෂන් සභාවල පරිපාලන රාමුව සහ වගවීම

சுயாதீன ஆணைக்குழுக்களின் நிர்வாகக் கட்டமைப்பு மற்றும் பொறுப்புக்கூறல்

ADMINISTRATIVE FRAMEWORK AND ACCOUNTABILITY OF INDEPENDENT COMMISSIONS

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Speaker, I wish to ask this Question under Standing Order No. 27(2) from the Hon. Prime Minister.

In terms of Article 41B of the Constitution of Sri Lanka, amended by the Twenty First and Twenty Second Amendments to the Constitution, the Constitutional Council is entrusted with the task of recommending of members to several independent Commissions. These Commissions play a vital role in safeguarding the integrity, transparency and accountability of public administration.

Based on publicly available information, the following 10 Commissions are currently considered independent or semi-independent.

1. Election Commission
2. Public Service Commission
3. National Police Commission

4. Audit Service Commission

5. Human Rights Commission of Sri Lanka

6. Commission to Investigate Allegations of Bribery or Corruption - CIABOC

7. Finance Commission

8. Delimitation Commission

9. National Procurement Commission

10. Public Utilities Commission of Sri Lanka - PUCSL- which is semi-independent.

While these Commissions derive their authority from the Constitution or enabling statutes, it appears that many of them function without publicly available or standardized Standard Operating Procedures - SOPs - governing internal operations such as recruitment, disciplinary processes, complaint management and public engagement. This has led to inconsistencies and an *ad hoc* policy framework in their administration.

In view of the above, I seek clarification from the Hon. Prime Minister as Minister in charge of Constitutional Affairs by raising the following questions:

1. Is the list of Commissions stated above accurate? If not, how many independent Commissions have been established under the Constitution of Sri Lanka, including those under Article 41B?

2. Have all these independent Commissions adopted Standard Operating Procedures - SOPs - or internal administrative guidelines to govern? Has it got approval from Parliament or is it only an internal policy?

3. If such Standard Operating Procedures have been adopted,

   - which Commissions have made them publicly available?

   - what oversight mechanisms are in place to ensure uniform implementation and transparency?

4. If Standard Operating Procedures - SOPs - have not been adopted,

   - what steps have been taken by the Government or the Constitutional Council to develop and implement them?

   - What is the expected timeline for formalizing such SOPs in each Commission?

5. Will the Government consider tabling the Standard Operating Procedures of each Commission in Parliament to ensure transparency, consistency in governance and public accountability?

At this particular moment, we wish to know the procedure for accountability, especially to whom these Commissions are accountable in relation to the discharge of functions and the assignment of various persons to these Commissions. Is it to Parliament or to the President? How fair play takes place is yet to be known.

So, Sir, I expect the Hon. Prime Minister to give us an Answer as to how fair play and accountability is going to be upheld in these independent Commissions.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා කල් ඉල්ලා තිබෙනවා. ඒ අනුව, ගරු අග්‍රාමාත්‍යතුමිය වෙනුවෙන් මා ඒ සඳහා කල් ඉල්ලා සිටිනවා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Speaker, it does not matter since the Hon. Prime Minister is not present in the House. Is it okay, Sir, if I add one additional question to that since time would be taken to answer that Question? Then, that question could also be answered through that process?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
No, that cannot be accommodated.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
To answer your Question, we have to consult all these ten Commissions. If you want to revise the Question, you have to submit it again.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Then, I will leave the Question as it is. Let the Hon. Prime Minister give the answer.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 91(ඒ) යටතේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම, ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දෙකක කාලයක් ලැබෙනවා.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ගරු කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි. පසුගිය දින කිහිපය තුළ මගේ නමත් සඳහන් කරමින් නැවතත් ලැයිස්තුවක් පිළිබඳව කථා කරනවා. අයථා ආකාරයකින් දේපළ ඉපයීමේ කටයුත්තක් සිදු වෙලා තිබෙනවා කියලා මාධ්‍යවල දිගින් දිගටම සඳහන් වෙනවා. විශේෂයෙන් මම මේ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කළ යුතුමයි, ගරු කථානායකතුමනි.

[ගරු හර්ෂණ රාජකරුණා මහතා]

යම් දේපළක් මට ලැබී තිබෙනවා. ඒ හැම දේපළක්ම මට ලැබී තිබෙන්නේ එක්කෝ මගේ දෙමව්පියන්ගෙන් -මගේ අම්මාගෙන් හෝ තාත්තාගෙන්-, එහෙම නැත්නම් මගේ සීයාගෙන් හෝ ආච්චිගෙන්. එහෙම නැතිව, අයථා විධියට දේපළ ලබාගෙන දේශපාලන කටයුතුවල නිරත වෙන පුද්ගලයෙක් නොවෙයි, මම. මා ඒක ඉතා පැහැදිලිව සඳහන් කරන්න ඕනෑ.

ඒ වාගේම, මීට ටික කාලයකට කලින් -මාසයකට දෙකකට කලින්- මට පෙට්‍රල් ෂෙඩ් එකක් තිබෙනවා කියමින් නම් ලැයිස්තුවක් ද ඉදිරිපත් කළා. මම ඒ අවස්ථාවේදීත් පාර්ලිමේන්තුවේදී සඳහන් කළා, මට එහෙම පෙට්‍රල් ෂෙඩ් එකක් තිබෙනවා නම් සොයා දෙන්න කියලා. අපේ පරම්පරාවට මම ඉපදෙන්නත් කලින් පෙට්‍රල් ෂෙඩ් තිබිලා තියෙනවා. දිගින් දිගටම මඩ ගසමින් කරන මේ උත්සාහය මම හෙළා දකිනවා. මේක ඉතාම අසාධාරණයි. අවංකවම මේ රටට වැඩක් කරන්නයි අපේ තරුණ කාලයත් කැප කරලා අපි දේශපාලනයට ඇවිත් ඉන්නේ. යම් දේශපාලනඥයකු අයථා විධියට දේපළ උපයා තිබෙනවා නම්, ඒවා ගැන පරීක්ෂණ කරලා ඒ අයට එරෙහිව ඉතා ඉක්මනින් නීතිය ක්‍රියාත්මක කරන්න. හැබැයි අපේ නම් ද පටලවා ලැයිස්තු ඉදිරිපත් කරමින් මේ කරන නින්දිත වැඩේ කරුණාකර නතර කරන්න. ගරු කථානායකතුමනි, ඔබතුමාගේ නායකත්වය යටතේ සිටින මේ පාර්ලිමේන්තුවේ නියෝජිතයෙකු වන මට ලොකු අසාධාරණයක් සිදු වෙලා තිබෙනවා. කරුණාකර ඒ වෙනුවෙන් පෙනී සිටින්න කියා ඉල්ලා සිටිනවා. අප ඕනෑම පරීක්ෂණයකට යටත්ව මේ විමර්ශනවලට සහයෝගය ලබා දෙන්න කටයුතු කරනවා කියලා මම නැවතත් ප්‍රකාශ කරනවා. ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 3 දක්වා ඉදිරිපත් කිරීම, ගරු (ආචාර්ය) අනිල් ජයන්ත ඇමතිතුමා.

මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත: නියෝගය
முத்திரைத் தீர்வை (விசேட ஏற்பாடுகள்) சட்டம்: கட்டளை
STAMP DUTY (SPECIAL PROVISIONS) ACT: ORDER

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் பொருளாதார அபிவிருத்திப் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Economic Development)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 මාර්තු 27 දිනැති අංක 2429/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.06.03 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ඊට අමතරව, න්‍යාය පත්‍රයේ විෂය අංක 2 සහ 3 දරන යෝජනා -ආනයන හා අපනයන පාලන පනත යටතේ රෙගුලාසි- ද මා ඉදිරිපත් කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Hon. (Dr.) Harshana Suriyapperuma to commence the Debate. You have 13 minutes.

[පූ.භා. 11.16]

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා (මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Harshana Suriyapperuma - Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, අද දවසේ අප සාකච්ඡා කරන මාතෘකා අතුරින් එකක් තමයි, 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ ගෙනෙන නියෝගය. එම පනත සංශෝධනය කරන්න තමයි මේ යෝජනාව ගෙනැල්ලා තිබෙන්නේ. මේ යෝජනාව ඉදිරිපත් කිරීමට ප්‍රධානම හේතුවක් වන්නේ, මේ පනත සම්බන්ධ සංශෝධනයක් 2006 වසරේ සිට අද දක්වා සිදු වී නොතිබීමයි. ඒ කියන්නේ, වසර 20කට වඩා පැරණි, යල් පැන ගිය අණපනත්වලට අදාළ කොටස් තමයි මේ තුළින් සංශෝධනය කරන්නට බලාපොරොත්තු වන්නේ. මේ සංශෝධනය මොකක්ද කියා අපි පැහැදිලිව අවධානය යොමු කර බලමු. මොකද, මේ අවස්ථාවට පාසල් දරුවන් ද සහභාගී වී ඉන්නවා. ඒ අය ද ඇතුළුව සමාජය දැනුවත් වීම සඳහා මම මේ සම්බන්ධයෙන් කියන්නම්.

විශේෂයෙන්ම කල්බදු මත මුද්දර බදු දැනටමත් අය කරනු ලබනවා. රුපියල් 1,000කට රුපියල් 10ක් වැනි මුදලක් තමයි දැනට ගාස්තුව විධියට අය කරනු ලබන්නේ. එම ගාස්තුව සංශෝධනය කරලා තිබෙනවා, රුපියල් 1,000ක් සඳහා ගාස්තුව රුපියල් 20ක් දක්වා වැඩි කිරීමට. මෙහිදී හිතෙන්න පුළුවන් රජයට අවශ්‍ය ආදායම උපයා ගැනීම සඳහා පුරවැසියාට බර වැඩි කරන්නට ද මේ වාගේ දේවල් කරන්නේ කියලා. ගරු කථානායකතුමනි, එහෙම අරමුණකින් නොවෙයි, මම මුලින් සඳහන් කළා වාගේ මේ අණපනත් යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය පියවරවල එක පියවරක් විධියට තමයි මේ පියවර ගන්නේ. වසර 20කට වැඩි, ඒ කියන්නේ 2006 තිබෙන අන්තිම සංශෝධනයටත් කලින් ඉඳන් තමයි රුපියල් 5 බද්ද ක්‍රියාත්මක වෙන්නේ.

විශේෂයෙන්ම අනෙක් වැදගත් කාරණය මේකයි. මේ මුද්දර බද්ද අය කරනු ලබන්නේ නිශ්චල දේපොළ සඳහා පමණයි. මොකක්ද, මේ මුද්දර බද්දෙන් රටට ලැබෙන වාසිය? එහෙම නැත්නම් අපේ පුරවැසියන්ට ලැබෙන වාසිය? මේ අය කර ගනු ලබන බදු මුදල් රජය කොයි විධියට ද භාවිත කරන්නේ? මේ ලබා ගන්න බදු මුදල මධ්‍යම ආණ්ඩුව වෙනුවට පළාත් සභාවලට තමයි ලබා දෙන්නේ. ඒ තුළින් පළාත් සභාවල අවශ්‍ය වැඩ කටයුතු සාර්ථකව කරවා ගන්නට එක පැත්තකින් අවශ්‍ය දායකත්වය ලැබෙනවා වාගේම, මධ්‍යම ආණ්ඩුවට ඒ වෙනුවෙන් යන වැය බර අඩු කර ගැනීමටත් මේ තුළින් අවස්ථාවක් ගොඩනැඟෙනවා. ඒ වාගේම මම මුලින් සඳහන් කළා වාගේ ආදායම් වැඩි කර

ගන්නවා - revenue maximization - වෙනුවට මේක යාවත්කාලීන කරවීම සඳහා තමයි මේ වැඩ පිළිවෙළ කරන්නේ. ඇයි, මෙහෙම රජය මේ වැඩ පිළිවෙළට සම්බන්ධ වෙන්නේ? එකක් තමයි, මේ යල් පැන ගිය වැඩ කටයුතුවලට පසුගිය රජයන් අවධානය යොමු නොකිරීම.

නිවැරැදි වෙලාවට, නිවැරැදි අණපනත් සංශෝධනය කරන්නට අවශ්‍ය අවධානය දුන්නේ නැහැ. ඒ වෙනුවට වංචාව, දූෂණය රජ කරවපු ආර්ථික ක්‍රමයක්, සුළු පිරිසකට ප්‍රතිලාභ යන ක්‍රමයක් විතරයි හැදුවේ. නමුත්, වර්තමාන රජය ඒ වෙනුවට අවශ්‍ය තැන්වලට අවධානය යොමු කරමින්, ඒ වැඩ පිළිවෙළ කාර්යක්ෂමව කරවා ගැනීම සඳහා පමණක් නොවෙයි, ඒ නීති-රීති යාවත්කාලීන කරන වැඩ පිළිවෙළක් මේ වෙනකොට ආරම්භ කරලා තිබෙනවා. ඒ වාගේම, මේ වැඩ කටයුත්ත තුළින් ගුණාත්මකභාවය ඉහළ නැංවීමට වැඩ කටයුතු සංවිධානය කරනවා. දැනට පවතින ක්‍රමවල තිබෙන නිරවද්‍යතාව ඉහළ නංවා ගැනීමට අවශ්‍ය වැඩ පිළිවෙළ පුරවැසියන්ට ළඟා කර දීමට මේ තුළින් අපි බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම මේ වාගේ බදු ගෙවීම සඳහා දැනට තිබෙන ක්‍රම වෙනුවට, ඩිජිටල් තාක්ෂණය සම්බන්ධ කරගෙන රජයට ඉක්මනින් ආදායම ලැබෙන, රස්තියාදුව අවම වෙන, කාර්යක්ෂමතාව වැඩි වෙන ක්‍රම හඳුන්වා දීමට අවශ්‍ය පියවර පිළිබඳව දැනටමත් අපි අවධානය යොමු කරලා තිබෙනවා.

අද කථා බහට ගැනෙන ගැසට් නිවේදන කිහිපයක් තිබෙනවා. ඒවා තමයි, 2025 අංක 04 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිවලට අනුකූලව 2025 අප්‍රේල් මස 29වැනි දිනැති අංක 2434/12 නැමති අති විශේෂ ගැසට් පත්‍රය සහ 2025 අංක 05 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි යටතේ 2025.05.05 දිනැති 2435/02 දරන අති විශේෂ ගැසට් පත්‍රය. මේ තුළින් ප්‍රධාන වශයෙන් බලාපොරොත්තු වන කාරණා හතරක් තිබෙනවා. එයින් පළමුවැනි කාරණාව තමයි, 2025.01.27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව, භාවිත කරන ලද රෙදි පිළි ආනයනය කිරීමට අදියර වශයෙන් වසර තුනක් වාගේ කාල සීමාවක් සඳහා අවශ්‍ය වැඩ කටයුතු සූදානම් කිරීම. ඇයි මේ භාවිත කරන ලද ඇඟලුම් ආනයනය කරන්නට අවශ්‍යතාවක් ඇති වෙන්නේ? සියලු ඇඟලුම් නොවෙයි, ගරු කථානායකතුමනි. විශේෂයෙන්ම සීතල පළාත්වල, සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් අංශක 20ට වඩා අඩු නුවරඑළිය, මාතලේ, බදුල්ල වාගේ දිස්ත්‍රික්කවල ජීවත් වන ආර්ථික අපහසුතා තිබෙන ජනතාවට සීතලට අඳින්න අවශ්‍ය ඇඳුම් වෙනුවෙන් තමයි අවධානය යොමු කරලා, ඒවා රටට ආනයනය කරන්නට අවශ්‍ය වැඩ කටයුතු සූදානම් කරලා තිබෙන්නේ. මේ තුළින් අනවශ්‍ය දේ ගෙනෙනවා නොවෙයි, නිවැරැදි ක්‍රමයක් යටතේ, අධීක්ෂණය යටතේ, අසරණභාවයට පත් වෙලා ඉන්න, ආර්ථික අපහසුතාවට පත් වෙලා ඉන්න ඒ පුරවැසියන්ට සහනයක් තමයි ලැබෙන්නේ. ඒකත් කෙටි කාලයක් තුළ, වසර තුනක් ඇතුළත පියවරෙන් පියවර - step by step - ඒ ප්‍රමාණය අඩු කරලා, නැවත වතාවක් තිබෙන තත්ත්වය restore කරන්නට බලාපොරොත්තු වෙනවා.

මේ සම්බන්ධයෙන් නිකුත් කරපු දෙවැනි ගැසට් පත්‍රය තමයි, මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්තය සඳහා අවශ්‍ය තල්ලුව දීමට සහ වාහන අලුත්වැඩියා කිරීමට අවශ්‍ය වන වාහන අමතර කොටස් ගෙන්වීම සඳහා මෙතෙක් කල් තිබුණු තහනමක් ඉවත් කිරීමට නිකුත් කරන ලද ගැසට් පත්‍රය. යම් යම් විශේෂ කාණ්ඩ යටතේ, ඒ විශේෂ නිර්ණායකවලට යටත් වන HS Codes 6ක් විතර තිබෙනවා. ඒ අමතර කොටස් ලංකාවට ගෙන්වා ගැනීමට තමයි, මේ තුළින් අවස්ථාව සූදානම් කරලා තිබෙන්නේ. ඒකෙන් බලාපොරොත්තු වන කාරණය තමයි, දැනට තිබෙන ඒ තහනම ඉවත් කිරීම තුළින් අපේ රටේ ඒ කර්මාන්තවල යෙදිලා ඉන්න, අපේ ආයෝජකයන්ට අවශ්‍ය පහසුකම් සලස්වා දීම.

ඊළඟට, ඒකට සමගාමීව තුන්වැනි ගැසට් පත්‍රයත් ඉදිරිපත් වෙනවා. ඒක තමයි, 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත යටතේ නිකුත් කර ඇති ගැසට් පත්‍රය. පසුගිය වසරවල මේ රටේ තිබුණු ආර්ථික අපහසුතා නිසා, කැසිනෝ ක්‍රීඩා උපකරණ මේ රටට ගෙන්වීම මේ දක්වා තහනම් කරලා තිබුණා. දැනට ලියාපදිංචිය ලබා ගෙන ඇති ආයතනවලට සංචාරක ප්‍රවර්ධනය සඳහා ඉවහල්වන කැසිනෝ ක්‍රීඩා උපකරණ හා සංචාරකයන් සඳහා පහසුකම් සපයන ස්ථානවල ඇති ක්‍රීඩා උපකරණ ගෙන්වන්නට අවස්ථාව ලැබෙනවා. විශේෂයෙන්ම HS Codes කිහිපයක් යටතේ නියාමනයකට යටත්ව ඒවා ආනයනය සඳහා අවස්ථාව උදා කරලා දෙනවා. මම අර මුලින් සඳහන් කළා වාගේම ඒ අදාළ කර්මාන්තවලට දැනට අවසර ලබා දීලා තිබෙන, දැනට අනුමැතිය ලබා ගෙන ක්‍රියා කරන ඒ ආයතනවලට, අවශ්‍ය අලුත් renovationsවලට, අලුත්වැඩියා කර ගැනීම්වලට අවශ්‍ය උපකරණ ගෙන්වීමට මේ තුළින් අවස්ථාව ලැබෙනවා.

ඊට අමතරව, හතරවැනි ගැසට් එකක් පිළිබඳවත් මේකට සමගාමීව අපි කථා බහ කරනවා. දැනට තාවකාලිකව ආනයනය අත්හිටුවා තිබුණු විද්‍යුත් යතුරු පැදි ගෙන්වීමට මේ ගැසට් පත්‍රය තුළින් අවස්ථාව උදා කරලා දෙනවා. දැනට තිබෙන combustion engine එක සහිත පෙට්‍රල්වලින් ක්‍රියාත්මක කරන යතුරු පැදිවලට අමතරව විද්‍යුත් යතුරු පැදි ගෙන ඒමටත් මේ තුළින් අවස්ථාව සූදානම් කරලා තිබෙනවා. 2025 ජනවාරි 31 දිනැති අංක 2421/44 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය තුළින් තමයි මේ ආනයනය සඳහා අවස්ථාව සූදානම් කරලා තිබෙන්නේ. මේ වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීමේදී අණපනත්, මේවාට අවශ්‍ය කරන සංශෝධන ගෙන ඒමේදී නිවැරදි කාල සීමාවලට අනුගතව ඒ වැඩ පිළිවෙළ කරන්නට අපි බලාපොරොත්තු වෙනවා. ඒ අනුව තමයි යම් කිසි ගැසට් පත්‍රයක් නිකුත් කරලා ඒ සඳහා අනුමැතිය ලබාගත යුත්තේ. ඒ ගැසට් පත්‍රයට අදාළ කාල සීමාවන් තිබෙනවා, පාර්ලිමේන්තුවට ඒවා ඉදිරිපත් කරලා ඒකට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට. ඒ ක්‍රමවේදය යටතේ තමයි අද මේ යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, ඊට අමතරව සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පිළිබඳ පනත් කෙටුම්පත - Gambling Regulatory Authority Bill - පිළිබඳවත් සඳහන් කිරීම මෙහිදී ඉතාම වැදගත් වෙනවා. පසුගිය දිනවල අපි ඒක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. අද අර මම මුලින් කියපු කැසිනෝ ව්‍යාපාර නියාමනය කිරීම සම්බන්ධයෙන් වන පනත එක්ක මේක සම්බන්ධ වෙනවා. මේකේ දැනට තිබෙන අඩුපාඩු ඉවත් කරගෙන ඒක නිසි නියාමනයකට ලක් කරන්නට අවශ්‍ය වැඩ පිළිවෙළ මේ තුළින් ක්‍රියාත්මක කරන්නට රජය කටයුතු සූදානම් කරලා තිබෙනවා. Online gambling තිබෙනවා, online සූදු ක්‍රීඩා කිරීම් තිබෙනවා. දැනට ලෝකයේ තිබෙන අනෙක් රටවල් අනුගමනය කරලා තිබෙන ක්‍රමවේද දිහා බලලා -සිංගප්පූරුව විතරක් නොවෙයි, මේ සම්බන්ධයෙන් ඉදිරියට ගිය ලෝකයේ අනෙක් රටවල් අනුගමනය කරලා තිබෙන ක්‍රමවේද දිහාත් බලලා තමයි- මේ වැඩ පිළිවෙළ, මේ අලුත් ක්‍රමවේදය සූදානම් කරලා ඒ පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා තිබෙන්නේ. "අපි කරනවා, අපි කරනවා" කියලා මෙච්චර කාලයක් කිය කියා හිටියා, අපි දැක්කා. නමුත් කළේ නැහැ. ගරු කථානායකතුමනි, වර්තමාන ආණ්ඩුව එම කෙටුම්පත පිළියෙළ කරලා, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නට කටයුතු කරලා තිබෙනවා.

මේ වැඩ පිළිවෙළ කරගෙන යාම තුළින් රජය රටට, ව්‍යාපාරිකයන්ට, පුරවැසියන්ට දීලා තිබෙන message එක තමයි මේ රජය දීපු පොරොන්දු ඉටු කරන රජයක් බව. අපි බලයට පත් වෙන්නට පෙර කථාබහ කරන වෙලාවේදී කිව්වා ඇප නැතුව ණය දෙන වැඩසටහන කරන්නට, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට අවශ්‍ය තල්ලුව දෙන්නට අපි වැඩසටහනක් සූදානම් කරනවා කියලා. අපි දැක්කා, එතකොට ඒක උපහාසයට

[ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා]

ලක් කළා. ඒකට හේතුව තමයි ඒගොල්ලන්ට බැරි වීම. ගරු කථානායකතුමනි, හැබැයි අද වෙනකොට වර්තමාන රජය ඒ වැඩසටහන ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඒකෙන් පැහැදිලිව පෙනෙනවා පසුගිය කාලයේ රටේ තිබුණු ආර්ථික වැඩ පිළිවෙළ අසාර්ථක, අදූරදර්ශී එකක් බව. නොතේරෙන පිරිසක් රට පාලනය කිරීම තුළින් තමයි මේ ආර්ථිකය කඩා වැට්ටුවේ.

වර්තමාන රජය කරගෙන යන වැඩ පිළිවෙළ තුළින් අපිට පෙනෙන දේ තමයි, that it is not only doing the right thing, but that the hope and the growth of the country have been restored. The numbers speak for itself. A 4.8 per cent growth has been reported for the first quarter. Sir, confidence among the business community has been restored; trust in the system has been restored. With the way the Government conducts its affairs, it has demonstrated to the public, the business community and the international community that there is consistency in the system, within the governance framework and in how the Government is implementing these activities. ගරු කථානායකතුමනි, මේ වැඩකටයුතු ක්‍රියාත්මක කරවීම තුළින් රට ඉදිරියට ගෙනියන දිශානතියයි පෙන්නුම් කරන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Deputy Minister, your time is over.

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)
මට තව තත්පර 30ක් දෙන්න, ගරු කථානායකතුමනි.

අපි මුලදී කිව්වා වාගේම ඒ කථා බහ - conversation එක - තුළින් කෙරෙන්නේ එයයි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ආණ්ඩු පක්ෂයේ කාලයෙන් අඩු කර එතුමාට වෙලාව ලබා දෙන්න. කොහොමත් අද එතුමාට විශේෂ දවසකුත් වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාට තව විනාඩි 5ක කාලයක් ලබා දෙනවා.

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)
බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

මේ රට ඉදිරියට ගෙන යන දිශානතිය, අපි පොරොන්දු වෙච්ච වැඩ පිළිවෙළ, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ගොඩ නඟනවා කියපු වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන බව තමයි මේ එකින් එක මඟින් අපි පැහැදිලිව කියන්නේ; this is testimony of the delivery of some of the promises we gave under "A Thriving Nation - A Beautiful Life", Sir. There is not only policy consistency, but also - in 2022, three years back, we saw several protests going on in several places - in 2025, under the present Government, because we have restored confidence, we now have conferences in Sri Lanka discussing about cross-border listing. Sir, that is the level of confidence the international investors have in the Sri Lankan market after the Government has restored the system. I recently attended a South Asian conference organized by the Actuarial Association. It was attended by foreign participants as well. What does it mean? The Government has restored the confidence that the business community, the private sector wanted. It has been achieved not only through the mandate for zero tolerance for corruption, the digitization and efficiency improvement, which we are driving at, but also through collective effort of everyone.

ගරු කථානායකතුමනි, මේ ගමන සාර්ථකව කරගෙන යන්නට අපි වැඩ කටයුතු කළේ, ඊට සහභාගි කරවා ගත්තේ රජයේ නිලධාරින්. අපිත් එක්ක සම්බන්ධ වෙලා ඉන්න දැනට සිටින රජයේ නිලධාරින් එක්ක එකතු වෙලා තමයි අපි මේ ගමන ගියේ. අපි මොකක්ද කළේ? පසුගිය කාලයේ කරන්න බැරිවෙච්ච දේවල් කරන්න ඒ රජයේ නිලධාරින්ට අවශ්‍ය කරන ධෛර්යය ලබා දුන්නා. දේශපාලන මැදිහත්වීම ඉවත් කර දුන්නා. නිවැරදි තීන්දු තීරණ ගන්නත්, තමන්ගේ මතය බය නැතුව ඉදිරිපත් කරන්නටත් අපි අවස්ථාව සලසා දුන්නා. ඒ රාජ්‍ය ආයතනවලට අවශ්‍ය කරන සම්පත් දායකත්වය ලබා දුන්නා. ඒ තුළින් අපි - වර්තමාන රජය- ක්‍රියාත්මක කර පෙන්නුවේ, කලින් කරන්නට බැහැ කියපු දේවල් රජයේ සේවකයන්ම පාවිච්චි කරගෙන, එම ව්‍යූහයම පාවිච්චි කරගෙන මාස කිහිපයක් -කෙටි කාලයක්- තුළ ක්‍රියාත්මක කර පෙන්වීමයි. මේ, ආරම්භය පමණයි.

අපේ නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කරවා, අපේ ව්‍යාපාරික ප්‍රජාවට, පෞද්ගලික අංශයට අවශ්‍ය රාජ්‍ය මැදිහත් වීම ලබා දී වැඩ කටයුතු ශක්තිමත් කරමින් මේ ගමන තවදුරටත් සාර්ථකව ඉදිරියට කරගෙන යන්නට -මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නට- අපි සැදී පැහැදී සිටිනවා. මේ ක්‍රමය තුළින් ව්‍යාපාරිකයන්ට අවශ්‍ය කරන පැත්ත විතරක් නොවෙයි, අපේ ආර්ථිකය නඟා සිටුවමින් පළමුවෙනි කාර්තුව තුළ සියයට 4.8ක වර්ධනයක් පෙන්නුම් කළා. ඒවා කරනකොට අපි රටේ ජනතාවට ලබා දුන් පහසුකම් අඩු කළේ නැහැ. ඒවා වැඩි කර දුන්නා. පීඩනයට පත් වෙලා සිටින අපේ ජනතාවට තිබිච්ච ගැටලු විසඳාගන්නට අස්වැසුම තුළින් සවිබලගැන්වීමේ ප්‍රතිලාභය අපි වැඩි කර දුන්නා. ඒ වාගේම වැඩිහිටි දීමනා වැඩි කර දුන්නා; අඩු කරනවා වෙනුවට වැඩි කරලා දුන්නා. පාසල් දරුවන්ට අවශ්‍ය කරන උපකරණ මිලදී ගන්නට අමතර ප්‍රතිපාදන ලබා දෙමින් ඒ වැඩ කටයුත්ත සාර්ථකව ඉදිරියට ගෙන ගියා. ගොවි ජනතාවට වාගේම ධීවර ප්‍රජාවටත් අවශ්‍ය කරන සහනාධාර ලබා දෙමින් තමයි අපි මේ වැඩ කටයුතු ඉදිරියට කරගෙන ගියේ. මෙච්චර කල් නැහැ කිව්වා; බැහැ කිව්වා. භාණ්ඩාගාරයේ තිබිච්ච මුදල්වලින් වෙන් කර දීපු මුදල් ප්‍රමාණය පවා රටේ දිළිඳු ජනතාවට ලබා දුන්නේ නැහැ. අඩුපාඩුකම්වලින් බැට කන ජනතාවට සහන දුන්නේ නැහැ. අපි ඒ දේවල් ක්‍රියාත්මක කරලා පෙන්නුවා. ඒක ජාත්‍යන්තර ආයතන පවා අගය කරන මට්ටමකට අද වෙනකොට ඇවිල්ලා තිබෙනවා. වර්තමාන රජය මේ වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා මුල් තැනක් දෙනවා; their implementation is the key. Sir, we will dedicate more resources, engage more and more by the day to ensure that this mechanism is strengthened further to deliver what was promised and to create the system that everyone hope for. The Sri Lanka that we all dream of will be created.

Thank you very much, Sir, for the extra time granted as well.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Next, the Hon. Nalin Bandara Jayamaha. You have 12 minutes.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Yes, Hon. Ravi Karunanayake? You can have a few seconds please.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, the Hon. Deputy Minister has been very eloquently trying to get across what has been going on. Whether he is going to execute it being here or being outside, I would like to know from the Hon. Deputy Minister.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Harshana Suriyapperuma, if you wish, you can answer or otherwise, we can move on to the next speaker.

The Hon. Nalin Bandara, you have 12 minutes from now.

[පූ.භා. 11.35]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි කිහිපයක් සහ මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ ගෙනෙන නියෝගයක් පිළිබඳව කථා කරන මේ අවස්ථාවේ විපක්ෂය වෙනුවෙන් මුලින්ම අදහස් දක්වන්න මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා.

ආනයන සහ අපනයන ගැන කථා කරද්දී ගරු මුදල් නියෝජ්‍ය ඇමතිතුමා කරුණු ගණනාවක් කිව්වා. මේ, විශේෂයෙන් අපේ අපනයනකරුවන් පිළිබඳව අපි වැඩි අවධානයක් යොමු කළ යුතු කාලයක්. අපි දන්නවා, කොවිඩ් වසංගතයෙන් පස්සේ ඇඟලුම් කර්මාන්තයට, පොල් ආශ්‍රිත කර්මාන්තවලට, පොල් ආශ්‍රිත අපනයනවලට, රබර් සහ තේ ආශ්‍රිත අපේ අපනයනකරුවන්ට විශාල වශයෙන් බලපෑම් එල්ල වුණු බව. අපි දන්නවා, මේ Simplified VAT - SVAT - එක සම්බන්ධයෙන් මෑතකදී ඔබතුමන්ලා ගත් තීන්දුවක් නිසා මේ සියලු කර්මාන්ත බරපතළ වශයෙන් බලපෑමකට ලක් වෙලා තිබෙන බව. මොකද, SVAT එක අයින් කරලා අපනයනකරුවන්ටත් සාමාන්‍ය පරිදි VAT එක පනවන්න ඔබතුමන්ලා කටයුතු කරමින් සිටිනවා. මම හිතන විධියට, මේක අපේ අපනයකරුවන්ට හොඳ දෙයක් නොවෙයි. මොකද, මේ ක්ෂේත්‍ර අපේ රටට විශාල වශයෙන් ඩොලර් ගේන්න කටයුතු කරන ක්ෂේත්‍ර. අපේ අපනයන පහත වැටුණොත්, ඒ තුළින් ඔබතුමන්ලාට, රටට, අපට -අපි සියලුදෙනාටම- බලපාන බරපතළ තත්ත්වයක් ඇතිවෙනවා, ගරු හර්ෂණ සූරියප්පෙරුම නියෝජ්‍ය අමාත්‍යතුමනි. ඒ නිසා ඔබතුමන්ලා මේ SVAT එක වෙනස් කරන්න යන්න එපා. ඔවුන්ට ලැබුණු ඒ පහසුකම, ඒ ක්‍රියාදාමයම ඔවුන් වෙනුවෙන් ක්‍රියාත්මක කරන්න. මොකද, එහෙම නොවුණොත් ඔවුන්ට වර්තමානයේ වෙළෙඳ පොළේ තිබෙන ප්‍රශ්නත් එක්ක තවත් ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිද්ධ වෙනවා.

විශේෂයෙන් පොල් කර්මාන්තය ගත්තාම, අද පොල් කර්මාන්තකරුවන්ට, පොල් ආශ්‍රිත කර්මාන්තකරුවන්ට අවශ්‍ය පොල් ප්‍රමාණය නැහැ. ඔබතුමන්ලා එක්තරා අවස්ථාවක කිව්වා, පොල් ගෙඩි මිලියන 200ක් ලංකාවට ගේනවා කියලා. හැබැයි, මේ එකක්වත් සිද්ධ වුණේ නැහැ. ඒ නිසා මේ කර්මාන්තය බරපතළ තත්ත්වයක තිබෙන්නේ. අද පොල් ලෙල්ලක් හොයාගන්න රට පුරා යන්න වෙලා තිබෙනවා. පොල් ලෙල්ලෙන් value add කරලා නොයෙක් නිෂ්පාදන export කරන අයට පොල් ලෙල්ලක් හොයාගන්න වෙලා තිබෙන්නේ රුපියල් 15ට, රුපියල් 20ට. මේක පොල් ගෙඩිය රුපියල් 15ට, රුපියල් 20ට තිබෙන කාලයක් නොවෙයි. දැන් පොල් ලෙල්ලකුත් රුපියල් 15ක්, රුපියල් 20ක් වෙලා තිබෙනවා. ඒ වාගේ කාලයක ඔබතුමන්ලා මේ SVAT එක අයින් කරලා සාමාන්‍ය පරිදි රටේ අනෙක් කර්මාන්තවලට, අනෙක් දේශීය ව්‍යාපාරවලට තිබෙන VAT එකම ඔවුන්ටත් ක්‍රියාත්මක කිරීම සුදුසු නැහැ. ඒ හරහා ඔවුන්ට තවත් අමතර මුදලක් දරන්න වෙනවා. ඒක claim කරන්න ගියාම අමතර කාලයක් ගත කරන්නත් වෙලා තිබෙනවා. ඒ වාගේම අපි දන්නවා, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ඔවුන්ට නොයෙක් විධියේ කරදර, අවහිරතා විඳින්නත් වෙනවා කියලා. ඒ සියල්ලක්ම මඟ හැරෙනවා, මේ තිබුණු SVAT system එක හරහා. ඒ නිසා මේ කටයුත්ත කරන්න එපා. මොකද, ඒ හරහා බරපතළ තත්ත්වයක් ඇති වෙනවා.

මම අද උදේත් මේ කාරණය කිව්වා, ගරු කථානායකතුමනි. අපනයන ගැන කථා කරද්දී, මම කථා කරන බිංගිරිය අපනයන සැකසුම් කලාපය ඇතුළුව අපේ රටේ කර්මාන්තකරුවන් දැන් ඖෂධ නිෂ්පාදනයට විශාල වශයෙන් යොමු වෙලා තිබෙනවා. ඒකෙදි ඒ ඖෂධ අපේ රටේ නිෂ්පාදනයට විතරක් නොවෙයි, export කරන්නත් ඔවුන්ට හැකියාව තිබෙනවා. දකුණු ආසියාවේ ලොකුම අපනයන සැකසුම් කලාපය වන, අපි මීට අවුරුදු 6කට කලින් ආරම්භ කරපු -මම නිර්මාණය කරපු- බිංගිරිය අපනයන සැකසුම් කලාපය හෙට අනිද්දා විවෘත වෙනවා. මේකෙන් අපේ රටේ ඖෂධ නිෂ්පාදන අවශ්‍යතාව සපුරා ගැනීමට විතරක් නොවෙයි, ඖෂධ export කරන්නත් අපට පුළුවන් වෙනවා. මට පෙරේදා මෙතැන Lobby එකේදි ගරු නලින්ද ජයතිස්ස සෞඛ්‍ය ඇමතිතුමා හම්බ වුණාම එතුමා කිව්වා, එතුමා මේ site එක visit කළා, "මාර වැඩක් කරලා තිබෙන්නේ, බොහොම හොඳයි, නලින්, මේ කටයුතු අපි ඉක්මනට අවසන් කරනවා" කියලා. එම අපනයන සැකසුම් කලාපයේ තිබෙන Synergy Pharmaceuticals Corporation (Pvt.) Limited කියන ඖෂධ නිෂ්පාදන ආයතනය

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

නිසා දැන් එවැනි අපනයන ඉලක්ක කරගත් තවත් ආයෝජකයන් කිහිපදෙනෙක් උනන්දුවෙන් ඉන්නවා, මේ බිංගිරිය අපනයන සැකසුම් කලාපයට එන්න.

අපි දැන් බෙහෙත් ගැන හැම දාම වාගේ කථා කරනවා. පිටරටින් ගෙනා සමහර බෙහෙත් පාවිච්චි කරපු අපේ මිනිස්සු පසුගිය කාලයේ මැරුණා. අද අපේ රටට විතරක් නොවෙයි, පිටරට යවන්න පුළුවන් උසස් තත්ත්වයේ බෙහෙත් නිෂ්පාදනය කරන්න පුළුවන් තැනට අපේ රට පත්වෙමින් තිබෙනවා. ඒකට දායක වුණු කෙනෙකු විධියට මම ඒ ගැන සතුටු වෙනවා. ගරු ඇමතිතුමනි, ඒ නිසා අපනයන ඉලක්ක කරගෙන ඖෂධ නිෂ්පාදනකරුවන්ට ඉස්සරහට යන්න නම්, ඔවුන්ට බදු පහසුකම් ලැබෙන්න ඕනෑ, බදු සහන ලැබෙන්න ඕනෑ, ඔවුන්ව දිරිමත් කරන්න ඕනෑ. ඒ නිසා මම ඔබතුමාගෙන් කරුණාවෙන් ඉල්ලීමක් කරනවා, ඒ සඳහා මැදිහත් වන්න කියලා. දැනටමත් ඒ අයගේ ඉල්ලීම් මුදල් අමාත්‍යාංශයට ලැබිලා තිබෙනවා. බිංගිරිය අපනයන සැකසුම් කලාපයේ ඉන්න ආයෝජකයන් වාගේම තව ආයෝජකයන් එතැනට එන්න ඕනෑ. මොකද, මම නියෝජ්‍ය ඇමතිවරයා විධියට ඒ අවස්ථාවේ බිංගිරියේ ආරම්භ කළේ අක්කර 1,000ක අපනයන සැකසුම් කලාපයක්. ඖෂධ නිෂ්පාදනය ඉලක්ක කරගෙනම අපට පුළුවන් නම් එතැනම තවත් කර්මාන්තශාලා ගණනාවක් ආරම්භ කරන්න ඒක වටිනවා. දැනටම කිහිපදෙනෙකු බිංගිරිය අපනයන සැකසුම් කලාපයේ ආයෝජන සඳහා සූදානම් බවත්, ඒ සඳහා බොහොම උනන්දුවෙන් ඉන්නවා කියලාත් මට ඊයේ නලින්ද ජයතිස්ස ඇමතිතුමා කිව්වා. ඒ නිසා ඒ අය දිරිමත් කරන්න අවශ්‍ය කටයුතු කරන්න කියන එකත් මේ අවස්ථාවේ මම සිහිපත් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2025 මාර්තු 19වැනි දා හැන්සාඩ් වාර්තාව මා ළඟ තිබෙනවා. මේ හැන්සාඩ් වාර්තාවේ මම කියා තිබෙනවා, බිංගිරිය ප්‍රාදේශීය සභාවේත්, උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේත් විපක්ෂය අනිවාර්යයෙන්ම බලය පිහිටුවනවා කියලා. මීට මාස තුනයි දවසකට කලින් තමයි මම එහෙම කිව්වේ. අද මම මෙතැනට ඇවිල්ලා කථා කරන්නේ එදා කියපු දේ ඒ විධියටම ඉෂ්ට කරලායි. අපේ දිස්ත්‍රික්කය නියෝජනය කරන ඇමතිතුමාත් මේ ගරු සභාවේ ඉන්නවා. බිංගිරියේත්, උඩුබද්දාවේත් ප්‍රාදේශීය සභාවල බලය පිහිටෙව්වා, විපක්ෂය. ඒ ගැන මම කිව්වේ මීට මාස 3කට කලින්. ඒ වාගේම මම එදා කිව්වා, පළාත් පාලන ආයතන 300න්, 100ක බලය විපක්ෂය පිහිටුවනවා කියලා. මම උදේ ගණන් හදලා බැලුවා. දැනට අප 58ක් පිහිටුවලා තිබෙන්නේ, තව 42කට තමයි යන්න තිබෙන්නේ. මම හිතන විධියට, අපට ශතකයත් ගහන්න පුළුවන් වෙයි. මොකද, තව පළාත් පාලන ආයතන බර ගාණක සභාපතිවරු, නගරාධිපතිවරු පත් කරන්න ඡන්ද පවත්වන්න තිබෙන නිසා. ඒ අනුව මීට මාස තුනකට කලින් මම කියපු දේ දැන් ඉෂ්ට වෙලා තිබෙනවා කියන එක මේ අවස්ථාවේ මම මතක් කරනවා.

මේ මැතිවරණයේදී රටේ ජනතාව හොඳ පණිවුඩයක් දුන්නා. ජනතාව මෙවර විපක්ෂයට අවස්ථාවක් දුන්නා, ගමේ බලය ලබා දීලා. ඒකට හේතුවක් තිබෙනවා. මොකද, මේ ආණ්ඩුව පත්වෙලා මාස 7ක්, 8ක් ගත වුණා. හැබැයි, වැඩක් වුණේ නැහැ, වැඩක් දකින්න නැහැ, ප්‍රගතියක් දකින්න නැහැ. හොරු අල්ලනවා-හොරු අල්ලනවා කියනවා විතරයි. බොහොම හොඳයි, හොරු අල්ලන එක. හැබැයි, ගමේ වැඩක් වෙන්නේ නැහැ, රටේ වැඩක් වෙන්නේ නැහැ, ව්‍යාපෘතියක් කෙරෙන්නේ නැහැ, බෝක්කුවක් පාලමක් හැදෙන්නේ නැහැ, දැවැන්ත කර්මාන්තශාලා හැදෙන්නේ නැහැ. අපනයන සැකසුම් කලාප 10ක් හදනවා කිව්වා, ගරු අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා ආවාම. දහයක් තියා තවම එකක්වත් හදලා නැහැ. ඒ නිසා අපට පෙනෙන්නේ නැහැ, රටේ ජනතාව බලාපොරොත්තු වුණු ආණ්ඩුවක් හැදිලා තිබෙනවා කියලා.

මේ අය කියනවා, පළාත් පාලන ආයතනවල බලය ඉල්ලන සමගි ජන බලවේගය ඇතුළු විපක්ෂයේ ඉන්න සියලුදෙනා හොරු කියලා. මම කියන්නේ මේකයි. එහෙම හොරු ඉන්නවා. එහෙම හිටපු හොරෙක් එක්ක පළාත් පාලන ආයතනයක් පිහිටුවීම ගැන තමයි මේ කියන්න යන්නේ. මොකද, කුරුණෑගල මහ නගර සභාවේ නගරාධිපතිවරයා පත් වෙනවා, මාලිමාවෙන්. නියෝජ්‍ය නගරාධිපතිවරයා විධියට පත් වෙන්නේ රිසාඩ් බදියුදීන් හිටපු ඇමතිතුමාගේ ACMC එකේ අසාර්දීන්. ඔහුව යෝජනා කරන්නේ පත් වුණු නගරාධිපතිවරයා. මේ අසාර්දීන් සම්බන්ධයෙන් පැමිණිලි ගණනාවක් තිබෙනවා. ඔහු කඩ කාමර දෙකක් තමන්ගේ බිරිඳගේ නමට ටෙන්ඩර් ක්‍රමවේදයකට පිටින් අරගෙන තිබෙනවා. දැන් ඒවා සම්බන්ධව ආණ්ඩුව කටයුතු කරනවාද? මේ සම්බන්ධව කරන්නාගොඩ කමිටු වාර්තාවේ පවා තිබෙනවා. ඒ, ආණ්ඩුකාරවරයාට කරපු පැමිණිල්ල අනුව පිහිටුවපු කමිටුව. ඊළඟට, building එකක් අනීතිකව ලබා ගැනීම සම්බන්ධයෙන් ඔහුට පැමිණිල්ලක් තිබෙනවා. කුරුණෑගල රෝහල ඉදිරිපිට රජයට අයත් පර්චස් 4.5ක් හොර ලියවිලි හදලා විකුණපු එකට පැමිණිල්ලක් තිබෙනවා. බුල්ඩෝසර කරපු බොහොම ප්‍රසිද්ධ බුවනෙක හෝටලය ගැන අපි දන්නවා නේ. ඒ, බුවනෙකබාහු රජුගේ රාජ සභා මණ්ඩපය ලෙස සැලකෙන පැරණි ගොඩනැඟිල්ලක්. ඒ සම්බන්ධ නඩුවට රුපියල් ලක්ෂ 116ක් ගෙවන්න ඒ ගත්ත තීන්දුවට අත ඔසවපු මන්ත්‍රීවරයෙක්. මේ විධියට චෝදනා ගණනාවක් තිබෙන ACMC එකේ කෙනෙක් තමයි නියෝජ්‍ය නගරාධිපති විධියට පත් කරන්නේ. ගස් කපපු ඒවා ගැන, පාස්කු ඉරිදා ප්‍රහාරය ගැන ඔබතුමන්ලා පසුගිය කාලයේ රිසාඩ් බදියුදීන් මැතිතුමාට එල්ල කරපු චෝදනා ගැන මම කියන්නේ නැහැ. නමුත් චෝදනා සහිත අසාර්දීන් තමයි අද ඔබතුමන්ලාගේ සහයෝගය අරගෙන කුරුණෑගල මහ නගර සභාවට මාලිමාවෙන් පත් වුණු නගරාධිපතිවරයාගේ යෝජනාවෙන් නියෝජ්‍ය නගරාධිපති බවට පත් වුණේ. ගරු සුජිත් සංජය මැතිතුමනි, විපක්ෂය එකතු වෙලා පළාත් පාලන ආයතනයක් හැදුවාම අපට කියනවා, නයි-මුගටි කියලා. මේ කවුද? නගර සභාවේ බලය පිහිටුවලා තිබෙන්නේ හොරුත් එක්ක එකතු වෙලා නේ. නියෝජ්‍ය නගරාධිපතිවරයා විධියට යෝජනා කරලා තිබෙන්නේ හොරෙකුගේ නමක් නේ. අපට නයි-මුගටි කියනවා. එතකොට මේ කවුද? දැන් ඔබතුමන්ලා මේවාට තීන්දු තීරණ ගන්නවාද? ඔබතුමන්ලා දැන් කරන්නාගොඩ කමිටු වාර්තාව අනුව මේ පුද්ගලයාට තිබෙන චෝදනා වෙනුවෙන් කටයුතු කරනවාද කියා අපට කියන්න. ඔබතුමන්ලා සුජාතභාවය ගැන බොහොම ඉහළින් කථා කරනවා. මුලින් කිව්වා, ස්වාධීන අය එකතු කරගන්නවා කියලා. දැන් බලනකොට ස්වාධීන අය විතරක් නොවෙයි, අපේ ප්‍රධාන පක්ෂයක මන්ත්‍රීවරයෙකු වන රිසාඩ් බදියුදීන් මැතිතුමාගේ පක්ෂයේ, -එතුමා ගැන ඔබතුමන්ලා කියපු ඒවා අපට මතකයි; කවි සීපද කියපුවා මතකයි- චෝදනා තිබෙන, ඒ චෝදනා ඔප්පු වුණු පළාත් පාලන ආයතනයක මන්ත්‍රීවරයෙක් නියෝජ්‍ය නගරාධිපතිවරයා බවට පත් කරලා තිබෙනවා. ඔහුගේ නෝනාගේ නමත් ඕනෑ නම් මම කියන්නම්. ඔන්න, ඔබතුමන්ලාගේ සුජාතභාවය. ඔබතුමන්ලාගේ සුජාතභාවය ඒකෙන්ම ඔප්පු වෙනවා. රිෆතුල්ලා කාසිම් කියන නමට තමයි ඒ කඩ කාමර ටික අරගෙන තිබෙන්නේ.

අපට බොහොම පැහැදිලිව කියන්න තිබෙන දේ තමයි, ඔබතුමන්ලාත් බලය වෙනුවෙන් ඕනෑම කුණු ගොඩක් කර ගහනවා කියන එක. ඕනෑම ගඳ වැඩක්, බලු වැඩක් කරන්න හොරෙක් එක්ක නොවෙයි, ප්‍රභාකරන් එක්ක හෝ එකතු වෙනවා. අපි නම් එහෙම අය එකතු කරගෙන නැහැ. අපේ ගමේ මන්ත්‍රීවරු ටික, ගමේ සභිකයෝ ටික එක්ක එකතු වෙලා තමයි අපි ඒ පළාත් පාලන ආයතන හදලා තිබෙන්නේ. ඒ නිසා අපට පේනවා, ඔබතුමන්ලා කියපු බයිලා, ඔබතුමන්ලා කියපු පරම පිවිතුරුභාවය, ඔබතුමන්ලාගේ සුජාතභාවය දැන් නැහැ කියලා. ඒ මුකුත්

නොවෙයි, බලය අහිමි වෙනකොට ඕනෑම බලු වැඩක්, ජඩ වැඩක් කරලා බලය ලබා ගැනීම තමයි ඔබතුමන්ලාගේ theory එක කියන එක දැන් ඔප්පු කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. අපට තිබෙන ප්‍රශ්නය තමයි රට ඉස්සරහට යන්නේ නැතිකම. රට ඉස්සරහට යන්නේ නැහැ. රට එක තැන පල් වෙනවා විතරක් නොවෙයි, රට reverse එකට යන්නේ. අද ව්‍යාපාරිකයෝ කථා කරලා අඬනවා. අද මිනිස්සුන්ට මිලදී ගැනීමේ හැකියාව නැහැ. ව්‍යාපාරයක් ඉදිරියට පවත්වාගෙන යන්න බැහැ. වැඩක් වෙන්නේ නැහැ. රජයේ ආයතනවල නිලධාරින් අත්සනක් ගහන්න මැළි වෙලා තිබෙනවා. ඒ වෙනුවෙන් එක වතාවක් නොවෙයි, දහ වතාවක් හිතනවා. ඔය ඕනෑම අමාත්‍යාංශයක නිලධාරියෙක් අද වැඩ කරනවාද, තීන්දු තීරණ ගන්නවාද කියලා බලන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon.Nalin Bandara, your time is up.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
විනාඩියකින් මගේ කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු විදුලිබල ඇමතිතුමනි, ඔබතුමා මට කියන්නකෝ, සියඹලාණ්ඩුවේ මෙගාවොට් 100ක solar panel ව්‍යාපෘතිය ගැන; ඒක එක තැන පල් වෙනවා. මම ඔබතුමාගෙන් ඒ ගැන මීට කලින් ඇහුවා. ඒකෙන් වැඩක් වෙන්නේ නැහැ. ඔබතුමන්ලාට වැඩක් ඉස්සරහට තල්ලු කරගෙන යන්න හැකියාව නැහැ. ඒ වාගේම තමයි, කෙරවලපිටියේ මෙගාවොට් 300ක හෝ මෙගාවොට් 350ක ඊළඟ අදියරේ විදුලි බලාගාරය. වැඩක් ඉස්සරහට යන්නේ නැහැ. මේ වැඩ එකක්වත් ඉස්සරහට යන්නේ නැත්තේ ඔබතුමන්ලා වැඩක් ඉස්සරහට තල්ලු කරගෙන යන්න දන්නේ නැති නිසායි. ඒ වාගේම අද වනකොට නිලධාරින් මැළි වෙලා තිබෙනවා, තීන්දු තීරණ ගන්න. මේ විදියට රටකට ඉස්සරහට යන්න බැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මට කථා කරන්න අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The next speaker is the Hon. R.M.Jayawardhana. You have 12 minutes.

[පූ.භා. 11.47]

ගරු ආර්.එම්. ජයවර්ධන මහතා (වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன - வர்த்தக, வாணிப மற்றும் உணவுப் பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. R.M. Jayawardhana - Deputy Minister of Trade, Commerce and Food Security)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ අපි පනත් කිහිපයක් යටතේ, නියෝගයක් සහ රෙගුලාසි පිළිබඳව සාකච්ඡා කරනවා. විශේෂයෙන්ම මේ පනත් යටතේ නියෝගය සහ රෙගුලාසි ගෙන එන්නේ ඇයිද කියන එක සම්බන්ධයෙන් අපේ නියෝජ්‍ය ඇමතිතුමා ඉතා පැහැදිලිව කරුණු ඉදිරිපත් කළා. අවුරුදු ගණනාවකට පස්සේ පසුගිය කාලයේ මේ විධියට සංශෝධනය කරන ලද පනත් කීපයක්ම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා, සම්මත කළ බව අපි දන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටකට නීතියක් අවශ්‍යයි. ඒ වාගේම චක්‍රලේඛ, නීති හැම එකක්ම නිකුත් කරන්නේ නැත්නම් ඒවා ඉදිරිපත් කරලා සම්මත කර ගන්නේ රටක් විධිමත් විධියට ඉදිරියට පවත්වාගෙන යන්නයි. හැබැයි අපි දන්නවා, පසුගිය දවස්වල ඉදිරිපත් කරපු සමහර පනත් සංශෝධන අවුරුදු 3ක්, 4ක් ඉදිරිපත් නොකර මේ පාර්ලිමේන්තුව තුළ තිබිලා තිබෙනවාය කියන එක. ඒ වාගේම අපි දන්නවා, පනතක් සංශෝධනය කිරීම හරහා බලාපොරොත්තු වෙන අරමුණ ඉෂ්ට කර ගන්න නම් ඒ පනත් කෙටුම්පත නීත්‍යානුකූලභාවයකට පත් කරන්න ඕනෑ බව.

අද දින ඉදිරිපත් කරලා තිබෙන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය ගත්තොත්, මුද්දර බදු කියලා අපි එකතු කරන බොහෝ දේවල් පළාත් සභා විෂය පථය තුළ පළාත් සභාවලට ලැබෙන ආදායම් මාර්ගයක් හැටියට තමයි තිබෙන්නේ කියන එක අප දන්නවා. හැබැයි, පළාත් සභාවලට ආදායම් ලැබෙන මේ මුද්දර බදු ක්‍රමය අවුරුදු 10කට, 15කට සැරයක්වත් සංශෝධනයට ලක් කළ යුතුයි. මොකද, රුපියල් 5,000කට තිබෙන වෙලාවක අය කරන බද්ද සියයට 1 නම්, රුපියල් 50,000ට තිබෙන වෙලාවට අය කරන බද්දත් සියයට 1 නම්, ඒක ඉස්සරහට යන එකක් නොවෙයි, එක තැන පල් වෙන එකක් කියලා අපි හිතනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම ගෙවල් කුලී අය කිරීම් වාගේ ඒවාට අදාළ සමහර පනත් තිබෙනවා. හැබැයි, අවුරුදු ගණනාවකට කලින් පනත හදන වෙලාවේ ඒ වෙනුවෙන් අය කරන මිල ගණන් තීරණය කරලා තිබෙනවා. ඒ පනත හදන කාලය වනවිට රාජ්‍ය සේවකයාගේ, නැත්නම් යම් ආදායමක් ලබන කෙනාගේ ආදායම රුපියල් 5,000 නම් ඒ කාලයේ නියම කරපු ගණනම තමයි ඒ ආදායම රුපියල් 100,000 වෙනකොටත් තවමත් මේ රට තුළ තිබෙන්නේ. ඒ නිසා අපි හිතනවා, යාවත්කාලීන විය යුතු පනත් තමයි එක පැත්තකින් මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ කියලා. මුද්දර බදුවලින් දැවැන්ත ආදායමක් නොලැබුණාට, එයින් ලැබෙන ආදායම පිළිබඳව මහා කතිකාවක් කර ගන්න බැරි වුණාට මේ පනත යටතේ නියෝගය ඉදිරිපත් කිරීම හරහා අපට පුළුවන්කම ලැබෙනවා, විශේෂයෙන් පළාත් සභාවලින් යම් ආදායම් මාර්ගයක් බලාපොරොත්තු වෙනවා නම්, ඒකට මෙමඟින් පුංචි හෝ උදව්වක් ලබා ගන්න.

අපි දන්නවා, මේ රටේ පුරවැසියෝ පසුගිය කාලයේ තමන්ට විදුලි බලයෙන් ධාවනය කරන බයිසිකලයක් ගන්න බලාපොරොත්තු වුණු බව. එහෙම සිහින දැකපු අය හිටියා. හැබැයි, එවැනි යෝජනාවක් ඇවිල්ලා තිබුණාට ඒ යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා යම් සීමා මායිම් ඉදිරිපත් කරලා තිබුණු තත්ත්වයක් තමයි පසුගිය කාලයේ තිබුණේ. ඒ සීමා මායිම් කඩලා ඒක නැවත ක්‍රියාත්මක කරන්න තමයි අපේ පැත්තෙන් අපි මේ උත්සාහයක් අරගෙන තිබෙන්නේ. සමහර විට හිතන්න පුළුවන්, මේ නිසා මහා ධනස්කන්ධයක්, ඩොලර් අපේ රටින් වෙන රටවලට පිට වෙයි කියලා. හැබැයි, අපි හිතනවා ඒ තුළින් මහා ධනස්කන්ධයක් අපේ රටින් වෙන රටවලට යන්නේ නැහැ කියලා. මොකද, පසුගිය කාලයේ ආර්ථික අර්බුදය විසින්, ආර්ථිකය කඩා වැටීම විසින් යම් සීමාවකට ලක් කරලා තිබුණු වාහන ආනයනය දැන් පටන් අරගෙන තිබෙනවා. වාහන ආනයනය කිරීම පටන් ගන්නකොට අපි ආර්ථික වශයෙන් වාගේම ආණ්ඩුවක් හැටියට සැලකිලිමත්

[ගරු ආර්.එම්. ජයවර්ධන මහතා]

වුණා, ඩොලර් අර්බුදයකට යයිද නැද්ද කියලා. නමුත් මේ දක්වා ආනයනය කරන ලද වාහන පිළිබඳව අපි නැවත සොයා බලනකොට අපට දැනගන්න ලැබුණා, එහෙම අර්බුදයකට ලක් වෙන මට්ටමක නොවෙයි එය තිබෙන්නේ කියන එක, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා රටක් ආර්ථික වශයෙන් ස්ථාවර තත්ත්වයට පත් වෙනකොට තමයි ආර්ථික ක්‍රියාවලිය ශක්තිමත් වෙන්නේ. කලින් කථා කළ මන්ත්‍රීවරයෙක් කිව්වා, ආර්ථිකය reverse එකට යන්නේ කියලා. හැබැයි, ආර්ථිකය reverse එකට යන්නේ කියලා එතුමාට පෙනුණාට, රටේ ජනතාවට ආර්ථිකය ඉස්සරහට යන බව තේරෙනවා. ව්‍යාපාරිකයන්ටත් තේරෙනවා. අනික් අයටත් තේරෙනවා. ඒ නිසා තමයි ලෝකයේ විශාල පිරිසක් ආයෝජකයෝ හැටියට ලංකාවට ආයෝජන ගෙනෙන බලාපොරොත්තුවෙන් ඉල්ලීම් කරන්නේ.

අපේ මොනරාගල වාගේ දිස්ත්‍රික්කයක් තුළ ආයෝජනය කරන්න කැමැත්ත දක්වන ආයෝජකයෝ ඕනෑ තරම් ඉන්නවා. කෘෂිකර්ම ක්ෂේත්‍රයේ, සංචාරක ක්ෂේත්‍රයේ ආයෝජනවලට ඉල්ලීම් කරන අයගේ සමහර ඉල්ලීම් ගැන අපට කල්පනා කරන්න වෙලා තිබෙනවා, ඒ ඔක්කෝටම ආයෝජනවලට අවස්ථාව හදලා දෙන්නේ කොහොමද කියලා. එතකොට එවැනි ආයෝජන සඳහා පෙලඹීමක් තිබෙන්නේ රට reverse එකට යන නිසා නොවෙයි. අපේ රට reverse එකට ගිය වකවානුවක් තිබුණා. ඒ reverse එකට ගිය වකවානුව ගැන අපි කාලයක් තිස්සේ අධ්‍යයනය කරලා බැලුවොත්, ඩොලර් බිලියන 23ක වාගේ පොඩි ගාණක ආයෝජන තමයි මේ රට තුළ කරලා තිබෙන්නේ. හැබැයි, එහෙම ආයෝජන නැති වෙන තැනකට රට පත් කරපු කට්ටිය අපට කියනවා, ආයෝජන නැතුව රට reverse එකට යනවා කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි. අපි දන්නවා, මේ වෙනකොට අපේ රටේ ජනතාව අතර දැවැන්ත උනන්දුවක් තිබෙන බව, ආර්ථිකය ස්ථාවර කර ගැනීම වෙනුවෙන් දේශීය වශයෙන් ආයෝජන කරන්න වාගේම දේශීය වශයෙන් ආයෝජන වැඩි කර ගන්නට. යම් ආර්ථික හැකියාවක් තිබෙන අය උනන්දු වෙනවා, තමන්ගේ ආයෝජනය අපේ රට තුළ සිදු කරලා ආර්ථිකයට දායක වෙන්න. දැන් බදු සහන දෙන්න කියලා කිව්වා. අපි දන්නවා, බදු සහන දිය යුතු ආයෝජන තිබෙන බව. ඒ වාගේම සමහර ආයෝජනවලට බදු සහන වෙනුවට, ආර්ථිකය ගොඩනගා ගැනීම වෙනුවෙන්, රජයට ආදායමක් උත්පාදනය කර ගැනීම වෙනුවෙන් බදු ලබා ගත යුතු ආයෝජනත් තිබෙනවා. මේවා පිළිබඳව ආණ්ඩුවට හොඳ අවබෝධයක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඊළඟට, පනත් සංශෝධනය කිරීම හරහා අපි මොනවාද බලාපොරොත්තු වෙන්නේ? කාලයක් තිස්සේ අපි දැක්කා, ආර්ථිකය හැකිළෙමින් තිබුණු බව. එලෙස හැකිළිලා තිබුණු ආර්ථිකය යම් විධියකට පුළුල් කර ගන්න අවශ්‍යයි. එලෙස ආර්ථිකය පුළුල් කර ගැනීමේදී ඒ සඳහා සක්‍රියව දායක වන යම් දේවල් තිබෙනවා නම්, ඒවා නිවැරදි කර ගැනීම වෙනුවෙන් අණපනත්, නීති සංශෝධනය කරන්න ඕනෑ. ඒ නිසා අපි හිතනවා, මේ පනත් හරහා ඉදිරියට යා හැකි ගමනක් තිබෙනවාය කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා ප්‍රාදේශීය සභා ජයග්‍රහණයක් ගැන කථා කළා. දැන් මට කියනවා ඇහුණා, එතුමා සෙන්චරිය ගහන්න ලැහැස්තියි කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රාදේශීය සභා ජයග්‍රහණයේ සෙන්චරියක් ගහන්න නම් තව ප්‍රාදේශීය සභා සියයක් විතර අලුතින් හදනකල් එතුමාට ඉන්න වෙනවා. පසුගිය දවස්වල අපි පළාත් පාලන ආයතන තුන්සිය ගණනකින් පළමුවන මොහොතේම පළාත් පාලන ආයතන 151ක බලය තනියම පිහිටෙව්වා. ඊට පස්සේ දවස ගණනේ එකින් එක බලය පිහිටුවනවා. පසුගිය දවස්වල තවත් පළාත් පාලන ආයතන 23ක බලය පිහිටෙව්වා. ඊයේ දවසේ පළාත් පාලන 06ක බලය පිහිටෙව්වා. මෙහෙම ගත්තාම එතුමා සෙන්චරිය ගහන්නේ කොහෙද? සෙන්චරිය ගහන්න අලුතින් තව පළාත් පාලන ආයතන නිර්මාණය කරන්න ඕනෑ.

අපි දන්නවා, ඒ පළාත් පාලන ආයතනවල බලය පිහිටුවීමේදී අනුගමනය කරන ක්‍රම පිළිබඳව, ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව. දැන් එතුමන්ලා කිව්ව විධියට ඒ අය ශුද්ධවන්තයෝ විධියට තමයි මේ කටයුත්ත කරන්නේ. හැබැයි, මේ ශුද්ධවන්තයෝ කියලා පෙන්නුවාට හිට ගත්තේ කොයි තැනද? අවුරුදු ගණනාවක් තිස්සේම රට තුළ සංවාදයට ලක් කළේ මොකක් ගැනද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පැවති ආණ්ඩුව, විශේෂයෙන් පොදුජන එක්සත් පෙරමුණු ආණ්ඩුව මේ රටේ ආර්ථිකයට විතරක් නොවෙයි, මේ රටේ මහජනතාවට කරපු හානිය පිළිබඳව කථා කළා. මෙතැනදී අපේ රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා ගැන කිව්වා. අපි අදත් ඒ ස්ථාවරයේ ඉන්නේ. අපට කිසි ප්‍රශ්නයක් නැහැ. ස්ථාවරය මොකක්ද? ස්ථාවරය තමයි, දූෂිතයාට එරෙහිව අපේ දේශපාලන කටයුතු කිරීම. දූෂිතයාට එරෙහිව දේශපාලන කටයුතු කිරීමේ අපේ ස්ථාවරයේ දශමයක වෙනසක් අපි කරලා නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ අනුව තමයි අද අපි මේ පළාත් පාලන ආයතනවලත් කටයුතු කරන්නේ. හැබැයි, එතුමන්ලාට මොකක්ද තිබෙන ස්ථාවරය?

පසුගිය කාලයේ විපක්ෂ නායකතුමා වේදිකාවේ ලොකු හඬකින් තමන්ගේ ශක්තිය පෙන්නුවා. "නෝ ඩීල්" කිව්වා. කාත් එක්කද? "නෝ ඩීල් හොරුත් එක්ක" කිව්වා. හැබැයි, "නෝ ඩීල් හොරුත් එක්ක" කියලා කියන කොට ඒ නෝ ඩීල් හොරු වෙලා තිබුණේ කවුද? පොදුජන පෙරමුණේ ආණ්ඩුව. ඒකත් එක්ක තමයි ඩීල් නැහැ කියලා කිව්වේ. හැබැයි, දැන් කවුරු එක්කද ඩීල් දාන්නේ? දැන් කථා කරපු නලින් මන්ත්‍රීතුමාගේ දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ, ජාතික ජනබලවේගයේ අපට මන්ත්‍රී ධුර 21ක් තිබුණා. හැබැයි, පොදුජන පෙරමුණට මන්ත්‍රී ධුර 6යි තිබුණේ. ආණ්ඩුව හදන්නේ මන්ත්‍රී ධුර 6ක් ගත්ත පොදුජන පෙරමුණ. සජබයට මන්ත්‍රී ධුර 9යි. ඒ විධියට ප්‍රාදේශීය සභාවේ බලය ලබා ගන්නේ කවුද? සභාපති වෙන්නේ මන්ත්‍රී ධුර 6ක් තිබෙන පොදුජන පෙරමුණේ කෙනා. ඒක වෙන්නේ කොහොමද? හොරුත් එක්ක නෙවෙයි කියපු කට්ටිය හොරුත් එක්ක ඉඳගෙන ඒවා හැදුවේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහා පැත්තේ ඉඳගෙන, තමන්ට මේ වෙලාවේ එල්ලෙන්න වැලක් නැති වෙනකොට වැලක් හොය හොය හිටියාට හැබැයි එල්ලෙන්න හම්බ වුණු වැල මොකක් වාගේද? දිරච්ච ලණුවක් වාගේ එකක්. දිරච්ච ලණුවක් වාගේ වැලක තමයි දැන් එල්ලෙන්නේ. ඇයි? ඊළඟ සැරේ ප්‍රාදේශීය සභාවල කාලය ඉවර වෙලා මැතිවරණයක් එනකොට තමන් මොකක්ද කරන්නේ, කාත් එක්කද තරග කරන්නේ කියලා තීරණය කර ගන්න බැහැ. ප්‍රාදේශීය සභාවල තමන්ට බලය හම්බ වුණා ලු. හැබැයි, අපි ප්‍රාදේශීය සභා 267ක තනියම, බහුතර මන්ත්‍රී සංඛ්‍යාවක් ගන්න කොට එතුමන්ලාට කීයකද ගන්න පුළුවන් වුණේ? ඒකත් ගත්තේ කීයද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේවා විහිළු. රටේ ජනතාවට මේවා විහිළු.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ පනත් සංශෝධනය කරමින් මේ රට යාවත්කාලීන කරන්න ඕනෑ. අවුරුදු ගණනක් එක දිගට පරණ දේ තියාගෙන, පරණ අදහස් තියාගෙන, පරණ වැඩ පිළිවෙළ තියාගෙන පරණ විධියට යනවා වෙනුවට නව විධියට කල්පනා කරලා දෛනිකව අලුත් වන ආර්ථික

ක්‍රියාවලියකට අපි පා තබන්න ඕනෑ. ඒ දෛනිකව අලුත්වන ආර්ථික ක්‍රියාවලියට යනකොට තිබෙන නීති-රීති වෙනස් කරන්න වෙනවා. සමහර නීති පනවා තිබෙන්නේ, 1800 ගණන්වල. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1800 ගණන්වල පැනවූ සමහර නීති අදටත් ක්‍රියාත්මක වෙනවා. නමුත් අපි විශ්වාස කරනවා අද ආර්ථිකය ගොඩ නහන්න ඕනෑ විධියට, ඒ ආර්ථිකය සැලසුම් කරන විධියට, අපේ ආණ්ඩුව සැලසුම් කර තිබෙන ආර්ථික ක්‍රියාවලිය ශක්තිමත් කරන විධියට ඉස්සරහට යන්න නම් තිබෙන අණපනත්, නීති රීති, සමහර චක්‍රලේඛ, සමහර දේවල් අලුත් කරමින් වෙනස් කරමින් කටයුතු කරන්න ඕනෑ බව. අද අපේ ආණ්ඩුව ඒ කටයුත්ත කරනවා. ඒ වෙනුවෙන් තමයි මේ පනත් සංශෝධනය අද ඉදිරිපත් කර තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. (Dr.) Pathmanathan Sathiyalingam. You have 20 minutes.

[மு.ப. 11.59]

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

நன்றி, கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே! இன்றைய தினம் இச்சபையில் சில சட்டத் திருத்தங்கள் முன்மொழியப்பட்டுள்ளன. குறிப்பாக, முத்திரைத் தீர்வை (விசேட ஏற்பாடுகள்) சட்டத்தின் கீழான கட்டளை, இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாட்டு) சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் என்பன முன்மொழியப்பட்டுள்ளன. உரிய நேரத்தில் நடைமுறைக்கு ஏற்ற வகையில் சட்டங்களைத் திருத்துவது இந்த நாட்டில் வாழ்கின்ற மக்களின் சுக வாழ்வுக்கும் நல்லாட்சிக்கும் மிகவும் இன்றியமையாதது. அந்த வகையில், முதலில் முத்திரைத் தீர்வை (விசேட ஏற்பாடுகள்) சட்டம் தொடர்பாக ஒருசில கருத்துகளைக் கூறலாமென நினைக்கின்றேன்.

நாங்கள் வாழுகின்ற வடக்கு மாகாணமானது, நீண்ட காலமாக யுத்தத்தால் பாதிக்கப்பட்ட ஒரு மாகாணம் என்பது உங்களுக்குத் தெரியும்! இந்த நாட்டில் யுத்தம் முடிவடைந்து 16 வருடங்களாகின்றன. இந்த 16 வருட காலப்பகுதியில் எங்களுடைய மாகாணத்தின் வருவாயை அல்லது அந்த மாகாணத்துக்குக் கிடைக்கக்கூடிய வருமானத்தின் அளவை அதிகரிப்பதற்கு எந்தவிதமான முதலீட்டு முயற்சிகளும் மேற்கொள்ளப்படவில்லை. இலங்கையில் இருக்கின்ற 9 மாகாண சபைகளில் வடக்கு, கிழக்கு மாகாண சபைகள் மிகவும் முக்கியமானவை. என்றாலும், ஓரளவு சுயமாக இயங்குவதற்குக் கூட எங்களுடைய மாகாண சபைக்குக் கிடைக்கின்ற வருமானமானது போதுமானதாக இல்லை. கிடைக்கின்ற வருமானத்தினூடாக மக்களுக்குச் சேவை செய்யக்கூடிய திறன் எங்களுடைய மாகாண சபைகளுக்கு மிகவும் குறைவாகவே இருக்கின்றது.

இன்று கொண்டுவரப்பட்டுள்ள முத்திரைத் தீர்வை (விசேட ஏற்பாடுகள்) சட்டத்தின் கீழான கட்டளையானது, மாகாண சபைகளுக்குக் கிடைக்கின்ற வருமானத்தின் ஊடாக அந்தந்த மாகாணங்களில் வாழுகின்ற மக்களுக்கான அடிப்படைத் தேவைகளை நிறைவேற்றிக் கொடுக்கக்கூடிய சந்தர்ப்பத்தை ஏற்படுத்தி இருக்கின்றது. அந்த வகையில், வடக்கு, கிழக்கு மாகாணங்களில் வாழ்கின்ற எங்களுடைய மக்களுக்கு மாகாண சபையால் வழங்கப்படவேண்டிய சேவைகளை மேலும் திருப்திகரமாக வழங்குவதற்கு இந்தச் சட்டத் திருத்தம் உதவியாக இருக்குமென நான் நம்புகின்றேன்.

அடுத்து, இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாட்டுச்) சட்டம் தொடர்பாகக் கூற வேண்டும். நிச்சயமாக அந்தந்தக் காலப்பகுதிக்கு ஏற்ற வகையில் இச்சட்டம் திருத்தப்பட வேண்டும். இதனுடன் சம்பந்தப்பட்ட முக்கியமானதொரு விடயத்தை நான் இந்தச் சபையில் குறிப்பிட விரும்புகின்றேன். இந்தச் சட்டத்தால் சுதேச மருத்துவம் மிகவும் மோசமாகப் பாதிக்கப்பட்டுள்ளது. குறிப்பாக, சித்த மருத்துவம் பாதிக்கப்பட்டுள்ளது. வடக்கு, கிழக்கு மாகாணங்களில் வாழ்கின்ற தமிழர்களில் பெரும்பாலானவர்கள் சித்த மருத்துவத்தைப் பயன்படுத்துகின்றனர். எங்களுடைய நாட்டில் ஆயுர்வேதம், சித்தம், யுனானி என மூன்று வகையான சுதேச மருத்துவத்துறைகள் இருக்கின்றன. இவற்றில் ஆயுர்வேத மருத்துவத் துறைக்கான மருந்துகள் இந்த நாட்டில் போதியளவு உற்பத்தி செய்யப்படுகின்றன. ஆனாலும், சித்த மருத்துவத்துக்குத் தேவையான மருந்துகள் மிகவும் குறைவான அளவிலே உற்பத்தி செய்யப்படுகின்றன. எங்களுடைய வடக்கு, கிழக்கு மாகாணங்களிலுள்ள இரண்டு பல்கலைக் கழங்களில் - யாழ்ப்பாண பல்கலைக்கழகத்திலும் கிழக்குப் பல்கலைக்கழகத்தின் திருகோணமலை வளாகத்திலும் - சித்த மருத்துவபீடம் இயங்கி வருகின்றது. இந்தப் பல்கலைக்கழகங்களில் பட்டம்பெற்று வெளியேறுகின்ற சித்த மருத்துவ பட்டதாரிகள் தாங்கள் கற்றறிந்த சித்த மருத்துவத்தினூடாக மக்களுக்குச் சேவை வழங்கும்போது, அம்மருந்துகளின் தட்டுப்பாட்டுக்கு முகங்கொடுக்கவேண்டிய நிலைக்கு ஆளாகின்றனர்.

எங்களுடைய நாட்டுக்கு வெளிநாடுகளில் இருந்து குறிப்பாக, இந்தியாவிலிருந்து இறக்குமதி செய்யப்படுகின்ற சித்த மருந்துகள் 'மருந்து' என்ற பிரிவுக்குள் உள்ளடங்காமல் அழகு சாதனப் பொருட்கள் - cosmetic items - என்ற பிரிவுக்குள் அடங்குவதால், அவற்றை இறக்குமதி செய்கின்ற இறக்குமதியாளர்கள் கூடிய வரியைச் செலுத்தவேண்டி இருக்கின்றது. இதனால் உள்நாட்டில் அவற்றின் விலை மிகவும் அதிகமாகக் காணப்படுகின்றது. இவ்வாறு சித்த மருந்துகள் அதிக விலைக்கு விற்கப்படுவதால் சித்த மருத்துவத்தை அடிப்படையாகக்கொண்டு இயங்குகின்ற வைத்தியசாலைகள் அல்லது அந்த மருத்துவத்தை அடிப்படையாகக் கொண்டு வைத்தியம் செய்கின்ற மருத்துவர்கள் பொது மக்களுக்குத் தரமான சேவையை வழங்கமுடியாத ஒரு சூழ்நிலை காணப்படுகின்றது. இன்றைய தினம் முன்வைக்கப்பட்டு இருக்கின்ற இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாட்டுச்) சட்டத்தின்கீழான ஒழுங்குவிதிகள் ஊடாகவும் சில திருத்தங்கள் கொண்டுவரப்பட்டு இருக்கின்றன. எதிர்காலத்தில் சித்த மருந்துகளை இறக்குமதி செய்யும்போது, அதனை அழகு சாதனப் பொருட்கள் என்ற பிரிவுக்குள் உள்ளடக்காமல், 'மருந்து' என்ற பிரிவுக்குள் உள்ளடக்கி இறக்குமதி செய்வதன்மூலம் மக்களுக்குக் குறைந்த விலையில் அவற்றைப் பெற்றுக்கொடுக்கலாம் என்பதை நான் இந்தச் சந்தர்ப்பத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

மேலும், வேலையாளர்களின் தேசிய குறைந்தபட்ச வேதனம் (திருத்தம்) சட்டமூலம் மிகவும் முக்கியமானது. இதன்மூலம், 2025ஆம் ஆண்டு ஏப்பிரல் மாதம் 1ஆந் திகதியிலிருந்து குறைந்தபட்ச நாளாந்த வேதனமாக 1,080 ரூபாயும் குறைந்தபட்ச மாதாந்த வேதனமாக 27,000 ரூபாயும் தொழிலாளர்களுக்குக் கிடைப்பதற்கு வாய்ப்பு

[ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා]

ஏற்பட்டிருக்கின்றது. அதேபோல, அடுத்த வருடம் சனவரி மாதம் முதலாம் திகதியிலிருந்து குறைந்தபட்ச மாதாந்தச் சம்பளம் 30,000 ரூபாய் எனவும் குறைந்தபட்ச நாளாந்தச் சம்பளம் 1,200 ரூபாய் எனவும் அதில் குறிப்பிடப்பட்டு இருக்கின்றது. எங்களுடைய நாட்டில் ஏற்பட்டிருக்கின்ற மிக மோசமான பொருளாதார நெருக்கடியால் அன்றாடம் கூலித்தொழில் செய்து வாழ்கின்ற மக்கள் மிகவும் சிரமப்பட்டுக்கொண்டு இருப்பது எல்லோரும் அறிந்த விடயமாகும். இந்தச் சம்பள அதிகரிப்பானது, குறைந்தபட்சம் இந்த மக்கள் அன்றாடம் தங்களுடைய குடும்பத்தைப் போஷிக்கக்கூடிய ஒரு நிலைமையையாவது ஏற்படுத்திக் கொடுத்து இருக்கின்றது.

நீண்ட காலமாகச் சம்பள அதிகரிப்பானது கொடுப்பனவாகத்தான் - allowanceஆகத்தான் - கொடுக்கப்பட்டதே ஒழிய, வேலையாட்களின் அடிப்படைச் சம்பளத்துடன் சேர்த்துக் கொடுக்கப்படவில்லை. தற்போதைய பொருளாதார நெருக்கடி நிலைமையில், மக்களுக்குரிய அடிப்படைத் தேவைகளை நிறைவேற்றுவதற்குப் போதுமான சம்பள அதிகரிப்பாக இது இல்லாவிட்டாலும்கூட, இந்த வேதன அதிகரிப்பானது அவர்களுடைய அடிப்படைச் சம்பளத்தோடு சேர்க்கப்படுவதென்பது மிகவும் முக்கியமானது. ஏனெனில், வேதன அதிகரிப்பை அடிப்படைச் சம்பளத்தோடு சேர்க்கும்போது, அது வேலையாட்களின் ஓய்வூதியத்துக்கு நன்மை பயப்பதுடன், பல்வேறு நன்மைகளையும் அவர்கள் பெற்றுக்கொள்ளக்கூடியதாக இருக்கும். அந்த வகையில், இந்தத் திருத்தச் சட்டமூலத்தை நான் வரவேற்கின்றேன். நான் ஏற்கெனவே குறிப்பிட்ட விடயங்களை உள்ளடக்கும் வகையில், எதிர்காலத்தில் உரிய சட்டங்களைத் திருத்துவதனூடாக எங்களுடைய நாட்டில் வாழுகின்ற மக்களுக்குச் சிறந்ததொரு வாழ்க்கையை அமைத்துக் கொடுக்கக்கூடிய சந்தர்ப்பத்தை ஏற்படுத்தலாம்.

அடுத்து, எங்களுடைய மக்கள் எதிர்கொள்கின்ற சில முக்கியமான விடயங்களை நான் இந்தச் சபைக்கு எடுத்துக் கூற விரும்புகின்றேன். எங்களுடைய நாட்டில் இருக்கின்ற தனியார் கல்வி நிறுவனங்களை ஒழுங்குபடுத்துவதற்கான சட்டரீதியான முறைமையொன்று இல்லாமல் இருப்பதை நான் மிக முக்கியமானதொரு விடயமாகப் பார்க்கின்றேன். மறைந்த கலாநிதி சி. டபிள்யு. டபிள்யு. கன்னங்கரா அவர்கள் இந்த நாட்டில் 1945ஆம் ஆண்டு இலவசக் கல்வியை அறிமுகப்படுத்தினார். இலவசக் கல்வியூடாக இந்த நாட்டில் வாழுகின்ற அனைத்து மக்களும் அடிப்படைக் கல்வியைப் பெறக்கூடியதாக இருந்ததால்தான் இன்று ஆசியாவில் இலங்கையும் எழுத்தறிவு வீதம் கூடிய ஒரு நாடாக இருக்கின்றது. இந்த நாட்டு மக்களின் கல்வி அறிவை மேம்படுத்துவதற்கு அரச கல்வி நிறுவனங்கள் எவ்வளவு முக்கிய பங்களிப்பை வழங்குகின்றதோ, அதேபோல் தனியார் கல்வி நிறுவனங்களும் முக்கிய பங்களிப்பை வழங்குகின்றன.

அரச கல்வி நிறுவனங்களுக்குச் சமாந்தரமாகத் தனியார் கல்வி நிறுவனங்களும் மாணவர்களுடைய கல்வி விருத்திக்கு முக்கிய பங்களிப்பைச் செய்யக்கூடியதாக இருக்கின்றன. இன்றைய காலகட்டத்தில் கல்வித்துறையில் தனியார் கல்வி நிறுவனங்கள் என்பது தவிர்க்க முடியாத ஒன்றாகக் காணப்படுகின்றன. எனினும், தனியார் கல்வி நிறுவனங்களை முறையாகக் கண்காணிப்பதற்கான எந்தவொரு பொறிமுறையும் இதுவரை சட்ட ரீதியாக உருவாக்கப்படவில்லை என்பது மனவருத்தத்துக்குரிய விடயமாகும். இதனால் இந்த நாட்டில் பெரும்பாலான மாணவர்கள் தரமற்ற கல்வியைப் பெறுவது மாத்திரமல்லாமல், அவர்கள் ஏமாற்றப்படுவதையும் நாங்கள் காணக்கூடியதாக இருக்கின்றது. எனவே, தனியார் கல்வி நிலையங்களை முறையாகக் கண்காணிப்பதற்கான ஒரு சட்டப்பொறிமுறை உருவாக்கப்பட வேண்டுமென்பதை நான் இந்தச் சபையில் முன்வைக்கின்றேன்.

இலங்கையில் கல்வியும் சுகாதாரமும் இரண்டு முக்கிய துறைகளாகும். இந்த நாட்டில் கல்வியைப் போலவே சுகாதார சேவையும் இலவசமாகக் கிடைக்கின்றது. அதனூடாக மக்கள் நிறையப் பயன்களைப் பெறுகின்றார்கள். இந்த நாட்டில் இலவச சுகாதார சேவைக்குச் சமனாக தனியார் சுகாதார நிறுவனங்களும் மக்களுக்கான அடிப்படை சுகாதார சேவையை வழங்குகின்றன. எங்களுடைய நாட்டில் தனியார் சுகாதார நிறுவனங்களைக் கட்டுப்படுத்துவதற்கென சட்டம் இருக்கின்றது. அதேபோல், அவற்றைக் கண்காணிப்பதற்கும் சட்டம் இருக்கின்றது. அதுமாத்திரமன்றி, அதனை நடைமுறைப்படுத்துவதற்கான அனைத்து ஒழுங்குகளும் சுகாதாரத் துறையில் ஏற்படுத்தப்பட்டு இருக்கின்றது. இவ்வாறு தனியார் சுகாதார நிறுவனங்களைக் கண்காணிப்பதற்கு ஒரு பொறிமுறையை ஏற்படுத்தி இருப்பதுபோல, தனியார் கல்வி நிறுவனங்களையும் கண்காணிப்பதற்கு ஒரு பொறிமுறையை ஏற்படுத்த வேண்டும்.

தனியார் கல்வி நிறுவனங்களால் வழங்கப்படும் கல்வியின் தரம் மிகவும் முக்கியமானது. இன்று எமது நாட்டில் பல்லாயிரக்கணக்கான தனியார் கல்வி நிறுவனங்கள் இருக்கின்றன. அவை தரமான கல்வியை வழங்குகின்றனவா என்பதைக் கண்காணிப்பதற்கு இதுவரை எமது நாட்டில் ஒரு பொறிமுறை உருவாக்கப்படவில்லை. அதேபோல, தனியார் கல்வி நிறுவனங்களில் கற்பிக்கின்ற ஆசிரியர்கள் தொடர்பிலும் அவர்களுடைய கல்வித் தகைமை தொடர்பிலும் கண்காணிப்பதற்கென சட்டரீதியான எந்தவொரு பொறிமுறையும் இதுவரை எமது நாட்டில் உருவாக்கப்படவில்லை. மேலும், ஒரு கல்வி நிறுவனத்துக்கு அடிப்படையாக இருக்கவேண்டிய உட்கட்டுமான வசதிகள் தனியார் கல்வி நிறுவனங்களில் இருக்கின்றதா என்பதைப் பரிசோதிப்பதற்கான சட்ட ரீதியான எந்தவொரு ஒழுங்கும் எமது நாட்டில் இல்லை. அதேபோல், தனியார் கல்வி நிறுவனங்களில் காணப்படவேண்டிய அடிப்படை சுகாதார வசதிகளான குடிநீர் வசதி, மலசலகூட வசதி என்பன முறையாக இருக்கின்றதா என்பதைக் கண்காணிப்பதற்கும் எந்தவோர் ஏற்பாடும் இதுவரை எமது நாட்டில் இல்லை.

தனியார் கல்வி நிறுவனங்கள் செய்கின்ற சேவையைப் பாராட்டுகின்ற அதேநேரத்தில், அங்கு எங்களுடைய மாணவர்களுக்குத் தரமான கல்வி வழங்கப்படுகின்றதா? மாணவர்களுக்குத் தேவையான அடிப்படை வசதிகள் அங்கு இருக்கின்றதா? என்பதைக் கண்காணிப்பதற்கென ஒரு சட்டம் கொண்டுவரப்பட வேண்டும் என்பதையும் நாங்கள் வலியுறுத்துகின்றோம். இந்த விடயத்துடன் நீங்கள் எல்லோரும் இணங்குவீர்கள் என நான் நினைக்கின்றேன்.

அடுத்து, tuition classes நடைபெறுகின்ற கல்வி நிலையங்களில் போதியளவு வெளிச்சம் இருக்கின்றதா? காற்றோட்டம் இருக்கின்றதா? என்றால், இல்லை! சில தனியார் கல்வி நிலையங்கள் தகரக் கொட்டில்களாகக்

காணப்படுகின்றன. அங்கு கற்றல் கற்பித்தல் செயற்பாடு நடைபெறாத சந்தர்ப்பங்களில் தெரு நாய்கள் அல்லது கால்நடைகள் உறங்குவதைக் காணக்கூடியதாக இருக்கின்றது. இதனால் அங்கு கல்வி கற்கின்ற மாணவர்களுக்குத் தொற்றுநோய் ஏற்படுவதற்கு வாய்ப்பு இருக்கின்றது. குறிப்பாக, அங்கு இரவு நேரத்தில் உறங்குகின்ற நாய்கள் அல்லது கால்நடைகளில் இருந்து வருகின்ற உண்ணி, தெள்ளு போன்றவற்றால் மாணவர்களுக்குச் சில நோய்கள் ஏற்படுவதற்கு வாய்ப்பு இருக்கின்றது. இதை நாங்கள் கவனத்திற்கொள்ள வேண்டும். ஆகவே, இந்தப் பாராளுமன்றக் காலத்தில் நிச்சயமாக தனியார் கல்வி நிலையங்களைக் கண்காணிப்பதற்குப் பொருத்தமானதொரு சட்டத்தை உருவாக்க வேண்டும் என்பதோடு, அந்தச் சட்டத்தை நடைமுறைப்படுத்தக்கூடிய அதிகாரத்தை அல்லது சட்ட ரீதியான வலுவை கல்வி அமைச்சு ஊடாக மாவட்ட மட்டத்தில் இருக்கின்ற கல்வித் திணைக்களத்துக்குக் கொடுக்க வேண்டும் என்பதை நான் இந்தச் சபையில் முன்வைக்க விரும்புகின்றேன்.

அடுத்து, எங்களுடைய மாவட்டம் தொடர்பான முக்கியமானதொரு பிரச்சினையை இங்கு முன்வைக்க விரும்புகின்றேன். எங்களுடைய வடக்கு மாகாணத்தில் இரண்டு தாதியர் பயிற்சிக் கல்லூரிகள் இருக்கின்றன. ஒன்று, யாழ்ப்பாணத்திலும் மற்றையது வவுனியாவிலும் இருக்கின்றது. வவுனியாவில் இருக்கின்ற தாதியர் பயிற்சிக் கல்லூரி 2008ஆம் ஆண்டு உருவாக்கப்பட்டது. அப்போது இந்த நாட்டில் யுத்த சூழ்நிலை காணப்பட்டது. வவுனியா வைத்தியசாலை ஒரு தள வைத்தியசாலையாகத்தான் அப்போது காணப்பட்டது. இதனால் இந்த தாதியர் பயிற்சிக் கல்லூரி நேரடியாக அநுராதபுரம் போதனா வைத்தியசாலையின் மேற்பார்வையின் கீழ் இயங்கி வந்தது. இப்பொழுதும் அவ்வாறுதான் இயங்கி வருகின்றது. இந்தத் தாதியர் பயிற்சிக் கல்லூரி அநுராதபுரம் போதனா வைத்தியசாலையின் மேற்பார்வையின்கீழ் இருந்தாலும், அதன் அன்றாட நடவடிக்கைகளுக்குத் தேவையான சகலவிதமான நிதியும் வவுனியா பிராந்திய சுகாதார சேவைகள் பணிமனைக்கு ஊடாகத்தான் வழங்கப்படுகின்றது. இந்தத் தாதியர் பயிற்சிக் கல்லூரியில் ஒவ்வொரு batchஇலும் 75-100 தாதிய மாணவர்களுக்குப் பயிற்சி அளிக்கப்படுகின்றது. பின்னர், அவர்கள் இலங்கையில் இருக்கின்ற சகல மாகாணங்களிலும் உள்ள வைத்தியசாலைகளுக்கு நியமிக்கப்படுகின்றார்கள். இந்தத் தாதியர் பயிற்சிக் கல்லூரியை நிரந்தரமாக அநுராதபுர போதனா வைத்தியசாலையின் மேற்பார்வையின்கீழ் கொண்டுவர இருப்பதாக அல்லது அதனை மூடக்கூடிய அபாயம் இருப்பதாகச் சொல்லப்படுகின்றது. வவுனியாவில் இருக்கின்ற இந்தத் தாதியர் பயிற்சிக் கல்லூரியை சகல வளங்களோடு tertiary care institutionஆகச் செயற்பட்டுக்கொண்டு இருக்கின்ற வவுனியா மாவட்டப் பொது வைத்தியசாலையின் மேற்பார்வையின்கீழ் கொண்டுவந்து, அதனூடாக அதனை நடத்துவதற்கான நிதியை வழங்குவதன்மூலம் அப்பயிற்சிக் கல்லூரியைச் சிறப்பாக இயக்கலாம். எனவே, அதற்குரிய வசதி வாய்ப்புகளை ஏற்படுத்திக் கொடுக்க வேண்டுமென்ற கோரிக்கையை இந்தச் சபையில் முன்வைத்து, எனக்குக் கிடைத்த சந்தர்ப்பத்துக்கு மீண்டும் நன்றிகூறி, விடைபெறுகின்றேன்.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Thilanka U. Gamage. You have 11 minutes.

[අ.භා. 12.18]

ගරු තිලංක යූ. ගමගේ මහතා
(மாண்புமிகு திலங்க யூ. கமகே)
(The Hon. Thilanka U. Gamage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කථාව ආරම්භ කිරීමට ප්‍රථමයෙන්ම කිව යුතු කාරණයක් තිබෙනවා. ඒ තමයි, අද ජාතික ශිෂ්‍ය වීර දිනය. විශේෂයෙන්ම මේ රටේ නිදහස් අධ්‍යාපනය සුරැකීම තම යුතුකමක් නොව, තම දෙඋර මත පැටවුණ වගකීමක් කර ගත්ත ඒ ආදරණීය සොයුරන් වෙනුවෙන් අපේ උත්තමාචාරය පුද කරන්නට ඕනෑ.

"අකුරු සොයන පීඩිත දූ දරුවන්ට -
අකුරු මුවා කළ තිරපට බිඳින්නට
අතැර තමන් ලද සුව පිරි හෙට දවස -
සැමට කලින් අවදි වූ ආදර සොයුර
උපන්දා සිට ම අපමණ දුක් වැලඳ -
මරණය තෙක්ම ජීවිතයක් නොම වින්ද
සුවහස් ගණන් මේ රට මහ ජනයින්ට -
අසීමිතව පෙම් කළ නුඹ විරුවන්ය..."

එසේ කියමින් මම විශේෂයෙන්ම ඔවුන්ට උත්තමාචාරය පුද කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ගාල්ල දිස්ත්‍රික්කයට සුවිශේෂ දවසක්. අද ගාල්ල මහ නගර සභාවේ බලය ජාතික ජන බලවේගය සතු වුණා. ඒ වෙනුවෙන් සහාය දැක්වූ ඒ ගාල්ලේ ජනතාව ඇතුළු සියලුදෙනාටම ස්තුතිය පුද කරන්න මා මෙය අවස්ථාවක් කර ගන්නවා.

මට පෙර කථා කරපු විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමෙක් කිව්වා, ව්‍යාපාර කඩාගෙන වැටෙනවා, ව්‍යාපාර හිමියෝ අඬනවා, ජනතාවගේ ක්‍රය ශක්තිය පහළ වැටෙනවා කියලා. එතුමාට මම කියන්න ඕනෑ, ව්‍යාපාර කඩාගෙන වැටිලා තිබෙනවා නම් ඒ කඩා වැටිලා තිබෙන්නේ, හොර ජාවාරම්කාරයන්ගේ ව්‍යාපාර, කසිප්පුකාරයන්ගේ ව්‍යාපාර බව. එහෙම නැතුව සාධාරණ ක්‍රමයකට ව්‍යාපාර කරගෙන යන කිසිදු ව්‍යාපාරයක් කඩාගෙන වැටිලා නැහැ. සෑම ව්‍යාපාරයක්ම අද වන විට දිගින් දිගටම ඒවායේ ආයෝජන පුළුල් කරමින්, අනාගතය පිළිබඳව සුබ දැක්මක් සහිතව ඉදිරියට ගමන් කරනවා. හැබැයි, අපි හොර ජාවාරම්කරුවන්ගේ ව්‍යාපාර තවදුරටත් මේ රටේ ක්‍රියාත්මක වෙන්න ඉඩ තබන්නේ නැහැ. ඒ ව්‍යාපාර අපි නතර කරනවා කියන එක විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ.

ඊළඟ කියනවා, ජනතාවගේ ක්‍රය ශක්තිය පහළ වැටී තිබෙනවා කියලා. අපි දන්නවා පසුගිය කාලයේ භාණ්ඩවල මිල ගණන් ඉතා අධික ලෙස ඉහළ ගිහින් තිබුණ බව. නමුත්, අපේ ආණ්ඩුව බලයට පත් වුණ අවස්ථාවේ සිට භාණ්ඩවල මිල ගණන් ක්‍රමක්‍රමයෙන් පහළ බසිමින් තිබෙනවා. අපි දන්නවා ක්‍රය ශක්තිය අඩු වන්නේ කොහොමද කියලා. ක්‍රය ශක්තිය පහළ වැටෙන්න නම් මූර්ත වැටුප අඩු වෙන්න ඕනෑ. එහෙම නම් එක්කෝ අපේ වැටුප අඩු වෙන්න ඕනෑ. එහෙම නැත්නම් භාණ්ඩවල මිල ගණන් ඉහළ යන්න ඕනෑ. හැබැයි, මේ වන විට එක පැත්තකින් භාණ්ඩවල මිල ගණන් පහළ යමින් තිබෙනවා. අනෙක් පැත්තෙන්, පසු ගිය අය වැයෙන් අපි ජනතාවගේ ආදායම, ඔවුන්ගේ මූල්‍යමය ආදායම ඉහළ යෑම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග අරගෙන තිබෙන නිසා මේ වන විට ඔවුන්ගේ ආදායම ඉහළ ගිහින් තිබෙනවා. අපි ඔවුන්ගේ වැටුප වැඩි කරලා තිබෙන්නේ. එම නිසා එක පැත්තකින් වැටුප

[ගරු තිලංක යූ. ගමගේ මහතා]

වැඩි වීම, අනෙක් පැත්තෙන් භාණ්ඩ මිල ගණන් පහළ යෑම තුළ කිසිසේත්ම ක්‍රය ශක්තිය පහළ වැටෙන්න හේතුවක් නැහැ. විපක්ෂය හැම දාම කළේ පාර්ලිමේන්තුවේ සභා ගර්භය තුළ බොරු වපුරමින් මේ රටේ ජනතාව මේ විධියට මුළා කරන්න උත්සාහ කිරීමයි. එම නිසා මම විශේෂයෙන්ම ඒ ගැන මතක් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළ තව විශේෂ කාරණයක් මම මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෑ. පසුගිය කාලයේ බාල ඖෂධ සම්බන්ධ ගැටලුවක් තිබුණා. බාල ඖෂධ ගෙන්වීම සම්බන්ධව හිටපු සෞඛ්‍ය අමාත්‍ය කෙහෙළිය රඹුක්වැල්ලට චෝදනා එල්ල වුණා. දැන් නිශ්චිතව තහවුරු වෙලා තිබෙනවා, ඒ ඖෂධවල ලුණු අඩංගු වෙලා තිබෙන බව. පසුගිය කාලයේ රටේ ලුණු හිඟ වනකොට ඒ පිළිබඳව කඳුළු හෙළපු අය, එම ඖෂධවල ලුණු අඩංගු කරලා මිනිස් ජීවිතවලට කළ හානිය පිළිබඳව කථා කරන්නේ නැහැ. අපට ඒ පිළිබඳව කනගාටුවක් තිබෙන්නේ. එම ඖෂධවල මාරාන්තික බැක්ටීරියා වර්ග අඩංගු වෙලා තිබුණු නිසා ජීවිතවලට හානියක් සිදු වෙලා තිබෙනවා. මිනිස් ජීවිත ඝාතනය වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මම ඒ ගැන මතක් කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ තවදුරටත් එවැනි දේවල් සිදු වන්නේ නැහැ. අපි මේ රටේ ජනතාවට වග කියන රජයක්. අපි යහපත් රටක් නිර්මාණය කරලා තිබෙනවා. අපට මතකයි, බාල ඖෂධ සම්බන්ධ කාරණයේදී හිටපු සෞඛ්‍ය අමාත්‍ය කෙහෙළිය රඹුක්වැල්ලට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ බව. ඒ මොහොතේ විපක්ෂයේ ඉදිරි පෙළ අසුන් ගෙන හිටපු මන්ත්‍රීවරු පවා ඒ විශ්වාස භංග යෝජනාවට විරුද්ධව ඡන්දය දුන්නා. එදා කෙහෙළිය රඹුක්වැල්ල වෙනුවෙන් පෙනී සිටි සමහර අයට පසුගිය මහ මැතිවරණයෙන් ගෙදර යන්න වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මම තවත් කාරණයක් මතක් කරනවා. මගේ බද්දේගම ආසනය ඇතුළු ගාල්ල දිස්ත්‍රික්කයේ සියලු මන්ත්‍රීවරු ඒ වෙනුවෙන් අත ඉස්සුවා. මිනිස් ජීවිත බිල්ලට දෙමින් එවැනි ඖෂධ ගෙන්වපු ඒ ඇමතිවරයා බේරා ගන්න එතුමන්ලා අත ඉස්සුවා. මගේ ගාල්ල දිස්ත්‍රික්කයේ ජනතාව නිවැරදි තීන්දුවක් අරගෙන ඒ සියලුදෙනා මේ පාර්ලිමේන්තුවෙන් එළියට වීසි කර දමන්න, ඉවත් කරන්න කටයුතු කර තිබෙනවා. ඒ නිසා මගේ ගාල්ල දිස්ත්‍රික්කයේ ජනතාවට මම ආචාරය පුද කරනවා, හිටපු සෞඛ්‍ය ඇමතිවරයා වෙනුවෙන් අත උස්සපු මගේ ආසනයේ හිටපු මන්ත්‍රීවරයා ඇතුළු සියලුදෙනා අද ගෙදර යවලා තිබීම වෙනුවෙන්. මේ උදවිය බලයේ හිටපු කාලයේ ඒ උදවියගේ පවුලට කර ගත් අය. ඒ සියලුදෙනා විශාල වශයෙන් සොරකම් කරලා, වංචා කරලා තමුන්ගේ පවුලට ධනය ගොඩ ගසා ගත්තා. හැබැයි, ඒ අය රට හැදුවේ නැහැ. දැන් ඒ අය එනවා, අපට රට හදන හැටි කියා දෙන්න. හැමදාම මේ පාර්ලිමේන්තුව ඇතුළේ ඒ අය විශාල කාලයක් ගන්නවා, අදාළ මාතෘකාව ගැන කථා නොකර අපට මේ රට හදන හැටි ගැන කියා දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ වන නියෝගය සහ 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි පිළිබඳව තමයි අද අපි විවාද කරන්නේ. මුද්දර ගාස්තු පිළිබඳව අපි කථා කළොත්, මේක අවුරුදු 20ක් වාගේ කාලයක් තුළ යාවත්කාලීන වෙලා නැහැ. අද තමයි අපි ඒ කටයුත්ත කරන්නේ. නමුත්, මේක අප්‍රේල් මාසයේ සිට ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. මේ යෝජනාව මාස තුනක් ක්‍රියාතමක වෙමින් තිබියදී තමයි අපි අද විවාදයට ගන්නේ. රුපියල් 1,000කට රුපියල් 10ක් ලෙස තිබුණු මුද්දර ගාස්තුව දැන් රුපියල් 20ක් බවට පත් වෙලා තිබෙනවා. මේක බදු වැඩි කිරීමක් විධියට අපට පෙණුනාට, පළාත් පාලන ආයතනවලට තමයි මේ මුද්දර ගාස්තු අය වෙන්නේ. ඒ නිසා මධ්‍යම ආණ්ඩුව කළ යුතු වියදම් ප්‍රමාණය අඩු වෙනවා. එතකොට මධ්‍යම ආණ්ඩුවේ වියදම් ටික අඩු වෙනවා. ඒ මුදල් පළාත් සභාවලට යනවා. ගමේ තිබෙන, බිම් මට්ටමේ තිබෙන විශාල වැඩ කොටසක් පළාත් සභා හරහා කරන්න අවශ්‍ය මුදල් ප්‍රමාණයක් මේකෙන් එකතු වෙනවා. ජනතාව බදු ගෙවීම පිළිබඳ ගැටලුවක් නැහැ. ඇත්තටම පසුගිය කාලයේම වුණේ ජනතාව බදු ගෙව්වත් ඒ බදුවලට වෙන දෙයක් නිශ්චිතව කියන්න බැරි වුණු එකයි. එදා විශාල වශයෙන් බදු වංචා වුණා; සොරකම් වුණා; දූෂණ වුණා. හැබැයි මේ හැම බදු මුදලක්ම, හැම සතයක්ම අපි ආරක්ෂා කරනවා. මේ ආකාරයට බදුවලින් එකතු කර ගන්නා සෑම රුපියලක්ම, සෑම සතයක්ම මේ රටේ ජනතාව වෙනුවෙන් නැවත අපි යොදවනවා. ඒ මුදල් ටික මේ බිමට වියදම් කරලා අපි මංමාවත් ටික හදනවා; යටිතල පහසුකම් ටික දියුණු කරනවා. ඒ මුදල් අධ්‍යාපනයට, සෞඛ්‍යයට ලබා දීලා ඒවා දියුණු කරන්නත් අපි කටයුතු කරනවා. ඒ මුදල් මේ රටේ ජනතාවට, ගම් බිම්වල ඉන්න අහිංසක දුප්පත් ජනතාවට සේවා සපයන මුදලක් බවට පත් වෙනවා. අපි එවැනි ආකාරයෙන් තමයි මේ බදු මුදල් හිතාමතා අරපරිස්සමින් භාවිත කරන්නේ.

ඒ වාගේම තමයි, ආනයන හා අපනයනවලට අදාළව තිබෙන සංශෝධනය ගත්තාම, පසුගිය ආර්ථික අර්බුදයත් එක්ක බොහෝ භාණ්ඩ ගෙන්වන එක නතර වුණා. ආර්ථික අර්බුදයත් එක්ක බලපත්‍ර තිබෙන ඇතැම් ඒවාත් ආනයනය කිරීම් නතර කළා වාගේම, එහෙම නොවෙන ඒවා ගෙන්වීමත් තාවකාලිකව අත්හිටුවීම් කළා. නමුත්, ක්‍රම ක්‍රමයෙන් මේ රට ආර්ථික අර්බුදයෙන් මුදාගෙන මේ රට හරි දිශානතියකට අරගෙන යනකොට, ඒ අත්හිටුවීම් අපි නැවත විවෘත කරමින් ඉන්නවා. ඒ විධියට අත්හිටුවා තිබුණු දේවල් අතරින් දැන් නැවත අපි මෝටර් රථ ආනයනය කරන්න අවස්ථාව ලබා දීලා තිබෙනවා. ඒ වාගේම, මෝටර් රථ අමතර කොටස් ගෙන්වීම අපි නතර කර තිබුණා. දැන් ඒවා ගෙන්වන්නත් අවස්ථාව ලබාදීලා තිබෙනවා. ඒ වාගේම, භාවිත කරන ලද රෙදිපිළි ගෙන්වන්නත් අපි අවස්ථාව දීලා තිබෙනවා. අපට ශීතල කාලයට අඳින්න අවශ්‍ය, වෙනත් රටවල පාවිච්චි කරපු ඇඳුම් ගෙන්වන්න අපි කෙටි කාලීනව අවස්ථාව ලබා දීලා තිබෙනවා. විදුලි මෝටර් රථ ගෙන්වන්නත් අපි අවස්ථාව ලබා දීලා තිබෙනවා. මේ සංශෝධන තුළින් අපි විශේෂයෙන්ම මෙවැනි කාරණා සම්බන්ධයෙන් අවධානය යොමු කර තිබෙනවා.

අද විවාදයට ගන්නා මෙම කරුණු කාරණා අතරේ මේ මතක් කිරීම් විශේෂයෙන්ම කරන්නේ මෙන්න මේ නිසායි. දැන් විවිධාකාර විධියට අපට කියනවා, අපි එක එක ඩීල් දානවා කියලා. අපි කිසිදු පක්ෂයක් එක්ක එහෙම ඩීල් දාලා නැහැ. අපි අභියෝග කරනවා, පුළුවන් නම් අපි එවැනි ඩීල් එකක් දාලා තිබෙනවා නම් පෙන්වන්න කියලා. පසුගිය කාලයේ එවැනි පක්ෂ එකට එකතුවෙලා සාකච්ඡා කරලා පළාත් පාලන බලය අත් පත් කර ගන්න උත්සාහ කරනවා අපි දැක්කා. නමුත්, මේ රටේ ජනතාව ජාතික ජන බලවේගයට බහුතර බලයක් ලබා දීලා තිබෙනවා. අන්න ඒ බහුතර බලයත් එක්ක, හරියට කොන්දක් තිබෙන සභිකයෝ හඳුනාගෙන පුංචි ආණ්ඩුවල බලය ජාතික ජන බලවේගයට දීලා ගම හදාගන්න ඕනෑ කියන තැන ඔවුන් ඉන්නවා. ඒ සඳහා ඔවුන් සහාය දක්වමින් ඉන්නවා. එම නිසා ඔවුන්ට අපේ ස්තුතිය පුද කරන්නට ඕනෑ.

විශේෂයෙන්ම දේශප්‍රේමීත්වය ගැන කථා කරන අයට අපි කියනවා, ඔබලා තමයි පසුගිය කාලයේ මිනිස් ජීවිත බිලි දීලා, මිනිසුන් මහ මඟට ඇද දමන්නට කටයුතු කරලා තිබුණේ කියලා. නමුත් මේ රටේ ජනතාව ඓතිහාසික තීන්දුවක් ගත්තා, ඒ ක්‍රමය වෙනස් කරන්න. පසුගිය කාලයේ තිබුණු සෞඛ්‍ය ප්‍රතිපත්තිය වගේ ඒවාත් එක්ක බලනකොට මේ වෙනකොට බහුතරයක්

දෙනා මිය ගිහිල්ලා. හැබැයි, දැන් මේ රටේ ජනතාවට සුබ සිහිනයක් තිබෙනවා. මේ රට හරි තැනකට ගමන් කරමින් තිබෙනවා. අද පාසල් ශිෂ්‍යයන්ට මේ පාර්ලිමේන්තුව නරඹන්න පුළුවන් තත්ත්වයක් අපි නිර්මාණය කරලා තිබෙනවා. මේ පාර්ලිමේන්තුව දිහා බැලුවාම අපට ඒක පෙනෙනවා. අපි දන්නවා, කලින් තිබුණු පාර්ලිමේන්තුව එහෙම එකක් නොවෙයි කියලා. ඒ කාලවල තිබුණු කුණු ගොඩවල් ටිකක් තවමත් මේ පාර්ලිමේන්තුවේ ඉතුරුවෙලා තිබෙනවා. විශේෂයෙන්ම උදේට කාලය නාස්ති කරමින්, කෑ ගසමින් සිටින මන්ත්‍රීවරු පිරිසක් අපට දකින්නට ලැබෙනවා. නමුත්, අපි මේක පිරිසිදු තැනක් බවට පත් කරලා මේ රටේ ජනතාවට වග කියන, සැබෑ තීන්දු තීරණ ගන්නා ස්ථානයක් බවට, එහෙම නැත්නම් ගරු පාර්ලිමේන්තුවක් බවට පත් කරලා තිබෙනවා. අන්න ඒක නිසා මේ රටේ පාර්ලිමේන්තුව දැන් හරි පාරේ යනවාය කියන එක ජනතාවට නිශ්චිත වෙලා තිබෙනවා. දැන් මේ රට හරි දිශානතියක් කරා ගමන් කරනවා. හෙමින් තමයි යන්නේ. නමුත් හරි තීන්දු අරන් තිබෙනවා. හෙමින්, නිවැරදි ගමන් මාර්ගය තුළ අපි යනවා. ජනාධිපති සහෝදරයාගේ ඉඳලා අපේ ඇමතිවරු, අපේ මන්ත්‍රීවරු මහා කැප කිරීමක් කරමින් ඉන්නවා. ඒ කැප කිරීමේ ප්‍රතිඵල තව අවුරුද්දක්, දෙකක් යනකොට සහතිකවම මේ මහ පොළොවට, මේ ජනතාවට අත් පත් කරනවා. ඈත පිටිසර ගම්වල දුක් විඳින අහිංසක, දුප්පත් මිනිසුන්ට, විශේෂයෙන්ම අධ්‍යාපනය ලබන දරුවන්ට සුබ සිහින ඉටු වන හොඳ පරිසරයක්, හොඳ රටක් නිර්මාණය වෙනවා. විශේෂයෙන් අපි සියලුදෙනා ඒ වෙනුවෙන් එකා වගේ පෙළ ගැහිලා ඉන්නවා.

විශේෂයෙන්ම අද දවසේ මේ අණපනත් තුළිනුත් අපි බලාපොරොත්තු වෙන්නේ, තවදුරටත් අවශ්‍ය කරන යාවත්කාලීන කිරීම් කරමින් මේ රට නිවැරදි දිශානතියට අරගෙන යෑම සඳහා වෙනස් කිරීම් සිදු කිරීමයි.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! The Sitting is suspended till 1.00 p.m. for lunch.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභාපතිතුමියගේ [ගරු හේමාලි වීරසේකර මහත්මිය] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.

Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.00]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අද මේ රටේ ආර්ථිකය සම්බන්ධයෙන් කථා කරන මොහොතේ අපටත් ඒ ගැන අදහස් ටිකක් ඉදිරිපත් කරන්නට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමියට ස්තුතිය පළ කරනවා. රටේ සංවර්ධනය, රටේ යහපත සම්බන්ධයෙන් කථා කරනවා කියන්නේ, අදට වඩා හොඳ ජීවිතයක් හෙට ගත කරන්න යම් ප්‍රයත්නයක යෙදෙනවා කියන එකයි. ඒ කියන්නේ ආදායම් වැඩි කිරීම, වියදම අඩු කිරීම, ඉතිරි කිරීම් වැඩි කිරීම, ප්‍රාග්ධන වියදම් වැඩි වීම, රටේ සංචිත වැඩි වීම, ණය අඩු වීම ආදිය තමයි ඕනෑම කෙනෙකුගේ බලාපොරොත්තුව. නමුත් ඒවා වෙනවාද, කොයි ආකාරයෙන්ද වෙන්නේ, කොහොමද ඒවා ක්‍රියාත්මක කරන්නේ කියන එක තමයි අපි සලකා බැලිය යුත්තේ.

අද ශ්‍රම බලශක්තියේ ලක්ෂ 81ක් ඉන්නකොට, ඒකෙන් ලක්ෂ 16ක් රාජ්‍ය සේවයේ ඉන්නවා කියා අපි දන්නවා. ඒ වාගේම පෞද්ගලික අංශයත් ඉමහත් සේවයක් කරනවා. අපි කොයි ආකාරයෙන්ද තවදුරටත් එම වැඩකටයුතු කරගෙන යන්න ඕනෑ කියන එක මේ අවස්ථාවේදී බලන්න ඕනෑ. කෘෂිකර්මය හැම අවස්ථාවකදීම මේ රටේ ආර්ථිකයේ ප්‍රබල සාධකයක් වුවාට, ඒ ක්ෂේත්‍රය සම්බන්ධව අවශ්‍ය කටයුතු තවම නිශ්චිත වශයෙන් සිදු වෙලා නැහැ. රටේ ණයබරතාව ගැන කථා කරනකොට අපේ අපනයනය තුළින් තමයි මේ රටේ තිබෙන ඒ ණයබරතාව අඩු කරන්න ඕනෑ. ඒ මතයේ අපි එදාත් සිටියා, අදත් සිටිනවා, ඉදිරියටත් සිටිනවා. ඒ නිසා පුළුවන් තරම් අපනයනය පහසු කිරීම තමයි අප සියලුදෙනාගේ කාර්යභාරය විය යුත්තේ. නමුත්, ඒක වෙනවාද? කොතැනින්ද ඒකට බාධක ඇති වන්නේ? මේ සම්බන්ධයෙන් red tape එකක් තිබෙනවා නම් ඒවා නැති කරන්න ඕනෑය කියන මතයේ තමයි අප සිටින්නේ.

2025 ජූලි 09වැනි දා වෙනකොට කැනඩාව, මෙක්සිකෝව, චීනය සහ ඇමෙරිකාවේ ඩොනල්ඩ් ට්‍රම්ප් අතර තිබෙන ප්‍රශ්න අතරින් රටවල් දෙකක ප්‍රශ්න විසඳෙනවා. ඒ ප්‍රශ්න දැන් බිම් බෝම්බයක් වශයෙන් අපට තමයි ඇවිල්ලා තිබෙන්නේ. මේ කෙටි කාලය තුළ අපි ගිවිසුම්ගත වෙන්න පුළුවන් තත්ත්වයක් ඇති කරන්නේ කොහොමද කියන එක තමයි අපි හැමදෙනාගේම මනසේ තිබෙන්නේ. ඒකට කටයුතු කරනවා වාගේම, අපි කොහොමද අපේ රටේ අපනයනය වැඩි කරගන්නේ කියන එක අපි බලන්න ඕනෑ අපි දැන් අවුරුදු 11ක් තිස්සේ මේ ගැන කථා කරලා තිබෙනවා. අපේ per capita එක ඇමෙරිකානු ඩොලර් 3,750-4,500 අතර දෝලනය වෙනවා. එක් පැත්තකින් දළ දේශීය නිෂ්පාදනය වැඩි වෙනකොට රුපියල බාල්දු වෙලා තිබෙනවා. නැත්නම් රුපියල ශක්තිමත් වෙනකොට දළ දේශීය නිෂ්පාදනය එක තැනක හිරවෙනවා. අවුරුදු 11ක් තුළ මොනවා කථා කළත්, අපේ per capita income එක ඇමෙරිකානු ඩොලර් 3,750-4,500 අතර තමයි තිබෙන්නේ.

මේ විවාදය තුළ අද නොයෙක් අදහස් ඉදිරිපත් කර තිබෙනවා. ඒ සම්බන්ධව ගරු හර්ෂණ සූරියප්පෙරුම නියෝජ්‍ය ඇමතිතුමාත් අදහස් ඉදිරිපත් කළා. එතුමා අපේ පාර්ලිමේන්තුවෙන් ඇත්වෙලා, මුදල් අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් පත් වෙනවා කියන ආරංචිය මට ලැබී තිබෙනවා. එතුමා මෙහෙන් එහෙට ගියාම එතුමාට අපේ තිබෙන කරදරවලට උත්තරයක් සපයන්න පුළුවන් වෙයි කියා මා හිතනවා.

එක් පැත්තකින් අපි බදු අය කිරීම සම්බන්ධයෙන් නිවැරදි කිරීමක් කර තිබෙනවා, රුපියල් 1,000කට අය කරන රුපියල් 10ක බද්ද රුපියල් 20ක් දක්වා වැඩි කරනවා කියලා. මේකෙන් ඇස්තමේන්තු කරලා තිබෙන්නේ ඇමෙරිකානු ඩොලර් බිලියන 3ක විතර ආදායමක් උපයන්නයි. නමුත් ඊට වඩා සරලව අපට කරන්න පුළුවන් දේවල් මහ හැර තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. දැන් අපි මෙතැන lease එකක් ගැන කථා කරනකොට, ඒ කියන්නේ සුද්දන්ට බදු දෙනකොට, ඔවුන්ට මේ රටට ඇවිල්ලා ඉඩම් ගන්න බැරි නිසා, ඔවුන් සියයට සියයක් බදු

[ගරු රවි කරුණානායක මහතා]

ගෙවන්නේ නැති නිසා, බදු ක්‍රමයක් උපයෝගී කර ගන්නවා. ඒ බදු ක්‍රමය උපයෝගී කර ගන්නකොට මේ රටේ තිබෙන නීතිය අනුව උපරිම අවුරුදු 20කට තමයි මේ බදු ක්‍රමය සම්බන්ධව තක්සේරු කරන්නේ. අවුරුදු 99ක් තිබුණත්, අවුරුදු 20කට ගිවිසුම්ගත කරනවා. ඒ අනුව, ඊට පසුව අපට ලබාගන්න පුළුවන් ආදායම නැති වෙනවා. මේ ලාභය එසේ මෙසේ ලාභයක් නොවෙයි. තව සියයට සියයක ආදායමක් සොයාගන්න පුළුවන් අවස්ථාවක් අපට තිබෙනවා. මම දන්නේ නැහැ, මේ සම්බන්ධයෙන් සංශෝධනයක් කර තිබෙන්නේ ඇයි කියලා. ඒ වාගේම තක්සේරු කරනකොටත් බදු ක්‍රමය යටතේ තක්සේරුව ගන්නේ ඒ අය දෙන තක්සේරුව. නමුත්, බැරි වෙලාවත් සල්ලිවලට ඉඩමක් ගන්නවා නම්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ඇවිල්ලා ඒක තක්සේරු කරනවා. මේ අවස්ථාවේදීත් එම ක්‍රමයම උපයෝගී කරගන්න නොහැකි වන්නේ ඇයි කියන එක මම අහනවා. මම හිතන විධියට, ඒක නිවැරදි කළ යුතුයි. අපට මේකෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 3ක ආදායමක් නොවෙයි, ඇමෙරිකානු ඩොලර් බිලියන 7ක්, 8ක් සොයාගන්න පුළුවන්. ඒ නිසා මේ ක්‍රමය උපයෝගී කරගන්න කියලා මම කියනවා. මේකෙන් අන්තිමට වෙන්නේ මොකක්ද? මෙහිදී ශ්‍රී ලාංකිකයන් නොවෙයි ගෙවන්නේ. මෙවැනි දෙයක් ඇති කිරීමෙන් අනික් අය ගෙවන එක අපට හරි මාර්ගයට ගෙනෙන්න පුළුවන් වේවි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අය වැය තුළින් ඉදිරිපත් කර තිබෙනවා, පඩි වැඩි කිරීමක්. බොහොම හොඳයි, ඕනෑම තැනක පඩි වැඩි කිරීමක් තිබෙනවා නම්. ඒ වාගේම වියදම් අඩු කරන්නත් අවශ්‍යයි. නමුත් මේ තුළ පෞද්ගලික අංශයට එක විධියකුත්, රාජ්‍ය අංශයට තව විධියකුත් තිබෙන එක තමයි පවතින ලොකුම බාධාව. අපේ මිත්‍ර නලින්ද ජයතිස්ස සෞඛ්‍ය ඇමතිතුමා මීට මාස එකහමාරකට පමණ කලින් "The Island" පත්තරයට දක්වා තිබුණු අදහසක් මම මේ අවස්ථාවේදී සඳහන් කරන්නම්. එතුමා කියා තිබෙනවා, "Government will not be able to pay salaries health workers are demanding through strikes" යනුවෙන්. එතුමන්ලා කියනවා, "අපි පෞද්ගලික අංශයට යම් පඩි වැඩි කිරීමක් කරනවා. නමුත් රාජ්‍ය අංශය දෙන එක ගන්න" කියලා. මේක තමයි කියා තිබෙන්නේ. මේවා තමයි තිබෙන ප්‍රශ්න. රාජ්‍ය සේවය වාගේම තමයි පෞද්ගලික අංශයත්. පෞද්ගලික අංශය තුළ ලක්ෂ 66ක ශ්‍රම බල ශක්තියක් තිබෙන බව කියනවා. ඒ තුළ තිබෙන බදු ක්‍රමය බලන්න. දැන් රජයට බදු ගෙවන්න ඒ තරම් අවශ්‍යතාවක් නැහැ. මොකද, ඒක එන්නේ දකුණු පොකට් එකෙන්, වම් පොකට් එකට. හැබැයි මේ වාගේ තත්ත්වයකදී අපි දැනගන්න අවශ්‍යයි, කොහොමද මේ සම්බන්ධයෙන් සරල මට්ටමින් උදවු කරන්න පුළුවන් හැකියාවක් ඇති කරන්නේ කියලා. නලින්ද ඇමතිතුමා කියා තිබෙන දෙය බොහොම ප්‍රායෝගිකයි. එතැනදී හැම පැත්තකටම එක සේ කටයුතු කරන්න ඕනෑය කියන එක තමයි මම මතක් කරන්නේ. නලින්ද ඇමතිතුමා "The Island" පත්තරයට මේක කියා තිබෙන්නේ 2025 මාර්තු 19වැනි දා.

අපේ ලාල්කාන්ත ඇමතිතුමා කියා තිබෙනවා, "Graduates should not depend on Government to grant them jobs" යනුවෙන්. දැන් එතුමන්ලාට මේ දේවල් තේරිලා තිබෙනවා. එදා විපක්ෂයේ සිටියදී "දියව්! ගනිව්!" කිව්වාට, එදා ඒ වාගේ සුරංගනා වචන කිව්වාට, ආණ්ඩු බලය ගත්තාට පසුව - විපක්ෂයෙන් ආණ්ඩු පක්ෂයට ආවාම - තේරෙනවා, ඊට වඩා හුඟාක් ලොකු වෙනසක් තමයි තිබෙන්නේ කියලා. ඒ වාගේ වෙනසක් වෙන දේවල් අපි අගය කරනවා. එහෙම තමයි විය යුත්තේ. නමුත්, ඒ කියන දේ සම්බන්ධව හරියාකාරව කටයුතු කරන්න ඕනෑය කියන එක තමයි මට කියන්න තිබෙන්නේ.

අපේ මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමාත් සභාවේ සිටින නිසා අපි අහනවා, කොයි ආකාරයෙන්ද සැබෑ ලෙස ආර්ථිකය වර්ධනය කරන්න පුළුවන් වන්නේ කියලා. වැඩ කරන සේවක පිරිසගේ අනාගතය සුරක්ෂිත කරන්න අපි EPF එකේ අරමුදල් මහ බැංකුවේ දමනවා. මහ බැංකුව - Central Bank එක - විසින් තමන්ගේ සේවකයන්ගේ සේවක අර්ථසාධක අරමුදලට - EPF එකට - සියයට 25ක පොලියක් දෙනකොට, අනික් සාමාන්‍ය සේවකයන්ගේ -පෞද්ගලික අංශයේ අයගේ- EPF එකට දෙන්නේ සියයට 11ක පොලියක්. ද්විත්ව ස්වරූපයක්! ඇයි, මේ සම්බන්ධයෙන් මීට වඩා වැඩ කටයුතු කරන්න බැරි? ඇයි, මෙහෙම දෙවිධියකට කටයුතු කරන්නේ? ඒ නිසා මම ඉතාම ඕනෑකමින් කියනවා, පඩි වැඩි කරලා නීතිගත කරනවාට වැඩිය, ප්‍රායෝගිකව වැඩ කරන්න කියලා.

ඊයේ විදේශ කටයුතු අමාත්‍ය විජිත හේරත් මැතිතුමාත් යම් මතක් කිරීමක් කළා, අපිත් ඉල්ලීමක් කළා. මම 2016දී මුදල් ඇමති වශයෙන් කටයුතු කරනකොට විදේශගත අපේ ශ්‍රමිකයින්ගේ පඩිය වැඩි කළා, අවම වශයෙන් ඇමෙරිකානු ඩොලර් 300ක්වත් තිබෙන්න ඕනෑය කියලා. නමුත් අද වන විට ඒ ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා, නොයෙක් හේතු නිසා. අපට මේ පඩිය වැඩි කරන්න පුළුවන් නම් අපේ රටට ලැබෙන විදේශ ආදායම තව වැඩි කර ගන්න පුළුවන්, අඩු ගණනේ ඇමෙරිකානු ඩොලර් බිලියන 1.5ක් දක්වා. ඒ ප්‍රමාණය වැඩි වෙනවා කියන්නේ, -මාසයකට ඇමෙරිකානු ඩොලර් 200ක් වැඩි වෙනවා කියන්නේ- අද ඇමෙරිකානු ඩොලර් 700ක් ලැබෙනවා කියන එකයි. ඒ ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් 1,000කට විතර ගියොත්, ඇමෙරිකානු ඩොලර් බිලියනයක් පමණ එනවා කියන එකයි. මේ වාගේ වෙලාවක ඒක ලොකු ප්‍රමාණයක්.

මේ අවස්ථාවේ අපි පුළුවන් තරම් ආයෝජන වැඩි කරන්න අවශ්‍යයි. මොකද, ආයෝජන වැඩි කරනවා කියන්නේ රටට ආදායමක් උපයන්න පුළුවන් මාර්ගයක්. එතකොට දළ දේශීය නිෂ්පාදනය වැඩි වෙනවා. Fiscal Management (Responsibility) Act එක අනුවයි අපේ අය වැය සකස් වන්නේ. දළ දේශීය නිෂ්පාදනය වැඩි වෙනකොට ඒකෙන් සියයට 13ක් තමයි වියදම් කරන්න පුළුවන් වන්නේ, ඊළඟ අවුරුද්දට. අපේ රටේ දැන් strikes නැහැ. බොහොම හොඳයි. පෙළපාළිත් නැහැ. දූෂණයත් නැහැයි ලු. සියයට 10ක, 20ක දේවල් ගෙවන්නත් නැහැයි ලු. හැබැයි, ආයෝජන එන්නේත් නැහැ. මේක තමයි අපට නිවැරදි කරන්න තිබෙන්නේ.

අපි අද කථා කළා, BoI එක ගැන සහ mattress manufacturing company එක ගැන. ඒක එක නිදසුනක් විතරයි. සරල වශයෙන් අපට කරන්න තිබෙන්නේ ආයෝජනයට තිබෙන feel-good factor එක, ආයෝජන කරන්න පුළුවන් හැකියාව වැඩි කරන එකයි. සාමාන්‍යයෙන් යමක් කරන්න ගියාම, ආයෝජන සඳහා ඉඩමක් වෙන් කර ගන්න ගියාම ඒකට අවුරුදු ගණනාවක් යනවා. ඒ තුළ තිබෙන සරල දේවල් සඳහාත් ඉතා අධික කාලයක් ගන්න නිසා තමයි ආයෝජකයන් තුළ දිරිමත්බවක් ඇති නොවන්නේ. මේවා තමයි නැති කළ යුත්තේ. Sinopec company එක ගැන බලන්න. ඒ අය ආයෝජන ගෙනෙනවා කියලා තිබෙනවා. කවදාද ඒවා එන්න පටන් ගන්නේ? ඒවා එන එක හොඳයි. මොකද, එතකොට තරගකාරී තත්ත්වයක් ඇති වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය

(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)

(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, තව මිනිත්තු දෙකකින් මගේ කථාව අවසන් කරන්නම්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මිනිත්තු දෙකක් නම් දෙන්න බැරි වෙයි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට මේ කාරණය කියන්න තව සුළු මොහොතක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

මට මේ අවස්ථාවේදී මතක් කරන්න අවශ්‍ය වන්නේ මේකයි. අපේ ලාල් කාන්ත ඇමතිතුමා කියනවා, මමත්, ඔබත් - අපි හැමෝමත් - මේ රටේ කඩා වැටීමට වගකිව යුතුයි කියලා. අපි එක දෙයක් මතක් කරන්න ඕනෑ. මේක තමයි, විපක්ෂයෙන් ආණ්ඩු පක්ෂයට ආවාම තිබෙන වෙනස. අපිට ආයෝජනය කිසිම භයක් නැතුව ඉදිරියට ගෙන යන්න අවශ්‍යයි. මේ වාගේ සිග්නල් දෙන එක හොඳයි. මොකද, එතකොට ආයෝජකයෝ දන්නවා, මේක වම ද, දකුණ ද කියන එකක් නොවෙයි, කෙළින් යන එකක්, වෙනසක් නැහැ, ඒ නිසා අපි ආයෝජනය වැඩි කරන්න ඕනෑ කියලා. මම ඔබ සියලුදෙනාගෙන්ම කාරුණිකව ඉල්ලන්නේ මේකයි. මේ රටේ ආයෝජනය වැඩි කරන එක තමයි අත්‍යවශ්‍යම දේ. ඒ තුළින් තමයි අපිට ඉදිරියට යන්න පුළුවන් වන්නේ.

වෙලාව හරස් වෙලා තිබෙන නිසා මම මේ අවස්ථාව උපයෝගී කර ගන්නවා, ආයෝජන ගැන එක කාරණයක් කියන්න. IMF එකත් එක්ක ආයෝජනයට තිබෙන බාධා ටික අඩු කරන්න පුළුවන්. අපිට tax holidays අවශ්‍යයි; qualifying payments අවශ්‍යයි. අද දවසේ ලබා ගන්න පුළුවන් ආයෝජනය තුළින් හෙට ආදායමක් ගෙනෙන්න පුළුවන් මාර්ගයකට අපි අඩිතාලම තියනවා කියන කාරණයත් මතක් කරමින්, මට කථා කරන්න කාලය ලබා දීමත් අගය කරමින් මම නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු බිමල් රත්නායක ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.11]

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මට කථා කරන්න කාලය ලබා දීම ගැන ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා. අද අපේ රටේ ආර්ථිකය සම්බන්ධවත් සාකච්ඡා කරන නිසා ඉතා ඉක්මනින් මේ කාරණය කියන්න මම හිතුවා. අද "ලංකාදීප" පුවත් පතේ වාර්තා කර තිබුණා, "ගැසට්ටු අවුලෙන් වාහන 700ක් වරායේ හිරවෙලා" කියලා. මේ පිළිබඳව ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් අපි වාර්තාවක් ගෙනාවා. අපි බලාපොරොත්තු වෙනවා, ඒ වාර්තාව මුද්‍රිත ආකාරයෙන් ලබා ගන්න පුළුවන් කියලා. නමුත්, දැනට තිබෙන තොරතුරු අනුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, කොළඹ වරායට ආනයනික වාහන ගෙනැල්ලා නතර කරන්නේ Guide Pier එකේ සහ Unity Container Terminal එකේයි. අද උදේ 10.00 වනවිට ආනයනය කරලා එතැන නතර කරලා තිබෙන වාහන සංඛ්‍යාව 402ක් පමණ වෙනවා. මේ කිසිදු ආනයනික රථ වාහනයක් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවා ගාස්තු අය කිරීම සම්බන්ධ ගැටලු නිසා හෝ අංගණගත පහසුකම් සැපයීම සම්බන්ධ ගැටලු නිසා හෝ නොවෙයි නතර කරලා තිබෙන්නේ කියන එක ඒකේ කළමනාකරුවන් විසින් නිල වශයෙන් දැනුම් දීලා තිබෙනවා. ඒ වාගේම මේ වාහන නිෂ්කාසනය කිරීම සඳහා රේගු දෙපාර්තමේන්තුව අනුගමනය කරන ගැසට්, පිළිවෙත්, procedures තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, සමහර වෙලාවට ලෝකයේ වාහනවල විවිධත්වයන් ඇති වන බව ඔබතුමිය දන්නවා. සමහර විට නීති සහ රෙගුලාසි එතරම් ඉක්මනට update වෙන්නේ නැහැ. එම නිසා මේ වනවිට ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවත්, ආනයන හා අපනයන පාලක ජනරාල් සහ නීතිපති දෙපාර්තමේන්තුවත් මේ ගැටලු විසඳන්න සාකච්ඡා කරමින් පවතිනවා. විශේෂයෙන්ම යම් ගැටලුවක් තිබෙනවා කියන එක නිවැරැදියි කියන එක තමයි මට වරාය පැත්තෙන් ඉදිරිපත් කරලා තිබෙන්නේ. ශ්‍රී ලංකා රේගුව තිබෙන්නේ වරාය ඇතුළේ වුණාට, රේගුව පාලනය වෙන්නේ වරාය අධිකාරියෙන් නොවෙයි. ඒක පැහැදිලිව මම හිතන විධියට රටේ ජනතාව තේරුම් ගන්න ඕනෑ. සමහර මන්ත්‍රීතුමන්ලාත් ඒක තේරුම් අරගෙන හිටියේ නැහැ. ඒ නිසා මේ වනවිට ආනයන හා අපනයන පාලක ජනරාල් සහ නීතිපති දෙපාර්තමේන්තුව මඟින් මේ ගැටලු විසඳා ගන්න සාකච්ඡා කරමින් පවතිනවා. අපිට වරාය අධිකාරියෙන් දැනුම් දීලා තිබෙනවා, අද දිනය තුළ දී මේ ගැටලුව විසඳන්න පුළුවන් කියලා. මොකද, කොළඹ වරාය කියන්නේ ලෝකයේ තිබෙන ඉහළම ප්‍රතිඅපනයනය කරන සහ බහලුම් නිෂ්කාසනය කරන වරායක්. මෙවැනි ගැටලු ඇතිවීම ස්වභාවිකයි. ඉරාන-ඊශ්‍රායල යුද්ධය නිසාත් යම් තෙරපුමක් එන්න පුළුවන්. නමුත්, ඒ ගැටලු විසඳා ගෙන අපට ඉදිරියට යන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒ එක්කම මේ කාරණය සම්බන්ධව කියන්නත් මෙය අවස්ථාවක් කර ගන්න මම හිතුවා. විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා මහත් උද්‍යෝගයෙන් ඉරාන-ඊශ්‍රායල යුද්ධය වෙනුවෙන් ඉල්ලපු විවාදය පැවතුණා නම් මේ සම්බන්ධව කරුණු දක්වන්නේ මීට දින කිහිපයකට කලින්. නමුත්, ඒ අවස්ථාව අපිට උදා කර ගන්න බැරි වුණා, ඒ යෝජනාව කළ මන්ත්‍රීතුමා වෙලාවට මේ ගරු සභාවට පැමිණියේ නැති නිසා. ඒ නිසා මේ සම්බන්ධව කරුණු දෙක, තුනක් කියන්න මම හිතුවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඔබතුමිය දන්නවා, ඊශ්‍රායලය විසින් ඉරානයේ තානාපති කාර්යාලවලට, ප්‍රධාන පෙළේ හමුදා නායකයන්ට, දේශපාලන නායකයන්ට පසුගිය මාස ගණනාවක් තිස්සේ ප්‍රහාර එල්ල කරමින් තිබෙන බව. ඊශ්‍රායල ආණ්ඩුවේ හමුදා අංශ මඟින් ඒ පහර දීම් සිදු කරනවා. සම්පූර්ණයෙන් ස්වෛරී රාජ්‍යයක් වශයෙන් ඉරානයට තිබෙන අයිතිවාසිකම් උල්ලංඝනය කරමින් කටයුතු කිරීම සිදු වනවා. පසුගිය වසර එකහමාරක් තිස්සේ ඇදෙන පලස්තීනයේ ගාසා ජනතාව සහමුලින්ම සමූල ඝාතනය කිරීමේ ඊශ්‍රායල ආණ්ඩුවේ සැලැස්මත් එක්ක තමයි මේ සියලු තත්ත්වයන් ඇති වෙලා තිබෙන්නේ කියන එක අපි දන්නවා. ඒ නිසා ඇත්තටම මේ ඉරාන -ඊශ්‍රායල යුද්ධය කියන එක වුණත් ඇති වෙලා තිබෙන්නේ

[ගරු බිමල් රත්නායක මහතා]

පලස්තීන ප්‍රශ්නය පදනම් කරගෙනයි. මම හිතන විධියට අද එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සලය රැස් වෙලා තිබෙනවා. නමුත්, රාජ්‍ය දෙකක් අතර මෙවැනි යුද්ධයක් ඇති වුණාම ඇත්තටම ලෝකයේ තිබෙන වගකිව යුතු රටවල් - හැම රටක්ම - කළ යුත්තේ එම යුද්ධයට උඩ ගෙඩි දීම නොවෙයි. මේ රටවල් දෙකම යම් ආකාරයක න්‍යෂ්ටික ශක්තීන් සහිත රටවල්. ඊශ්‍රායලය ගත්තොත්, මම දන්නා තරමින් එක්සත් ජනපදය සතුව තිබෙන න්‍යෂ්ටික ආයුධවලින් කොටසක් තමයි ඔවුන් භාවිත කරන්නේ. නමුත් ඉරානය සතුව න්‍යෂ්ටික ආයුධ තිබෙනවාද, නැද්ද කියන එක සම්බන්ධ විවාදය කෙසේ වෙතත්, එය අවුරුදු හතළිස් පහක, හතළිස් හයක පමණ කාලයක් දැඩි සම්බාධක පැවැති රටක්. ඉරානය 1979 අවුරුද්දේ පැවති දේශපාලන අරගළයෙන් පසුව අතිදැවැන්ත ස්වශක්තියකින් තාක්ෂණය, විද්‍යාව -හැම දෙයක්ම- දියුණු කරගත්ත රටක්. එම නිසා ඉරානයේ තිබෙන ශක්තීන් ගැන සමහරවිට බොහෝ අය නොදන්නවා වෙන්නත් පුළුවන්.

අනෙක් කාරණය තමයි, ඉරානය කියන්නේ මිලියන 90ක ජනතාවක් ඉන්න රටක්. ඒ වාගේම ලෝකයේ ඉතා පැරණි ශිෂ්ටාචාරයක්. න්‍යෂ්ටික බලවතුන් වාගේ වන මෙවැනි රටවල් දෙකක් අතර ගැටුමක් ඇති වුණාම, ලෝකයේ හැම රටකටම පැවරී තිබෙන වගකීම තමයි මේ ගැටුම සාකච්ඡා මාර්ගයෙන් ඉතාම ඉක්මනින් විසඳා ගන්න තැනට ගේන එක. ඒක තමයි අපිත් විය යුතුයි කියලා හිතන දේ. නමුත් අපි කනගාටු වෙනවා, අද මේ යුද්ධය ඇවිළිගෙන යන එන ගැන. ලෝකයේ ගොඩක් රටවල් ඊශ්‍රායලය පැත්ත අරගෙන එම රටට මේ යුද්ධය කරන්න කියන පණිවුඩය තමයි ලබා දෙන්නේ. තමන්ගේ රටට ආරක්ෂා වීමට තිබෙන අයිතිය කියලා තමයි ඒකෙන් අදහස් කරන්නේ. නමුත් ආරක්ෂා වීම පිළිබඳ අයිතිය නැති වෙන්නේ කොහොමද? අපි කවුරුත් දන්නවා, පසුගිය කාලයේ ඊශ්‍රායල ආණ්ඩුව ඒ පළාතේ තිබෙන හැම රටකටම පහර දෙමින් සිටි බව.

මම මේ අවස්ථාවේදී තව දෙයක් කියන්න කැමතියි. ඊශ්‍රායල ආණ්ඩුවේ දේශපාලන කටයුතු සම්බන්ධයෙන් තිබෙන විවේචනය, ඊශ්‍රායලයේ සමස්ත ජනතාවට එරෙහිව ප්‍රකාශ කිරීමත් වැරදියි. ඒකත් යම් ආකාරයක වැරදි දෙයක්. මොකද, ඊශ්‍රායල ආණ්ඩුව විසින් කරන අඩුපාඩුවක්, වැරැද්දක් මෙතැන පැහැදිලිව පෙනෙන්න තිබෙනවා. එහෙම දෙයක් තිබෙනවාය කියා මම පෞද්ගලිකවත් විශ්වාස කරනවා. නමුත් ඒකෙන් අදහස් වෙන්නේ නැහැ, සමස්ත ඊශ්‍රායල ජනතාවටම විරුද්ධ වෙන්න ඕනෑ කියන එක. මොකද, එම ජනතාවම තමයි ඒ ආණ්ඩුව වෙනස් කරන්න අවශ්‍ය නම් වෙනස් කළ යුත්තේ. ඒ ආණ්ඩුව තියා ගන්න අවශ්‍ය නම් ඔවුන් තියා ගනියි. නමුත්, අද සිදු වෙලා තිබෙන්නේ යුද බිස්නස් කරන කට්ටියගේ වුවමනාව මත, නැත්නම් දේශපාලන අරමුණු මත රටවල් දෙකක මිනිස්සු මැරෙන එකයි. ඒ නිසා අපි පැහැදිලිව කියන්න කැමතියි, පලස්තීනය නිදහස් රාජ්‍යයක් ලෙස ස්ථාපිත කරන්න ඉඩ නොදීම නිසා තමයි මේ ප්‍රශ්නය ඇති වෙලා තිබෙන්නේ කියන එක. පලස්තීනය කියන්නේ අමුතු රටක් නොවෙයි, ලෝකයේ අවසාන කොලනිය; ආසියාවේ අවසාන යටත් විජිතය. මොකද, 1947 අවුරුද්දට කලින් පලස්තීනය කියලා රටක් තිබුණු බව ඔබතුමිය දන්නවා. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් අපේ රට දෙකට, තුනට කඩලා, සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් හා මැලේ කියන මිනිසුන් අතර යුද ගැටුම් හදලා අපිව විනාශ කළා වාගේම ඉන්දියාවත් දෙකට තුනට කැඩුවා. අදත් ඉන්දියාව දෙස බලන්න. අද වනකොට ඉන්දියාවයි, පාකිස්තානයයි ගහ ගන්නවා. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් ඉන්දියාව කඩා දැමුවේ කොහොමද කියලා ඔබතුමිය සොයා බලන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. ඇත්තටම බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් ඉන්දියාව කඩා දැමුවා නොවෙයි, තීරු-තීරුවලට ඉරලා තිබෙන්නේ. ඒවායේ විපාකවලට අදත් එම රටවල ජනතාව මුහුණ දෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඔබතුමිය දකින්න ඇති, මෑතකදී ඉන්දියාව සහ පාකිස්තානය අතර විශාල ගැටලුවක් ඇති වුණු බව. අන්න ඒ ජාතිවාදී, අධිරාජ්‍යවාදී අරමුණුවලින්ම තමයි පලස්තීනය කියලා රටක් තිබුණු මිනිසුන්ට රටක් නැති කළේ. ලෝකයේ රටවල මිනිසුන් අලුත් රටක් ඉල්ලා සටන් කරන බව අපි දන්නවා. තමන්ට වෙනම රාජ්‍යයක් දෙන්න කියලා ඔවුන් සටන් කරනවා. හැබැයි, පලස්තීනයේ සටන එහෙම දෙයක් නොවෙයි. ඒ ජනතාවට තිබුණු ස්වෛරී රාජ්‍යය තමයි උදුරාගෙන තිබෙන්නේ. එතැනදී ලෝකයේ රටවලට වගකීමක් පැවරී තිබෙනවා. මොකද, ඊශ්‍රායලය ඇති කරන්නේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ එකඟතාවෙන්. ඒ එකඟතාව තුළ නිදහස් පලස්තීන රාජ්‍යයක් ඇති කළ යුතුයි, නිදහස් ඊශ්‍රායල රාජ්‍යයකුත් ඇති කළ යුතුයි කියන කොන්දේසි දෙක එකට තිබෙන්නේ. නමුත් අද ලෝක බලවතුන් විසින් උදවු කරලා එක රාජ්‍යයක් ඇති කරලා තිබෙනවා. ඒ රාජ්‍යය තමයි, ඊශ්‍රායල රාජ්‍යය. හැබැයි, පලස්තීනය කියන නිදහස් රාජ්‍යය ඇති කරලා නැහැ. අද ඒක ටිකෙන් ටික අඩු කරලා තිබෙනවා. 1947 අවුරුද්දේ පලස්තීනය ආක්‍රමණය කරලා, පලස්තීනය තුළ ඊශ්‍රායලය ඇති කරනකොට තිබුණු භූමියෙන් අද වනකොට ඒ පලස්තීන ජනතාවට අයිතිව තිබෙන්නේ සියයට 10ක්, 11ක් වාගේ ප්‍රමාණයක්.

ඊට අමතරව අති දැවැන්ත අමානුෂික ඝාතන කරනවා. අපට පෙනෙනවා, ඒ කිසිම ඝාතනයක් සම්බන්ධව විශේෂයෙන්ම එක්සත් ජනපදයේ නායකයන් කිසිසේත් සලකන්නේ නැහැ කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒකේ ප්‍රතිවිපාක මොනවාද? අපි මෙතැනදී උනන්දු වෙනවා, ඒ රටවල් දෙකේ ඉන්න අපේ රටේ ජනතාව ආරක්ෂා කර ගන්න. ඒ වාගේම ඔබතුමිය දන්නවා, මේ ප්‍රශ්නය නිසා තෙල් මිල ඉහළ යන්න පුළුවන් බව. අපි මෙතැනදී කොච්චර කථා කළත්, අපට පුළුවන් උපරිම දේ වෙන්නේ ඒ රටවල ඉන්න අපේ රටේ ජනතාව - දැනටත් තුවාල ලබා සිටින අය ඉන්නවා- ආරක්ෂා කර ගන්නා එක විතරයි. ඒ යුද්ධයෙන් ඇති කරන මහා විශාල සමාජ ප්‍රතිවිපාක, ආර්ථික ප්‍රතිවිපාක නතර කරන්න පුළුවන්කම තිබෙන්නේ ඒකාබද්ධ ප්‍රවේශයකින් විතරයි. ඒ කියන්නේ, රටවල නායකයෝ වග කිව යුත්තන් ලෙස හැසිරෙන්න ඕනෑ, warmongersලා විධියට වැඩ කරලා වැඩක් නැහැ.

මේ යුද්ධවල ප්‍රතිවිපාක මොනවාද? ඔබතුමිය දන්නවා ඇති, ඔය විධියටම ඉරාකය විනාශ කළා. ඉරාකය ගහපු ගැහිල්ලා තමයි, අතිවිශාල refugee crisis එකක් බවට පත් වුණේ. ඊශ්‍රායලය හා පලස්තීනය ආයුධවලින් ගහ ගන්නා විට අද ඇමෙරිකාව ගිනි ගන්නවා. ලොස් ඇන්ජලීස්, නිව්යෝර්ක් ගිනි ගන්නවා. යුරෝපය එකම refugee crisis එකක් වෙලා තිබෙනවා. දැන් මේ යුද්ධය පැතිරුණොත් මොකක්ද වෙන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි? ඒ refugee crisis එක ආයෙත් යුරෝපයට එනවා. ඒ නිසා ලෝක නායකයන් සුළු පිරිසක් ඔවුන්ගේ දේශපාලන වුවමනාවන් වෙනුවෙන්, තමන්ගේ අසාර්ථකභාවය වසා ගන්න යුද්ධය පාවිච්චි කරනවා.

ඔබතුමිය දන්නවා, යුද්ධයක් පැටළුවාට පස්සේ මිනිස්සු වෙන කිසිම දෙයක් බලන්නේ නැහැ, ඒක දිහා බලාගෙන ඉන්නවා කියන එක. මැච් එකක් වාගේ නේ. මිනිස්සු dronesවලින් බලනවා. ඔය ගංවතුර බලන්න සමහරු යන්නේ. බිල්ඩින් එකට වැදිලා කුඩු වුණාම තමයි, ඒ මනසේ thrill එක හදන්නේ. හැබැයි, අපි හිතන්න ඕනෑ ඒ බිල්ඩින් එක ඇතුළේ ඉන්නේ මගේ දරුවාය කියලා. ඒ නිසා කියන්න ඕනෑ, එක පැත්තකින් අද ඒ අද යුද්ධය විකුණනවා කියන එක.

මම අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න කැමැතියි. මේ ඊශ්‍රායල - ඉරාන යුද්ධයේ ප්‍රතිවිපාක ලැබෙන්නේ ඒ රටවල

ජනතාවට පමණක් නොවෙයි, මුළු ලෝකයටමයි. විශේෂයෙන්ම අද ඇමෙරිකාව දැවැන්ත සමාජ ආර්ථික අර්බුදයකට ගිහිල්ලා තිබෙන්නේ, මුළු ලෝකය පුරාම ඔවුන්ගේ නායකයන් විසින් ගන්නා ලද වැරැදි තීන්දු නිසා, ඒ වාගේම යුරෝපයේ නායකයන් විසින් ගන්නා ලද වැරැදි තීන්දු නිසා. ඔබතුමිය දන්නවා, ඇෆ්ගනිස්ථානය කුඩුපට්ටම් කළා, ඉරාකය කුඩුපට්ටම් කළා, සිරියාව කුඩුපට්ටම් කළා, ලිබියාව කුඩුපට්ටම් කළා. මොකක්ද ඇති වෙලා තිබෙන සාමය?

ඒ නිසා අපි එක දෙයක් කියන්න කැමැතියි. අපි පුංචි රටක් වෙන්න පුළුවන්. නමුත්, අපි ස්වෛරී රාජ්‍යයක්. එක පැත්තකින් පලස්තීනයේ නිදහස ස්ථාපිත කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා රජයත්, ශ්‍රී ලංකාවේ ජනතාවත් විධියට අපිට උපරිම වශයෙන් වැඩ කරන්න වගකීමක් තිබෙනවා. ඒ වාගේම අපි ස්වෛරී රාජ්‍යක් ලෙස, මේ යුද උන්මාදකරුවන්ගේ පැත්ත ගන්නේ නැතුව, ඊශ්‍රායලයත් ඉරානයත් අතර තිබෙන යුද්ධය වහාම නතර කරන්න අපේ පැත්තෙන් කළ හැකි බලපෑම කරන්න ඕනෑ. මොකද, අපේ රට පුංචි රටක් වෙන්න පුළුවන්. මම දන්නවා මේවාට comments එනවා, "ඔයාට පුළුවන්ද යුද්ධය නතර කරන්න?" කියලා අහලා. අපේ වචනය පවා වැදගත් වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. මොකද, අපිට safe environment එකක් හදා ගන්න ඕනෑ නම්, අපි ඒකට වචනයකින් හරි මැදිහත් වෙන්න ඕනෑ. ඒ කාරණයත් අවධාරණය කරමින්, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.23]

ගරු චානක මාදුගොඩ මහතා
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමියට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ ගෙනෙන නියෝගය පිළිබඳවත් කථා කරන මේ මොහොතේ, ඒ පිළිබඳව කථා කරන්න පෙර ඊයේ දවසේ මතු වෙච්ච ගැටලුවක් පිළිබඳව පිළිතුරක් දෙන්න මම මේක අවස්ථාවක් කර ගන්නවා.

ඊයේ ගරු ආනන්ද විජේපාල අමාත්‍යවරයා අපේ පක්ෂයේ ජාතික සංවිධායක ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාට චෝදනාවක් එල්ල කළා, පාර්ලිමේන්තු වරප්‍රසාද භාවිත කරලා මේ පාර්ලිමේන්තුව තුළ බොරු කියනවා කියලා. මම මේ ගරු සභාව හමුවේ කියන්න කැමැතියි, ගරු ආනන්ද විජේපාල මැතිතුමා එවකට දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂවරයා විධියට වැටුප් හා දීමනා ගත්තේ නැහැ කියන කාරණය ඊයේ දින මේ ගරු සභාව හමුවේ පුන පුනා සිහිපත් කළ බව. එතුමා ඒ පිළිබඳව දැඩිව කිව්වා; පුළුවන් නම් ගත්තා කියලා පෙන්වන්න, පුළුවන් නම් ඔප්පු කරන්න කියලා කිව්වා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, වැටුප් ගත්ත එක, දීමනා ගත්ත එක අපිට ගැටලුවක් නොවෙයි. ඒ පිළිබඳව අපිට විවාදයක් නැහැ. හැබැයි, ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා කියපු කරුණ, එතුමා මේ ගරු සභාව හමුවේ ඉදිරිපත් කරපු ඒ තර්කය පිළිබඳව තමයි අපි මේ කථා කරන්නේ.

විශේෂයෙන් දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලය හරහා වැටුප් හා දීමනා විධියට ගරු ආනන්ද විජේපාල මැතිතුමා රුපියල් 1,285,167ක මුදලක් අරගෙන තිබෙනවා කියන කාරණයට අදාළව තිබෙන දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලයේ වාර්තාව මම මේ ගරු සභාව හමුවේ ඉදිරිපත් කරන්නම්. විශේෂයෙන්ම පක්ෂයක් විධියට අපි මේ සභාව හමුවේ කියන කාරණා පිළිබඳව විපක්ෂයෙන් විවිධ චෝදනා එල්ල කළාට, අපි ඒ කියන කාරණා ඉතාම හොඳ, නිවැරදිතාවකින් යුතුව කියනවාය කියන කාරණය පමණයි අපිට මේ මොහොතේ සභාව හමුවේ පසක් කරන්න තිබෙන්නේ. ඒ පිළිබඳව සිහිපත් කරමින්, අද දවසේ විවාදයට අදාළ නොවුණත් තවත් එක කාරණයක් මතක් කරලා මම අද දවසේ මාතෘකාවට එන්නම්.

මේ ආණ්ඩුව බලයට පත් වෙනකොට කිව්වා, මහජනතාව මත බදු පනවන්නේ නැහැ, මහජනතාවට සහන දෙනවා කියලා. සිංහල අලුත් අවුරුද්දට සහන මල්ලක් දෙනවා කියලා කිව්වා. ඒක තවම නැහැ. පසුගිය දිනවල කිව්වා ඡන්දය නිසා ඒක දෙන්න බැහැයි කියලා. අපි බලාපොරොත්තු වෙනවා, අනාගතයේදී, ඉදිරි මාසයේදී අපේ ජනතාවට ඒ දීපු පොරොන්දු ඉටු කරයි කියලා. ඒ වාගේම විදුලි බිල අඩු කරනවාය කිව්වා. එවැනි විවිධ කාරණා කියමින් තමයි මේ ආණ්ඩුව බලයට පත් වුණේ.

මේ මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ ගෙනැල්ලා තිබෙන නියෝගය තුළින් මේ සමාජයට තවත් යම් පීඩනයක් එකතු කර තිබෙනවා කියලා තමයි අපට හිතෙන්නේ. ඒ නිසා මේ සඳහා අපේ එකඟත්වය නැහැ කියන කාරණය මේ සභාව හමුවේ අපි පළමුවෙන්ම සිහිපත් කරනවා. නිවසක් බදු පදනමට ගන්නා අපේ රජයේ සේවකයෙක් වෙන්න පුළුවන්, ඒ වාගේම ඉඩමක අයිතියක්, නිවසක අයිතියක් නැති පහළ මධ්‍යම පාන්තිකයෙක් වෙන්න පුළුවන්, ඔවුන්ට නිවසක් නැති නිසා තමයි ඔවුන් බදු පදනමට නිවසකට යන්නේ. ඒ විධියට නිවසකට යනකොට ඒ බදු පදනම මත ඒ ගෙවිය යුතු මුදල් ගෙවීම සම්බන්ධයෙන් ඔවුන් ඉතා අපහසුතාවට පත් වෙන තත්ත්වයක් තමයි මේ අනුව තිබෙන්නේ. උදාහරණයක් විධියට රුපියල් 30,000ක මාසික බද්දක් ගෙවන්න තිබෙන පුද්ගලයෙකුට එවකට මුද්දර ගාස්තු වශයෙන් ගෙවන්න වුණේ රුපියල් 7,200ක පමණ මුදලක්. නමුත් අද දවසේ මේ මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ ඉදිරිපත් කර තිබෙන නියෝගය අනුව රුපියල් 30,000ක මාසික කුලියකට නිවසකට යන අපේ ආදරණීය අම්මා කෙනෙකුට, තාත්තා කෙනෙකුට අද රුපියල් 14,400ක මුදලක් ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒක ගෙවන්න අපහසුයි, මේ ආර්ථික අපහසුතා මධ්‍යයේ ඉන්නා වෙලාවක. ඒ වාගේම තමුන්නාන්සේලා දන්නවා, නව ව්‍යාපාරයක් ආරම්භ කරනකොට බදු පදනම මත තමයි කවුරුන් හෝ ඒ ව්‍යාපාරය පවත්වා ගෙන යන්නේ කියන එක. විශේෂයෙන් අලුතින් ව්‍යාපාර ආරම්භ කරන උදවියට, නව ව්‍යාපාර සඳහා සහන දෙමින්, ව්‍යවසායකයන්ට ශක්තියක් දෙනවාය කියමින් තමයි මේ ආණ්ඩුව කටයුතු කළේ. නමුත් මේ තුළින් ව්‍යවසායකයන්, ව්‍යාපාරිකයන් අධෛර්යයට පත් වෙනවාය කියන කාරණයත් මේ මොහොතේ අපි සිහිපත් කරනවා.

ඊළඟට, අද දවසේ මේ සමාජයේ තිබෙන තවත් ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්නත් මම මේ අවස්ථාව යොදා ගන්නවා. අද ජාතික තරුණ සේවා සභාව දේශපාලනීකරණය වෙමින් තිබෙනවා. මම උත්සාහ ගන්නේ නැහැ, පරණ කාලයේ සිදු වෙච්ච දේවල් නැවත මේ සභාවේ කියන්න. ඔබ ආවේ පරණ දේවල් වැරදි නිසා නේ. අද ගමක යෞවන සමාජයක් පිහිටුවීම සඳහා පළාත් අධ්‍යක්ෂවරයා, දිස්ත්‍රික් අධ්‍යක්ෂවරයා, තරුණ සේවා නිලධාරිවරයාට අද ගමේ ඉන්න ඔබේ ප්‍රාදේශීය සභා අපේක්ෂකයා, වත්මන් මන්ත්‍රීවරයා අනිවාර්යයෙන්ම සහභාගි කරවන්න කියන නිර්ණායක ඉදිරිපත් කර තිබෙනවා. හැබැයි, අපි දන්නවා, තරුණයන් සමඟ දේශපාලන ගනුදෙනුව, තරුණයන් සමඟ ඒ කටයුතු කිරීම ඉතාම

[ගරු චානක මාදුගොඩ මහතා]

ගැඹුරින් කළ යුතු දෙයක් බව. විශේෂයෙන් ලංකාවේ අද ජාතික තරුණ සේවා සභා, යෞවන සමාජ ව්‍යාපාරය කියන්නේ දකුණු ආසියාවේ දැවැන්තම ස්වේච්ඡා සමිති ව්‍යාපාරය. අද ඒ ස්වේච්ඡා සමිති ව්‍යාපාරය තුළ ගනුදෙනු කරන ආකාරය පිළිබඳව අපට ප්‍රශ්නයක් තිබෙනවා. අද ඔබේ ගමේ තිබෙන සමාජවාදී තරුණ සමිතියේ සාමාජිකයන් අනිවාර්යයෙන් ගමේ තිබෙන යෞවන සමාජයට සහභාගි කරවන තැනට පත් වෙලා, අද ඒ සඳහා ඔවුන්ට යම් බලයක් දීලා, අද යෞවන සමාජයේ තිබෙන ලාංඡනයට - logo එකට- තරුව එකතු වෙලා තිබෙනවා. තරු එකක් නොවෙයි, හතක් එකතු වුණත් අපට ප්‍රශ්නයක් නැහැ. හැබැයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපි මේ තරුණයන් සමඟ කරන ගනුදෙනුව, විශේෂයෙන්ම දේශපාලනඥයා තරුණයන් සමඟ ගනුදෙනු කරන්න ඕනෑ ආකාරය පිළිබඳව ඔබ ආණ්ඩුවක් විධියට තේරුම් ගන්නවා නම් වටිනවාය කියන කාරණයත් මා සිහිපත් කරනවා.

ඒ වාගේම යෞවන සමාජ ක්ෂේත්‍රය ශක්තිමත් කරන තරුණ සේවා නිලධාරි මහත්ම මහත්මීන්ගේ අද විශාල හිඟයක් තිබෙනවා. විශේෂයෙන් පසුගිය කාලයේ තරුණ සේවා සභාව මඟින් බඳවා ගත්තා, යෞවන සමාජ ක්ෂේත්‍රයෙන්ම ගොඩ නැඟුණු තරුණයන්, අභ්‍යාසලාභී තරුණ සේවා නිලධාරින් විධියට. මම විශේෂයෙන් ඉල්ලීමක් කරනවා, තරුණ කටයුතු ඇමතිතුමාගෙන්. ඔවුන් ඉතා හොඳින් එම කටයුතු කළා. ඔවුන් තරුණ සේවා සභාවෙන්, යෞවන සමාජ ක්ෂේත්‍රයෙන් ගොඩ නැඟුණු කණ්ඩායමක්. ඒ නිසා තරුණ සේවා සභාව ගොඩනඟන්න ඒ අභ්‍යාසලාභී පුහුණු නිලධාරි මහත්ම මහත්මීන් මේ සේවයට එක් කරගන්න කියන ඉල්ලීමත් කරමින්, අද දවසේ සභාව හමුවේ යෝජනා කරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ ගෙනෙන නියෝගය තුළින් එක් කොටසකට -විශේෂයෙන්ම නිවාස බදු දීම් වෙන්න පුළුවන්, වෙනත් කාරණා වෙන්න පුළුවන්- සිදුවන අපහසුතාව පිළිබඳවත් අපේ විරෝධය පළ කරමින්, ඒ සඳහා අපේ එකඟත්වය පළ නොකරනවාය කියන කාරණයත් සිහිපත් කරමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.31]

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ ගෙනෙන නියෝගය අනුමත කිරීම සම්බන්ධයෙන් ද සාකච්ඡා කරන මේ මොහොතේ ගරු මුදල් නියෝජ්‍ය අමාත්‍යතුමා ඇතුළු අපේ කථිකයන් බොහෝ දෙනෙකුගෙන් එයට අදාළ කාරණා කියැවුණා. මම මේ අවස්ථාව, මේ විනාඩි කිහිපය වෙන් කරනවා මේ මාතෘකාවට සෘජුව අදාළ නොවුණත් අද දවසේත්, පසුගිය දවස් තුනේදීත් විපක්ෂයේ කථිකයන් දිගින් දිගටම සඳහන් කළ පළාත් පාලන ආයතනවල බලය පිහිටුවීම කියන කාරණය සම්බන්ධයෙන් අදහස් දක්වන්න. ඒ සම්බන්ධයෙන් කථා කරමින් ජාතික ජන බලවේගයට සහ අපගේ ආණ්ඩුවට චෝදනා එල්ල කිරීම සඳහා ඒ අය විශාල කාලයක් වැය කළා. මම හිතනවා අප ඒවාට උත්තර දිය යුතුයි කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, "ජාතික ජන බලවේගය කලින් වාගේ නැහැ, කට්ටියක් එක්ක එකතු වෙලා සභා හදනවා. හරි වැඩේ තමයි. බලන්නකෝ, මාර අපරාධයක් වෙලා තිබෙන්නේ" කියලා විපක්ෂයේ අය කියනවා. මේ ගැන කථා කරනවා නම් අපි යන්න ඕනෑ, මේ ප්‍රශ්නයේ මුලට. ඒ ගැන මතක් කර දෙන්න මම මේ වෙලාව වෙන් කරනවා. මේ ප්‍රශ්නයේ, මේ සිදුවීමේ මුල තමයි 2025 මැයි 06වැනි දා. මොකද, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම පැවැත්වුණේ එදා. ඒ මැතිවරණයේදී හැමෝම පක්ෂ වශයෙන් වෙන් වෙන්ව ඡන්දය ඉල්ලුවා. ඒ ඡන්දයේදී මිනිස්සු ලබා දුන්නා ප්‍රතිඵලයක්. පළාත් පාලන ආයතන 339ක් වෙනුවෙන් ඒ ඡන්දය පැවැත්වුණා. එම ආයතනවලින් 266ක් ජාතික ජන බලවේගය ජයග්‍රහණය කළා. විපක්ෂයේ සමහරු කෑ ගැහුවාට සමගි ජන බලවේගයට, එක්සත් ජාතික පක්ෂයට ආයතන කීයක ජයග්‍රහණ ද ලැබුණේ? ඒ පළාත් පාලන ආයතන 339න් එක්සත් ජාතික පක්ෂයට බින්දුවයි; පොහොට්ටුවට බින්දුවයි; සමගි ජන බලවේගයට ආයතන 13යි. දෙමළ සන්ධානයේ මන්ත්‍රීවරුන්ගේ මහන්සිය තමන්ගේ ගොඩට දමා ගන්න යන්න එපා. ඒගොල්ලන් ඔබතුමන්ලාත් එක්ක නැහැ නේ. එහෙම තමයි වුණේ.

පසුගිය පළාත් පාලන ඡන්දයේදී අපි ආයතන 239ක් ජයග්‍රහණය කළා. පවතින නීතියට අනුව ඒ 239න් ආයතන 151ක සභා සෘජුව පිහිටුවන්න අපට පුළුවන් වුණා. ඉතිරි පළාත් පාලන ආයතන 115ක සභා තනියම පිහිටුවන්න අපට බැහැ. අපි ඒවා දිනලා තිබෙන්නේ, මෙතුමන්ලා පැරදිලා තිබෙන්නේ. නමුත් අපට මන්ත්‍රී ධුර එකක, දෙකක, තුනක අඩුවක් තිබෙනවා. ඒක තමයි මේ ඡන්ද ක්‍රමයේ තිබෙන විධිය. හැබැයි, ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික ලක්ෂණය වෙන්න ඕනෑ මොකක්ද? ප්‍රජාතන්ත්‍රවාදය නම්, දිනපු මිනිස්සු සභාව කරගෙන යන්න එපායැ. ජනතාව යම් සභාවකට අදාළව ඡන්දය දීලා යම් කණ්ඩායමක් දිනවලා තිබෙන්නේ ඒ දිනවපු කණ්ඩායමට ඒ සභාව කරගෙන යන්නයි. එහෙම නැතුව පැරදිච්ච; ඡන්දවලින් සියයට 10ක්, 15ක් ගනිපු අයට සභාව කරගෙන යන්න නොවෙයි; සියයට 10ක් ගනිපු පක්ෂයෙන් සභාපතිවරුන් පත් කරන්න නොවෙයි. ඒක ප්‍රජාතන්ත්‍ර විරෝධියි. විපක්ෂයේ මෙතුමන්ලා මොකක්ද කළේ? ප්‍රසිද්ධියේ බොහොම අශුද්ධ සන්ධානයක් හැදුවා, මේ ආණ්ඩුව පළාත් පාලන ආයතනවල සභාපති පත් කරන ඡන්ද විමසීම් පරාජය කරන්න. එක්සත් ජාතික පක්ෂයේත්, සජබයේත්, පොහොට්ටුවේත් කට්ටිය ගිහිල්ලා එක මේසයේ වාඩි වෙලා මාධ්‍ය සාකච්ඡා පවත්වනවා අපි දැක්කා. මොකක්ද ඒකේ පදනම? දිනන්නේ කවුරුවත්, සභාව හදන්නේ තවත් කවුරුවත්. එහෙම වෙන්න පුළුවන්ද? එහෙම නම් මොකටද ඡන්ද තියන්නේ? කොළඹ නගර සභාව ගැන පසුගිය කාලයේ අමුඩ ගහගෙන වැඩ කරනවා අපි දැක්කා. මන්ත්‍රී ධුර 119ක් තිබෙන තැනින් සමගි ජන බලවේගය ගත්තේ මන්ත්‍රී ධුර 29යි. මන්ත්‍රී ධුර 119න් 29ක් අරගෙන ඒ මහ නගර සභාවේ නගරාධිපති පත් කරන්න කථා කරන්නේ කොහොමද? මොකක්ද ඒකේ පදනම? මේගොල්ලන් ඒ ඡන්ද ප්‍රතිඵලය විකෘති කරලා බොහොම දූෂිත හවුලක් හදාගෙන යන්න තමයි උත්සාහ කළේ. නමුත්, "විපක්ෂය" කියලා එකකට කවුරුවත් ඡන්දය දුන්නේ නැහැ. "විපක්ෂය" කියලා එකක් ඡන්දය ඉල්ලුවේ නැහැ. ඡන්දය ඉල්ලුවා, ජාතික ජන බලවේගය, සමගි ජන බලවේගය, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ, එක්සත් ජාතික පක්ෂය ආදිය. එහෙම නැතුව "විපක්ෂය" කියලා එකකින් ඡන්දය ඉල්ලුවේ නැහැ නේ. මිනිස්සු ජන මතය දුන්නේ වෙන වෙනම පක්ෂවලට. එතකොට දිනපු පක්ෂය පැත්තක සිටියදී පැරදිච්ච අයට බැහැ, දෙකයි, තුනයි, හතරයි, පහයි, අපි ඔක්කොම ලොකුයි කියලා සභා පිහිටුවන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, නීතියේ රෙගුලාසිවල වාක්‍ය තිබෙනවා; වචන තිබෙනවා. ඒ වාගේම, ඒවා අතර හිස්තැනුත් තිබෙනවා. ඒ හිස්තැන්වලින් රිංගලා ප්‍රජාතන්ත්‍රවාදයේ,

නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික දේවල් උල්ලංඝනය කරන්න අපි ඉඩ දෙන්නේ නැහැ. ඒවා කරන කල් බලාගෙන ඉන්න ඕනෑ නැහැ. ඉදිරියේදී අප ඒ හිස්තැන් පුරවනවා. ඒක වෙනම කථාවක්. මේගොල්ලන් මාධ්‍ය සාකච්ඡා තියලා තමයි මේ වැඩේ පටන් ගත්තේ. මේ වැඩේ පටන් ගනිද්දීම, මාධ්‍ය සාකච්ඡා තියද්දීම ඒවායෙහි වාඩි වෙලා ඉන්න පුද්ගලයන් දැක්කාම අපි දැනගත්තා ඒක මොන පැත්තට ද කැරකෙන්න යන්නේ කියලා. කොහොම හරි එහෙම තමයි ඒ දේවල් වුණේ. නමුත්, දැන් අපට චෝදනා කරනවා, අපි තව කාගේ හරි මන්ත්‍රී කෙනෙකුගේ සහයෝගය අරගෙන සභා පිහිටුවනවා කියලා. ඒක මාර කථාවක් නේ. සමගි ජන බලවේගයට පොහොට්ටුවත් එක්ක එකට වාඩි වෙලා "අපි ඔක්කොම එකතුයි. අපි දැන් ඔයගොල්ලන් පරද්දනවා" කියලා සන්ධාන ගහන්න පුළුවන්. පසුගිය කාලයේ ඡන්ද විමසීම් තුනක්ම පැවැත්වුණා. එහෙම සන්ධානයක් හදන බවක් ඒ එකකදීවත් කිව්වේ නැහැ. ජනාධිපතිවරණයේදී රාජපක්ෂලාට බැන්නා. මහ මැතිවරණයේදීත් රාජපක්ෂලාට බැන්නා. පළාත් පාලන මැතිවරණයේදීත් බැන්නා. එහෙම බැණලා එකට වාඩි වෙලා දැන් කියනවා, අපව පරද්දන්න එකතු වෙනවා කියලා. "මේ රට බංකොලොත් කළා කියලා රාජපක්ෂලාට විරුද්ධව අපි නඩු දැම්මා. නඩු දැම්මේ අපි. ඔයගොල්ලන් නොවෙයි" කියමින් මේ දසවැනි පාර්ලිමේන්තුව පටන් ගත්තු කාලයේ, ඒ කියන්නේ මීට ටික කාලයකට කලින් මෙතුමන්ලා අපිත් එක්ක රණ්ඩු වෙන්න ආවා. දැන් "මීක්" ශබ්දයක් නැහැ. දැන් ප්‍රවෘත්ති - news - පළ වෙනවා, හොර ඖෂධ ගනුදෙනු ආදිය ගැන. ඒවා පිළිබඳව තොරතුරු එළි වෙනවා. මේගොල්ලන් පූස් පැටව් වාගෙයි. වචනයක් කියන්නේ නැහැ පොදුජන පෙරමුණට හෝ රාජපක්ෂලාට හෝ ඒ හිටපු දූෂිතයන්ට හෝ විරුද්ධව. මොකද, එතකොට උඩ ගනුදෙනු අවුල් වෙනවා නේ. අපට එහෙම බාධාවක් නැහැ.

දේශපාලන පක්ෂ සම්බන්ධයෙන් අපේ තිබුණු ස්ථාවරය වෙනස් වෙලා නැහැ. අපට කිසිදු පක්ෂයක් එක්ක එහෙම විශේෂ ගනුදෙනුවක් නැහැ. අපි සභා හදනවා. අපි සභා හදනවා, ඒ සභාවල ඉන්න සභිකයන් එක්ක. ඒක තැනින් තැනට වෙනස් වෙන්නත් පුළුවන්. මොකද, අප දිනපු සභා තමයි අපි පිහිටුවන්නේ. නමුත්, විපක්ෂය මේ කරන්නේ මොකක්ද? කොහෙන්ද මේ තීරණ ගත්තේ? මේවාට කාගේද අනුමැතිය ලැබුණේ? මොකක්ද ඒ සන්ධානයේ නම? ඊළඟ ඡන්දෙට ඉල්ලන්නේ කොහොමද? මේවා ගැන පාක්ෂිකයන් දන්නවාද? පාක්ෂිකයන්ට කියලා ද, මේ තීරණ අරගෙන තිබෙන්නේ? එහෙම තීරණ ගන්නේ නැහැ. එහෙම තීරණ ගන්නේ නැති වෙනකොට ඒ පක්ෂවල මිනිස්සු ඇවිල්ලා අපට සහයෝගය දෙනවා තමයි. ගමේ සමගි ජන බලවේගයේ මනුස්සයාට; සමගි ජන බලවේගයෙන් ඡන්දය ඉල්ලලා මෙච්චර කලක් එම පක්ෂයේ දේශපාලනය කරපු මනුස්සයාට දැන් ගිහිල්ලා පොහොට්ටුවත් එක්ක එකතු වෙන්න කිව්වාට බැහැ. එහෙම උඩින් උඩින් එකතු වන තරම් ලේසියෙන් යටින් එකතු වෙන්නේ නැහැ නේ. එතකොට ඒ මිනිස්සු හිතට එකඟව තීරණ ගන්නවා තමයි. සභා පිහිටුවන එක ඒ විධියට කරන්න බැහැ.

ගරු චානක මාදුගොඩ මහතා
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
Madam, I rise to a point of Order. - *[Interruption.]*

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
There is no point of Order.

මම උදාහරණයක් දෙන්නම්, කුලියාපිටිය ප්‍රාදේශීය සභාවෙන්. *[බාධා කිරීමක්]* කලින් කථා කළ මන්ත්‍රීවරයෙක් කුලියාපිටිය ප්‍රාදේශීය සභාව තුළ පැවැති ඡන්දය ගැන කිව්වා. කුලියාපිටිය ප්‍රාදේශීය සභාව අපියි දිනුවේ. කුලියාපිටිය ප්‍රාදේශීය සභාව අපි දිනුවේ මන්ත්‍රී ධුර 21ක් අරගෙන. හැබැයි සභාපති වෙන්නේ පොහොට්ටුවේ අපේක්ෂකයෙක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චානක මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු චානක මාදුගොඩ මහතා
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ගාල්ල මහ නගර සභාව අද ජාතික ජන බලවේගයේ සභික මන්ත්‍රීවරයකුගේ සභාපතිත්වයෙන් පිහිටුවා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක කියන්න.

ගරු චානක මාදුගොඩ මහතා
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
Point of Order එක තමයි- [බාධා කිරීමක්] දැන් මෙතුමා කිව්වා- [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඒක point of Order එකක් නොවෙයි නේ. ගරු නජිත් ඉන්දික මන්ත්‍රීතුමනි, ඔබතුමා කථාව කරගෙන යන්න.

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මගේ වෙලාව ගන්න දෙන්න එපා, point of Order එකක් නොවෙයි නම්.

අපි ආසන -මන්ත්‍රී ධුර- 21ක් අරගෙන කුලියාපිටිය ප්‍රාදේශීය සභාව දිනුවා. හැබැයි එහි සභාපතිවරයා වුණේ කවුද? මන්ත්‍රී ධුර 6ක් ගනිපු පොහොට්ටුවේ සභිකයෙක්. උඩුබද්දාව ප්‍රාදේශීය සභාව මන්ත්‍රී ධුර 9ක් අරගෙන අපි දිනුවා. හැබැයි පොහොට්ටුවෙන් තමයි සභාපති පත් කළේ. නමුත් ඔවුන් එක සභාවක්වත් ඡන්දයෙන් දිනලා නැහැ. මේ ඡන්ද ප්‍රතිඵලය එහෙම විකෘති කරන්න බැහැ. එහෙම කරනවා නම් මොකක්ද ඒ මැතිවරණයේ ප්‍රතිඵලයේ තේරුම? මෙතුමන්ලාට ප්‍රතිපත්ති අදාළත් නැහැ, ප්‍රජාතන්ත්‍රවාදය අදාළත් නැහැ. එතකොට මොකක්ද ඒ දේශපාලනය? සමගි ජන බලවේගයටයි, පොහොට්ටුවටයි එකතු වෙන්න කවුද ජන වරමක් දුන්නේ, ඒගොල්ලන්ගේ පක්ෂවලින්? එහෙම ජන වරමක් දීලා නැහැ. මේගොල්ලෝ ඒ විධියට කරමින් හිතනවා, "හරි, අපිට 2යි මදි. ඔයගොල්ලෝ 3යි, 4යි, 5යි එකතු කරගෙන සභාව හදන්න. අපි බලන් ඉන්නම්" කියලා අපි ඒ දිහා නිකම් බලාගෙන ඉන්න ඕනෑ කියලා; "ඔහේගේ නම් ඔහේ ගන්න, හොඳ නැහැ නොවැ දොස් කියන්න" කියලා අපි නිකම් ඉඳීවි කියලා. එහෙම ඉන්න අපට පිස්සු නැහැ නේ. අපි දිනපු සභා අපි පිහිටුවන්න ඕනෑ. මිනිස්සු අපට බලය දුන්නේ ඒවා පිහිටුවන්න. එහෙම නැතුව පරාජිතයන්ට එකතු වෙලා ඒවා පිහිටුවන්න නොවෙයි. ඒක තමයි මේකේ මූලික ඇත්ත. එහෙම නොවෙයි නම්, නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය අනුව ඡන්දය තියන්න ඕනෑ නැහැ නේ.

[ගරු (වෛද්‍ය) නලින් ඉන්දික මහතා]

මේ රටේ මිනිස්සු දශක ගණනකට පස්සේ මේගොල්ලන් එකට තියලා පැරැද්දුවේ හේතුවක් ඇතුවයි. ඒක මිනිස්සු නිකම් විනෝදෙට කරපු වැඩක් නොවෙයි. මිනිස්සු පසුගිය ජනාධිපතිවරණයෙන් මේගොල්ලෝ පැරැද්දුවේ හේතුවක් ඇතුවයි; පසුගිය මහ මැතිවරණයෙන් මේගොල්ලෝ පරද්දලා අපට විශිෂ්ට ජයග්‍රහණයක් ලබා දුන්නේ හේතුවක් ඇතුවයි. මේ පළාත් පාලන ඡන්දයත් එහෙම තමයි. මිනිස්සු යම් සභාවක අපව දිනවලා තියෙද්දී පවතින නීතිය අනුව අපි ඒ සභා හදන්නේ නැතුව වෙනත් මොකක්ද කරන්නේ? එතකොට ඒක කොහොමද වැරැද්දක් වෙන්නේ? සභා හදන්න අපට මන්ත්‍රී ධුර ගෙදරින් ගේන්න බැහැ නේ. එතකොට මේ ඉන්න කවුරු හරි සභික මන්ත්‍රී කෙනෙකුගේ; මිනිසුන් පත් කරලා එවපු සභික මන්ත්‍රී කෙනෙකුගේ සහයෝගය අරගෙන තමයි අපි ඒ සභා හදන්නේ. හැබැයි අපි පැහැදිලිව කියනවා, අපි පක්ෂත් එක්ක ඩීල්වලට ගිහිල්ලා නැති බව. එහෙම ගියා නම් අපට කැ ගහන්න ඕනෑ නැහැ නේ. ඒ සභාවල ඉන්න තනි තනි මන්ත්‍රීවරුත් එක්ක අපි එකඟතා හදාගෙන තිබෙනවා, අපි දිනපු සභා පිහිටුවන්න. ඒක තමයි මේකේ පදනම.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපි ගේම් ගහනවා කියලා මේගොල්ලෝ කියනවා නේ. මේගොල්ලෝ දේශපාලනය කියලා දන්නේ ගේම් ගහන එක තමයි. ඒක තමයි මේ රටේ මෙච්චර කල් කළේ. ඇත්තටම හිතන්නකෝ, මේගොල්ලෝ දෙපැත්තට පැන පැන හිටපු හැටි. මොකක් හරි ඇමතිකමක් ගන්න අර පැත්තට පනිනවා, මේ පැත්තට පනිනවා. බතික් ඇමතිකම හරි කමක් නැහැ. ඒවා තමයි මේගොල්ලෝ කළේ, මෙච්චර කල්. පවුල් පිටින් පොහොසත් වෙච්ච, පවුල් පිටින් දේශපාලනය පාවිච්චි කරලා ව්‍යාපාර ගොඩනඟා ගනිපු, බෙහෙත් ටිකෙන් ගහපු, බෙහෙත් වෙනුවට වතුර දීපු ඉතාම දූෂිත සන්ධානයක් එය. මේගොල්ලෝ දේශපාලන ගේම් කියලා හිතාගෙන ඉන්නේ ඒවා. හැබැයි ගේම්වලින් ගොඩ යන්න පුළුවන් කියලාත් මේගොල්ලෝ හිතනවා. මම මෙහිදී මේ කියන කාරණය මතක තියාගන්න. තමන්ගේ පෞද්ගලික වුවමනා හින්දා තමයි, තමන්ගේ පවුල ගොඩ දාන්න, තමන්ට සල්ලි ටිකක් හම්බ කරගන්න තමයි ඔය ඔක්කෝම ගේම් ගැහුවේ. එහෙම ගේම් ගහපු අය හිතාගෙන ඉන්නවා නම්, ඒක මාර ලොකු වැඩක්, ඒගොල්ලන්ට ලොකු දේවල් කරන්න පුළුවන් කියලා, මම මේ කාරණයත් ඒගොල්ලන්ට කියන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. මෙතැන ඉන්න පෞද්ගලිකත්වය අත හැරලා වෙනත් පොදු අරමුණකට වැඩ කරන්න ආපු මිනිසුන්ට ඒ අයට වඩා ගොඩක් දුර යන්න පුළුවන්, ඒ අරමුණ වෙනුවෙන්. මෙතැන ඉන්නේ එහෙම මිනිස්සු; මේ ජාතික ජන බලවේගයේ ඉන්නේ එහෙම මිනිස්සු. ඒ පාරවල්වලින් එනවා නම්, එහෙම එනවා නම් අපි කරලා බලමු, කාටද වැඩිපුර කරන්න පුළුවන් කියලා. විකෘතියක් වෙන්න අපි ඉඩ දෙන්නේ නැහැ.

මිනිස්සු අපව දිනවලා තිබෙනවා. අපි ඒ සභා පිහිටුවනවා. අපි පළාත් පාලන ආයතනවල වැඩ කරන්නේ අපි දිනපු හින්දා. අපි පළාත් පාලන ආයතන හැදුවා. හදන්නේ ඒ පදනමෙන්. අපි දිනපු සභාව හදන්න කවුරු හරි මන්ත්‍රී කෙනෙකුගේ සහයෝගය ගනිද්දි මෙතුමන්ලා දිගටම වෙන වෙන කථා කියනවා; "ඔයගොල්ලෝ එකතු වෙන්නේ නැහැ කිව්වා නේද, කවුරුවත් එකතු කර ගන්නේ නැහැ කිව්වා නේද?" කියලා අහනවා. එහෙම එකක් නැහැ. මෙතුමන්ලා හදන්නේ "ඔයගොල්ලෝ සිල් අරගෙන නේ ඉන්නේ. ඇයි ඔයගොල්ලෝ මෙහෙම කරන්නේ" කියලා තමන්ගේ වැඩේ කර ගන්න. සිල් ගන්න වෙලාවට සිල් ගන්න එක ඇත්ත, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. හැබැයි සිල් රෙද්දෙන් අපේ අත් දෙක බැඳලා, අපේ පොකට් එකට ගහන්න මේගොල්ලන්ට අපි ඉඩ දෙන්නේ නැහැ. ඒ, අපි දිනපු සභා. අපි දිනපු ඒ සභා අපි පිහිටුවනවා. ඒකේ ආයේ අමුතු අපභ්‍රංසයක් නැහැ. ඒක තමයි මේ සිද්ධ වෙමින් තිබෙන්නේ. එහිදී මේ අවුරුදු කිහිපයේ දූෂිත වළල්ලක් එක්ක එකතු වෙලා තමන්ට පය තියාගන්න මොකක් හරි කොනක්, නගර සභා කිහිපයක් පිහිටුවාගෙන එල්ලිලා ඉන්න තැන් හෙව්වා නම් අපි ඒකට ඉඩ දෙන්නේ නැහැ. ඒ නිසා තමයි අපි මේ සභා පිහිටුවීම කරන්නේ. මේක හරි පැහැදිලියි. අපේ ප්‍රතිපත්තියක් තිබෙනවා. අපි කවුරුවත් එක්ක ඩීල් කරලා නැහැ. මේගොල්ලන් කවුරුවත් එක්ක, පක්ෂත් එක්ක සාකච්ඡා කරලා එකඟතාවලට ඇවිල්ලා නැහැ. එහෙම නම්, ඔය සභාවල resultsවලින් ඒක බලා ගන්න පුළුවන්. ඒ නිසා ඒ අය ගේම්කාරයෝ, මේවා කරන්න පුළුවන්, දෙන්නම් ආණ්ඩුවට කියලා හිතුවා නම් මහත්වරුනේ ඒක කරන්න බැහැ. ඒක තමයි මේ ඔප්පු වෙමින් තිබෙන්නේ. අපි එහෙම කරන්න ඉඩ දෙන්නේ නැහැ. අපි දිනපු සභාවල බලය අනිවාර්යයෙන්ම අපි පිහිටුවනවා. මෙච්චර කල් බලය තිබුණා නේ. ප්‍රාදේශීය සභාවක හරි බලය ඕනෑ නම්, ඉස්සෙල්ලා ඡන්දයෙන් දිනලා එන්න. නැත්නම්, ඡන්ද තියන්න ඕනෑ නැහැ නේ. ඡන්දයෙන් පැරදිලා සියයට 10යි, සියයට 15යි, සියයට 13යි, සියයට 14යි එකතු කළාම සියයට 50ට වැඩියි කියලා සූත්‍ර දමන්න එන්න එපා. ඒක ප්‍රජාතන්ත්‍රවාදයටත් විරුද්ධයි. පනත්වල හිස්තැන්වලින් විතරක් පනින්න ලෑස්ති වෙන්න එපා. එතකොට අපි අත් දෙක බැඳගෙන බලාගෙන ඉන්නේ නැහැ. ඒ නිසා අපට චෝදනා කරන්න කලින් පොඩ්ඩක් හිතන්න. තනි තනි මන්ත්‍රීවරු එක්කයි අපි ගනුදෙනු කරන්නේ. ඉතිහාසයේ දරපු සියලු ප්‍රතිපත්ති අත්හැරලා සජබ, පොහොට්ටු, යූඑන්පී එක තැනකට එකතු වෙලා සන්ධානගත වෙලා, තමන්ගේ ප්‍රතිපත්ති පාවා දීම ගැන බොහොම ගැඹුරින්, seriously හිතන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.42]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා point of Order එකක් ඉදිරිපත් කරන්න ගිය අවස්ථාවේ ඔබතුමියත් සමඟ අනෙක් හැමෝම "මොකක්ද, මොකක්ද?" කියලා ඇහුවා. ඒ වෙලාවේ අපි නැඟිට්ටේ නැහැ. හැබැයි, ඔබතුමිය හොඳටම දන්නවා, Standing Orders ගැන. Standing Order 91(e) states, I quote:

> "Every Member must confine his observations to the subject under discussion;"

ඒ ගරු මන්ත්‍රීතුමා කථා කළේ සම්පූර්ණයෙන්ම topic එකෙන් පිට. එහෙම වෙනවා. එතුමාට ඒ අවස්ථාව දෙනවා නම් අපේ මෙතුමාටත් ඒ අවස්ථාව දෙන්න ඕනෑ.

ඒ කෙසේ වෙතත්, අද අපි කථා කරනවා ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ගෙනෙන රෙගුලාසි සම්බන්ධයෙනුත්. නමුත්, කලින් කථා කළ මන්ත්‍රීතුමා නොයෙකුත් චෝදනා එල්ල කළා. ඇත්ත කථාව මේකයි. ගිය පාර මහ ඡන්දයෙන් සියයට 62ක් වාගේ ප්‍රමාණයක් ඔබතුමන්ලා

ගත්තා. නමුත්, පළාත් පාලන ඡන්දයේදී ඒක සියයට 43ට අඩු වුණා. ඒක තමයි ඇත්ත. නමුත් ඒ ගැන නොයෙකුත් දේවල් මෙතැන කියන්න පුළුවන්. අපට කිව්වා, සුන්බුන් එකතු කරගෙන සභාවල බලය හදන්න හදනවා යනාදී වශයෙන්. එතකොට ඔබතුමන්ලාත් සභාවල බලය හදලා තිබෙන්නේ සුන්බුන් එකතු කරගෙන තමයි. මට හොඳට මතකයි, ඡන්දයට කලින් කිව්වා, ඔක්කොම ඉන්නේ හොරු කියලා. NPP එක හැරෙන්න අනෙක් ඔක්කොම හොරු කිව්වා. එහෙම කිව්වා නේ. කිව්වා, කිව්වා. පළාත් පාලන ආයතනවලට සල්ලි දෙන්න කලින් සිය පාරක් ද කොහේද හිතන්න ඕනෑ කිව්වා, හොරකම් කරයි කියලා. ඉතින්, මොකක්ද දැන් කියන්නේ? දැන් ඉන්නේ සුන්බුන් එකතු කරගෙන නොවෙයිද, දැන් හොරුත් එක්ක එකතු වෙලා නොවෙයිද ඒ සභා හදලා තිබෙන්නේ? මම ඕවා ගැන වැඩිය කථා කරන්න යන්නේ නැහැ. ඩීල් ගහපු කට්ටිය හිටියා තමයි. ඩීල් ගහන කට්ටිය දැන් ඒ පැත්තෙනුත් අපට පෙනෙන්නේ. නමුත් අපි ඩීල් ගහන කට්ටිය නොවෙයි. එච්චරයි මට ඒ සම්බන්ධයෙන් කියන්න තිබෙන්නේ.

ගරු ඇමතිතුමා අද මේ කාරණාව ඉදිරිපත් කරන කොට කිව්වා, මේ අණ පනත් යාවත්කාලීන කරන්න ඕනෑ නිසා තමයි මේ යෝජනා ගෙනැල්ලා තිබෙන්නේ, එහෙම නැතිව මිනිස්සු අමාරුවේ දමන්න නොවෙයි කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, එතකොට ඔබතුමිය හිටියේ නැහැ, මේ පාර්ලිමේන්තුවේ. මට මතකයි, ලංකාව වැටිලා හිටපු අවස්ථාවේ ගොඩ ගන්න අත්‍යවශ්‍ය අණ පනත් ගෙනෙන කොට එදා හිටපු NPP එක ඒ කිසිම එකකට සහයෝගය දුන්නේ නැහැ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට කුඩු පට්ටම් වෙන්න පහර ගැහුවා. ඒකට කියන්න තිබෙන වර්ගයේ ඔක්කොම කිව්වා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, දවස් තුන හතරකට කලින් ගීතා ගෝපිනාත් ලංකාවට ආවා. "2022න් පස්සේ රට ගොඩ ගත්තේ කොහොමද, ඉදිරියට මොනවාද කරන්නේ?" කියන කාරණය සම්බන්ධයෙන් සමුළුවක් පැවැත්වුණා. මමත් ඒකට ගියා. ගරු ජනාධිපතිතුමාත් ඒකට ඇවිල්ලා හිටියා. එතැනදී ලොකුවට IMF එක ගැන කථා කළා. IMF එකට වඩා කෙනෙක් නැති තත්ත්වයට කථා කළේ. හැබැයි, එදා ඒ අත්‍යවශ්‍ය අණ පනත් ගෙනෙන කොට විරුද්ධ වුණා. ශ්‍රී ලංකා මහ බැංකුව ස්වාධීන කිරීමේ පනතට සම්පූර්ණයෙන්ම විරුද්ධ වුණා. එතුමන්ලා විරුද්ධ වුණේ ප්‍රතිපත්තියක් මත. ඒ ප්‍රතිපත්තිය තමයි මහ බැංකුව කියන ආයතනය ඡන්දයෙන් පත් වෙච්ච රජයට -ආණ්ඩුවට- පුළුවන් වෙන්න ඕනෑ, කළමනාකරණය කරන්න. ඒක තමයි ඔබතුමන්ලාගේ ප්‍රතිපත්තිය. මොකද, ඒ කට්ටියට එහෙම ස්වාධීනත්වයක් දෙන්න බැහැ කිව්වා. මොකද, ඒ කට්ටිය ඡන්දයෙන් ඇවිල්ලා නැහැ කිව්වා. එහෙම නම්, දැන් කොහොමද ශ්‍රී ලංකා මහ බැංකුව පනත සියයට 5,000ක් හොඳයි කියලා කියන්නේ?

ඊට පස්සේ අපි සම්මත කර ගත්තා, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පත, රාජ්‍ය ණය කළමනාකරණ පනත, ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත. මේ සියලු පනත්වලට ඔබතුමන්ලා විරුද්ධ වුණා. ඔය පැත්තේ මන්ත්‍රීතුමන්ලා සුප්‍රිම් උසාවියට ගිහිල්ලා කිව්වා, මේ ආර්ථික පරිවර්තන පනතට විරුද්ධයි, ඒක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවටත් විරුද්ධයි කියලා. හැබැයි දැන් අද මොකද වෙලා තිබෙන්නේ? මම දැක්කා අපේ ජනාධිපතිතුමාගේ කථාවේදී මහින්ද සිරිවර්ධන කියන විශ්‍රාම යන මුදල් ලේකම්තුමා මහා ලොකුවට වර්ණනා කරනවා. ඒ කාලයේ කිව්වා හිරේ දානවා කියලා. පුදුම විදියට බැන්නේ. ජනාධිපතිතුමා නොවෙයි වෙනත් පුද්ගලයෝත් එහෙම කළා. හැබැයි දැන් ඒ අයට එතුමා හොඳයි. මේක කබරගොයා තලගොයා කර ගන්නවා වාගේ වැඩක්. ඉස්සෙල්ලා කිව්වා ඩීල් දාන එක වැරදියි, සුන්බුන් ගන්න එක වැරදියි, ඒ අය හොරු කියලා. නමුත් දැන් ඔබතුමන්ලා ගන්නකොට ඒගොල්ලන් ඉතාම විශිෂ්ට පුද්ගලයෝ. මොකක්ද මේ? ප්‍රතිපත්තියක් තිබෙනවා නම් ප්‍රතිපත්තියේ ඉන්න. ඔබතුමන්ලාට අවශ්‍ය number එක නැත්නම් පැත්තකට වෙලා ඉන්න. එක එක වෙලාවට කටුස්සා වාගේ - chameleon වාගේ - පාට වෙනස් කරන්නේ නැතිව.

ඩිජිටල් තාක්ෂණය භාවිත කරලා බදු ගෙවීම කාර්යක්ෂම කරන එක අපි සම්පූර්ණයෙන්ම පිළිගන්නවා; ඒක හොඳයි; ඒක විය යුතුයි. හැබැයි දැන් මෙතැන ලොකු අවුලක් තිබෙනවා. මම දිගින් දිගටම කිව්වා Unique ID එක ගෙනෙන්න ආචාර්ය හාන්ස් විජයසූරිය ඇවිල්ලා consultant කෙනෙකු හැටියට ජනාධිපතිතුමා සමඟ වැඩ කරනවා. එතැන අවුල තිබෙන්නේ unique ID එක සම්බන්ධයෙන් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. අවුල තිබෙන්නේ ඒක කරන අතරතුර polycarbonate cards මිලියන 15ක්ද කොහේද - මට හරියට මතක නැහැ - ගන්න ටෙන්ඩර් එකක් දාලා තිබෙන එක. ඉතින් ඒක අවශ්‍ය නැහැ. මොකද, මේක redundant. අපට unique ID එක තිබෙනවා නම්, ඒ unique ID එකට කාඩ් එකක් ඕනෑ නැහැ. Aadhaar එකට කාඩ් එකක් ඕනෑ නැහැ. Iris එක වෙන්න පුළුවන්, fingerprint එක වෙන්න පුළුවන්. නැත්නම් බොහෝ දුරට අද පාවිච්චි කරන්නේ telephone එක, කාඩ් එකක් ඕනෑ නැහැ. Polycarbonate card එකක් ඩොලර් එකක් දෙකක් විතර වෙනවා. කාඩ් එකක් ඕනෑම නම් මම කිව්වා, PVC card එකක් දෙන්න කියලා. මොකද, වැඩි කාලයක් ඒක පාවිච්චි කරන්න ඕනෑ නැති නිසා. මොකද, Unique ID එක එන නිසා. මතයක් ආවා, පනතේ තිබෙන්නේ අවුරුදු 10ක් කාඩ් එක පාවිච්චි කරන්න ඕනෑ කියලා. පාර්ලිමේන්තුව තිබෙන්නේ පනත් යාවත්කාලීන කරන්න තමයි. එතකොට අද කියනවා නම් මේ කරන්නේ රටේ අවශ්‍යතා අනුව පනත යාවත්කාලීන කරන එක කියලා, ගරු ඩිජිටල් ඇමතිතුමාට මම යෝජනා කරනවා අපි ඒ පනත වෙනස් කර ගනිමු, අවුරුදු 10 නොවෙයි අවුරුදු 2කට කියලා. එතකොට අනවශ්‍ය විධියට polycarbonate cardsවලට සල්ලි වියදම් කරන්න ඕනෑ නැහැ.

දැන් මම අහගෙනයි කියනවා 2025 පසුගිය කාර්තුවේ ආර්ථික වර්ධන වේගය 4.8ක් කියලා. හොඳයි. හැබැයි අමතක කරන්න එපා, 2024 පළමුවෙනි කාර්තුවේ 5.1යි, දෙවෙනි කාර්තුවේ 4.1යි, තුන්වෙනි කාර්තුවේ 5.3යි, හතරවෙනි කාර්තුවේ 5.4යි. එතකොට පහළට ඒමක් තිබෙන්නේ. ඉහළට යෑමක් නොවෙයි. අපි දිගින් දිගටම කියන්නේ දැන් අවශ්‍ය ස්ථාවර කිරීමක් නොවෙයි, වර්ධනයක්. වර්ධනයට අවශ්‍ය වෙන්නේ ආයෝජනය. දැන් මේ සභාවේ දී ලොකු කථාවක් වුණා, ගරු ඇමතිවරයෙක් කිව්වා, ලංකාවේ පළමුවෙනි වතාවට පළමුවෙනි කාර්තුවේ ඩොලර් මිලියන 650ක සෘජු විදේශ ආයෝජන ඇවිල්ලා තිබෙනවා කියලා. හැබැයි ඇත්ත කථාව, ඒක එහෙම නොවෙයි. ඩොලර් බිලියන 80 ගාණක් වාගේ තමයි අපට ආරංචි විධියට ඇවිල්ලා තිබෙන්නේ. ඒ නිසා ඒවා ගැන සොයලා බලන්න. මොකද, මෙතැනට එක එක දේවල් කිව්වාට, ආයෝජකයෝ එනවා කියලා කිව්වාට, අයෝජකයෝ එන්නේ නැත්නම් ඒ යථාර්ථය තේරුම් ගන්න.

අපි ඊයේ TV එකේ දැක්කා පුද්ගලයෙක් කියනවා ඒගොල්ලන්ගේ foam mattress company එක වහලා දාලා යන්න යනවා කියලා. ඊයේ පෙරේදා ඇඟලුම් කර්මාන්තයකුත් වහලා ඒ කට්ටිය ගියා. අපට පත්තරෙන් බලන්න ඕනෑ ආයෝජකයෝ එනවා, ආවා, හෙට එනවා කියලා කියන එක නොවෙයි. ආයෝජකයෝ ආපහු යන එක තමයි අපට වැඩිපුර දකින්න ලැබෙන්නේ.

අවසාන වශයෙන් මම මේකත් කියන්න ඕනෑ. තව සති කීයද තිබෙන්නේ ඇමෙරිකාවේ tariff ප්‍රශ්නය විසඳා ගන්න? මම හිතන

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

විධියට, ලබන මාසයේ 9වෙනි දා වෙනකොට ඒ නියමිත දවස් 90 පනිනවා. නමුත් කෝ, රජය මොකක්ද ඒ වෙනුවෙන් කළේ? රජය අපට කිව්වා ඇමෙරිකාවයි, ලංකාවයි එකතු වෙලා ඒකාබද්ධ statement එකක් ඉදිරිපත් කරනවා කියලා. ගරු ජනාධිපතිතුමා ම කිව්වා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. නමුත් තවම ඒක ඇවිල්ලා නැහැ, දැන් මාස දෙකහමාරක් ගිහිල්ලාත්. තව සති දෙකයි තුනයි තිබෙන්නේ. කරුණාකරලා අපට කියන්න, මොකද වෙන්නේ කියලා. ඩොලර් බිලියන 3යි දශම ගණනක වටිනාකමකින් යුත් අපනයන අපි ඇමෙරිකාවට යවනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒවායෙන් MFN plus 10 එක ගත්තාම ඩොලර් බිලියන 2.94ක අවදානමක් තිබෙනවා, මේ reciprocal tariff එක බේරා ගන්න බැරි වුණොත්. දැන් එක ආයතනයක් වැහුවා; ආයතන දෙකක් වැහුවා. එතකොට කවුරු හරි කියන්න පුළුවන්, මේක මේ systemic ප්‍රශ්නයක් නොවෙයි, එතැන අවුලක්; මෙතැන අවුලක් වෙන්න ඇති කියලා. අපි පිළිගනිමුකෝ ඒක. Foam mattresses manufacturing plant එකේ කථාවේ වෙනම ප්‍රශ්නයක් තිබෙනවා කියලා හිතමු. හැබැයි, systemic ප්‍රශ්නයක් වෙනවා, ඔය කට්ටියට මේ ප්‍රශ්නය විසඳා ගන්න බැරි වුණොත්. එතකොට ආයතන එකක් දෙකක් නොවෙයි, හැම තැනම ආයතන වැහෙන්න පටන් ගන්නවා. අපි මාස දෙකහමාරක් බලාගෙන හිටියා. ආණ්ඩුවට කල් දුන්නා. හැබැයි, ආණ්ඩුව රටටවත්, අපටවත්, කිසිම කෙනෙකුට, ආයෝජකයන්ට කියලා නැහැ, මෙන්න අපේ plan එකක් තිබෙනවා, මෙන්න මේක තමයි අපි resolve කරලා තිබෙන්නේ, මේක තමයි අපේ ඩීල් එක කියලා. තැන් තැන්වල, නගර සභාවල අර සුන්බුන්,-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මට තත්පර 30ක් දෙන්න.

සුන්බුන් එක්ක ඩීල් ගහලා වැඩක් නැහැ. ඩීල් එක ගහනවා නම් ගහන්න ඕනෑ, ඇමෙරිකාවේ ට්‍රම්ප් එක්ක. ඒකයි අපි බලාපොරොත්තු වෙන ඩීල් එක. එහෙම ඩීල් එකක් ගහන්න පුළුවන් නම්, ඔන්න වැඩක් කරලා තිබෙනවා කියලා අන්න අපට කියන්න පුළුවන්.

අවසාන වශයෙන් මම මේ කාරණය කියන්න ඕනෑ. කරුණාකරලා මේක තේරුම් ගන්න. මේ රටේ දරිද්‍රතාව ශීඝ්‍රයෙන් ඉහළ ගිහිල්ලා තිබෙනවා. Department of Census and Statistics ඉදිරිපත් කර තිබෙන ගණනය කිරීම් අනුව, අද කොළඹ සිටින හතර දෙනෙකුගෙන් යුත් පවුලකට මාසයකට රුපියල් 70,328ක් අවශ්‍යයි, මැරෙන්නේ නැතුව ජීවත් වන්න. රුපියල් 70,328ක් අවශ්‍යයි. එහෙම නම් රැකියා නිර්මාණය වෙන්න ඕනෑ. ආදායමක් ලැබෙන්න ඕනෑ. ආයෝජන එන්න ඕනෑ. ඒ නිසා මේ වල්පල් කථා කරලා, සුන්බුන් එක්ක ඩීල් ගහලා ඇති වැඩක් නැහැ. කරන වැඩේ හරියට කරන්න. ඒකයි අපි මේ ධනාත්මක විවේචනයක් ඔබලාට ඉදිරිපත් කරන්නේ. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නිශාන්ත පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.53]

ගරු නිශාන්ත පෙරේරා මහතා
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ ගෙනෙන නියෝගය සහ ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි දෙකක් පිළිබඳව සාකච්ඡාවට ගන්නා මේ මොහොතේ, ඇත්තටම අපි අවධාරණය කර ගන්න ඕනෑ කාරණා කිහිපයක් තිබෙනවා. විපක්ෂය පැත්තෙන් මේ විශේෂ විධිවිධාන පනත යටතේ වූ නියෝගය සහ මේ රෙගුලාසිවලට වඩා කථා වුණේ මොනවා ගැනද? එක පැත්තකින් විපක්ෂය මතු කරන්න ගත්තා, අපේ රට කර්මාන්ත සම්පූර්ණයෙන්ම වහලා ආපස්සට තල්ලු කරගෙන යනවා කියලා. අනෙක් පැත්තෙන් රට ආපස්සට යනවා කියන එක තහවුරු කරන්න ගත්තා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, නමුත් ජාතික ජන බලවේගයට -අපට - මේ රට භාර දුන්නේ කොහොමද කියලා විපක්ෂයේ මේ උදවියට මතක නැහැ. ලංකාවාසී ජනතාවත්, ඒ වාගේම ලෝකවාසී ජනතාවත් දන්නවා, අපට රට භාර දුන්නේ මොන විධියටද කියලා. මුළු රටම මහ පාරට ඇදලා දාලා, අත පය හතර කඩලා දාලා, මේ රට බංකොලොත් කරලා, මේ රට බංකොලොත් කියලා මුළු ලෝකයටම කියලා තමයි අපට මේ රට භාර දුන්නේ. නමුත් දැන් කියනවා, රට ආපස්සට යනවා කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, රටක් විධියට අපට අභියෝග දෙකක් තිබුණා. එකක් මේ රටට ඩොලර් නැති වෙලා තිබුණා. අනෙක් පැත්තෙන් රුපියල් නැති වෙලා තිබුණා. මේ දෙකම උඩට අරගෙන රට ඇවිද්දවීමේ වුවමනාව තමයි ගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ වර්තමාන ආණ්ඩුවට තිබුණේ. දැන් ඒක ඉස්සරහට යනවා. ඉතින්, දැන් මේ ගොල්ලන්ට හරි අමාරු වෙලා තිබෙනවා; රිදිලා තිබෙනවා. ඒ වාගේම ඒක ජනතාවගේ පැත්තෙන් ගත්තොත්, ජනතාව ඒකට ශක්තිය සපයනවා; ධෛර්යය සපයනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, පසුගිය පළාත් පාලන මැතිවරණයෙන් ඒක තමයි පෙන්නුම් කළේ. ඊට පෙර ජාතික ජන බලවේගයට කිසිදු පළාත් පාලන ආයතනයක බලය තිබුණේ නැහැ. බලය තිබුණේ කාටද? ඒගොල්ලන්ට. බලය තිබුණේ, පොහොට්ටුවට. බලය තිබුණේ, සජබයට. බලය තිබුණේ, යූඑන්පී එකට. කොළඹ මහ නගර සභාවේ අවුරුදු 75ක් බලය තිබුණේ කාටද? අපටද? ජාතික ජන බලවේගයටද? වමටද? නැහැ. අවුරුදු 75ක් කොළඹ තිබුණේ කොළ පාටට. හැබැයි, අවුරුදු 75කට පස්සේ මේ රටේ ජනතාව කොළඹ රතු පාට කළා. සියලු පළාත් පාලන ආයතන තිබුණේ ඒ දෙගොල්ලන් යටතේ. අපට එකදු පළාත් පාලන ආයතනයක්වත් තිබුණේ නැහැ. තිබුණු එකම ප්‍රාදේශීය සභාව - තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව - කොමසාරිස් පාලනයට අරගෙන අපෙන් උදුරා ගත්තා. ඒක තමයි ඉතිහාසය. හැබැයි, අපි නොබියව කියනවා, අද අපට සතුටුදායක දවසක් කියලා. කොළඹ අගනගරයේ බලය අපි ගත්තා. කෝට්ටේ අගනගරය සීසීකඩ යැව්වා. මෙතුමන්ලාට එකදු කොට්ඨාසයක් දිනා ගන්න බැරි වුණා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒ වාගේම තමයි අද ගාල්ලේ මහ නගර සභාවත් ජාතික ජන බලවේගයේ අපි ජයග්‍රහණය කරලා තිබෙනවා. ගාල්ලත් එහෙමයි. ගාල්ලත් කොළ පාටින් තමයි තිබුණේ. ඒකත් ජාතික ජන බලවේගයේ අපි දිනලා තිබෙනවා. දැන් මේගොල්ලෝ කියනවා, "ඩීල්" කියලා. අපි අභියෝග කරනවා. ගාල්ලේ පොහොට්ටුවේ නායකයෝ ඉන්නවා. ගාල්ලේ සජබයේ නායකයෝ ඉන්නවා. අපි අභියෝග කරනවා, ඒගොල්ලොත් එක්ක මොකක්ද දාපු ඩීල් එක කියලා ප්‍රසිද්ධියේ කියන්න කියලා. පළාත් පාලන ආයතනවල හිටපු මහජන නියෝජිතයෝ හැටියට අපි දන්නවා, ඒ පළාත් පාලන ආයතනවල අවංක සභිකයෝ ඉන්න බව. ඇත්තටම පළාත් පාලන ආයතන ජයග්‍රහණය -

ගරු චානක මාදුගොඩ මහතා
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
Madam, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මොකක්ද point of Order එක, ගරු මන්ත්‍රීතුමා?

ගරු චානක මාදුගොඩ මහතා
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ස්ථාවර නියෝග 90 (ඒ),-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
එහෙම එකක් නැහැ.

ගරු චානක මාදුගොඩ මහතා
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
'ඩීල්' එක තමයි, උපනගරාධිපති -

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නිශාන්ත පෙරේරා මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව කරගෙන යන්න.

ගරු නිශාන්ත පෙරේරා මහතා
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)
දේශපාලනයේදී ජංගියේ කක්කා කරගන්නේ නැතුව ඉන්න. ඕවා කියවලා එන්න. ජංගියේ කක්කා කර ගන්න කට්ටියත් ඉන්නවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. අපි කිව්වේ පක්ෂ එක්ක 'ඩීල්' නැහැ කියලා. පළාත් පාලන ආයතනවලට අසීමිත විධියට ආදරය කරන නියෝජිතයෝ ඉන්නවා. අපි එක්ක කථා කරනවා. ඔය සභාපතිවරු, ප්‍රාදේශීය සභා සුන්නද්දූලි කරන කොට, ප්‍රාදේශීය සභාව ගෙදර අරගෙන යන කොට ඒ අවංක මහජන නියෝජිතයෝ සමහර පළාත් පාලන ආයතන ඡන්දවලින් පරද්දලා තිබෙනවා. ඒක ඇල්පිටියෙත් කළා. ඒ නිසා ඒ අවංක මහජන නියෝජිතයෝ අද ජාතික ජන බලවේගයත් එක්ක එකතු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේගොල්ලෝ කියනවා දැන් කර්මාන්ත වැටිලා කියලා; කර්මාන්ත වැටිලා කර්මාන්ත, හකුළා ගෙන යනවා කියලා. මේගොල්ලන්ට මතක නැහැ, කර්මාන්තවලට කරපු සෙල්ලම් ටික. පොහොර හදන්න තිබුණු කර්මාන්තශාලා වහලා වධකාගාර දාලා, දැන් කියනවා කර්මන්ත වැහිලා ලු. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, කර්මාන්තශාලාවේ ඉඳලා ගබඩාව දක්වාම වැහුවා, විකුණුවා අපට මතකයි. ගාල්ලේ, ගිංතොට තුනී ලැලි සංස්ථාව වැහුවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, සාමාන්‍යයෙන් ඒ දවස්වල ගිංතොට තුනී ලැලි සංස්ථාවේ වැඩ කරනවා කියලා කිව්වොත් ලොකු පිළිගැනීමක් තිබුණා. ගිංතොට තුනී ලැලි සංස්ථාවේ වැඩ කරන සේවකයෙකු කසාද බඳින්න කසාද යෝජනාවක් ආවාම, කවුරුත් ඒ යෝජනාව ස්ථිර කරනවා. මොකද ඔහු ගිංතොට තුනීලැලි සංස්ථාවේ වැඩ කරන සේවකයෙක් නිසා. එහෙම තත්ත්වයක තමයි ගිංතොට තුනී ලැලි සංසථාව තිබුණේ. අපට ඩොලර් ආවා. ඒවා විදේශ රටවලට යනකොට අපට ඩොලර් ආවා. ලංකාවේ රුපියල් ආවා. ගිංතොට තුනී ලැලි සංස්ථාවට මේ දෙගොල්ලන් මොකක්ද කළේ? දැන් මේ දෙගොල්ලන් පූට්ටුවෙලා පළාත් පාලන ආයතන හදන්න හදනවා. පූට්ටුවෙලා පළාත් පාලන ආයතන හදන්න හදන පූට්ටු විපක්ෂයත් එක්ක අපේ ඩීල් නැහැ.

මහපොළොව විකුණාගෙන කන එකට විරුද්ධ, මේ රටට ආදරය කරන ජනතාවත් එක්ක ඉන්න නියෝජිතයන් අපිත් එක්ක ඉන්නවා. අද ගිංතොට තුනී ලැලි සංස්ථාව නැහැ. ඒ මැෂින් ටිකත් නැහැ. බිමත් නැහැ. ඒවා විකුණාගෙන කාලා. ඒවා ගැන කැක්කුමක් තිබෙන ඇත්ත මහජන නියෝජිතයන් බිම් මට්ටමින් ඉන්නවා. ඒ වාගේ ආයතන බේරා ගන්නවා නම්, මේගොල්ලන් එක්ක ගිහින් බේරා ගන්නද? ඒක මේගොල්ලෝ එක්ක ගිහිල්ලා බේරා ගන්න බැහැ. ඒක බේරා ගන්න ජාතික ජන බලවේගයත් එක්ක අද පෙළ ගැහෙනවා. ඒක තමයි ඇත්ත.

අද බදු සහන ගැන කථා කළා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේගොල්ලන් බදු සහන දුන්නේ කාටද? දැන් හරි කැක්කුමෙන් කථා කළා, රුපියල් දහයක් වැඩි කරලා කියලා. සාමාන්‍යයෙන් රුපියල් දාහකට ගාස්තුව රුපියල් දහයක් ලෙසයි තිබුණේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

ඒක දැන් රුපියල් 1,000කට, රුපියල් 20ක් කළා. මේගොල්ලන් ඒක එකතු කරලා දුන්නේ කාටද? කෙහෙළිය රඹුක්වැල්ලලා බදු සල්ලි ටික විද ගන්නකොට, මේ දෙගොල්ලන් එකට එකතු වෙලා, ගාල්ලේ මන්ත්‍රීවරුනුත් එකතු වෙලා අත ඉස්සුවා. ජොන්ස්ටන්ලාගෙන්, අර්ජුන් ඇලෝසියස්ලාගෙන් රුපියල් කෝටි 16,000ක බදු සල්ලි ගන්නකොට "මීක්" සද්දයක් නැහැ. ජාතික ජන බලවේගයේ පාලනය ඇවිල්ලා අර්ජුන් ඇලෝසියස්ලාගේ බදු සල්ලි ගත්තේ නැද්ද? ජොන්ස්ටන්ලාගේ බදු සල්ලි ගත්තේ නැද්ද? ගත්තා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, යුරෝපයේ රටවල ජනතාව බදු ගෙනැල්ලා දෙනවා; කර්මාන්තකරුවන් බදු ගෙනැල්ලා දෙනවා. මේගොල්ලන් පිට රට ගිහිල්ලා කරපු සෙල්ලම් දැක්කාට පස්සේ අපේ රටේ මිනිස්සු බදු ගෙවයි ද? නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපට මතක විධියට අපේ රටට ඩොලර් නැති වෙන්න එක හේතුවක් වුණේ මොකක්ද? හම්බන්තොට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයෙක් කරපු ක්‍රියාවක් ගැන අපට මතකයි. රුසියානු පෙම් යුවළක් අපේ රටට ආවා. අපේ රටේ එක්කෙනා අර පෙම්වතියට හිතේ තිබුණු එක කරන්න ගිහිල්ලා, පෙම්වතිය ඉස්සරහ පෙම්වතා මැරුවා. අපේ රටට ඩොලර් ලැබෙන්නේ නැතිව ඩොලර් හිරවුණේ එහෙමයි. ඩොලරුත් නැති වුණා. ඊළඟට, රුපියල් නැති වුණේ කොහොමද? ඔයගොල්ලන් ජොන්ස්ටන්ලාට, අර්ජුන් ඇලෝසියස්ලාට ඒ බදු සල්ලි ටික එහේ ගොඩ ගහගන්න ඉඩ දුන්නා. ජාතික ජන බලවේගයේ පාලනය ආවා විතරයි නීතිය ක්‍රියාත්මක වුණා. යුක්තිගරුක දේශයක්, සාධාරණ සමාජයක්, නිවහල් මිනිසෙක් හැදෙන්න පටන් ගත්තා. ලෝකයට විශ්වාසය හැදුණා, ගරු ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. අපේ රටට ඩොලර් එන එක නතර වුණේ කොහොමද කියලා මේගොල්ලන්ට මතක නැහැ. විදේශ ආයෝජකයන් අපේ රටට එනකොට නිමල් සිරිපාල ද සිල්වා හිටපු ඇමතිවරයා ඔවුන්ව අමාත්‍යාංශයේ නිල කාමරයට එක්කගෙන ගියා. එක්කගෙන ගිහිල්ලා ඇහුවේ මොකක්ද? "මට හම්බ වෙන්නේ කීයද?" කියලා ඇහුවා. දැන් ජපානයේ තානාපතිතුමා ප්‍රසිද්ධියේ ලෝකයටම ඒ ගැන කියනවා. අපි බලයට ඇවිල්ලා අපේ රටේ ඩොලර් සංචිතය බිලියන 6.5 දක්වා ඉස්සුවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු නිශාන්ත පෙරේරා මහතා
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)
මට තව තත්පර 30ක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. *[බාධා කිරීමක්]* භය වෙන්න එපා, අපි ඒක බේරා ගන්නම්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපේ රටේ සංචිතය ඩොලර් බිලියන 6.5 දක්වා වර්ධනය කර ගත්තේ අපේ රට කෙරෙහි විශ්වාසය හදලායි. අපේ ගරු ජනාධිපතිතුමා ඒ විශ්වාසය හැදුවා. අද ආයෝජකයෝ අපේ රටට එනවා. ඒක මේ අයට දරාගන්න බැහැ. අද අපේ රටට ඩොලර් එනවා; අද වන විට අපි රුපියල් ඉතුරු කරනවා. අපේ ජනාධිපතිතුමා විදෙස් රටකට යනකොට සාක්කුවට දාපු සල්ලි ටික, pocket money ඉතිරි කරගෙන ඇවිල්ලා එතුමා නැවත ඒ මුදල් භාර දුන්නා. වර්තමාන ආණ්ඩුව එහෙමයි; ඇමතිවරුන් එහෙමයි; මන්ත්‍රීවරුන් වෙච්ච අපිත් එහෙමයි. මම තවම යන්නේ GF-6978 කියන පෞද්ගලික වාහනයෙන්. අපි සල්ලි ඉතුරු කරන්නේ එහෙමයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒ විධියට ඉතුරු කරපු සල්ලි තමයි, ඒ බදු මුදල් තමයි අපි මේ රටේ අධ්‍යාපනය වෙනුවෙන් යොදවා තිබෙන්නේ. අධ්‍යාපනයට රුපියල් කෝටි කීයක් අපි වෙන් කර තිබෙනවා ද? රුපියල් කෝටි 61,900ක් වෙන් කර තිබෙනවා. අපේ රටේ සෞඛ්‍යය වෙනුවෙන් අපි කොච්චර මුදලක් වෙන් කර තිබෙනවා ද? සෞඛ්‍යයට රුපියල් කෝටි 60,400ක් වෙන් කර තිබෙනවා. ගමේ පාරවල් හදන්න මුදල් වෙන් කරනවා; අධ්‍යාපනයට මුදල් වෙන් කර තිබෙනවා; සෞඛ්‍යයට මුදල් වෙන් කර තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒ බදු සල්ලි අපි යොදවන්නේ අන්න එහෙමයි.

මට කාලය ලබා දුන්නාට ඔබතුමියට බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.05]

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ ගෙනෙන නියෝගයක් පිළිබඳවත්, ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ගෙනෙන රෙගුලාසි පිළිබඳවත් විවාද කරන මේ වෙලාවේ, ඒ සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිය පුද කරනවා.

මුද්දර ගාස්තු සම්බන්ධයෙන් කථා කරද්දී, එම බදු මුදල් පළාත් පාලන ආයතනවලට ලැබීම පිළිබඳව කථා කරනවා අපි දැක්කා. හැබැයි, මේ මොහොතේ අපි ව්‍යාපාරික වශයෙන් රටක් විධියට ගොඩ නැඟෙන්න උත්සාහ කරන මොහොතක, අලුතෙන් ඉඩමක් අරගෙන ව්‍යාපාරයක් ආරම්භ කරන්නට හෝ ඉඩම උකසට තියලා කටයුතු කරද්දී, ඒ ව්‍යාපාරිකයාට මුද්දර ගාස්තුව නැවත ඩබල් වෙලා ගෙවන්න වෙනවා කියන කාරණයත් අපි හැමෝම දන්නවා. මුද්දර ගාස්තු අපි වැඩි කළ යුතුයි. ඒකේ කිසි ප්‍රශ්නයක් නැහැ. අපි බදු එකතු කර ගන්න ඕනෑ. හැබැයි, බදු එකතු කරගෙන පළාත් පාලන ආයතනවලින් වැඩි සේවාවක් කරන්න ඕනෑය කියලා කථා කළාට, අපි ඉන්නේ බොහොම අපහසු අඩියක. ව්‍යාපාරිකයෝ විධියට හුස්මක් ගන්න උත්සාහ කරමින් ඉන්න මොහොතකයි අපි ඉන්නේ. මේ වාගේ බරක් ව්‍යාපාරිකයන් පිට පටවනකොට අපි දෙපාරක්, තුන්පාරක් කල්පනා කළ යුතු වෙනවා.

ඒ වාගේම ආනයන හා අපනයන පිළිබඳව කථා කරනකොට විශේෂයෙන්ම මේක ගළපා ගන්න මේ ආණ්ඩුවටවත් හැකියාව ලැබිලා නැහැ කියන එක බොහොම පැහැදිලිව පෙනෙන කාරණයක්. මම ගිය සතියේත් පාර්ලිමේන්තුවේදී මේ සම්බන්ධයෙන් කථා කළා. අපේ රටේ විශේෂයෙන්ම අනුරාධපුරය දිස්ත්‍රික්කයේ විශාල වශයෙන් බඩඉරිඟු වගා කරනවා. බඩඉරිඟු වගා කරලා ඒ stock එක දැන් තිබෙන්නේ සමහර ගොවින්ගේ ගෙවල්වල. එලෙස බඩඉරිඟු stock එකක් තිබෙනකොට ආනයනයත් කරනවාද? ආනයනය කළ යුතු බව හඳුනාගෙන ද මේ ආණ්ඩුව කටයුතු කරලා තිබෙන්නේ? අද වනකොට බඩඉරිඟු ආනයනය කරලා ඉතාම අඩු මිලට වෙළෙඳ පොළට නිකුත් කරලා තිබෙනවා. ඒවාට බදු නැහැ. හැබැයි, පසුගිය කාලයේ හාල් ගෙන්වනකොට කොහොමද කටයුතු කළේ කියලා අපි දැක්කා. හාල් කියන්නේ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යයක්. වෙළෙඳ පොළේ හාල් මිල ඉහළ නොගිහින් තිබෙන වෙලාවක හාල් ගෙන්වනකොට රජය හාල් කිලෝවකට රුපියල් 65ක ආනයන බද්දක් ගැහුවා. හැබැයි, අද බඩඉරිඟු ගෙන්වනකොට ඒක ආණ්ඩුවට අමතක වෙලා. අද බඩඉරිඟු ගෙන්වලා තිබෙනවා. හැබැයි, අද ගොවියෝ ළඟ බඩඉරිඟු stock එකකුත් තිබෙනවා. ගොවියෝ ළඟ වාගේම සුළු ව්‍යාපාරිකයන් ළඟත් බඩඉරිඟු stock එකක් තිබෙනවා. ඒ මොකද, එම ප්‍රදේශවල සිටියා, ගොවියාගෙන් බඩඉරිඟු අරගෙන stock කරගෙන හිටපු සුළු ව්‍යාපාරිකයන් කොටසක්. ඒ, බැංකුවලින් ණයක් අරගෙන, ණය පොලියත් ගෙවාගෙන, බැංකුත් පෝෂණය කරගෙන, තමන් ළඟ ඉන්න සේවක පිරිසකුත් නඩත්තු කරගෙන, ගොවියාටත් සහනයක් දෙන්න කටයුතු කරමින් සුළු පරිමාණයෙන් බඩඉරිඟු ගබඩා කරගෙන සිටි ව්‍යාපාරිකයන්. ඒ අය ඔක්කෝම අද ඉවරයි. ඒ ඔක්කෝම කඩා වට්ටන්න ආණ්ඩුව බඩඉරිඟු ආනයනයට අත ගසා තිබෙනවා. බඩඉරිඟු ආනයනය කළා කියලා බිත්තරවල මිල අඩු කරන්න පුළුවන් වුණාද? බිත්තරවල මිලත් එන්න එන්න වැඩි වෙනවා. එහෙම නම් මෙතුමන්ලාගේ ආනයන ප්‍රතිපත්තිය මොකක්ද?

මම දැක්කා, අපේ රටට පෙට්‍රල් වාහනවල එන්ජින් ගෙන්වන්න පුළුවන්, ඩීසල් වාහනවල එන්ජින් ගෙන්වන්න බැහැ කියලා තිබෙනවා. අපේ රටේ කාලාන්තරයක් තිස්සේ -අවුරුදු ගණනාවක් තිස්සේ- වාහන ආනයනය නතර කරලා තිබුණේ. දැන් යාන්තම් ගෙන්වනවා. වාහන ආනයනය නොකර තිබෙනකොට තමන්ගේ ළඟ තිබෙන ලඬිය කොහොම හරි හදලා ගොඩ දාගන්න බැරි වනකොට එන්ජින් එකක් තබන එක තමයි අපේ වාහන හිමියෝ කළේ. අපේ රටට පෙට්‍රල් වාහන එන්ජින් එක ගෙන්වන්න පුළුවන්, ඩීසල් වාහනවල එන්ජින් එක ගෙන්වන්න තහනම්. ආනයන සහ අපනයන පිළිබඳව පුදුම තීන්දු තීරණ අපේ රටේ අරන් තිබෙන්නේ. එවැනි කරුණු කාරණා ගණනාවක් සිද්ධ වන කාල වකවානුවක් තමයි මේ. හැබැයි, මේවා හරියට කළමනාකරණය කරලා කටයුතු කරනවා කියලා තමයි කියන්නේ.

ආණ්ඩු පක්ෂයේ කථිකයෝ ගණනාවක් දැන් කථා කළා. හැබැයි, මේ රෙගුලාසි ගැන නොවෙයි එතුමන්ලා කථා කළේ. අද

එතුමන්ලාගේ ප්‍රධාන මාතෘකාව බවට පත් වුණේ මොකක්ද? එතුමන්ලාගේ නිර්දෝෂීභාවය, එතුමන්ලාගේ සුජාතභාවය, එතුමන්ලා ඒ කියපු කාරණා ඒ විධියමට ඉෂ්ට කරනවා, හොරු අල්ලනවා කියන දේවල් තමයි කථා කළේ. දිවා ආහාරයට කලින් ආණ්ඩු පක්ෂයෙන් කථා කළ ගරු මන්ත්‍රීතුමෙක් කිව්වා, මේ රටේ ව්‍යාපාරවලට කිසි ගැටලුවක් නැහැයි ලු. ව්‍යාපාර ඔක්කෝම දැන් ඉදිරියට ගමන් කරනවා ලු. කසිප්පු ව්‍යාපාරය විතරයි ලු කඩාගෙන වැටිලා තිබෙන්නේ. කසිප්පු ව්‍යාපාරයට තමයි ලු අද ප්‍රශ්නයක් වෙලා තිබෙන්නේ. එම ව්‍යාපාරය කරගෙන යන අය කෑ ගැහුවාට කිසි ප්‍රශ්නයක් නැහැ ලු. කසිප්පු ව්‍යාපාරිකයන් කෑ ගහනවා කියන එක එතුමන්ලාට දැනිලා තිබෙන්නේ කොහොමද? අපි දැක්කා, කළුතර දිස්ත්‍රික්කය නියෝජනය කරන මෙතුමන්ලාගේ මන්ත්‍රීවරයෙක් පොලීසියේ OICට කථා කරලා තිබෙන බව කසිප්පුකාරයෙක් බේරාගන්න. ඒක කළේ නැත්නම් ඔහුව වවුනියාවට මාරු කරනවා ලු. මේකද, ඔබතුමන්ලාගේ සුජාතභාවය? හොරු, දූෂිතයෝ අල්ලන්න සහ අයින් කරන්න ආපු කණ්ඩායම, කසිප්පු ව්‍යාපාරය, කුඩු සහ එතනෝල් ව්‍යාපාර නවත්වන්න ආපු කණ්ඩායම මෙහෙමද කටයුතු කරන්නේ? පළාතෙන් පළාතට මේවා වෙනස්ද? කළුතරට යනකොට ඒක වෙනස්ද? සංජීව රණසිංහ කියන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාට ඒක වෙනස්ද? එතුමා කළුතර පොලීසියට කථා කරලා, OIC මහත්මයාව වවුනියාවට මාරු කරනවා කියපු එක සාධාරණද?

ගරු සංජීව රණසිංහ මහතා
(மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ)
(The Hon. Sanjeewa Ranasingha)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, -

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා.

ගරු සංජීව රණසිංහ මහතා
(மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ)
(The Hon. Sanjeewa Ranasingha)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා මගේ නම ප්‍රකාශ කළා.

කළුතර දිස්ත්‍රික්කයේ, වැලිපැන්න පොලීසියට අදාළව මා සම්බන්ධ කර එතුමා ඒ නඟපු චෝදනාව මා ප්‍රතික්ෂේප කරනවා. පොලීසියට රැගෙන ආ කසිප්පු ව්‍යාපාරිකයෙක් බේරා ගැනීම සඳහා වැලිපැන්න පොලීසියේ නිලධාරියෙක් මැදිහත්වීම පිළිබඳව ඇති වූ ප්‍රශ්නයකදී ඒ අදාළ පුද්ගලයා බේරාගැනීම සඳහා පොලීසිය ගත් ක්‍රියාමාර්ගය වෙනුවෙන්, ඒ අනීතික ක්‍රියාව වෙනුවෙන් මා නැඟූ හඬ තමයි විපක්ෂය විකෘති කරලා මේ ප්‍රකාශ කරමින් ඉන්නේ. ඒ පළ වූ පත්තර වාර්තා සහ ඒවාට අදාළ නිවේදන නිකුත් වුණේ කොහොමද කියන එක මේ රටේ ජනතාව දන්නවා. එම පුවත් වාර්තා කරන්නේ කොහොමද කියලාත් ජනතාව දන්නවා. මම පැහැදිලිව ප්‍රකාශ කරනවා, වැලිපැන්න පොලීසියේ ඒ නිලධාරියා විසින් සිදු කළ අනීතික ක්‍රියාව නිවැරදි කරන්න, අයුක්තියට ලක් වුණු ඒ අදාළ පුද්ගලයා වෙනුවෙන් සාධාරණය ඉටු කිරීම වෙනුවෙන් තමයි මම ඒ කාර්යභාරය ඉටු කළේ කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා, ඔබතුමා කථා කරන්න.

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, දැන් අපට බොහොම පැහැදිලියි, නඩුත් හාමුදුරුවන්ගේ බඩුත් හාමුදුරුවන්ගේ කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමනි, ඔබතුමාට ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමාගේ කාලයෙනුත් විනාඩි පහක් ලැබිලා තිබෙනවා.

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ කාරණා අහගෙන ඉන්නේ නැති එක ගැන අපි කනගාටු වනවා. මම ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමාගේ නම කියනකොට එතුමාට ඇහුණේ නැහැ. එහා පැත්තේ සිටින මන්ත්‍රීතුමා තමයි කියන්නේ, එතුමාගේ නම කිව්වා කියලා. ඒක නිවැරදි කරන්න ගිහිල්ලා ඉල්ලාගෙන කෑවා. දැන් එතකොට නඩු අහන්නේ මෙතුමන්ලාද? පොලීසියේ පැමිණිල්ලක් විභාග වෙන්නේ නැතුව, එම කාරණය උසාවියට යන්නේ නැතුව, මෙතුමා නිර්දෝෂීයි කියලා ඔප්පු කරන්නේ කොහොමද? මේ රටේ නීතිය පසිඳලන්න ඉන්න පළමුවැනි කණ්ඩායම තමයි පොලීසිය. පොලීසියේ මහත්වරු ඔහු කසිප්පුකාරයෙක් විධියට දැක්කා නම් මෙතුමා කොහොමද දන්නේ ඔහු කසිප්පුකාරයෙක් නොවෙයි කියලා? එතුමා කොහොමද, නීතිය පසිඳලන්න ඉන්න පොලීසියේ මහත්වරුන්ට මේ වාගේ උපදෙස් දෙන්නේ? පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වුණා කියලා එතුමාට හැකියාවක් තිබෙනවාද, පොලීසිය ක්‍රියාත්මක වෙන්න ඕනෑ මේ ආකාරයට කියලා පොලීසියේ මහත්වරුන්ට උපදෙස් දෙන්න? එහෙම කථා කිරීමේ හැකියාවක් තිබෙනවාද? ඒ මහත්වරු වවුනියාවට මාරු කරනවා කියලා තර්ජනය කරන්න එතුමාට අයිතියක් තිබෙනවාද? මේ විධියට සුජාතභාවය, නැත්නම් පතිවත අමු අමුවේ බිඳ ගන්න එපා. තමන් ඒක කළා නම්, තමනුත් පරණ පාරේම යනවා කියන එක පිළිගන්න.

ගරු මන්ත්‍රීවරයෙක් දැන් ගාල්ල නගර සභාව ගැන කථා කළා. ගාල්ල නගර සභාවේ නගරාධිපති අද ඔබතුමන්ලාගේ පක්ෂයෙන් පත්වෙලා තිබෙනවා. නියෝජ්‍ය නගරාධිපති පොහොට්ටුවේ. නියෝජ්‍ය නගරාධිපති කවුද? හොරා කියලා ඔබතුමන්ලාම චෝදනා කරපු, විශාල වශයෙන් චෝදනා තිබෙන පට්ටපල් දූෂිතයෙක්. එතුමාට තිබෙන දූෂිත චෝදනා ටිකෙන් වැළකෙන්න, තමන්ගේ නඩුවලින් බේරෙන්න, තමන්ගේ හොරකම් ටික ඔප්පු වෙයි කියලා ඒකෙන් ගැලවෙන්න ඔබතුමන්ලා නියෝජ්‍ය නගරාධිපතිකම පූජා කරලා තිබෙනවා. මාලිමාවට ඡන්දය දෙනකොට එතුමා හොඳයි. එතකොට සුන්බුන් මිණි කැට බවට පත් වෙනවා. සල්ලි ටිකක් වියදම් කරනකොට, හොරෙක් යටපත් කරන්න යනකොට සුන්බුන් කියපු ඒවා මිණි කැට බවට පත්වෙලා තිබෙනවා.

පසුගිය දිනක අපේ දිස්ත්‍රික්කයේ, මගේ ආසනයේ, මැදවච්චිය ප්‍රාදේශීය සභාවේ බලය පිහිටුවන්න ගියා. කට්ටිය කලින්ම දන්නවා, කොමසාරිස්තුමා එතැනට එන්නේ රහස් ඡන්දයක් පවත්වන්න කියලා. ඒ නිසා භය නැතුව වරෙන්, ඇවිත් ඡන්දය දීපන් කිව්වා. රුපියල් ලක්ෂ 50කට පොරොන්දු වෙලා, රුපියල් ලක්ෂ 15ක advance එකක් දීලා, ඔහුව අරගෙන ඇවිල්ලා ඡන්දය ගත්තා. කොමසාරිස්තුමා බෙදීමේත් බෙදීම් ඉල්ලනවා. නම් දෙකයි යෝජනා වෙලා තිබුණේ. තවත් යෝජනා තිබෙනවාද කියලා අහනවා. ගන්නේ රහස් ඡන්දයක්ද, විවෘත ඡන්දයක්ද

[ගරු රෝහණ බණ්ඩාර මහතා]

කියලා බලන්න බෙදීම් ඉල්ලනවා. අපේ කට්ටිය කියනවා, විවෘත ඡන්දයක් කියලා. මාලිමාවේ කට්ටිය කියනවා, රහස් ඡන්දයක් කියලා. කොමසාරිස්තුමා අහනවා, තවත් යෝජනා තිබෙනවාද කියලා. එතකොට මාලිමාවේ තවත් කෙනෙක් නැඟිටලා කියනවා, "රහස් ඡන්දයක්" කියලා. තව කෙනෙක් ඒක ස්ථිර කරනවා. මාලිමාවේම තව කෙනෙක් නැඟිටලා "රහස් ඡන්දයක්" කියනවා. ඒක තව කෙනෙක් ස්ථිර කරනවා. එතකොට බෙදීම් 4යි. ඒ බෙදීම් ඔක්කෝම කාගේද? මාලිමාවේ. නමුත්, සභාපති අපේක්ෂකයෝ දෙදෙනායි. සභාපති අපේක්ෂකයෝ දෙදෙනෙක් සිටින තැන බෙදීම් 4ක් තිබෙන්න පුළුවන්ද, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි? තමන්ගේ අවශ්‍යතා ඉෂ්ට කර ගන්න රාජ්‍ය සේවක මහත්වරුන්ගේ කොන්ද සම්පූර්ණයෙන්ම කඩලා තිබෙනවා. අනෙක් පැත්තෙන්, සල්ලි දීලා මන්ත්‍රීවරු බිලී බාගන්නවා. මේ, මාලිමාව කථා කරපු දේවල්ද? හොරකම, දූෂණය වළක්වන්න කියලා ඔබතුමන්ලාට ඡන්දය හම්බ වුණා. අපි දන්නවා, අනුරාධපුර දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන 16ක කිසිදු ගැටලුවක් නැතුව බලය පිහිටුවන්න ඔබතුමන්ලාට අවස්ථාව ලැබුණු බව. අපි ඒවාට ඇඟිලි ගහන්න ආවේත් නැහැ. ජනතාව වරම දුන්නා; ඡන්දය දුන්නා. අපට බහුතර බලයක් නොලැබුණු ආයතන ලංකාවේ විශාල ප්‍රමාණයක් තිබෙනවා. මේ රටේ ජනතාව විපක්ෂයේ ඉන්න කණ්ඩායම විධියට අපෙන් ප්‍රශ්න කරනවා, මේ තරම් බලසම්පන්න ආණ්ඩුවක් මේ තරම් ජනතා හිතකර නොවන තීන්දු තීරණ ගන්නකොට, ජනතාව කියපු දේවල් නොකර පලා යමින් ඉන්නකොට, ඒකට විරුද්ධව ඔබතුමන්ලා එකතුවෙලා දැන්වත් වැඩක් කරන්නේ නැද්ද, විපක්ෂය නිදිද කියලා. ඒ නිසා විපක්ෂයේ අපි සියලුදෙනා එකතුවෙලා ඒ පළාත් පාලන ආයතනවල බලය පිහිටුවන්න තීන්දු කළා. හැංගිලා, "ඩීල්" දාලා නොවෙයි, එළිපිට විවෘතව මාධ්‍ය ප්‍රකාශයක් කරලා තමයි අපි ඒ එකඟතාව හදා ගත්තේ. ඒ එකඟතාව අනුව අද පළාත් පාලන ආයතන ගණනාවක් පිහිටුවනවා. එසේ පළාත් පාලන ආයතන පිහිටුවන අතරේ හොරෙන් පැනලා, යටින් ගාණක් දීලා, බලපෑම් කරලා, රාජ්‍ය සේවකයින්ගේ කොන්ද කඩලා, නිලධාරිනුත් භය කරලා, ඒ අයටත් තමන්ට ඕනෑ විධියට වැඩ කර ගන්න දෙන්නේ නැතුව කවුද මේ කැත වැඩ කරන්නේ? කවුද මේ වාගේ හොර විධියට ප්‍රාදේශීය සභා පිහිටුවන්නේ? හොරෙන් ගහනකොට හොඳයි, එළිපිට ගහනකොට ප්‍රශ්නයක්. එළිපිට ගත්තොත් හොරෙක්. හැබැයි, ඒ පුද්ගලයා හොරෙන් ගැහුවොත් පට්ට හොරෙක්. ඔහු නිවැරදි හොරෙක්. ඒකද, මාලිමාවේ ප්‍රතිපත්තිය? හොරු නම් හොරු. හොරු එපා කියලා නේ ඔබතුමන්ලා බලය ඉල්ලුවේ. ඒ නිසා ඔබතුමන්ලාට ඒ විධියට යන්න තිබුණා. අපි ඔක්කෝම හොරු කියලා නේ ඔබතුමන්ලා කියන්නේ. අපි ඔක්කෝම හොරු කිය-කියා හරි,-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

මට අමතරව විනාඩි 5ක කාලයක් ලැබුණා කිව්වා නේද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ඒ කාලයත් එක්ක තමයි ගතවෙලා තිබෙන්නේ.

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

මට බාධා කරපු මන්ත්‍රීතුමා කථා කරපු කාලය මට අදාළ නැහැ. එතුමා කථා කරපු වේලාව මට ලබා දෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ඒ කාලය අයින් කරලා තමයි ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

ඔබතුමන්ලා කියපු කාරණා ඒ විධියට ඉෂ්ට කරගෙන යනවා නම් රටේ ජනතාවට ප්‍රශ්නයක් නැහැ.

ඒ වාගේම වැසී ගිය ව්‍යාපාර ගැන අපි එකින් එක කථා කරන්නම්. මේ ගැන අපි හැමදාම කථා කරලා තිබෙනවා. ව්‍යාපාර වැහුණේ කොහොමද? ඒ වාගේම ඔබතුමන්ලා කිව්වා, වධකාගාර දැම්මා කියලා. වධකාගාර දාන්න වුණේ ඇයි කියලාත් ඔබතුමාට කියන්න ඕනෑ නැහැ නේ. අද වාගේ ඔබතුමන්ලා බොහොම සර්ව සාධාරණ විධියට ඡන්දය ඉල්ලලා කටයුතු කරලා තිබුණා නම් වධකාගාර දාන්න ඕනෑ වෙන්නේ නැහැ. එම නිසා කර්මාන්ත වහලා වධකාගාර දාන තැනට පත් කළේත් ඔබතුමන්ලා. ඔබතුමන්ලා කර්මාන්තශාලා ගිනි තැබූ යුගයකුත් තිබෙනවා. ඒවාත් ඔබතුමන්ලා කරපු දේවල්. ඒ කාරණා නැවත නැවතත්, හාර-හාරා අහන්න, සෝද සෝදා මඩේ දමන්න ඕනෑ නැහැ. ඒවා මේ රටේ ඔක්කෝම මිනිස්සු දන්නවා. එම නිසා ඔය මහත්වරු නිකම් අද පාර්ලිමේන්තුවට ඇවිල්ලා වාඩි වුණා කියලා ඔබේ ඉතිහාසය, පරණ කළු පැල්ලම් ඔබෙන් අයින් වෙලා යයි කියලා හිතන්න එපා. පව්! ඒ අතරේ පාපිසි මහත්වරු ටිකකුත් ඉන්නවා නේ. හොරු ටිකට, මිනීමරුවෝ ටිකට, රටේ දේපළ ගිනි තියපු අයට බලයට එන්න, පොහොට්ටුවේ ඉඳලා, සජබයේ ඉඳලා, යූඑන්පී එකේ ඉඳලා කර කියාගන්න දෙයක් නැතුව රට බංකොලොත් වෙනකොට, යන්න තැනක් නැති වුණාම ගිහිල්ලා මුක්කු ගහලා - දැන් කිව්වා නේ, "පූට්ටු" කියලා - අපේ පූට්ටු වාගේම ඒ පූට්ටුත් ගහලා හදපු මහත්වරු ටික දැන් පාපිස්ස යට ඉඳගෙන කෙඳිරි ගානවා. දැන් හදලා තිබෙන සභාවල මාලිමාවේ මහත්වරු කීදෙනෙක් සභාපති වෙලා ඉන්නවාද? හොඳ නැහැ කියපු, සියයට 3ක් තියාගෙන පසුගිය කාලයේ ළඟ හිටපු මහත්වරු තමයි අද සභාපතිවරු, උප සභාපතිවරු වෙලා තිබෙන්නේ. එතැනට යන්න පාර කපලා දුන් මහත්වරු ටික අද නිහඬව ඉන්නවා.

ඊයේ දවසේ කිරි ගවයින් සම්බන්ධයෙන් සභාව කල් තැබීමේ යෝජනාවක් ගෙනැවිත් තිබුණා. නමුත් මට ඒ සම්බන්ධයෙන් කථා කරන්න බැරි වුණා. ඒ සිද්ධියට සම්බන්ධ හොරුන්ට නිසි දඬුවම් ලබා දෙන්න. ඒ සම්බන්ධයෙන් කිසි ගැටලුවක් නැහැ. හැබැයි, ඒ කටයුතු පරිපාලනය කර ගන්න බැරි වුණු සමහර ආයතන නිසා වාගේම කිරි ගවයින් ලබා දෙනකොට ඇති වුණු ගැටලු නිසා තමයි ආනයනය කළ සමහර කිරි හරක් මැරිලා හරියාකාරව ඒ කටයුතු කර ගන්න බැරි වුණේ. හැබැයි, හොඳින් කටයුතු කරන ආයතන ගණනාවක් තිබෙනවා. අද වෙනකොට කිරි ලීටර් 65,000කට වඩා ගන්නා කිරි ගොවි පොළවල් මාතලේ දිස්ත්‍රික්කයේ තිබෙනවා. ගෙන්වපු කිරි ගවයින්ගේ නොවෙයි ප්‍රශ්නය තිබෙන්නේ, ඒ ක්‍රියා පටිපාටියේයි. ඒ ක්‍රියා පටිපාටියේ යෙදී සිටි මහත්වරු දැන් ඔයගොල්ලන්ගේ ගොඩේත් ඉන්නවා. එම නිසා ඒ සියල්ල වළක්වන්න. මේ ව්‍යාපාර සියල්ලටම අද විශාල ගැටලුවක් තිබෙනවා.

අද ඔබතුමන්ලාට බැරිවෙලා තිබෙනවා, යූරියා ටික ආනයනය කරලා දෙන්න. යූරියා ටික එනකොටම එක company එකකට දෙනවා. ඊයේ දවසේ නිදහස් වෙච්ච යූරියා ටික ඔක්කොම එක company එකකටයි දුන්නේ. අද වෙළෙඳ පොළට යූරියා කිලෝ 10ක මිටිය එන තත්ත්වයට පත් වෙලා, sachet packets ඇවිල්ලා. කලින් ආවේ යූරියා කිලෝ 50ක මිටිය. දැන් යූරියාත් sachet packets එන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. යූරියා කිලෝ 10ක මිටිය දැන් කිලෝ නවයහමාරක් තිබෙන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. එදා රුපියල් 8,000ට තිබුණු යූරියා මිටිය අද වනකොට රුපියල් 9,500ක් වෙනවා. ඒ වාගේ ශීඝ්‍රයෙන් ඒවායේ මිල ඉහළ යන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. අද වනකොට ගොවීන් අතර විශාල සැකයක් ඇතිවෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට තව විනාඩි දෙකක අමතර කාලයක් ලැබී තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
බොහොම ස්තුතියි.

අද වෙනකොට ඉරානයේ පවතින යුද්ධය එක්ක අපේ රටට යූරියා ආනයනය කිරීම පිළිබඳව ගැටලුවක් ඇති වෙන්න පුළුවන්. ඒ සම්බන්ධව ප්‍රශ්නයක් ඇති වුණොත් ඔබතුමන්ලාට ඒ වෙනුවෙන් තිබෙන සැලැස්ම මොකක්ද? යුද්ධය නැති වෙලාවේ යූරියා ගෙනෙන්නට හැකියාව තිබියදීත් යූරියා ටික වෙළෙඳ පොළට සුලබව ලබා දීලා, ඒවා අඛණ්ඩව ගොවියාට ලබා දෙන්න පුළුවන් හැකියාව ඔබතුමන්ලා නිර්මාණය කරලා නැහැ. ඔබතුමන්ලා කයිවාරු ගැහුවාට, පම්පෝරි ගැහුවාට මොකක්ද මේ සම්බන්ධව ඉදිරිපත් කරලා තිබෙන වැඩ පිළිවෙළ? ගොවියාට පොහොර සහනාධාරය දෙනවා කියපු එක ගොවි ආධාරයක් බවට පත් කළා. දැන් වෙළෙඳ පොළෙන් පොහොර ටික ගන්න පුළුවන් තැනක් නැහැ. කිරි ගොවීන් සම්බන්ධව අපි එදා කරගෙන ආපු වැඩ පිළිවෙළ තව ඉස්සරහට අරගෙන ගියා නම් අපේ රට කිරිවලින් ස්වයංපෝෂිත කරන්න තිබුණා. මොකද, කිරිවලින් අපේ රට ස්වයංපෝෂිත වන තැන ළඟටම අපි ඇවිල්ලා තිබුණේ. කිරි ලීටර් ලක්ෂ 15ක් තමයි අපට දෛනිකව අවශ්‍ය වෙන්නේ. අපි කිරි ලීටර් ලක්ෂ 10ක් දක්වා නිෂ්පාදනය කළා. ඔබතුමන්ලා බලයට ඇවිල්ලා ගත වුණු මාස 7ට කිරි ලීටර් ලක්ෂ දෙකහමාරකින් නිෂ්පාදනය කඩා වැටිලා තිබෙනවා. අද දෛනික කිරි නිෂ්පාදනය කිරි ලීටර් ලක්ෂ හතහමාර දක්වා අඩු වෙලා තිබෙනවා. අනික් පැත්තෙන් රටේ ජනතාවගේ ක්‍රය ශක්තිය හීන වීම නිසා ජනතාව කිරි පරිභෝජනයෙන් ඈත් වෙලා තිබෙනවා. කිරි ගොවීන්ටත් යූරියා අවශ්‍යතාව තිබෙනවා. මොකද, අවශ්‍ය තෘණ ටික වගා කරගන්නත් යූරියා අවශ්‍යයි. ඒ නිසා හැම ගොවිතැනකට වාගේම මේ කිරි ගොවීන්ටත් යූරියා අවශ්‍ය වෙනවා. ඔබතුමන්ලා යෝජනා ගෙනෙනකොට, තැනින් තැන කථා කරනකොට සර්ව සම්පූර්ණ අය වාගේයි කථා කරන්නේ. තව කෙනෙකුට ඇහුම්කන් දෙන්න ලැහැස්ති නැහැ, උද්ධච්ච විදියටයි හැසිරෙන්නේ. හැබැයි, ඒකේ ප්‍රතිඵලය තමයි රටක් විදියට අපි ආපස්සට ගමන් කරන එක. අපට ලැබුණේ ඩොලර් නැතුව තිබුණු රටක් කියලා මන්ත්‍රීතුමෙක් කිව්වා. ඩොලර් නැතුව, බංකොලොත්භාවය ප්‍රකාශ කරපු රටක් තමයි තිබුණේ. හැබැයි, ඔබතුමන්ලාට භාර දෙනකොට අපි බංකොලොත්භාවයෙන් ගැලවුණා කියන ප්‍රකාශයත් කරලා තිබුණු රටක් තමයි භාර දුන්නේ. ඩොලර් බිලියන 5.9කට වඩා ඉතුරු කරපු රටක් ඔබතුමන්ලාට භාර දුන්නේ. රටේ මිනිස්සුන්ට බොරු කියනවා වාගේම ඔබතුමන්ලා ජාත්‍යන්තරයටත් බොරු කියන්න ගියා. අපේ සංචිත ඩොලර් බිලියන 1.4කින් වැඩියි කියලා මෙහේ මිනිස්සුන්ට බොරු කියනවා වාගේ ජාත්‍යන්තරයටත් බොරු කියන්න ගිහිල්ලා පව වෙච්ච ආණ්ඩුවක්, මේක.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.20]

ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අද ඉතාම වැදගත් පනත් කිහිපයක් යටතේ ගෙනෙන නියෝගයක් හා රෙගුලාසි පිළිබඳව සාකච්ඡා කරනවා. මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත ගත්තාම, එය දීර්ඝ කාලයකින් -අවුරුදු ගණනාවකින්- සංශෝධනය වෙලා නැහැ. ඒ නිසා මේ පනත සම්බන්ධ සංශෝධනයක් තමයි අපි අද දවසේ මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය තුළින් ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ නිසා ඒක ඉතාම වැදගත් කරුණක් වෙනවා. ඒ පිළිබඳව අපේ මුදල් නියෝජ්‍ය ඇමතිතුමා අදහස් දැක්වූවා.

දැන් එකින් එක, එකින් එක තමන් බලය පිහිටුවන්න හීන දැකපු ආයතන කඩාගෙන වැටෙනකොට, ඒ බලය තමන්ගෙන් ගිලිහෙනකොට මේ මහත්වරු කෙඳිරිගාන එක අපට අරුමයක් නොවෙයි. හැබැයි, පසුගිය ජනාධිපතිවරණයේදීත්, ඊට කලින් 2019දී පැවැති ජනාධිපතිවරණයේදීත් මේගොල්ලන්ගේ නායකයෝ - පුතාණෝලා - කොහොමද කිව්වේ? පුතාණෝලා කොහොමද පොහොට්ටුවට එරෙහිව කඳවුරු බැන්දේ? විවිධ වංචනිකයන්ට, දූෂිතයන්ට දඬුවම් කරන්න කොහොමද මේගොල්ලන් කයිවාරු ගැහුවේ? ඒ විදියට කයිවාරු ගහපු අය අද අමුතු-අමුතු ඩීල් දාගෙන, සභා බෙදාගෙන, ගිවිසුම් ගහගෙන, ඒවා බෙදා ගන්න යනකොට මොකක්ද වෙලා තිබෙන්නේ? අපි දැක්කා, කන්දකැටිය ප්‍රාදේශීය සභාවේ සජබයේ මන්ත්‍රීවරුම ඇන කොටා ගන්නවා. ඇයි, ඒ? මේගොල්ලන්ගේ තීරණවලට එකඟ නොවීම. ඒක තමයි අද ප්‍රාදේශීය සභාවල, නගර සභාවල සභිකයන්ගේ ඇත්ත හෘදය සාක්ෂිය. පසුගිය දශක ගණනක් තිස්සේ මේගොල්ලන් ඇදවට්ටලා, බිඳවට්ටලා තිබුණු රට ජාතික ජන බලවේගයේ ආණ්ඩුව විසින් ක්‍රම ක්‍රමයෙන් ඉහළට ඔසවමින් යනකොට, ආයෝජකයින් ලංකාවට එනකොට, විදෙස් සංචිත වැඩි වෙනකොට, විදෙස් ආයෝජන ගලාගෙන එනකොට අද තක්කුමුක්කු වෙලා තිබෙනවා. දැකපු හීන බොඳ වෙනකොට, ජනතාවට කියා ගන්න දෙයක් නැතුව මේගොල්ලන් අපි ගැන ඩීල් කථාවක් කියනවා. අපි එකක් කියනවා, මේ මහත්වරුන්ට. කවුරු මොන විදියට අපට සහයෝගය දුන්නත් වංචනිකයන්ට, දූෂිතයන්ට එරෙහි අපේ ගමන, අපේ ක්‍රියාමාර්ග කිසිවක් නතර කරන්නේ නැහැ කියන සහතිකය අපි මේ රටට අද දෙනවා. ඒ කිසිවක් නතර කරන්නේ නැහැ. ඒගොල්ලන් ඩීල් දමා ගත්තේ දැන්. අපි ඊයේත් ඇහුවා. දැන් නාමලුයි, සජිතුයි දෙන්නා ඩීල් එකේ යනවා, කරට අත දමාගෙන. සභා බෙදා ගෙන යනවා. සජබයට වඩා අඩු මන්ත්‍රීවරු ඉන්නා සභාවල සභාපතිකම් දෙනවා, පොහොට්ටුවට. දැන් ඩීල් එක දමාගෙන යනවා. ඊළඟ ජනාධිපතිවරණයේදී කවුද අපේක්ෂකයා? ඔයගොල්ලන්

[ගරු මහින්ද ජයසිංහ මහතා]

පොරොන්දු වුණේ ඒකද? නැහැ. ඒ නිසා අපි ඒගොල්ලන්ට කියන්න ඕනෑ, මේ ඩීල් එක සහිකයෝ පිළිගන්නේත් නැහැ කියන එක. ඒවාගේම ඒගොල්ලන්ට ඡන්දය දීපු ඡන්ද දායකයෝ පිළිගන්නේත් නැහැ. ඒ නිසා ඉතුරු වෙලා ඉන්නා ඡන්ද දායකයෝ ටිකත් ඒගොල්ලන් අතහැර යන එකට වැඩි දවසක් නැහැ. අපි දැක්කා අදත් පක්ෂ සාමාජිකත්වය අහෝසි කර තිබෙනවා. මම දැක්කා, සජබයත් පක්ෂ සාමාජිකත්වය අහෝසි කර තිබෙනවා. වැඩි දවසක් නැහැ, ඔයගොල්ලන්ගේ පක්ෂත් අත්හිටුවන්න. ජනතාව ඔයගොල්ලන්ගේ පක්ෂ අත්හිටුවන එකට වැඩි දවසක් නැහැ. ඒක අපි කියන්න ඕනෑ, මේගොල්ලන්ට.

අපි හැම දාම හොරුන්ට "හොරු" කියලා කිව්වා බය නැතුව. අපිට පුළුවන්කම තිබුණා, හොරාගේ මූණට හොරා කියලා කියන්න. ඒ, අපි හොරු නොවන නිසා. අපි එදාත් කිව්වා, මේ රටේ හොරුන්ට දඬුවම් දෙන පාලනයක් හැදෙනවා නම්, ඒ අන් කිසිවක් නොවෙයි, ජාතික ජන බලවේග ආණ්ඩුවේ පාලනයයි කියලා. ඇයි ඒ? මේ කඳවුර විතරයි වංචනිකයෝ, දූෂිතයෝ නැති අදූෂිත දේශපාලන ව්‍යාපාරය වන්නේ. මම දැක්කා මේ මහත්වරුන් අද කියනවා, දූෂිතයෝ උපනගරාධිපතිලා වෙලා ඉන්නවා ලු. ඉතින් ඔයගොල්ලන්ට පුළුවන්, ඊට විරුද්ධව ක්‍රියාත්මක වෙන්න. තව මහත්තයෙක් කිව්වේ මොකක්ද? ලක්ෂ 15කද, කොහේද කප්පමක් දුන්නා ලු. මේවා පාර්ලිමේන්තුවේ කියන්නේ නැතුව අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිසමට ගිහිල්ලා පැමිණිල්ලක් දමන්නකෝ. අල්ලස් කොමිසමේ හොඳ මහත්වරුන් ටිකක් ඉන්නවානේ, කිසි භේදයක් නැතුව, කිසි පක්ෂ භේදයක් නැතුව, ආණ්ඩුවද, විපක්ෂයද කියලා බලන්නේ නැතුව අල්ලස්, වංචා, දූෂණවලට එරෙහිව ක්‍රියාත්මක වන. ඉතින් පැමිණිල්ලක් දමන්නකෝ. ක්‍රියාත්මක නොවෙනවා නම් අපි මැදිහත් වෙන්නම්, ඒවා ක්‍රියාත්මක කරන්න. අපේ කවුරුහරි අල්ලස් දීලා මන්ත්‍රීවරුන් බිලී බා ගෙන අරගෙන තිබෙනවා නම් එහෙම කථා කරන්න.

ඔයගොල්ලන් ලජ්ජා වෙන්න ඕනෑ. පසුගිය කාලයේ වංචාවට, දූෂණයට එරෙහිව ක්‍රියා කළාද? ඊයේ සංවාදයක් තිබුණා. එක වචනයක් කථා කළාද? නැහැ. ඇයි? කථා කරන්න බැහැ. එදා කෙහෙළියව ආරක්ෂා කළා. අද ගියේ නැද්ද දන්නේ නැහැ, කට්ටිය කෙහෙළියව බලන්න. නාමල් මන්ත්‍රීතුමා කෙහෙළියව බලන්න ගිහිල්ලාද දන්නේ නැහැ නේද, මාදුගොඩ මන්ත්‍රීතුමා? ගියේ නැද්ද, කෙහෙළියව බලන්න? ගිය ආණ්ඩු කාලයේ ඔය නාමල් රාජපක්ෂලා, එහා පැත්තේ හිටපු කළුතර මන්ත්‍රී රෝහිතලා, අද එළියේ ඉන්නා පාර්ලිමේන්තුවේ නැති මාධ්‍ය සාකච්ඡා පවත්වන සමහර මහත්වරුන් එදා සජබය විශ්වාස භංගය ගෙනා වෙලාවේ විශ්වාස භංගයට විරුද්ධව අත ඉස්සුවා, කෙහෙළියව ආරක්ෂා කරන්න. එහෙම කරපු අය තමයි අද මේ සුදනෝ වාගේ කථා කරමින් ඉන්නේ. අද ඒ ගැන එක වචනයක් කථා කරන්නේ නැහැ. ඒ විතරක් නොවෙයි, *[බාධා කිරීමක්]* නඩු දැම්මේ කවුද කියන එක වැඩක් නැහැ. නඩු අහන්නේ කවුද, දඬුවම් කරන්නේ කවුද -*[බාධා කිරීමක්]* ඔයගොල්ලන් නඩු දමපුවා අපි දැක්කා නේ. 2015 - 2019 කාලයේ, රනිල්, සජිත්, මෛත්‍රීලාගේ ආණ්ඩුව හොරුන්ට දඬුවම් කළ විධිය අපි දැක්කා නේ. වංචනිකයෝ ආරක්ෂා කළ විධිය අපි දැක්කා නේ. *[බාධා කිරීම්]* ඒ විතරක් නොවෙයි, මම දැක්කා මේ මහත්වරුන් කියනවා, - *[බාධා කිරීම්]* මම දැක්කා, මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා කියනවා, බස්නාහිර පළාත් පාලන කොමසාරිස්තුමිය එතුමන්ලාගේ ආණ්ඩුවක් තිබෙන කාලයකදී නීතිය හමුවට ගෙනෙනවා ලු. බස්නාහිර පළාත් පාලන කොමසාරිස්තුමිය නීතිය හමුවට - *[බාධා කිරීම්]* කමක් නැහැ. හීන දකින්න. මොකද, එතුමිය නීතිය හමුවට ගෙනෙන්න මේගොල්ලන්ගේ ආණ්ඩුවක් එන්න ඕනෑ. මේ කපේට මේගොල්ලන්ගේ ආණ්ඩුවක් එන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. ඒ නිසා මේගොල්ලන් හීන දැක්කාට කමක් නැහැ, තව අවුරුදු හතරහමාරක්, පහක් විතර ඊළඟ ඡන්දය එනකම්. එතකම් හීන දැක දැක ඉන්න පුළුවන්, ආණ්ඩු ගෙනෙන්න. අපි කියන්න ඕනෑ, නීතියට වැඩ කරන, හරියට ක්‍රියාත්මක වන, අකුරට වැඩ කරන සාරංගිකා කොමසාරිස්තුමිය විතරක් නොවෙයි, ඕනෑම රාජ්‍ය නිලධාරියෙක් වත්මන් ආණ්ඩුව ඉහළින්ම ආරක්ෂා කරනවාය කියන එක. අපි මේ රටට ඒ ගැන කියන්න ඕනෑ. *[බාධා කිරීම්]* දන්නේ නැත්නම් ගිහිල්ලා නීතිඥ මහත්වරුන්ගෙන් අහගන්න. අපි මේ සභාවේ ඇති තරම් ඒකේ නීතිමය පදනම කිව්වා. කිසිදු නීතිමය වැරැද්දක් කරලා නැහැ. හැබැයි, මේගොල්ලන් හීන දැක දැක හිටියා නේ පසුගිය 16වැනි දා වෙනකම්, කොළඹ මහ නගර සභාවේ බලය අල්ලන්න. හීන බොඳ වුණාට පසුව අද එක එක කයිකතන්දර කියනවා. ඔය මුජිබුර් මන්ත්‍රීතුමා මාධ්‍ය සාකච්ඡාවක් තියලා කිව්වා, කොළඹ තියන්නේ රහස් ඡන්දයක් කියලා. මා ළඟ ඒ voice-cut එක තිබෙනවා. ඕනෑ නම් දැන් දමලා පෙන්වන්න පුළුවන්, voice-cut එක. ඔය මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා තමයි කිව්වේ. එහෙම කියපු එතුමාම පහුව දා කියනවා, "අම්මෝ, හරි වැරැද්දක් කළා කොමසාරිස්තුමිය. අපි අපේ ආණ්ඩුවකදී එතුමිය නීතිය හමුවට ගෙනෙනවා" කියලා. පව්! එච්චරයි අපිට කියන්න තිබෙන්නේ. මේ මහත්වරුන්ට අනාගත ආණ්ඩුවක් ගැන හීන දැක දැක ඉන්න පුළුවන්. අපි ඒකට අනුකම්පා කරමු.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, රජයේ කිසිදු නිලධාරියෙක් නීතියට වැඩ කරන්න කිසිදු ලෙසකින් බය වෙන්න ඕනෑ නැහැ. මේ ආණ්ඩුව ඒ සියලු නිලධාරීන් ආරක්ෂා කරනවා. ඒ ගැන කිසිදු සැකයක් තියා ගන්න ඕනෑ නැහැ. රජයේ නිලධාරීන් අද බෙදිලා තිබෙන්නේ කොහොමද? රජයේ නිලධාරීන් අද බෙදිලා නැහැ, ජාතික ජන බලවේගය සහ විපක්ෂය කියලා. අද රජයේ නිලධාරීන් බෙදෙන්න ඕනෑ කොහොමද? හොරකමට, වංචාවට, දූෂණයට පක්ෂ සහ විපක්ෂ කියලායි. එහෙමයි බෙදෙන්න ඕනෑ. හොරකමට, වංචාවට, දූෂණයට පක්ෂ සියලු දෙනාට තරාතිරම නොබලා දඬුවම් කරනවා. ඒ ගැන කිසි සැකයක් තියා ගන්න එපා. හැබැයි, වංචාවට, දූෂණයට එරෙහි, නීතිය හරියට ක්‍රියාත්මක කරන, හරියට වැඩ කරන හැම රාජ්‍ය නිලධාරියෙක්ම අපි ආරක්ෂා කරනවා කියන සහතිකය අපි සියලු රාජ්‍ය සේවකයන්ට ලබා දෙනවා.

මම දැක්කා, අපේ හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කිව්වා - එතුමා මේ වෙලාවේ සභාවේ හිටියා නම් හොඳයි- මහින්ද සිරිවර්ධන ගැන කලින් දොස් කිව්වාය, දැන් ජනාධිපතිතුමාත් එතුමාව වර්ණනා කරනවාය කියලා. ඔව්, මමත් ඡන්ද කාලයේදී මහින්ද සිරිවර්ධන මහත්තයාගේ ඒ කාලයේ සමහර වැඩ ගැන විවේචනය කරලා තිබෙනවා. අපිට විවේචනයක් තිබුණා. හැබැයි, එතුමාගේ කථාවට හොඳින් සවන් දුන්නා නම් අහන්න ලැබේවි, පසුගිය කාලයේ එතුමා වැඩ කරපු විධිය, වැඩ කරන්න වෙච්ච විධිය ගැන. එතුමා ඉතා හොඳින් ඒ ගැන පැහැදිලි කළා. ඒ වාගේම අපේ ආණ්ඩුව ආවාට පස්සේ එතුමා අපිත් එක්ක ඉතා හොඳින් වැඩ කළා. අදත් එහෙමයි. මම වැඩ කරන මගේ අමාත්‍යාංශයේ, මගේ දිස්ත්‍රික්කයේ සමහර නිලධාරීන් ඉන්නවා විවිධ දේශපාලන වුවමනාවන් මත ඒ ඒ තනතුරුවලට ගෙනාපු. හැබැයි, ඒ මහත්තුරු අද අපිත් එක්ක ඉතාම හොඳින්, සහයෝගයෙන් වැඩ කරගෙන යනවා. ඒකයි අපිට ඕනෑ වෙලා තිබෙන්නේ. ඔවුන්ගේ දේශපාලනය අපිට වැඩක් නැහැ. අපිට ඕනෑ එක දෙයයි. අපිට ඕනෑ වන්නේ ඔවුන් මේ රටේ ජනතාවට පක්ෂ වීමයි. ඒක තමයි අපි බලන්නේ, ඔවුන්ගේ දේශපාලනය කොහොමද කියලා. මේ රටේ ජනතාවට පක්ෂ වෙන්න ඕනෑ. මේ ආණ්ඩුව ගෙනියන සංවර්ධන ක්‍රියාවලියට, රට ගොඩනඟන ක්‍රියාවලියට දායක වෙනවා නම් ඊට වඩා දෙයක් අපි ඔවුන්ගෙන් බලාපොරොත්තු වෙන්නේ නැහැ. ඒ නිසා අද රාජ්‍ය නිලධාරීන් බෙදෙන්න ඕනෑ එහෙමයි.

ඒ විතරක් නොවෙයි. මහින්ද සිරිවර්ධන මහත්මයා ආසියානු සංවර්ධන බැංකුවේ විකල්ප විධායක අධ්‍යක්ෂ ලෙස අද නම් කරලා තිබෙනවා. කවුද? මේ ආණ්ඩුව. මේ ආණ්ඩුව තමයි ඒ තනතුරුවලට නම් කරන්නේ. අපි එහෙමයි හොඳින් වැඩ කරන, හරියට වැඩ කරන නිලධාරින් වෙනුවෙන් පෙනී සිටින්නේ. ඒ වාගේම තමයි එහෙම නොකරන අයට එරෙහි වෙන්නත් අපි කිසිදු ලෙසක පසුබට වෙන්නේ නැහැ කියන කාරණයත් අවධාරණය කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒ වාගේම මම තව දෙයක් කියන්න ඕනෑ. මාදුගොඩ මන්ත්‍රීතුමාත් කලින් කිව්වා, දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලයක් හදලා රුපියල් ලක්ෂ 12ක පඩි ගත්තාය කියලා. ඊයේ ඉතා පැහැදිලිව ආනන්ද විජේපාල ගරු ඇමතිතුමා පැහැදිලි කළා, සිද්ධ වුණේ මොකක්ද කියලා. නැවත නැවත එකම පවය කියනවා. දැන් මේ කලින් කථා කළ සමහර මන්ත්‍රීලාත් අපි දැක්කා එකම පවය නැවත නැවත කියනවා. එකම පවය. අවස්ථා ගණනාවකදී උත්තර දීලා තිබුණා. එකම පවය කිව්වා. ඉතින් දැනුත් මේගොල්ලන් ඒ පවයම කියනවා.

[බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. මම කථා කරලා අවසන් වුණාට පස්සේ අවශ්‍ය නම්,- *[බාධා කිරීමක්]* හරි. හරි. ඔබතුමා ප්‍රශ්නය මතු කරන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා, කථා කරන්න.*[බාධා කිරීමක්]*

ගරු මහින්ද ජයසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
නම කිව්ව පළියට point of Order එකක් තියෙනවාද? මම දන්නේ නැහැ, ලේකම් මණ්ඩලය උපදෙස් දෙන්න. එතුමා කියපු,- *[බාධා කිරීමක්]*

ගරු චානක මාදුගොඩ මහතා
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඇත්තටම මම මේ ලේඛනය සභාගත කරන්න හිතාගෙන හිටියේ නැහැ. ඊයේ දිනයේදී නාමල් රාජපක්ෂ මැතිතුමා කියපු කාරණය බොරුවක් කියලා මෙතුමා පුන පුනා කියන නිසාත්, අද දවසේ මෙතුමා ඔච්චර ඉල්ලන නිසාත් දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලයේ උපදේශක මහත්වරුන්ගේ ඉඳන් සියලු දෙනා පඩි ගත්ත විධිය සඳහන් මේ ලේඛනය මේ අවස්ථාවේදී මම **සභාගත*** කරනවා. සභාගත කළාම ඕනෑ කෙනෙකුට ඒක බලාගන්න පුළුවන්.

ගරු මහින්ද ජයසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
බොහොම හොඳයි. රුපියල් ලක්ෂ 12යි ගණනක් පඩි ගත්තා කිව්වා නේ. හොඳයි. හැබැයි, මතක තියාගන්න ඒගොල්ලෝ කරපු වැඩ නිසා තමයි අදත් සමහර නඩු ගිහිල්ලා තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, ඔයගොල්ලන්ගේ ගෝඨාභයලාගේ කාලයේ ඔය කාරණය ගැන "අබේරත්න කොමිසම" කියලා කොමිසමක් පත් කරලා විමර්ශනය කළා. ඒ කොමිසම පව වුණා. ඒවා ඔක්කෝම ප්‍රතික්ෂේප වුණා. එහෙම එකක් තමයි දැන් නැවත නැවත මේ හෝද හෝදා මඩේ දමන්නේ. මට කියන්න ඕනෑ වුණේ ඒක නොවෙයි. හෙට සභාව නැහැ නේ. ඊළඟ සභා වාරයේදී,-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු මහින්ද ජයසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මට තවත් විනාඩි දෙකතුනක කාලයක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. ඊළඟ සභා වාරයේදී තවත් ලේඛනයක් තිබෙනවා, සභාගත කරන්න. ඒ ගැන හොඳට අහගන්න, ගරු මන්ත්‍රීතුමා. ඒ තමයි, නිත්‍යා සේනානි සමරනායක ගැන. කවුද මේ නිත්‍යා සේනානි සමරනායක? ශ්‍රී ලංකා ගුවන් සමාගමේ air hostess කෙනෙක්. ඇය කොහේද වැඩ කළේ? ඒ කාලයේ ඇය ජනාධිපති ලේකම් කාර්යාලයට අනුයුක්තව වැඩ කළා. මාසික පඩිය කීයද? රුපියල් 158,000යි. ඒ මුළු කාල සීමාවට කීයක් ගෙව්වාද? රුපියල් ලක්ෂ 42යි. *[බාධා කිරීමක්]*

ගරු චානක මාදුගොඩ මහතා
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
අදාළ ලේඛනය සභාගත කරන්න.

ගරු මහින්ද ජයසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ඔබතුමා එය සභාගත කරන්න. ඔය ලේඛනය සභාගත කළා වාගේම මේ කියන කාරණයට අදාළ ලේඛනයත් ගෙනැල්ලා සභාගත කරන්න. මම සොයා බැලුවා, නිත්‍යා සේනානි ජනාධිපති ලේකම් කාර්යාලයේ කොහේද වැඩ කරලා තිබෙන්නේ කියලා; ඇයගේ office room එක කොහේද කියලා. Office room එකක් නැහැ. එයා ඇත්තටම වැඩ කරලා තිබෙන්නේ ජනාධිපති ලේකම් කාර්යාලයට අනුබද්ධව අරලියගහ මන්දිරයේ. නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා මේ අවස්ථාවේ සභාවේ සිටියා නම් හොඳයි. මම ඊයේ මේ ගැන අහන්න හැදුවත්, මට ඒකට හරියාකාර අවස්ථාවක් ලැබුණේ නැහැ. නාමල් රාජපක්ෂත් එක්ක ව්‍යාපෘතියකයි ඇය වැඩ කරලා තිබෙන්නේ. විශේෂ ව්‍යාපෘති සම්බන්ධීකාරක ලෙස තමයි වැඩට අරගෙන තිබෙන්නේ. හැබැයි, ගුවන් සමාගමෙන් රුපියල් 70,500ක් මාසයකට ගෙවලා තිබෙනවා. ජනාධිපති ලේකම් කාර්යාලයෙන් රුපියල් 87,680ක් මාසයකට ගෙවලා තිබෙනවා. සමාගම් දෙකක මුදල් විශුද්ධිකරණ නඩුවක් පවරා තිබුණා, රුපියල් මිලියන 45ක හෙවත් රුපියල් ලක්ෂ 450කට අදාළව. නාමල් රාජපක්ෂලා, මාදුගොඩලා ඒ වීදුරු ගෙවල්වල ඉඳගෙන තමයි අපේ දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලයට අද එක එක චෝදනා කරන්නේ. දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලය කියලා කාර්යාලයක් තිබුණා; නිල ආයතනයක් තිබුණා; එහි පිරිසක් වැඩ කළා; රාජකාරි කළා. එහෙමයි එහි වැඩ කෙරුණේ. නමුත්, මා අර කියපු කාරණයට අදාළව නිල කාමර මොකවත් නැහැ. අපි දන්නේ නැහැ, අරලියගහ මන්දිරයේ නිල කාමරයක් නැතුවාට වෙන මොකක් හරි කාමරයක් තිබුණා ද කියලා. ඒවා අපි දන්නේ නැහැ. එහෙම කරපු කට්ටිය, මේ. එයාර්ලංකා සමාගමේ ගුවන් සේවිකාවන් තමන්ගේ ගෙවල් ඇතුළේ තියාගෙන පඩි දීපු මහත්තුරු දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලය -මෙරට වංචාවට, දූෂණයට එරෙහිව ක්‍රියාත්මක වෙච්ච ආයතනය- ගැන දිගින් දිගටම ප්‍රශ්න කරමින් සිටිනවා.

* පුස්තකාලයේ තබා ඇත.
* நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
* Placed in the Library.

[ගරු මහින්ද ජයසිංහ මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපි එක දෙයක් කියන්න ඕනෑ මේ රටේ ජනතාවට. ජාතික ජන බලවේගය ආණ්ඩුව ගොඩ නැඟුණේත්, ඉදිරියට යන්නේත් මේ රටේ ජනතාව සමඟ ඇති කර ගත් ඩීල් එකත් එක්ක. ඒ හැර වෙනත් ඩීල් අපට නැත. වංචනිකයන්, දූෂිතයන්, අපරාධකරුවන් සමඟ ඩීල් අපට නැත. සියලු වංචනිකයන්ට, දූෂිතයන්ට, අපරාධකරුවන්ට දඬුවම් කරනු ඇත; නීත්‍යනුකූලව විධිමත්ව දඬුවම් කරනු ඇත. ඔබතුමන්ලා ඊළඟට බලය ගන්න තවතවත් හීන දකිමින් එක එක පූට්ටු අටවා ගත්තාට මේ රටේ ජනතාව ඔබතුමන්ලාට ඒ පූට්ටු අටවන්න ඡන්දය දුන්නේ නැහැ එකම මැතිවරණයකදීවත්. ජනාධිපතිවරණයේදීවත්, මහ මැතිවරණයේදීවත්, පළාත් පාලන මැතිවරණයේදීවත් ඔබතුමන්ලාට පූට්ටු වෙන්න, ඒ කියන්නේ පොහොට්ටුවටයි-සජබයටයි,පොහොට්ටුවටයි-රනිල්ටයි, සජිත්ටයි -නාමල්ටයි එකතු වෙන්න මේ රටේ කිසිවෙක් ඡන්දය දුන්නේ නැහැ. අද ඒ මන්ත්‍රීවරුන්ගේ හෘදය සාක්ෂිය තිබෙන්නේත් ජාතික ජන බලවේගයත් එක්කයි. අද රට පුරා සභා හඳද්දී ඒ මන්ත්‍රීවරුන් පෙන්නුම් කරමින් තිබෙන්නේ එයයි. ඒ බව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

මට වෙලාව ලබා දුන්නාට බෙහෙවින් ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චිත්‍රාල් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.35]

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි. දැන් කථා කළ ගරු නියෝජ්‍ය ඇමතිතුමාට මම මුලින්ම ස්තුතිවන්ත වෙනවා. මොකද, එතුමා කෙහෙළිය රඹුක්වැල්ල ගැන කථා කළා. ඒ හිටපු ඇමතිවරයාට විරුද්ධව නඩු පැවරුවේත් අපි, විශ්වාසභංග යෝජනාව ගෙන ආවේත් අපි කියලා එතුමා කිව්වා. ඉඳලා හිටලා හරි එහෙම අගය කිරීමක් කිරීම සම්බන්ධයෙන් මම ඔබමාට ස්තුතිවන්ත වෙනවා, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. *[බාධා කිරීමක්]* ඒ වෙනුවෙන් ගොඩක් ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ වන නියෝගයත් අද විවාදයේ මාතෘකාවක්. ඒ කියන්නේ, බදු ඔප්පු සම්බන්ධයෙන් තිබෙන මුද්දර ගාස්තු ප්‍රමාණය එකකට එකක් වැඩි කිරීම. එම පනතේ තුන්වැනි වගන්තිය යටතේ තමයි මුද්දර ගාස්තු දෙගුණ කිරීම කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, සාමාන්‍යයෙන් ඕනෑම මුද්දර ගාස්තුවක් අය කිරීමේ අරමුණු දෙකක් තිබෙනවා. එකක් තමයි නීතිමය ලියවිල්ලකට වටිනාකමක් - validation එකක් - ලබා දීම. දෙවැනි කාරණය තමයි රජයට ආදායම් උත්පාදනය කර ගැනීම. ගරු මුදල් නියෝජ්‍ය ඇමතිතුමා මෙම විවාදය ආරම්භ කරමින් පැවසුවේ මෙයින් අවශ්‍ය වන්නේ බදු මුදල් ලබා ගැනීම නොව පනත යාවත්කාලීන කිරීම වන බවයි. ඒ කාරණය උළුප්පා දක්වන්න තමයි හැදුවේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දහහත්වන සියවසේ වැනීසියේ, එහෙම නැත්නම් ස්පාඤ්ඤයේ මුද්දර ගාස්තු කියන එක හඳුන්වා දීමේ අරමුණ වෙලා තිබුණේ බදු ආදායම ලබා ගැනීම තමයි. මම ඒකත් මතක් කරන්නට කැමැතියි. "යාවත්කාලීන" කියන වචනයෙන් බදු ආදායම ඉපයීම කියන කාරණය වහන්න හදන්න එපා.

කලින් කථා කළ මන්ත්‍රීවරයෙක් ඇහුවා, රුපියල් 10 රුපියල් 20ක් කිරීම නේ කළේ කියලා; රුපියල් 10 රුපියල් 20 කළා, ඒක මොකක්ද කියලා. හැබැයි, ලංකාවේ ඇති කරගෙන තිබෙන සමහර බදු ගිවිසුම් අපි දැකලා තිබෙනවා, මිලියන ගණන්වලින් ලියැවුණු. බස්නාහිර පළාතේ කොළඹ ප්‍රමුඛ ප්‍රදේශවල ඇති කර ගන්නා බදු ගිවිසුම් ගත්තාම, මෙය පොඩි ගණනක නොව රුපියල් මිලියන ගණනක වැඩිවීමක්. රුපියල් 10 රුපියල් 20ක් කළා කිව්වාම, රුපියල් 10ක ප්‍රමාණයකින් වැඩි වුණා නොවෙයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, බදු ආදායම ලබා ගන්න ඕනෑ තමයි. ඒ ගැන කිසි ප්‍රශ්නයක් නැහැ. හැබැයි, එසේ බදු ගන්නා බව අයිසිං තවරනවා වාගේ වහලා දමන්න හදන්න එපා. එහෙම කරන්න අවශ්‍යතාවක් නැහැ කියා මම කියනවා. බදු ආදායම මේ ආකාරයට දෙගුණ - double - කිරීම සම්බන්ධයෙන් අපට සාධාරණ භයක් දැනෙනවා. මොකද, මේ වන කොටත් නඩු සම්බන්ධයෙන් අධිකරණ පද්ධතියට දරන්න බැරි පීඩනයක් එල්ල වෙලා තිබෙනවා. නඩු ලක්ෂ 11ක් තිබෙනවා කියලා මෙතැනදී එළිදරව් වුණා. ජනතාවට මේ බදු බර දරන්න බැරිව, නීත්‍යනුකූල බදු ගිවිසුම්වලින් පිට ගිහින් -අනීතික, එහෙම නැත්නම් නීත්‍යනුකූල නොවන බදු ගිවිසුම්වලට ගිහින්- නැවතත් නඩු කටයුතුවල පැටලුණොත් ඒ බරත් පැටවෙන්නේ අපේ අධිකරණ පද්ධතියටයි කියන එක නීතිඥවරයෙකු හැටියට මම මතක් කරන්න කැමැතියි. මේ ගරු සභාවේ නීතිඥවරු ගොඩක් ඉන්නවා. එතුමන්ලාටත් මම එය මතක් කරන්න කැමැතියි. ඒ අවදානම අනිවාර්යයෙන් මේ තුළ තිබෙනවා කියන එක මා කියනවා.

ඒ වාගේම, මම නැවතත් මතු කරන්න කැමැතියි, ගාස්තු යාවත්කාලීන කිරීම කියන කාරණය. ඩිජිටල්කරණය කරන්න දැන් විශාල සූදානමක් තිබෙනවා ලු. නමුත්, ආණ්ඩුවට මාස හයහතක් ගිහිල්ලාත් තවමත් අපට ඒ සම්බන්ධයෙන් පෙනෙන්නට කරපු දෙයක් නම් නැහැ. හැබැයි, ඩිජිටල්කරණය හරහා මුද්දර ගාස්තු ගෙවන ක්‍රමයක් හදා ගන්න තිබුණා නම්, යාවත්කාලීන කිරීමක් හැටියට අපට එය හඳුන්වන්න පුළුවන්. ඉන්දියාවේ e-stamping, එහෙම නැත්නම් digital stamp duty කියන ක්‍රමය 2013 වර්ෂයේ ඉඳලා මේ වන විටත් ඉතාම සාර්ථකව ක්‍රියාත්මක වෙනවා. 2013දී Regulation එකක් ගෙනැල්ලා, ඔවුන් ඒක යාවත්කාලීන කළා. ඉන්දුනීසියාව 1986 තිබුණු නීතිය 2021දී වෙනස් කරලා, digital stamp duty ගෙවන ක්‍රමයක් ගෙනැල්ලා යාවත්කාලීන කළා. අපේ රටේ මෙය යාවත්කාලීන කරනවා කියලා කරලා තිබෙන්නේ, රුපියල් 10ක්ව තිබුණු එම ගාස්තුව රුපියල් 20ක් කරපු එක. ඒක පුදුම යාවත්කාලීන කිරීමක්. එය යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාවක් ඇත්තටම තිබෙනවා නම්, ඒ වෙනුවෙන් ඩිජිටල් ක්‍රමවේදයක් හදන්න කියලා මම ඉල්ලා සිටිනවා. අපේ නීතිඥවරු මේ ගැන දන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, බදු ඔප්පුවකට මුද්දර ගහන්න ගියාම මුද්දර ගන්න ඕනෑ. වැඩිම වටිනාකම සහිත මුද්දරය රුපියල් 1,000 මුද්දරයයි. රුපියල් 50,000ක මුද්දර ගහන්න ගියොත්, රුපියල් 1,000 මුද්දර 50ක් ගහන්න ඕනෑ. තව ක්‍රමයක් තිබෙනවා. මම ඒකත් කියන්නම්. එතකොට ඒවායේ දිනය ලියන්න ඕනෑ, ඔප්පුවක නම් අංකය ලියන්න ඕනෑ, අත්සන් කරන්න ඕනෑ, සමහර වෙලාවට හිල් කරන්න ඕනෑ. ඒ ඔක්කොම කරලා ඒකේ photo copy එකකුත් ගහලා අමුණන්න ඕනෑ, ලියාපදිංචියට ඉදිරිපත් කරද්දී. තවත් ක්‍රමයක් තිබෙනවා. ඒ තමයි ලංකා බැංකුවට ගිහිල්ලා ගෙවන එක. එහෙම නේද, ගරු තුෂාරි ජයසිංහ මන්ත්‍රීතුමියනි? ඔබතුමියත් මේ ගැන දන්නවා නේ. ඒක ලංකා බැංකුවට ගෙවන්නත් පුළුවන්. අපි ලංකා බැංකුව සමඟ එම කාරණයට අදාළව පුදුම මහන්සියක් ගන්නවා, ගරු නියෝජ්‍ය

කාරක සභාපතිතුමියනි. මොකද, මේක ගෙවන්න ගිහිල්ලා සමහර වෙලාවට ලංකා බැංකුවෙන් අපට slip එකවත් ගන්න බැහැ. ඇත්තම කියනවා නම්, නීතිඥවරයෙක් slips ටික සොයන්න බැංකු දෙකකට විතර යන්න ඕනෑ. ඒ slips අපට ගෙදර ගෙන යන්න දෙන්නේ නැහැ. ඒක මේ නීතිඥවරුන්ට විශාල කරදරයක් වෙලා තිබෙනවා. අපේ ගරු සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමාත් මේ ගැන දන්නවා නේ. ඒකේ photocopy ගහන්න ඕනෑ, ආයෙත් ලියාපදිංචියට ඉදිරිපත් කරන්න ඕනෑ. සමහර දවස්වලට ගියාම ඒ කොළය ගන්න නැහැ.

ඉන්දියාවේ නම් මේ කටයුතු ඉතාම පහසුයි. යශේෂ් ෂා මැතිතුමා ඉතාම හොඳ ලිපියක් ලියලා තිබෙනවා. මා අතේ මේ තිබෙන්නේ එයයි. මෙහි digital stamp duty ගෙවන ක්‍රමය ගැන ඉතා හොඳට පැහැදිලි කර තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපට කරන්න තිබෙන්නේ මේ legal instrument එක, එහෙම නැත්නම් මේ නීතිමය ලියවිල්ල අන්තර්ජාලයට upload කිරීමයි. ඒ කාරණය සම්බන්ධයෙන් මුළු ඉන්දියාවටම එක සමාගමක් වග කියනවා. ඒකට අනුව ස්වයංක්‍රියව ඒ ගණන හැදිලා QR code එකක් එක්ක print වෙලා එනවා. අපට online payment කරන්න පුළුවන්; තත්පර ගණනක වැඩක් තිබෙන්නේ; ආයෙත් මුද්දර අලවා අලවා ඉන්න දෙයක් නැහැ. පවතින ක්‍රම යාවත්කාලීන කිරීමේ සැබෑ වුවමනාවක් තිබෙනවා නම්, මේ කියන අලුත් දේවල් ගෙනෙනවා නම් ඉතාම හොඳයි. මේ පිළිබඳ වැඩි විස්තරයක් කියන්න වෙලාව නැති නිසා මම මේ ලේඛනය **සභාගත*** කරනවා. මම ඔබ සියලුදෙනාට කියනවා, මේ ලේඛනය කියවා බලන්න කියලා.

මා ඉහතින් කී විධියේ යාවත්කාලීන කිරීමකට අපි යමු කියන එක තමයි මා විශේෂයෙන් කියන්නේ. එහෙම නැතුව කියන්න එපා, "රුපියල් 10 නේ රුපියල් 20 කළේ, රුපියල් 10කින් නේ වැඩි වුණේ" කියලා. මේ හේතුවෙන් එම ගාස්තු විශාල ප්‍රමාණයකින් වැඩි වීමට නියමිත බවයි මා කියන්නේ.

අපේ නියෝජ්‍ය අමාත්‍ය ගරු සුනිල් වටගල මැතිතුමා -මගේ ජ්‍යෙෂ්ඨ නීතිඥතුමා- ඊයේ දවසේ යම් ප්‍රකාශයක් කරනවා මම දැක්කා. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා විපක්ෂයට විවෘත අභියෝගයක් කළා. ඒ අභියෝගය කරලා, ගරු නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා නොමැති වෙලාවේ ඇවිල්ලා එතුමාගේ ජනාධිපති නීතිඥකම ගැනත් ප්‍රශ්න කරලා යනවා මම දැක්කා. ඔබතුමා විපක්ෂයට අභියෝගයකුත් කළා රීති සංග්‍රහයක් ගැන කියමින්. "රීති සංග්‍රහය" කියලායි ඔබතුමා කිව්වේ. මා හිතන්නේ එහෙම කිව්වේ වැරදිලා.

ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)
රීති සංග්‍රහය තමයි.

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
ඒක රීති සංග්‍රහයක් නොවෙයි. එය, පළාත් පාලන ආයතන මාර්ගෝපදේශ සංග්‍රහය.

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

ගරු නීතිඥ සුනිල් වටගල මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
නැහැ.

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, බලන්න, මේ ලේඛනය නේද?

ගරු නීතිඥ සුනිල් වටගල මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ඔව්.

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
මේක "රීති සංග්‍රහය" නොවෙයි, "මාර්ගෝපදේශ සංග්‍රහය". අඩු ගණනේ මේක රීති කියලාවත් පිළිගන්නවා නම් මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. එහෙමවත් පිළිගන්නේ නැති එක නේ ප්‍රශ්නය වෙලා තිබෙන්නේ. ඔබතුමා කිව්වා, විවෘත ඡන්දයක් පවත්වන්න කියලා මෙහි කොහේද තිබෙන්නේ කියා පෙන්වන්න කියලා. ඔබතුමා විපක්ෂයට විවෘත අභියෝගයක් කළා.

ගරු නීතිඥ සුනිල් වටගල මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ඔව්.

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
ඊට පස්සේ ගරු නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා පනතේ අදාළ වගන්තිය කියෙව්වා. හැබැයි ඔබතුමා කිව්වා, එතුමා රීති සංග්‍රහය ගැන කිව්වේ නැහැ කියලා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මෙහි 7.2.14හි සඳහන් වගුව ඔබතුමා බැලුවා ද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
ඔබතුමා බලන්න 15 වැනි පිටුව.

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ඔබතුමා වාඩිවෙලා බලන්න. නැඟිටින්න ඕනෑ නැහැ, ඕකට.

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
මම එතකල් කියවන්නම්. "ඡන්ද විමසීමේ ක්‍රමය පිළිබඳව සභාවේ බෙදීමක් ඇත්නම්, සභිකයන්ගෙන් විවෘත ඡන්ද විමසීමක් කර ඡන්දය පවත්වන ක්‍රමය පිළිබඳව බහුතර එකඟතාව අනුව කටයුතු කරන්න." මේ, "විවෘත" කියන එක පෙනෙන්නේ නැද්ද?

[ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා]

නිසාම් කාරියප්පර් මැතිතුමාගේ ජනාධිපති නීතිඥකම පිළිබඳව ප්‍රශ්න කරන්න කලින් ඔබතුමා ඇස් දෙක බලාගෙන එන්න. මොකද, මෙතැන ඇවිල්ලා කථා කළාට වැඩක් වෙන්නේ නැහැ. හැබැයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා. ප්‍රශ්නයක් නැත්තේ නැහැ. අපට ඒක තේරෙනවා. මේ පළමුවෙනි ඡන්ද විමසීම තියන්න ඕනෑ ක්‍රමය ගැන, පූර්වයෙන් තිබෙන ඡන්ද විමසීම තියන්න ඕනෑ ක්‍රමය ගැන තමයි මේ ප්‍රශ්නය තිබෙන්නේ. මේ මාර්ගෝපදේශ සංග්‍රහයත් හදා තිබෙන්නේ මේ සියලුදෙනා ත්‍රිකුණාමලයට එක්කගෙන ගිහිල්ලා දවස් දෙකක වැඩ මුළුවක් තියලා, කන්න බොන්න දීලා, වියදම් කරලා. එහෙම කරපු එකක් තවත් මොකක් හරි ලියුම් කඩදාසියකින් එක දවසින් අයින් කරන්න පුළුවන් නම් එතැනින්ම අපට තේරෙනවා, මොකක්ද තිබෙන අරමුණ කියලා. මේකේ තිබෙනවා පැහැදිලිවම, "විවෘතව" කියලා. එතුමා අභියෝග කරපු නිසායි මම මේක පෙන්නුවේ. හැබැයි, තව තැන් ගණනාවක "විවෘත" කියලා තිබෙනවා. හැබැයි, ඒක අපට අදාළ කරගන්න පුළුවන්, නගරාධිපතිවරයා තෝරන ඡන්දයකදී. ඒ නිසා මම ඒ ටික කියන්න ලැහැස්ති වෙන්නේ නැහැ. ඉතාම පැහැදිලිව එක් එක් සභිකයාගේ නම අඬ ගසා තීරණය කළ යුතුයි කියලාත් තිබෙනවා. ඒක තමයි ඔබතුමන්ලා අර්ථ කථනය කරන්න හදන්නේ, එක් එක් සභිකයාගේ නම අඬ ගසා රහසිගතව තියන්න කියලා. ඉතින් මේක මටවත්, එතුමාටවත් විසඳන්න පුළුවන් දෙයක් නොවෙයි. මේක අධිකරණයට ගිහිල්ලා විසඳා ගන්න තිබෙන ප්‍රශ්නයක්. අධිකරණයෙන් විසඳා දෙයි, මේකේ ඇත්ත අර්ථය මොකක්ද කියලා. හැබැයි, මම මේ කරුණු කිව්වේ එතුමා කරපු අභියෝගයට. මේ වගුවක් තිබෙනවා. මේ වගුවේ ඉතාම පැහැදිලිව තිබෙනවා, අවධානය යොමු කළ යුතු දේවල් ආදිය ඔක්කෝම. මේකේ තිබෙනවා, විවෘතව මේ ඡන්දය තිබිය යුතුයි කියලා. ඒක නිසා මම හිතන හැටියට ඔබතුමන්ලාගේ අරමුණ ඉෂ්ට කරගන්න ඕනෑම දෙයක් මෙතැන කියනවා.

අපි දැක්කා, තව ගරු මන්ත්‍රීවරයෙක් කිව්වා, අපි දිනපු නගර සභාවල බලය පිහිටුවන්න අපට දෙන්න කියලා. දැන් දිනුවාය කියන එකේ අර්ථ කථනය මොකක්ද, මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා? දිනුවා කියන්නේ සියයට 50ක් ගත්ත එකද? වැඩිපුර ගත්ත එකද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, නියමිත කාලය අවසන්.

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
මට තව විනාඩියක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

දිනුවා කියන්නේ වැඩිපුර ගත්ත එකද, සියයට 50ට එහා ගත්ත එකද? කොහොමද දිනුවා කියන්නේ? දිනුවා නම් කොහොමද සියයට 60ක් විපක්ෂයේ කණ්ඩායම්වලට මන්ත්‍රීවරුන් ඉන්නේ? මෙතැන ඇවිල්ලා කියනවා, “අපි දිනුවා. අපිට සභා පිහිටුවන්න දෙන්න" කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
මට තව විනාඩියක් පමණ ලබා දෙන්න. ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, වෙලාව තිබෙනවාද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි එතුමාට තව විනාඩියක් දෙන්න.

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
දිනුවා කියනවා නම්, දිනුවා නම් අපට ප්‍රශ්නයක් නැහැ. සමහර සභා තිබෙනවා, සියයට 52ක්, 55ක් අරගෙන ඔබතුමන්ලා දිනලා ඉවරයි. රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා කිව්වා වාගේ අපි ඒවාට ඇඟිලි ගහන්න යන්නේ නැහැ. *[බාධා කිරීමක්]* ඒවා කතන්දර නේ, මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමන්ලා දිනුවා නම්, ඔබතුමන්ලාට සියයට 50ට වඩා තිබෙනවා නම්, මේ ඡන්ද ක්‍රමය යටතේ ප්‍රශ්නයක් නැහැ නේ. ඔබතුමන්ලාට මේ ඡන්ද ක්‍රමය ගැන ගැටලුවක් තිබෙන බව හොඳට දැන දැන නේ මේ ඡන්දයට ගියේ, තුනෙන් දෙකකුත් තියාගෙන, 159කුත් තියාගෙන, ජනාධිපති ධුරයත් තියාගෙන. ටිකක් ඉඳලා, ඕනෑ නම් මේ ඡන්ද ක්‍රමය වෙනස් කරලා ඡන්දයට යන්න තිබ්බා නේ. එහෙම වුණා නම් මේ ප්‍රශ්න ඇති වෙන්නේ නැහැ නේ. හැබැයි, බලය ලබා ගැනීමේ තිබෙන වුවමනාවට කඩිමුඩියේ ඡන්දය තියලා දැන් හොම්බ ඇන ගත්තාට පස්සේ අපට කියනවා, අපි දිනලා තිබෙන්නේ, අපට මේ සභාව පිහිටුවන්න දෙන්න කියලා. දැන් ගාල්ලේ පොහොට්ටුවේ මන්ත්‍රීවරු අරගෙන සභාවල බලය හැදුවාම, ඒ මිනිස්සු ලොන්ඩරියට දමලා හේදිලා එනවාද? ඒ නිසා අපි විපක්ෂයේ කණ්ඩායම් ටික එකතු වෙලා මේ සභාවල බලය පිහිටුවන්න ගියාම, හොරු, මංකොල්ලකාරයෝ, වංචාකාරයෝ කියලා අපට කියන්න එපා. මම කියන්නේ ඒක නිසා දිනුවාය කියලා කියනවා නම්, - *[බාධා කිරීමක්]* ඒක තමයි. වී පැදුරට කුකුළා රිංගනවා වාගේ රට රට මන්ත්‍රීවරුන් හොයාගෙන යනවා. ඊට පස්සේ කියනවා, අපි පක්ෂ එක්ක නොවෙයි වැඩ කරන්නේ, මන්ත්‍රීවරු එක්ක කියලා. එතකොට ඒ පක්ෂයෙන් එළියට බැහැපු ගමන් ඒ මන්ත්‍රීවරයා කිරෙන් හේදෙනවාද? මලෙන් පහළ වෙනවාද? හේදිලා එනවාද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා. කාලය අවසානයි.

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
ඒ නිසා මම කියන්නේ, එකතු වෙලා වැඩ කරනවා නම් අපි හැම දෙනාටම එකතු වෙලා වැඩ කරන්න පුළුවන්. ඔබතුමන්ලාට විතරක් නොවෙයි ඒ අයිතිය තිබෙන්නේ. ඒක මතක් කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අජන්ත ගම්මැද්දෙගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු නීතිඥ සුනිල් වටගල මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, "ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.

[අ.භා. 2.47]

ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා
(மாண்புமிகு அஜந்த கம்மெத்தெகே)
(The Hon. Ajantha Gammeddage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ ගෙනෙන නියෝගය හා ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි ඇතුළත් අති විශේෂ ගැසට් පත්‍ර අද විවාදයට ගනු ලබනවා.

මේ විවාදයේදී විපක්ෂය පැත්තෙන් සාධනීය කරුණු ඉදිරිපත් කළා නම් අපට එකඟ වෙන්න තිබුණා. විපක්ෂය හැම වෙලාවේම කල්පනා කරන්නේ කොහොමද මාධ්‍ය සන්දර්ශන දමා ගෙන වැඩ කරන්නේ කියලා. ඒ තමයි විපක්ෂයේ හැටි. රටේ විපක්ෂයක් තිබෙන්න ඕනෑ. ඒ විපක්ෂය ආණ්ඩුවට සාධනීය කරුණු ඉදිරිපත් කරලා ජනතාව වෙනුවෙන් අදහස් ප්‍රකාශ කරන්න ඕනෑ. හැබැයි, මේ පාර්ලිමේන්තුව තුළ ඒක වෙන්නේ නැහැ. ඒක අපට ලොකු කනගාටුවක්. විපක්ෂය සාධනීය කරුණු ඉදිරිපත් කළා නම්, ඒකට අවශ්‍ය කරුණු අපට ඉදිරිපත් කරන්න පුළුවන්. හැබැයි දැන් ඒක විකෘතියක් බවට පත් වෙලා තිබෙනවා. අද විපක්ෂය දිගටම කල්පනා කරන්නේ, දිගටම මැදිහත් වෙන්නේ, එතුමන්ලා පළාත් පාලන ආයතනවල බලය පිහිටුවන්න දරන උත්සාහය සාධාරණය කරන්නයි. ඒකට තමයි අද විපක්ෂය වැඩ කරන්නේ. ඒකට අදාළව තමයි විපක්ෂය කරුණු ඉදිරිපත් කරන්නේ. සාමාන්‍යයෙන් පළාත් පාලන ආයතනයක බලය හැදෙන්නේ, කොට්ඨාස ක්‍රමයට. කොට්ඨාස තමයි දිනන්නේ. බොහෝ පළාත් පාලන ආයතනවල කොට්ඨාස ජයග්‍රහණය කරලා තිබෙන්නේ, මේ ආණ්ඩුව නියෝජනය කරන දේශපාලන ව්‍යාපාරය වෙච්ච ජාතික ජන බලවේගය. ජාතික ජන බලවේගය තමයි කොට්ඨාස වැඩිපුරම ජයග්‍රහණය කර තිබෙන්නේ. එහෙම නම් කොට්ඨාස වැඩිපුර ජයග්‍රහණය කරපු ප්‍රාදේශීය සභාවල බලය පිහිටුවීමේ අයිතිය තිබෙන්නේ, ජාතික ජන බලවේගයට. හැබැයි ඒක විකෘතියක් බවට පත් කරන්න විපක්ෂය විවිධ විවිධ පුට්ටු අටවා ගන්න උත්සාහ කරමින් ඉන්න ආකාරය අපි දකිනවා. අපි ඒක පරද්දන්න ඕනෑ. ඒක පරද්දන්න අවශ්‍ය වැඩ පිළිවෙළ, ඒක පරද්දන්න අවශ්‍ය මැදිහත්වීම අපි අනිවාර්යයෙන්ම කරනවා. එහෙම නොකළොත්, මේ රටේ ජනතාවගේ සැබෑ මතය එතැන විදහා පාන්නේ නැහැ. ඒ නිසා අපි ඒ මැදිහත්වීම කරනවා. කවුරු මොනවා කිව්වත් අපි ඒ මැදිහත්වීමත් එක්ක ඉස්සරහට යනවා. ගොඩක් පළාත් පාලන ආයතනවල කොට්ඨාසවලින් එකක් දෙකක් තමයි විපක්ෂය ජයග්‍රහණය කරලා තිබෙන්නේ. හැබැයි ජාතික ජන බලවේගයේ අපි තමයි බොහෝ පළාත් පාලන ආයතනවල කොට්ඨාස දිනලා තිබෙන්නේ. එහෙම නම් ඒ කොට්ඨාසවල වැඩ කරන්න ඕනෑ. මධ්‍යම ආණ්ඩුවෙන් කරන වැඩ ටික ඒ කොට්ඨාස තුළ කරන්න ඕනෑ. ඒකට අවශ්‍ය මැදිහත් වීම තිබෙන්නේ පළාත් පාලන ආයතනයේ නම්, පළාත් පාලන ආයතනයේ බලය තිබෙන්න ඕනෑ ආණ්ඩුව පැත්තේයි. ඒකට අදාළ මැදිහත්වීම තමයි අපි මේ කරමින් ඉන්නේ. එහෙම නැතුව ඒවා විකෘති කරන්න නොවෙයි අපි කටයුතු කරන්නේ.

ගොඩක් තැන්වලදී මතු වුණු කාරණයක් තමයි පළාත් පාලන ආයතනවල බලය පිහිටුවීම ගැන. පළාත් පාලන ආයතනවල බලය පිහිටු වනකොට යම් යම් අය එකතු කරගෙන පිහිටවන්න පුළුවන්. ඒක ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ආණ්ඩුවට සහයෝගය දෙන්න එකතු වෙන කවුරු හරි ඉන්නවා නම් එයා හොරෙක් කියලා කියන්න ගත්තා. හොරු ඉදිරිපත් කරලා තිබෙන්නේ ඒ කණ්ඩායම්වලින්නේ. ඒ කණ්ඩායම්වලින් තමයි නාම යෝජනා දීලා තිබෙන්නේ. ඒ කණ්ඩායම්වලින් නාම යෝජනා දීපු අය ගැන තමයි මෙහෙම විකෘති විධියට කථා කරන්නේ, එහෙම මැදිහත්වීම් කරන්නේ. ඒ නිසා කන්න ඕනෑ වෙනකොට කබරගොයාත් තලගොයා කරගන්න න්‍යාය තිබෙන්නේ විපක්ෂයේ පැත්තේ කියලා අපි මේ වෙලාවේ මේ රටේ ජනතාවට කියන්න ඕනෑ. ගම්වල ඇවිදිනකොට ජනතාවගේ ඇත්ත සිතුම් පැතුම් ගැන අපි දන්නවා. ගොඩක් සභාවල ඒ මැදිහත්වීම් කරනකොට, ජනතාව අපිත් එක්ක සාකච්ඡා කරනවා, දැන් කොහොමද බලය පිහිටුවා ගන්නේ, ඒකට අවශ්‍ය මැදිහත්වීම් කරන්නේ කොහොමද කියලා. එහෙම සාකච්ඡා කරනකොට ඒ පක්ෂවලින් ඡන්දෙ ඉල්ලා බලයට ආපු අයට ජනතාව ගිහින් කියනවා, මේ වෙලාවේ ආණ්ඩුවට මැදිහත් වෙන්න, අවශ්‍ය සහයෝගය දෙන්න කියලා. එහෙම තමයි ගොඩක් අය වෙනස් වෙලා තිබෙන්නේ. මේ මැදිහත්වීම කරන්නේ එහෙමයි. එහෙම නැතුව ඔවුන්ට වෙන වරප්‍රසාද, වරදාන අපි දෙන්නේ නැහැ. අපි දන්නවා, වෙන පක්ෂවලින් ඡන්දය ඉල්ලුවත් ප්‍රදේශය දියුණු කරගන්න, ඒකට අවශ්‍ය මැදිහත්වීම් කරගන්න, ප්‍රදේශයේ පාර හදා ගන්න, ජනතාවගේ ජීවිතය ඉහළට ඔසවා තබන්න ඕනෑ කියලා හිතන බිම් මට්ටමේ විශාල පිරිසක් ඉන්න බව. අන්න ඒ අය වෙනුවෙන් තමයි අපි ආණ්ඩුවක් විධියට මේ සභාවල බලය පිහිටුවන්න කටයුතු කරන්නේ. මොකද ආණ්ඩුව පැත්තේ සභාවක් තිබුණොත් තමයි ඒ සභාව සාර්ථකව ඉස්සරහට ගෙන යන්න පුළුවන්. ඒ නිසා මොන දේ කිව්වත් මේ රටේ ජනතාවගේ අභිලාෂ, පරමාර්ථ ඉෂ්ට කරන්න ඕනෑ කරන මැදිහත්වීම අපේ පැත්තෙන් කරනවා කියලා මේ විපක්ෂයේ මහත්වරුන්ට අපි කියනවා. ඔබතුමන්ලාට ඕනෑ විධියට සෙල්ලම් දමන්න අපි ඉඩ දෙන්නේ නැහැ.

මීට කලින් කථා කරපු බොහෝ අය කිව්වා, දැන් මේ බදු අය කළාට වැඩක් නැහැ, බදු අය කළාට තේරුමක් නැහැ, රට ආර්ථික අතින් ආපස්සට - reverse එකට - යනවා කියලා. එතුමන්ලා මේ රටේ ජීවත් වෙනවාද කියලා අපි දන්නේ නැහැ. මොකද, මේ රටේ ජීවත් වෙනවා නම් එතුමන්ලාට ඒක තේරෙනවා. සාමාන්‍යයෙන් ගත්තාම 2022, 2023 අවුරුදුවල සෘණ ආර්ථික වර්ධනයක් තමයි

[ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා]

තිබුණේ කියලා අපි දන්නවා. 2022දී සියයට 7.3ක ඍණ ආර්ථික වර්ධනයක් තිබුණේ. 2023දී සියයට 2.3ක ඍණ ආර්ථික වර්ධනයක් තිබුණේ. එහෙම තිබුණු රටක් තමයි අපි දැන් මේ තැනට ගෙනැල්ලා තිබෙන්නේ. අපි මේ රටේ හොරකම්, දූෂණ, වංචා ගැන කථා කළොත්, මේ රට මේ මට්ටමින් තිබෙන එකත් ලොකු වාසනාවක් කියලා අපිට හිතෙනවා. මොකද, ඒ තරමට හොරකම, දූෂණය, වංචාව පැල පදියම් වෙලා තිබුණු ආයතන තමයි අපි දැක්කේ. ඒවා දැන් යථා තත්ත්වයට පත් කරලා තිබෙනවා. ඒවා නැවත මුදාගන්න අපිට හැකි වෙලා තිබෙනවා. ඒක නිසා අද මේ රට මෙතැනට ගෙනෙන්න හැකිවීම පිළිබඳව අපි සතුටු වෙනවා. ඒකට අපි ලොකු කැපකිරීම් කළා, මැදිහත්වීම් කළා. අපි නිකම් දේශපාලනය කළා නොවෙයි. අපි මේ රටේ ජනතාවට කියපු දේවල් ඉෂ්ට කරන්න මැදිහත් වෙන දේශපාලන ව්‍යාපාරයක්; මැදිහත් වෙන ආණ්ඩුවක්. විපක්ෂයේ මහත්වරු අන්න ඒක තේරුම් ගන්න ඕනෑ.

පසුගිය කාලයේ කරපු හොරකම්, දූෂණ, වංචා දැන් නැවතිලා තිබෙනවා කියලා අපි දන්නවා. දැන් ඒවා කරන්න කෙනෙක් නැහැ. අන්න ඒවා දැන් reverse වෙලා තිබෙනවා. හොරකම්, දූෂණ, වංචා නැති ආණ්ඩුවක් දැන් හැදිලා තිබෙනවා. ඒ නිසා ඒ ගැන සතුටු වෙන්න ඕනෑ. මොකද, ඒ හොරකම්වල විධිය ගත්තාම, ඒ හොරකම් කරපු අය, වංචා කරපු අය, දූෂණ කරපු අය අද අධිකරණ ක්‍රියාමාර්ග හරහා බන්ධනාගාරගත වෙන එක අරුම පුදුම වැඩක් වෙලා තිබෙනවා කියලා අපි දන්නවා. මොකද, සාමාන්‍යයෙන් පවුල් පිටින් විදේශගත වෙනකොට තාත්තා තමයි ඉස්සෙල්ලා ඒ රටට ගිහිල්ලා රස්සාවක් හොයාගෙන විදේශගත වෙන්න අවශ්‍ය මැදිහත්වීම් ටික, වටපිටාව හොයාගෙන එන්නේ. ඒ වාගේ තමයි දැන් හොරු බන්ධනාගාරයට යන්නේත්. හොරු බන්ධනාගාරයට යන්නේ කොහොමද? ඉස්සෙල්ලා තාත්තා යනවා. ගිහිල්ලා විස්තර හොයාගෙන ඇවිල්ලා පවුල් පිටින් විදේශගත වෙනවා වාගේ හොරකම් කරපු අය බන්ධනාගාරගත වෙන තත්ත්වයට අද පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ රටේ නීතිය හරියට ක්‍රියාත්මක වෙනවා කියන සතුට අපිට තිබෙනවා. ඒ සතුට අපිට ඇති. මේවා කියනකොට රජයේ නිලධාරින් ටිකක් අකර්මණ්‍ය කරන්න, බය කරන්න විපක්ෂය උත්සාහ ගන්නවා. "හරියන්නේ නැහැ. මේ ආණ්ඩුවත් එක්ක වැඩ කරන්න බැහැ, මෙහෙම වැඩ කළොත් මාර අමාරුවක වැටෙනවා. ඒක නිසා වැඩ කරන්න එපා" වැනි අදහසක් තමයි මේ ගෙනෙන්න හදන්නේ.

මේ රටේ රජයේ නිලධාරින් සියයට 80ක් මේ ආණ්ඩුව බලයට පත් කරන්න මැදිහත් වුණු බව අපි දන්නවා. මේ ආණ්ඩුව බලයට පත් කරන්න ඒ අය ඡන්දය දුන්නා. ඒ ඡන්දය දීලා තමයි මේ ආණ්ඩුව බලයට පත් කරලා තිබෙන්නේ. මේ හොරකම්, දූෂණය, වංචාව නවත්වලා හොඳ රටක් හදාගන්න ඕනෑ කියලා ඒ රජයේ නිලධාරින් තුළ ඇත්ත හැඟීමක් තිබුණා. එහෙම නැත්නම් අපේ පවුල්, පරම්පරාවල් ඔක්කෝම ඉවරයි කියලා රජයේ නිලධාරින් හිතුවා. එහෙම හිතපු රජයේ නිලධාරින් තමයි මේ වෙනකොට මේ රටේ රාජ්‍ය අංශයේ ඉන්නේ. ඒක නිසා රජයේ නිලධාරින් හරියට වැඩ කරනවා, නීතිගරුකව වැඩ කරනවා කියන ඒ සතුට අපිට තිබෙනවා. ඒ අතරේ මීට කලින් හොරකම් කරපු ඒ පාලකයොත් එක්ක එකට ඉඳගෙන හොරකම් කරපු සමහර අතලොස්සක් නිලධාරින් අද දඬුවම් විඳිනවා. අපිට ඒ ගැන කනගාටුයි. මොකද, මේ වාගේ ආණ්ඩු ඇවිල්ලා ඔවුන්ට මේ වාගේ දඬුවම් කරයි කියලා ඔවුන් ඒ කාලයේ හිතුවේ නැහැ. හැබැයි බහුතරයක් රජයේ නිලධාරින් අද සතුටු වෙනවා. මොකද, තමන්ට ස්වාධීනව වැඩ කරන්න පුළුවන් විධියට රාජ්‍ය යන්ත්‍රණය සූදානම් කරලා තිබෙනවා, ඒ වෙනුවෙන් මැදිහත්වීම් කරලා තිබෙනවා කියන සතුට අද රජයේ නිලධාරින්ට තිබෙනවා. ඒක නිසා විපක්ෂයේ අය මොනවා කිව්වත්, රජයේ නිලධාරින් අකර්මණ්‍ය කරන්න කටයුතු කරන්න බැහැ කියන කාරණය විශේෂයෙන් මේ අවස්ථාවේ කියනවා.

අපි දන්නවා, පළාත් පාලන ආයතනවලට තමයි මේ මුද්දර බදුවලින් වැඩි ප්‍රමාණයක් යන්නේ කියලා. ඒක නිසා පළාත් පාලන ආයතන ශක්තිමත්ව තිබෙන්න ඕනෑ. පළාත් පාලන ආයතනවලට ලැබෙන මේ මුද්දර බදු වලින් තමයි ප්‍රදේශයේ පාර හැදෙන්නේ, මංමාවත් ටික ගොඩනැඟෙන්නේ, සෞඛ්‍ය සේවාව දියුණු කරන්නේ. මේ ආදී සියලු කාරණා වෙන්නේ මුද්දර බද්දෙන්. ඒ බදු අය කළාට ඒ බදු සාධාරණව බිමට ගලාගෙන එනවා කියන විශ්වාසය අද මේ රටේ ජනතාව තුළ තිබෙනවා. තමන්ට අවශ්‍ය ඒ යටිතල පහසුකම් ටික සංවර්ධනය වෙනකොට, තමන්ගේ නිෂ්පාදනය වැඩි වෙනකොට ඒවා රටේ ජනතාවට දැනෙනවා. ගොවිතැන දියුණු වෙනකොට, වැව් ටික හැදෙනකොට, ඒ වාගේම ගොඩ වෙච්ච ඇළ වේලි ටික ප්‍රතිසංස්කරණය වෙනකොට ඒවා මේ රටේ ජනතාව දකිනවා. ඒ නිසා විපක්ෂය මොන දේ මවන්න උත්සාහ කළත්, මොන බොරුව වපුරන්න උත්සාහ කළත්, දැන් මේ ආණ්ඩුව යන්නේ මොන ගමනක්ද, මේ ආණ්ඩුව රටේ ජනතාව කෙරෙහි තබන විශ්වාසය, ජනතාව කෙරෙහි දක්වන ආකල්ප මොනවාද කියන එක මේ රටේ ජනතාවගෙන් බහුතරයක් දන්නවා. ඒක නිසා විපක්ෂයේ මහත්වරුන්ට අපි කියනවා, තමන් මේ කරන ප්‍රකාශ එළියට ගිහිල්ලා, රටේ ජනතාව ඉස්සරහට ගිහිල්ලා කියන්න පුළුවන්ද කියලා බලන්න කියලා. පාර්ලිමේන්තුව ඇතුළේ ඉඳන් විවිධ කථා කියන්න පුළුවන්; විවිධ අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්. හැබැයි, පාර්ලිමේන්තුවෙන් එළියට ගිහිල්ලා මහජනතාවත් එක්ක මේ ගනුදෙනුව කරන්න විපක්ෂයේ අයට අද බැරි වෙලා තිබෙනවා. මොකද, මහජනතාව ඒ අය ප්‍රතික්ෂේප කරන තැනට පත් වෙලා තිබෙන නිසා. පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් පසුගිය දවස් ටිකේ දැක්කෙත් ඒ කාරණයම තමයි. තමන්ගේ පක්ෂයේ සිටි අයත් තමන්ට එරෙහිව ආණ්ඩුව පැත්තට ඇවිල්ලා ඡන්දය ප්‍රකාශ කරලා, පළාත් පාලන ආයතනවල බලයත් ආණ්ඩුවට ලබා දෙන්නට කටයුතු කර තිබෙනවා. විශේෂයෙන්ම ඒ සියලුදෙනාට අපි ආචාර කරනවා. මොකද, නිවැරදි තැනක ඉඳගෙන නිවැරදි තීන්දු ගන්න අවශ්‍ය මැදිහත්වීම් කරන නිසා. එම නිසා හැම පළාත් පාලන ආයතන සභිකයෙකුටම ඔවුන් ඒ කරන කර්තව්‍යය වෙනුවෙන් අපේ ආචාරය පුද කරනවා. මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අම්බිකා සාමිවෙල් මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 2.59]

ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය
(மாண்புமிகு (செல்வி) அம்பிகா சாமிவேல்)
(The Hon. (Ms.) Ambika Samivel)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நாங்கள் முத்திரைத் தீர்வை வரி (விசேட ஏற்பாடுகள்) சட்டத்தின் கீழான கட்டளை மற்றும் இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாட்டுச்) சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் குறித்து விவாதித்துக் கொண்டு இருக்கின்றோம்.

விஷேடமாக, 20°Cக்கும் குறைந்த வெப்பநிலை நிலவக்கூடிய நுவரெலியா, பதுளை, மாத்தளை போன்ற குளிர்ப் பிரதேசங்களில் வசிக்கின்ற மக்கள் மத்தியில் குளிர் காலங்களில் அணியக்கூடிய உடைகளுக்குப் பாரிய கேள்வி இருக்கின்றது என்பதை மலையகத்தைப் பிரதிநிதித்துவப் படுத்தும் பாராளுமன்ற உறுப்பினர் என்ற வகையில் நான் இங்கு கூறிக்கொள்கின்றேன். மேற்கூறிய பிரதேசங்களில் வசிக்கின்ற மக்கள், பொருளாதார ரீதியாகப் பாரிய சிக்கல்களை அனுபவிக்கின்ற அதேநேரம், குறைந்த ஊதியத்தைப் பெற்று சாதாரண வாழ்க்கையையே வாழ்ந்து கொண்டு இருக்கின்றார்கள். எனவே, அவர்களால் அதிக விலை கொடுத்து இவ்வாறான உடைகளைக் கொள்வனவு செய்ய முடியாது. இதனைக் கருத்திற்கொண்டு எமது தேசிய மக்கள் சக்தி அரசாங்கமானது, சுமார் 5 வருட காலமாக இடைநிறுத்தப்பட்டு இருந்த இந்த ஆடைகளின் இறக்குமதியை மீளவும் மேற்கொள்வதற்கு அனுமதி அளித்துள்ளது. இது எமது சமூகத்துக்குக் கிடைத்துள்ள நன்மை என்றே சொல்லலாம். மேற்கூறப்பட்ட ஒழுங்குவிதிகள் ஊடாகச் சுற்றுலாத்துறை சார்ந்த விளையாட்டு உபகரணங்களை இறக்குமதி செய்வதற்கும் அனுமதி வழங்கப்பட்டு இருக்கின்றது. இதன்மூலம் சுற்றுலாப் பிரயாணிகளை அதிகமாக ஈர்க்கக்கூடிய எல்ல, ஹப்புத்தளை போன்ற பகுதிகளில் சுற்றுலாக் கைத்தொழிலில் ஈடுபடுகின்றவர்கள் அதிகளவு இலாபத்தை ஈட்டுவதற்கான வாய்ப்பும் ஏற்பட்டு இருக்கின்றது. நாம் தொழில்நுட்ப ரீதியாக முன்னோக்கிப் பயணிப்பதில்லை என்ற குற்றச்சாட்டும் எதிர்க்கட்சியில் இருந்து எழுகின்றது. ஆனாலும், தற்போது வாகனங்களை இறக்குமதி செய்வதற்கும் நாங்கள் அனுமதி வழங்கியுள்ளோம்.

அடுத்து, இன்று பலரும் உள்ளூராட்சி மன்றத் தேர்தல் குறித்துப் பேசினார்கள். பதுளை மாவட்டத்தை எடுத்துக் கொண்டாலும் சரி, ஏனைய மலையகப் பகுதிகளை எடுத்துக்கொண்டாலும் சரி, அங்குள்ள அநேகமான சபைகளில் அரசாங்கத் தரப்பினரே ஆட்சி அமைத்து இருப்பதைக் காண முடிகின்றது. கடந்த பொதுத் தேர்தலில் மக்கள் எங்களுடைய கட்சிக்கு 159 உறுப்பினர்களைப் பெற்றுக் கொடுத்தார்கள். இது எமது அரசாங்கத்துக்கு மக்கள் அளித்த பலமாகும். மக்கள் எங்களிடம் எதிர்பார்க்கின்ற விடயம் என்னவெனில், அவர்களுக்காக நாங்கள் சேவையாற்ற வேண்டும் என்பதைத்தான். அந்த நோக்கத்துக்காகவே அவர்கள் ஊழல் மிக்க ஆட்சிக்கு முற்றுப்புள்ளி வைத்து, தூய்மையானதோர் அரசாங்கத்தை அமைப்பதற்காக தேசிய மக்கள் சக்தியினராகிய எங்களைத் தெரிவு செய்தனர். அந்த வகையில், தங்களது தேவைகளை நிறைவேற்றித் தரக்கூடிய ஓர் அரசாங்கமாகவே அவர்கள் எங்களைப் பார்க்கின்றனர்.

இவ்வாறான நிலையில், கடந்த உள்ளூராட்சி மன்றத் தேர்தல் முடிவுகளின் பிரகாரம், எங்களுடைய தேசிய மக்கள் சக்தி பல சபைகளைக் கைப்பற்றியபோதிலும், சில சபைகளில் தனித்து ஆட்சி அமைக்க முடியவில்லை. மக்களின் பிரதிநிதிகளாக வந்த நாங்கள், அவர்களுக்குச் சேவை செய்யவேண்டி உள்ளதால், தனித்து ஆட்சியமைக்க முடியாத சபைகளில் ஆட்சி அமைப்பதற்காகச் சில உத்திகளைக் கையாண்டோமே தவிர, எந்த கட்சியுடனும் அரசியல் deal செய்யவில்லை. மக்களுக்குச் சேவை செய்வதற்காக அவர்களின் வாக்குகளைப் பெற்று உள்ளூராட்சி மன்றத் தேர்தலில் வெற்றிபெற்றவர்கள் அரசாங்கக் கட்சியோடு இணைந்து சபைகளில் ஆட்சியமைத்தனர். இது அவர்களுடைய கடமை! சுயநலம் இல்லாமல் மக்களுக்குச் சேவை செய்ய வேண்டும் என்ற ஒரே நோக்கத்துக்காகத்தான் அவர்கள் அரசாங்கக் கட்சியுடன் இணைந்து ஆட்சி அமைத்தார்கள். உள்ளூராட்சி மன்றங்களில் ஆட்சி அமைக்க வேண்டியது தேசிய மக்கள் சக்தியின் கட்டாயத் தேவை! ஏனெனில், உள்ளூராட்சி மன்றங்கள் ஊடாகத்தான் மக்களுக்குச் சேவை செய்யவேண்டி இருக்கிறது. ஊழல் மிக்க, ஒன்றுமே செய்ய முடியாத, பலனற்ற எதிர்க்கட்சிக்கு ஆட்சி அமைக்குமாறு சொல்லிவிட்டுப் பார்த்துக்கொண்டு இருப்பதற்கு எங்களுக்கு எந்தவிதமான அதிகாரமும் இல்லை. அதனால்தான் நாங்கள் தனித்து ஆட்சி அமைக்க முடியாத சபைகளில் பல்வேறு உத்திகளைப் பயன்படுத்தி ஆட்சி அமைத்தோம். அதற்குக் காரணம், மக்களுக்குச் சேவை செய்ய வேண்டுமென்ற எண்ணம்தான்.

இவ்வாறான சட்டத் திருத்தங்கள் ஊடாக மக்களுக்குச் சென்றடையவேண்டிய எல்லாவிதமான நன்மைகளையும் அவர்களுக்குப் பெற்றுக்கொடுக்க வேண்டும். சுயேச்சைக் குழு உறுப்பினராக இருந்தாலும் சரி, எதிர்க்கட்சியைச் சேர்ந்த உறுப்பினர்களாக இருந்தாலும் சரி, எந்தவிதமான பயனும் அற்ற கட்சியில் நான்கு வருடங்கள் இருந்தால் மக்களுக்குச் செய்யவேண்டிய சேவைகளைச் செய்ய முடியாமல் போய்விடும் என்று அவர்கள் உணர்ந்தார்கள். அதன் விளைவாகத்தான் அவர்கள் எந்தவித எதிர்பார்ப்பும் இல்லாமல் ஆட்சியிலிருக்கின்ற தேசிய மக்கள் சக்தியோடு இணைந்து மக்களுக்குச் சேவை செய்வதற்குத் தீர்மானித்தனர். உண்மையிலே நாங்கள் அவர்களுடைய அர்ப்பணிப்பைப் பாராட்ட வேண்டும். அவர்களை விமர்சிப்பதற்கோ, குறைசொல்வதற்கோ, அவர்கள்மீது சேறுபூசுவதற்கோ எதிர்க்கட்சியில் இருக்கின்ற எவருக்கும் எந்தவிதமான அதிகாரமும் கிடையாது. ஏனெனில், அவர்களுடைய தூய்மையான ஒரே நோக்கம் மக்களுக்காகச் சேவை செய்வதே ஆகும். எங்களுடைய நோக்கமும் அதுவாகத்தான் இருக்கின்றது.

இன்றைய தினம் கொண்டுவரப்பட்டு இருக்கின்ற முத்திரைத் தீர்வை வரி அதிகரிப்பு ஊடாகக் கிடைக்கப் பெறுகின்ற வருமானத்தைப் பிரதேச சபைகளின் அபிவிருத்திக்காக, அவற்றின் வேலைத்திட்டங்களுக்காகப் பயன்படுத்துவதற்கு வாய்ப்பு ஏற்பட்டு இருக்கின்றது. மேலும், இன்றைய தினம் இந்தச் சபையில் கொண்டுவரப்பட்டு இருக்கின்ற சட்டத் திருத்தங்கள் மலையக மக்களுக்கும் அவர்களுடைய பிரதிநிதியாக இருக்கின்ற எனக்கும் நன்மை பயக்கும். விசேடமாக, குளிர் காலத்தில் அணிகின்ற ஆடைகள் இறக்குமதி தொடர்பில் தெளிவாகப் புரிந்துகொள்ள வேண்டிய ஒரு விடயம் உள்ளது. அதாவது, இறக்குமதி செய்யப்படுகின்ற குளிர்கால ஆடைகள் வெறுமனே பயன்படுத்தப்பட்ட ஆடைகள் அல்ல. மாறாக, தூய்மையானதும் தரம்சோதிக்கப்பட்டதுமான சிறந்த ஆடைகளாகும். வறுமைக் கோட்டுக்குக்கீழ் வாழுகின்ற மக்களுக்கு நன்மை பயக்கின்ற விடயமாகவே இது அமைகின்றது. எனவே, இவ்வாறான சட்டத் திருத்தங்களைக் கொண்டுவருவது மக்களுக்கு நன்மை பயப்பதற்காகும். இதுவே எமது அரசாங்கத்தின் நோக்கமாகவும் இருக்கின்றது என்று கூறி, விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 3.07]

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Thank you, Hon. Presiding Member. நான் ஒரு சில விடயங்களை தமிழ் உரையாற்றிவிட்டு, சிங்களத்தில் உரையாற்றலாம் என நினைக்கின்றேன். அண்மைய தினம் NPP அரசாங்கத்தின் 159 தூண்களில் மிகப் பெரிய தூணாக இருக்கின்ற, எங்களுடைய யாழ்ப்பாணத்துப் பிரசாரப் பீரங்கி கௌரவ இளங்குமரன் அவர்கள் ஒரு பேட்டியில், மக்கள் எல்லோரும் சேர்ந்து ஜனாதிபதியிடம் ஒரு கோரிக்கையை முன்வைப்போம் என்று சொல்லியிருந்ததை நான் பார்த்தேன். அதாவது, எங்களுடைய விடுவிக்கப்படாத காணிகளுக்குள் இரண்டு மணித்தியாலங்கள் சென்று வருவதற்கான அனுமதியைத் தர வேண்டுமென்று கோரிக்கை முன்வைப்போமெனக் கூறிய video ஒன்றை நான் பார்த்தேன். எங்களுடைய இளங்குமரன் உட்பட யாழ்ப்பாணத்தைச் சேர்ந்த NPP பாராளுமன்ற உறுப்பினர்களுக்குத் தெரியாது, தாங்கள் இப்போது இருப்பது அரசாங்கத்தில் என்பது. மன்னிக்க வேண்டும். தெளிவாகக் கேட்டுக் கொள்ளுங்கள். தெரியாவிட்டால், எழுதி வைத்துக்கொள்ளுங்கள். நீங்கள் இப்போது அரச தரப்பு உறுப்பினர்கள். அப்படியிருக்கும் போது, இரண்டு மணித்தியாலங்கள் அந்தக் காணிகளுக்குச் சென்று வர பாதைகளைத் திறந்து விடுங்கள் என்று ஜனாதிபதியிடம் கோரிக்கை முன்வைக்க முடியாது.

அடுத்து, இரண்டாவது விடயத்துக்கு வருகிறேன். 2014இல் A/L செய்த, யாழ்ப்பாணப் பல்கலைக்கழகத்திலிருந்து pass-outஆன பட்டதாரிகள் ஒரு முறைப்பாட்டுக் கடிதத்தை நேற்றைய தினம் அனுப்பியிருக்கிறார்கள். கௌரவ றஜீவன் அவர்கள் தேர்தலுக்கு முன்பு வாக்குச் சேகரிக்கின்ற நேரத்தில் அந்த பட்டதாரிகளைச் சந்தித்து, தான் MPஆக வந்து முதல் 3 மாதங்களுக்குள்ளே கௌரவ பிரதமருடன் கதைத்து வடக்கிலே இருக்கின்ற வேலையில்லாப் பட்டதாரிகள் 3,000 பேருக்கு வேலையைப் பெற்றுக்கொடுப்பதாகச் சொல்லியிருக்கிறார். இப்போது அதுபற்றி அவரிடம் கேட்டபோது, தேர்வுப் பரீட்சை ஒன்றை எழுத்தித்தான் பட்டதாரி நியமனம் பெறலாமே ஒழிய, நேரடியாக நியமனம் கொடுக்க முடியாதெனச் சொல்லியிருக்கிறார். அப்படியென்றால், தேர்தலுக்கு முன்னர் ஒரு கதை; தேர்தலுக்குப் பின்னர் இன்னொரு கதை!

அடுத்து, வடக்கு மாகாணத்தில் உள்ள வைத்தியசாலை ஒன்றிலே இருக்கின்ற வைத்தியர் கிருசாந்தினி என்பவரின் ஊழல்கள் தொடர்பாக இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழுவிலே நான் முறைப்பாடு செய்திருக்கிறேன். அதைவிட, சாவகச்சேரி ஆதார வைத்தியாசலையிலே முன்னர் இருந்த வைத்தியசாலை நிருவாகிகள் மில்லியன் கணக்கான பணத்தை ஊழல் செய்திருக்கிறார்கள். இது தொடர்பாகவும் அந்த ஆணைக்குழுவிலே நான் முறைப்பாடு செய்திருக்கிறேன். அப்படி முறைப்பாடு செய்து கிட்டத்தட்ட 20 நாட்கள் கடந்துவிட்டன. ஆனால், இன்றுவரை அந்த ஆணைக்குழுவினால் எந்தவொரு விசாரணையும் மேற்கொள்ளப்படவில்லை. அதற்கு முக்கிய காரணம், வடக்கு மாகாணத்தில் இருந்து தெரிவுசெய்யப்பட்ட NPP பாராளுமன்ற உறுப்பினர்

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

அவர்கள் யாழ்ப்பாணப் போதனா வைத்தியசாலையில் நடந்த அத்தனை ஊழல்களுக்கும் sign பண்ணியிருப்பதே ஆகும்.

NPP அரசாங்கம் ஒருபோதுமே வடக்கு மாகாண வைத்தியாசலைகளில் நடந்த ஊழல்களைத் தேடிப்பிடிக்காது. ஆனால், ஸ்ரீ ஜயவர்தனபுர வைத்தியசாலையிலே neurologist ஒருவர் ஊழல் செய்ததற்காக இந்த அரசாங்கம் அவரை arrest பண்ணியிருக்கின்றது. வடக்கிலே இடம்பெற்ற ஊழல்கள் தொடர்பாக என்னுடைய ஆரம்ப உரைகளிலேயும் நான் சொல்லியிருக்கிறேன். இலண்டனை ஆதாரத்தளமாகக் கொண்டு இயங்குகின்ற 'டொகா' என்ற நாட்டியக் குழுவொன்று கிட்டத்தட்ட £31,300 யாழ்ப்பாண வைத்தியசாலைக்குக் கொடுத்திருக்கின்றது. அதன் பெறுமதி கிட்டத்தட்ட 1,200 இலட்சம் ஆகும். அந்தப் பணத்துக்கும் வைத்திய உபகரணங்களுக்கும் என்ன நடந்ததெனத் தெரியாது. அது தொடர்பில் எந்தவொரு கணக்கறிக்கையும் இல்லை. பிரதி அமைச்சரைக் கேட்டால், அது தொடர்பான internal auditஐப் பாராளுமன்றத்தில் சமர்ப்பிப்பதாகச் சொல்கிறார்.

நீங்கள் சில விடயங்களை விளங்கிக்கொள்ள வேண்டும். தமிழில் பேசுவது உங்களுக்கு விளங்கவில்லையென்றால், interpretationஐ கேட்டு விளங்கிக்கொள்ளவும். நான் internal auditஐக் கேட்கவில்லை. நான் கேட்டது, வைத்தியசாலையில் இருக்கின்ற நோயாளர் நலன்புரிச் சங்கத்தினூடாக வருகின்ற பண விபரங்கள் பற்றியதாகும். வட மாகாண வைத்தியசாலைகளில் ஊழல்கள் நடந்திருப்பதை சுகாதாரம் மற்றும் வெகுசன ஊடக பிரதி அமைச்சர் அவர்களும் ஏற்றுக்கொண்டுள்ளார். அது சம்பந்தமாக நடவடிக்கை எடுப்பதாக அவர் சொல்லியிருக்கிறார். ஊழல்வாதிகளைப் பிடிப்போம், கள்வர்களைப் பிடிப்போம், தாங்கள் சுத்தவாளிகள் எனக்கூறி வந்த எந்தவோர் அரசாங்கமும் இதுவரை அவற்றைச் செய்யவில்லை. நான் உங்களுக்கு 100 சதவீதம் ஆதரவு அளித்தவன். இவற்றை நினைக்கும்போது மிகவும் கவலையாக இருக்கின்றது.

அடுத்து, மன்னார் வைத்தியசாலை பற்றிய விடயத்துக்கு வருவோம். இன்று நான் பாராளுமன்றத்தில் இருக்கிறேனென்றால், அதற்கு முக்கிய காரணம் யாழ்ப்பாண மக்களும் மன்னார் மக்களும்தான். மன்னார் மாவட்ட பொது வைத்தியசாலையிலே - General Hospitalஇலே - குழந்தைக்குப் பாலூட்டும்போது இறந்த அம்மாவினதும் அதனால் தூக்குப்போட்டு இறந்த மரியதாஸ் அவர்களினதும் குடும்பத்துக்கு இன்றுவரைக்கும் நீதி கிடைக்கவில்லை. மன்னாரிலே விசாரணைகள் நடந்துகொண்டு இருக்கின்றன. ஆனால், இன்னும் சம்பந்தப்பட்ட வைத்தியர் கைது செய்யப்படவில்லை. நேற்றைய தினம் செய்தி ஒன்றைப் பார்த்தேன். பால் புரைக்கேறிய குழந்தையை டிக்கோயா ஆதார வைத்தியசாலைக்குக் கொண்டு சென்றபோது அங்கு வைத்தியர் இருக்கவில்லை. அவர் வீட்டுக்குப் போய்விட்டார். அதன் பிறகு அந்தக் குழந்தையை ஒரு தனியார் வைத்தியசாலைக்கு - private hospitalக்கு - எடுத்துச் சென்றிருக்கிறார்கள். அங்கு குழந்தையைப் பொறுப்பேற்க முடியாதெனச் சொல்லியிருக்கிறார்கள்.

எனக்கு இப்போதும் ஞாபகம் இருக்கின்றது. சாவகச்சேரி வைத்தியசாலையிலே கடமையாற்றிய வேளையில் அங்குள்ள quartersஇலே நீண்டகாலம் என்னுடைய குழந்தையுடன் வாழ்ந்தவன் நான். ஒருநாள் அந்த வைத்தியசாலையில் குழுந்தையொன்றின் அழுகுரல் கேட்டபோது, நான் போட்டிருந்த காற்சட்டையோடும் T-shirt உடனும் போய் அந்தப் patientஐ resuscitate பண்ணி அனுப்பினேன். அது என்னுடைய duty நாளும் அல்ல. ஆனால், இங்கு அதற்கு நேர்மாற்றமாக இருந்தது.

யாழ்ப்பாணம் போதனா வைத்தியசாலையிலே மலரவன் ஐயாவுடைய wardஐ இல்லாமல் செய்வதற்கு அவ்வைத்திய சாலையின் Director சத்தியமூர்த்தி அவர்கள் மிகப்பெரிய ஊழல் வேலைகளைச் செய்தார். ஆசியாவிலே அதிகூடிய surgery செய்யப்படுகின்ற யாழ்ப்பாணம் போதனா வைத்திய சாலையிலே இன்னும் 2-3 unitsஐ நிறுவி மலரவன் ஐயாவுடைய அந்த wardஐக் குழப்புவதற்கான வேலைகளை அவர் செய்தார். Sectoral Oversight Committeeஇலே நான் அது சம்பந்தமாகக் கதைத்து DG இடமும், Secretary இடமும் சொல்லி அந்த வேலையை நிறுத்தியிருக்கின்றேன். அதைவிட, நான் சில விடயங்களைச் சிங்களத்தில் சொல்ல விரும்புகின்றேன்.

මම මේ ගැන සිංහලෙන් කියන්නම්. මම මේ පාර්ලිමේන්තුවට ආවේ politics කරලා නොවෙයි. මම කවදාවත් politics කරලා නැහැ. අවුරුදු 39ක් මම කාටවත් ඡන්දය දාලා නැහැ. 2024 අවුරුද්දේ මම appointment එකක් අරගෙන ගියා, Chavakachcheri Base Hospital එකට. රුපියල් මිලියන 17ක් - රුපියල් ලක්ෂ 170ක් - ඒ hospital එකට ඩයස්පෝරාවෙන් දීලා තිබුණා. මම ඒ hospital එකට යනකොට දැක්කා, ඒ hospital එකේ surgical theatre එකක් නැති බව. Buildings තුනක් හදලා තිබෙනවා. එක building එකක් විතරක් තුන් වතාවක් open කරලා තිබෙනවා. ඩග්ලස් ඇවිල්ලා open කළා; අංගජන් රාමනාදන් ඇවිල්ලා open කළා. රුපියල් මිලියන 17ක බඩු එවලා තිබෙනවා, පිටරට ඉඳන්. නමුත්, ඒවා නැහැ. මම ඒ ගැන හොයලා මගේ Facebook page එකේ දැම්මා, මෙච්චර ගාණක් දීලා තිබෙනවා, හැබැයි, මේ ටික නැහැ, ඒවා කෝ කියලා. එතකොට GMOA එක strike එකක් කළා. ඊට පස්සේ දිගින් දිගටම රනිල් මහත්තයා මාව ඇදලා දැම්මා. විපක්ෂ නායකතුමාත් මාව ගෙන්වලා ඒ ගැන කථා කළා. ඊට පස්සේ දිගින් දිගටම මේ ප්‍රශ්නය දුරදිග ගිහිල්ලා, සැප්තැම්බර් 26වෙනි දා මම හිරේට ගියා. 29වෙනි දා, හිටපු Secretary to the Ministry of Health, පාලිත මහීපාල මට ලියුමක් ගැහුවා, මම අද ඉඳන් සේවයෙන් ඉවත් කරලා කියලා. ඒ letter එකේ තිබුණු heading එක තමයි, "Irresponsible Behaviour of Dr. Ramanathan Archchuna" කියන එක. මම මුකුත් වරදක් කරලා නැහැ; මම කිසි වරදක් කළේ නැහැ. හැබැයි, මම දවස් 19කට හිරේ ගියා. මම හිරෙන් එළියට ඇවිල්ලා nomination භාර දුන්නා. එතකොට මම interdict වෙලා ඉවරයි. අපේ Director අර්ජුන තිලකරත්න සර්ට මම 09වෙනි දා කථා කරලා ඇහුවා, "සර්, මම තවම service එකේ ඉන්නවාද?" කියලා. සර් කිව්වා, "ඔයාව interdict කරලා ඉවරයි" කියලා. මම nomination භාර දීලා, Parliament එකට ඇවිල්ලා, මාසයකට පස්සේ එක්කෙනෙක් Court of Appealහි නඩුවක් දැම්මා, මම ඩොක්ටර් වෙලා හිටපු කාලයේ nomination දුන්නා, ඒක වැරදියි, මාව interdict කරන්න කියලා. හැබැයි, මෙතැන තමයි ප්‍රශ්නය තිබෙන්නේ. මම interdict වෙලා ඉන්නකොට කොහොමද ඉවත් වෙන්නේ? ලියුම ලියලා තිබෙනවා, සිංහලෙන්. ඒ ලියුමේ තිබෙන්නේ ඔයා අද ඉඳන් සේවයෙන් ඉවත් කරලා කියලා. කවුරු හෝ සේවයෙන් ඉවත් කරපු කෙනෙක් කොහොමද resign වෙන්නේ? Resign වෙන්න බැහැ. ඒ නඩුව පවත්වන්නේ 26වෙනි දා සහ 29වෙනි දා. අපේ පාර්ලිමේන්තුවේ ඉන්න 159දෙනාට තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි, මෙතැනට කවුරු හෝ ඇවිල්ලා ඇත්ත කියන එක.

බලන්න, අපේ පඩිය රුපියල් 385,000යි; ඒකෙන් රුපියල් 200,000ක් යනවා, මට මෙහේ ඉඳන් Jaffna වෙනකම් යන්න. තව රුපියල් 100,000ක් යනවා, අපේ office එක පවත්වාගෙන යන්න. දැන් මෙතැන NPP එකේ 159දෙනෙක් ඉන්නවා. හිතලා බලන්නකෝ, NPP එකේ 159දෙනාට office එකක් තිබෙනවාද කියලා. එහෙම නැත්නම් අපේ කට්ටිය කවුරු හරි office එකක් දාලා, මිනිස්සු හම්බ වෙලා, ඒ මිනිස්සුන්ගේ ප්‍රශ්න අහලා, මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඒවා ගැන කථා කරනවාද? නැහැ. ඒ අනුව අපි සම්පූර්ණ වංචාවක් කරනවා.

තව කාරණයක් මම කියන්නම්. අනුරාධපුරයට මම ගියා, නඩුවකට. ඒක මට දාපු නඩුවක්. ඒ කියන්නේ, රතු පාට signal light එක තිබියදී වාහනය දැම්මා කියලා නඩුවක් විතරයි. ඒ නඩුවෙන් මට ගෙනැත් දුන්නා,- පාර්ලිමේන්තුවේ දැන් එතුමා නැහැ. ඔක්කෝම ආසන හිස්. එතුමාගේ නම කියන්නත් මම කැමැති නැහැ. මෙතැන ලොකු කථාවක් කියපු මන්ත්‍රී කෙනෙකුගේ ලේකම්ගේ නමට ලියලා තිබෙනවා, රුපියල් ලක්ෂ 500ක ගෙයක්. අනුරාධපුර නගරය මැදින් කාට හෝ රුපියල් ලක්ෂ 50ට ගෙයක් ගන්න පුළුවන්ද? අද අපි පනත් දෙකක් යටතේ නියෝගය සහ රෙගුලාසි ගැන විවාද කරනවා. ඉන් එකක් තමයි, මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය. හැබැයි, ජරා වැඩක් කරලා තිබෙන්නේ NPP එකේ ලොක්කා. ඒක අත්සන් කරලා තිබෙන්නේ, ඒගොල්ලන්ගේ ලේකම්. මම ඒ ඔප්පුවත් මේ පාර්ලිමේන්තුවට ගෙනැත් දුන්නා. රුපියල් ලක්ෂ 500ක් වටිනා ගෙයක් රුපියල් ලක්ෂ 50කට ලියලා ඉවර වෙලා මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය ගේනවා. මේවා ගැන ලජ්ජා වෙන්න ඕනෑ. මම නම් කවදාවත් politics කරලා නැහැ. හැබැයි, මම නම් මේ පාර්ලිමේන්තුවේ politics කරනවා කියන්නේ, ඔය වාගේ මිනිස්සුන්ට ජම්පරය අන්දලා නොවෙයි, ගලවලා යවනවා. බලන්න, ඔයගොල්ලන් අද වෙනකම් කරලා තිබෙන්නේ ජරා වැඩ. Jaffna Teaching Hospital එකට අපි රුපියල් මිලියන ගාණක් යැව්වා. නමුත් අපි අහනවා, කෝ ඒ යවපු සල්ලි කියලා. නලින්ද ජයතිස්ස ඇමතිතුමා ගිහිල්ලා, හිටපු Director එක්ක ඩීල් එකක් දානවා. අපට මේක ඔප්පු කරන්න පුළුවන්, එළියේ නඩුවක් දමා ගන්න.

තව දෙයක් මම කියන්න ඕනෑ. අපේ සභානායකතුමාට මම ලියුමක් ලියලා දුන්නා, කන්ටේනර් 323 ගැන මම පාර්ලිමේන්තුව තුළ කරපු කථාව සම්බන්ධයෙන්. කන්ටේනර් 323ක් ගෙනාපු එක ගැන පාර්ලිමේන්තුව තුළ කරපු කථාවට අදාළව මාව CID එකට ගෙන්වා ගත්තා. ඒ අනුව මමත් CID එකට ගියා. සාමාන්‍යයෙන් දෙමළ මිනිහෙක් CID එකට යන්නේ භය වෙලා. ඒ කාලයේ අපේ මිනිසුන්ව කැලි-කැලිවලට කපලා, වෙඩි තියලා, ඇස් දෙක එළියට ගන්නවා වාගේ දේවල් නේ කළේ. හැබැයි, CID එකේ තිබුණු සම්පූර්ණ තත්ත්වය දැන් මේගොල්ලන් මාරු කරලා. එතැනට යනකොට මට හිනාත් ගියා. එතුමන්ලා මට කිව්වා, අනේ! ඩොක්ටර් ඒක ගැන සම්බන්ධ මොකක් හරි document එකක් තිබෙනවා නම් දෙන්න කියලා. මම කිව්වා, මම මේක දෙන්නේ නැහැ, ඕනෑ නම් පාර්ලිමේන්තුවෙන් අහන්න, මම පාර්ලිමේන්තුවේදී තමයි ඒක දෙන්නේ කියලා. ඊට පස්සේ මන්ත්‍රීතුමන්ලා දෙන්නෙක් ඇවිල්ලා මට කිව්වා, ඔයාට guts තිබෙනවා නම් ඒ ගැන එළියේ කථා කරන්න කියලා. මට මේවා තේරෙන්නේ නැහැ. 159ක් නොවෙයි, ලක්ෂ 225ක් ආවත් මම කියන්න ඕනෑ දේ කියලා තමයි ඉවර කරන්නේ. කන්ටේනර් 323 ගැන මම කියලා ඉවර කරන්න ඕනෑ. මේ වාගේ කන්ටේනර් 323ක් මම release කළා නම් මම අද හිරේ. ඒකට එක හේතුවක් තමයි, මම දෙමළ කෙනෙක් වීම. අනික් හේතුව තමයි, මම ඇත්ත කියන එක. හැබැයි, ඔය බිමල් රත්නායක මහත්තයා දැන් එළියේ හිනා වෙලා ඉන්නවා. දැන් ආණ්ඩු මාරු වෙනවා. මේගොල්ලන් අනික් පැත්තට ගිහිල්ලා, අරගොල්ලන් මේ පැත්තට එනකොට ඔය කන්ටේනර් 323 ගැන හොයා ගන්නවා.

මම කාලයක් හිතාගෙන හිටියා, මගේ තාත්තා මරපු

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

දවසක මරන්න ඕනෑ කියලා. මම එහෙම හිතපු මිනිහෙක්. අද මම නාමල් රාජපක්ෂ ළඟට ගිහිල්ලා ලස්සනට කථා කළා, 'මචං' කියලා. ඒ වෛරය අපේ පපුවේ තිබුණා. මම ඇත්ත කියන්නම්.

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා]

1986 මම ඉපදුණේ. පොඩි කාලයේදී මට කිව්වා, සිංහල මිනිස්සු කියන්නේ යකා වාගේ අය, අනෙක් මිනිස්සුන්ගේ බඩ මෙහෙම කරලා,- *[බාධා කිරීමක්]* කන මිනිස්සු කියලා. එතකොට අපට සිංහල තේරෙන්නේත් නැහැ; සිංහල කථා කරන්නේත් නැහැ; එක සිංහල මිනිහෙක් දැකලාවත් නැහැ. අපි හිතාගෙන හිටියේ සිංහල මිනිස්සු කියන්නේ වැරදි කරන මිනිස්සු කියලා. ඒ වාගේ, ඔයගොල්ලන්ට අපි ගැන මොනවාද වැරදි කියලා තිබුණේ? කොටි කියන්නේ ඇවිල්ලා බෝම්බ පුපුරවන අය, ඒ නිසා දෙමළ මිනිස්සු ඔක්කොම කොටි කියලා කිව්වා. දැන් අපි සම්පූර්ණයෙන් වෙනස් කරලා තිබෙන්නේ. මම කියන්නේ මේකයි. මගේ තාත්තා නැති වුණා, මේ යුද්ධයෙන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට ලැබී ඇති කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මට විනාඩි 20ක් දෙන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විනාඩි 20ක් දෙන්න බැහැ.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
නැහැ, නැහැ, තත්පර 20ක් මට දෙන්න.

1960දී පොලීසියට බැඳිලා, පොලීසියේ football team එකේ captain විධියට හිටපු මගේ තාත්තා 1983 කළු ජූලිය නිසා Jaffna ආවා. ඊට පස්සේ පොලීසියෙන් සම්පූර්ණයෙන්ම ඉවත් වෙලා කොටි සංවිධානය හදනකොට අපේ තාත්තා ගිහිල්ලා ඒකට join වුණා. අපිට කන්න, බොන්න මුකුත් තිබුණේ නැහැ. අපි කොහේද යන්නේ? තාත්තාට පුළුවන්, පොලීසියේ වැඩ විතරයි. ඒ නිසා එතැන පොලීසියේ පඩියකට ගියා, වැඩ කළා. ඒකට, දැන් මේගොල්ලන් කියන්නේ තවත් ඒ විධියට අපේ රට හදන්න ඕනෑ කියායි. මම නම් කියන්නේ, ඉගෙන ගත්ත කිසිම පුද්ගලයෙකුට මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා ජීවත් වෙන්න බැහැ කියන එකයි. චන්ද්‍රසේකරන් වාගේ A/Lවත් නැති කෙනෙකුට තමයි මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා ජීවත් වෙන්න පුළුවන්. හේතුව, ඇත්ත කිව්වොත් මේ පාර්ලිමේන්තුවේ ඉන්න බැහැ. බොහොම ස්තුතියි.

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ வைத்தியர் அர்ச்சுனா அவர்கள் தனது உரையிலே, நான் தேர்தல் பிரசாரத்தின்போது பட்டதாரிகளைச் சந்தித்து, அவர்களுக்குப் பொய்யான வாக்குறுதிகளைக் கொடுத்து விட்டு இப்போது ஏமாற்றியதாகக் கூறியிருந்தார். தேசிய மக்கள் சக்தி அரசாங்கம் யாரையும் ஏமாற்றுவதில்லை. உண்மையில் நாங்கள் அவர்களைச் சந்தித்தோம். அப்போது, நாட்டினுடைய நிலைமையை எடுத்துக்கூறி, பட்டதாரிகளுடைய வேலைவாய்ப்பைப் பற்றியும் தெளிவாகக் கூறியிருந்தோமே தவிர, அவர்களை ஏமாற்றி வாக்குகளைப் பெறவில்லை. இந்தச் சபையிலே இவ்வாறான கருத்துகளை முன்வைப்பதனூடாக அவர்களை எங்களுக்கு எதிராகத் திசை திருப்புகின்ற செயற்பாட்டை நான் அவதானித்தேன். ஆகவே, அவர் கூறிய கருத்தை நான் முற்றாக நிராகரிக்கின்றேன். நன்றி.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රොෂාන් අක්මීමන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.21]

ගරු රොෂාන් අක්මීමන මහතා
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සුවිශේෂී දිනයක්. විශේෂයෙන්ම ශිෂ්‍ය ව්‍යාපාරය ඔස්සේ දේශපාලන කටයුතු ආරම්භ කරලා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් දක්වා ආපු අපේ ආණ්ඩු පක්ෂයේ බොහෝ පිරිසක් අද මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. අද ජාතික ශිෂ්‍ය වීර දිනය. ඉතිහාසයේ යම් උදාර අරමුණක් වෙනුවෙන් තමන්ගේ ජීවිතය පරිත්‍යාග කරලා, ඒ වෙනුවෙන් සටන් කරලා, ඔවුන් ඒ ඉතිහාසයේ සපයපු ආලෝකය, ඒ අනුප්‍රාණය ඔස්සේ තමයි අපි අපේ දේශපාලන ගමන ආරම්භ කළේ. අදටත් ඒ අරමුණ ඔසවාගෙන යන දේශපාලන ව්‍යාපාරයක් විධියට මේ සුවිශේෂී දිනයේදී පාර්ලිමේන්තුවේදී ශිෂ්‍ය වීර දිනය මතක් කරන්නට ලැබීම ගැන මම සතුටු වෙනවා.

නියෝගයක් සහ රෙගුලාසි කිහිපයක් පිළිබඳ විවාද කරන අද දිනයේ අපේ මුදල් නියෝජ්‍ය ඇමතිතුමා උදේ විශේෂ ප්‍රකාශයක් කළා. මේ දිනවල විශේෂ කථාබහට ලක් වෙන, යම් ආකාරයකට විපක්ෂය අපට චෝදනා කරන පළාත් පාලන ආයතනවල බලය පිහිටුවීම සම්බන්ධ කාරණාවේදී අපට එල්ල වන චෝදනාවලට පිළිතුරු විධියට කාරණා කිහිපයක් මම මතක් කරන්න කැමැතියි. එකක්, මෙවර පළාත් පාලන මැතිවරණයේ ප්‍රතිඵලය අපේ විපක්ෂය තවමත් හරිහැටි තේරුම් අරගෙන නැති බවක් තමයි පේන්නේ. විපක්ෂයට මතක් කරන්නට ඕනෑ පැවති මැතිවරණයේදී පළාත් පාලන ආයතන 339කින් 266ක් අපි ජයග්‍රහණය කළ බව. ඒ විතරක් නොවෙයි, කොට්ඨාස විධියට ගත්තොත් කොට්ඨාස පන්දහස් ගණනකින් හාරදහසකට ආසන්න ප්‍රමාණයක් අපි ජයග්‍රහණය කර තිබෙනවා. ඒ කියන්නේ සියයට 74ක පමණ ප්‍රමාණයක් අපි ජයග්‍රහණය කර තිබෙනවා. ඒ මැතිවරණ ප්‍රතිඵලය දෙස අපි බලන්නේ, අපි ඒ මැතිවරණ ප්‍රතිඵලය කියවා ගන්නේ ජනතාව මැතිවරණයේදී ඡන්දය භාවිත කිරීමෙන් අපේක්ෂා කරන්න අත්තේ කුමක්ද, ජනතාව බලාපොරොත්තු වෙන්න ඇත්තේ කුමක්ද කියන එක ඔස්සේයි. අපි ජයග්‍රහණය කළ සභාවලින් සභා 151ක අපට ඉතාම පහසුවෙන් බලය පිහිටුවන්න පුළුවන්කම තිබුණා. තවත් සභා 115ක් තිබුණා අපට තනි පක්ෂයක් ලෙස බලය පිහිටුවන්න බැරි. ඒ තැන්වල අපට එක මන්ත්‍රී ධුරයක් හෝ දෙකක් තමයි බොහෝවිට අඩු වුණේ, ඒ මැතිවරණ ක්‍රමයේ තිබෙන ස්වභාවය අනුව. අපි ඒ වාගේ තැන්වල වෙනත් පක්ෂවල, ස්වාධීන කණ්ඩායම්වල යම් තනි මන්ත්‍රීවරුන්ගේ සහාය අරගෙන බලය

පිහිටුවා තිබෙනවා. ඒක රහසක් නොවෙයි. හැබැයි ඒක හුවා දක්වන්න හදනවා, ඒක ඩීල් දේශපාලනයක්, ඒක දූෂිත දේශපාලනයක්, ඒක අපි ප්‍රතික්ෂේප කළ දේශපාලන සංස්කෘතිය කියලා. අපට තනිවම බලය පිහිටුවන්න බැරි වුණු ඇතැම් සභාවල වෙනත් පක්ෂවල හෝ ස්වාධීන කණ්ඩායම්වල යම් යම් මන්ත්‍රීවරුන්ගේ සහයෝගය අපට ලැබුණේ අපේ පක්ෂයේ ඉහළින් හරි, ඒ පක්ෂවල නායකයන් එක්ක හරි ඇති කර ගත්ත ගනුදෙනුවක්, ඩීල් එකක් නිසා නොවෙයි. ඒ ඒ පක්ෂවල මන්ත්‍රීවරුන්ට ඒ ඒ පක්ෂවල ඉහළ නායකත්වය විසින්ම ඩීල් දේශපාලනය යෝජනා කළ නිසා ඒ අයට ඇති වුණු කලකිරීම නිසායි අපට ඒ සහයෝගය ලැබුණේ කියන එක මම මතක් කරන්න කැමැතියි.

මම උදාහරණ කිහිපයක් කියන්නම්. එකක්, මගේ දිස්ත්‍රික්කයේ කන්තලේ ප්‍රාදේශීය සභාවේ ප්‍රතිඵලය. ජාතික ජන බලවේගය එහි මන්ත්‍රී ධුර 10ක් දිනා ගන්නවා, සමගි ජන බලවේගය මන්ත්‍රී ධුර 6යි දිනා ගන්නේ; කන්තලේ ප්‍රාදේශීය සභාවේ එක කොට්ඨාසයයි ජයග්‍රහණය කරන්නේ සමගි ජන බලවේගය. ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරනවා නම්, ඩීල් දේශපාලනය එපා කියනවා නම් සමගි ජන බලවේගයට කන්තලේදී මොකක්ද කළ යුතුව තිබුණේ? ජනතාවගේ ප්‍රතිඵලය පිළිගෙන, ජනතාව ලබා දීපු සංඥාව පිළිගෙන ජාතික ජන බලවේගයට බලය පිහිටුවන්න ඉඩ දෙන්න තිබුණා. හැබැයි ඒ වෙනුවට සමගි ජන බලවේගය කන්තලේ කළේ මොකක්ද? විපක්ෂයේ කණ්ඩායම් එකතු කර ගන්න උත්සාහ කරනවා, ඒ අයට යම් යම් යෝජනා ඉදිරිපත් කරනවා. ජනතාවගේ ප්‍රතිඵලය, ජනතාවගේ සංඥාව සම්පූර්ණයෙන් යට කරන්න උත්සාහ කළා. එවැනි අවස්ථාවක ජනතාවගෙන් ඉහළ ප්‍රතිඵලයක් ලැබුණු, ජනතාවගේ ඡන්දය ලැබුණු, මන්ත්‍රී ධුර 10ක් ලැබුණු, කොට්ඨාස සියයට 90ක්ම ජයග්‍රහණය කළ දේශපාලන ව්‍යාපාරයක් විධියට අපි අත්දෙක බැඳගෙන බලාගෙන ඉන්නද? ඒක ප්‍රජාතන්ත්‍රවාදය නොවෙයි, ඒක නිවටකම. එවැනි අවස්ථාවල අපි ජනතාව අපේක්ෂා කරන ප්‍රතිඵලය ලබා දෙන්න යම් යම් මන්ත්‍රීවරුන්ට පෞද්ගලිකව, - පක්ෂ වශයෙන් නොවෙයි- ඒත්තු ගන්වලා සහයෝගය ලබා ගත්තා. අනෙක් පැත්තෙන්, ඒ බොහොමයක් මන්ත්‍රීවරු නවක මන්ත්‍රීවරු; පළමු වතාවට ප්‍රාදේශීය සභාවට ආව මන්ත්‍රීවරු. ඔවුන්ටත් ලොකු වුවමනාවක් තිබෙනවා ජනතා ප්‍රසාදය ලැබිලා තිබෙන මේ ආණ්ඩුව අරගෙන යන සංවර්ධන ක්‍රියාවලියට, මේ ආණ්ඩුවත් එක්ක එකට වැඩ කරලා, ආණ්ඩුවට ලැබිලා තිබෙන ඒ ප්‍රසාදය තමන්ටත් දිනා ගන්න. ඒ පදනමින් තමයි අපි යම් යම් ප්‍රාදේශීය සභාවල, යම් යම් පළාත් පාලන ආයතනවල බලය පිහිටුවන්න වෙනත් පක්ෂවල යම් යම් මන්ත්‍රීවරුන්ගේ සහයෝගය අරගෙන තිබෙන්නේ. ඒකත් අවම වශයෙන්. අපට එකක් මදි වෙන තැන්වල බොහෝවිට අපි එක ආසනයයි ලබා ගන්න උත්සාහ කරන්නේ, අපට දෙකක් මදි වෙන තැන්වල අපි අවම සහයෝගයක් ලබා ගන්න පමණයි උත්සාහ කරන්නේ. එහෙම නැතිව මෙතුමන්ලා වාගේ කටයුතු කළේ නැහැ. පක්ෂ නායකයෝ රැස් වෙලා, සජිත්-නාමල් ඩීල් ගහලා, පක්ෂයේ පල්ලෙහාට පණිවුඩය යවනවා අන්න අර සභාවේ පොහොට්ටුවේ සභාපතිට ඡන්දය දෙන්න, අර සභාවේ සමගි ජන බලවේගයේ සභාපතිට ඡන්දය දෙන්න කියලා. ඒක කළේ නැත්නම් පක්ෂ සාමාජිකත්වය අහෝසි කරනවා. ඒක ප්‍රජාතන්ත්‍රවාදය ද? සජබයේ දඹුල්ලේ මන්ත්‍රීවරු හයදෙනෙකුගේ පක්ෂ සාමාජිකත්වය අහෝසි කළා. ඇයි? සජිත් ඕඩර් එක යැව්වා, පොහොට්ටුවේ සභාපතිට ඡන්දය දෙන්න කියලා. ඒ මන්ත්‍රීවරු ඒවා පිළිගත්තේ නැහැ. අන්න ඒවා තමයි ඩීල් කියන්නේ. ස්වාධීනව ඒ මන්ත්‍රීවරුන්ට යම් අවස්ථාවක් තිබෙනවා, තමන්ගේ බලප්‍රදේශයේ තමන්ට ඡන්දය දීපු ජනතාවට වඩාත්ම හොඳ මොකක්ද කියලා තීරණය අරගෙන කටයුතු කරන්න. අන්න, ඒ අනුව ඔවුන් කටයුතු කර තිබෙනවා. මම වැඩි වෙලා කාලය නාස්ති කරන්නේ නැහැ. අපේ මන්ත්‍රීවරු බොහෝ දෙනෙක් ඒ චෝදනාවලට හරි පිළිතුරු ලබා දුන්නා.

ඊළඟට, මම තවත් කාරණයක් මතු කරන්න කැමැතියි. සමහර අය මේක සදාචාරාත්මක ප්‍රශ්නයක් ලෙස කථා කරනවා. අපෙන් අහනවා, කොහොම කොහොම හරි ප්‍රාදේශීය සභාවල, පළාත් පාලන ආයතනවල බලය ලබාගත්තා තමයි, හැබැයි සදාචාරය එතැනින් බිඳෙනවා නේද කියලා. සදාචාරය කියලා වියුක්ත සංකල්පයක් ගැන අපි විශ්වාස කරන්නේ නැහැ. සදාචාරය කියලා වෙනම එකක් තිබෙනවා කියලා අපි පිළිගන්නේ නැහැ. අපේ සදාචාරය අපි නිර්වචනය කර ගන්නේ, අපේ cause එකත් එක්ක, අපේ අරමුණත් එක්ක, අපි බලාපොරොත්තුවන ප්‍රතිඵලය මොකක්ද කියන එකත් එක්ක. අපි දේශපාලනය කරන්නේ, අපි වැඩ කරන්නේ මේ රටේ ජනතාවගේ බලයක් පිහිටුවීම වෙනුවෙන්; කාලයක් තිස්සේ මේ රටේ පාලන බලය හෙබවූ පාලක පන්තිය පරාජය කරලා, මහජනතා ව්‍යාපාරයක් මේ රටේ බලය හොබවන්න ඕනෑය කියන අරමුණ වෙනුවෙන්. අන්න ඒ අරමුණ සාර්ථක කර ගන්න, ඒ බලය තහවුරු කර ගන්න, පරාජිත පාලක පන්තියේ අවසාන නෂ්ටාවශේෂත් බිමට සමතලා කර දමන්න අවශ්‍ය ප්‍රජාතන්ත්‍රවාදී උපකරණ සියල්ලම අපි භාවිත කරනවා. අන්න, එතැන තමයි අපේ සදාචාරය තිබෙන්නේ. එහෙම නැතුව, සදාචාරය කියලා කොහෙදෝ එකක් තිබෙනවා, එවැනි වියුක්ත සංකල්පයක් තිබෙනවා, ඒක අරගෙන වැඩ කරනවා කියන එක නොවෙයි.

ඒ සාකච්ඡාව එතැනින් අවසන් කරමින් මම යම් පිළිතුරක් දෙන්න කැමැතියි මෙන්න මේ කාරණයට. පසුගිය කාලයේ විපක්ෂයේ ජනප්‍රිය වෙලා හිටියා ආර්ථික විශේෂඥයෙක්, ආර්ථික දැනුමක් තිබෙන පුද්ගලයෙක්. දත්ත බලලා, facts බලලා කථා කරන, ආර්ථික විශේෂඥයෙක් විධියට ජනප්‍රිය වෙලා හිටපු කෙනෙක් තමයි, හර්ෂ ද සිල්වා කියන කෙනා. එතුමාට පසුගිය කාලයේ රනිල් වික්‍රමසිංහ ආණ්ඩු කරන කොට දත්ත බලලා විශ්ලේෂණය කරලා කථා කරන්න පුළුවන්කමක් තිබුණා. හැබැයි, දැන් එතුමාට එක පාරටම ආර්ථික විද්‍යාව අමතක වෙලා. දත්ත බලන්න අමතක වෙලා. එතුමා එකපාර ඇවිල්ලා කියනවා, "මෙන්න මේ කාර්තුවේ ආර්ථිකය වර්ධනය වෙලා නැහැ, වෙලා මදි, ඔයිට වඩා කලින් වුණා, රස්සා බිහිවෙලා නැහැ, ආයෝජන ඇවිල්ලා නැහැ කියලා. මම දන්නේ නැහැ, කොහොමද එහෙම කියන්නේ කියලා. ආර්ථිකයක් ගැන අපි කරුණු කථා කරන්නේ, විශ්ලේෂණය කරන්නේ එහි දත්ත බලලා, facts බලලා. හැබැයි, හර්ෂ ද සිල්වාට එකපාර ආර්ථික විද්‍යාව අමතක වෙලා. නිකම් ඔහේ කථා කරනවා. මෙතැන වැලපෙනවා. කෝ, රැකියා බිහිවෙන්නේ නැහැ ලු, ආයෝජන එන්නේ නැහැ ලු, ආර්ථික වර්ධනය අපේක්ෂා වෙන තරම් වෙන්නේ නැහැ ලු.

පසුගිය දිනවල අපි දක්කා, ඊශ්‍රායලයෙන් ඉරානයට ගහනකොට මෙතැන කට්ටියක් අඬන්න හදනවා. ඇයි? එයාලාට දැන් හීනෙන් තෙල් පෝලිම් පේනවා; තේ අපනයනය අඩුවෙයි කියලා හිතනවා. ඒකට සතුටු වෙනවා. මෙතැන කෑ ගහලා අඬන්න හැදුවා, විවාද ඉල්ලලා. එතකොට රටේ යම් ආතතියක් ඇති වෙන්න පුළුවන් නේ. යුද්ධය නිසා තෙල් පෝලිම් එන්න පුළුවන්. එහේ ගහ ගන්නවා, මෙහේ තෙල් පෝලිම් එන්න පුළුවන්, තෙල් මිල වැඩි වෙන්න පුළුවන්, අපේ තේ මිලදී ගන්නේ නැති වෙන්න පුළුවන්, නැවත ආර්ථික අර්බුද ඇති වෙන්න පුළුවන් කියලා භීතියක් ඇති කරන්න, තැති ගැන්මක් ඇති කරන්න මේ පාර්ලිමේන්තුව පාවිච්චි කරන්න උත්සාහ කළා. විවාදයක් ඉල්ලලා අන්තිමට විවාදය ඉල්ලපු අයත් නැහැ. අන්න, ඔවුන් තුළ ජනතාවට තිබෙන ආදරය.

හර්ෂ ද සිල්වා මෙතැනට ඇවිල්ලා නහයෙන් අඬපු නිසා මම හර්ෂ ද සිල්වාට මතක් කරන්න කැමැතියි, මේ අවුරුද්දේ පළමුවැනි කාර්තුවේ ආර්ථික දත්ත. ජනවාරි මාසයේ සිට අප්‍රේල් මාසය වනතුරු අඛණ්ඩව ජංගම ගිණුමේ අතිරික්තයක්

[ගරු රොෂාන් අක්මීමන මහතා]

තිබෙන්නේ. අපේ රටේ විදේශ ගෙවීම්වලට වඩා විදේශ ලැබීම් වැඩියි. පළමු වතාවට, අඛණ්ඩව මාස හතරක් අතිරික්තයක් තිබෙනවා, ජංගම ගිණුමේ. පළමුවන කාර්තුවේ සංචාරක පැමිණීම සියයට 19කින් වැඩි වෙලා. සංචාරක ආදායම සියයට 10කින් වැඩි වෙලා. හර්ෂ ද සිල්වාට මේවා පෙනිලා නැහැ. විශ්ලේෂණය කරනවා ලු. නමුත්, දත්ත බලන්නේ නැහැ. විදේශ ශ්‍රමිකයන්ගෙන් ලංකාවට එන ප්‍රේෂණ පළමු කාර්තුවේ සියයට 18කින් වැඩි වෙලා. අපෙන් ඇහුවා, ආණ්ඩු බලයට ආවාට පස්සේ විදේශවල ඉන්න අය සල්ලි එවනවා කිව්වා, ඒවා එව්වාද කියලා. මේ එවලා තිබෙන්නේ. එවන ප්‍රමාණය සියයට 18කින් වැඩි වෙලා. ඒ මිනිසුන්ගේ විශ්වාසය වැඩි වෙලා. පසුගිය කාලයේ ආණ්ඩු ගැන විශ්වාසය නැති නිසා, ඩොලරයේ අගයේ ස්ථාවරත්වයක් නැති නිසා මුදල් එවපු නැති අය දැන් මුදල් එවනවා. අන්න, විදේශ ශ්‍රමිකයන්ගේ විශ්වාසය වැඩිවෙලා. විපක්ෂයේ හිටපු එකම ආර්ථික ඔස්තාර්ටත් ආර්ථික විද්‍යාව අමතක වෙන තරමට ආර්ථිකය වර්ධනය වෙන්න පටන් අරගෙන. අපි පුදුම වෙන්නේ නැහැ ඒ අයට එය නොපෙනීම ගැන. රනිල් වික්‍රමසිංහගේ ආර්ථික විද්‍යාව ගැන විශ්වාසය තියාගෙන හිටපු අයට ජාතික ජන බලවේගයේ ආර්ථික විද්‍යාවක් ගැන පෙනෙන්නේ නැති එක ගැන අපට පුදුමයක් නැහැ.

ඒ වාගේම, Overnight Policy Rate එක තවදුරටත් පහළ ගිහින් දැනට සියයට 7.75ක් දක්වා අඩු වෙලා තිබෙනවා. පොලී අනුපාත අඩු වෙලා තිබෙනවා. අපේ ආර්ථිකය යම් ආකාරයකින් ස්ථාවරත්වයකට පත් වෙලා, යම් ආකාරයකින් දීර්ඝ කාලීන වර්ධනයකට අවශ්‍ය මූලාරම්භයකුත් දමා තිබෙන විට ඒක පිළිගන්න බැරි, ඒක දරා ගන්න බැරි පරාජිත දේශපාලන පක්ෂ ටික මෙන්න ආයෙත් වෙන වෙන කථා ඇදලා අරගෙන මේ මාතෘකාව යට ගහන්න හදනවා. නමුත්, අපි මේ රටේ ජනතාවට කියන්න කැමැතියි, ඔබ ජාතික ජන බලවේගයෙන් අපේක්ෂා කළේ මොනවාද, අන්න ඒ සියල්ල දැන් සිදු වෙන්න පටන් ගෙන තිබෙනවා කියලා. දැන් ආර්ථික වර්ධනය, දේශපාලන ස්ථාවරභාවය ඇති වෙමින් තිබෙනවා; දූෂිතයන්ට දඬුවම් කිරීම සිදු වෙමින් තිබෙනවා.

කෙහෙළිය රඹුක්වැල්ලගේ බාල ඖෂධ ගෙන්වීමේ කේස් එකට විශ්වාසභංග යෝජනාව ගෙනාවාම, මෙතැන ඉඳන් කෙහෙළියව ආරක්ෂා කරපු අයගෙන් නාමල් රාජපක්ෂ, චාමර සම්පත් දසනායක, රෝහිත අබේගුණවර්ධන, ඩී.වී. චානක කියන මන්ත්‍රීතුමන්ලා අදත් පාර්ලිමේන්තුවේ ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා මෙතුමන්ලා නැඟිටලා කථා කළා, කෙහෙළිය ආරක්ෂා කරන්න. "නැහැ, එහෙම වෙන්න බැහැ" කියලා එදා කිව්වා. නමුත්, අද ඒ වැරැදි ඔප්පු වෙලා තිබෙනවා. අද නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමන්ලා මාලිමාවේ දූෂිතයන් ගැන කථා කරනවා; මාලිමාව ජනතාවට ද්‍රෝහි වුණා කියලා කියනවා. නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමන්ලාට අපි දැන් කියනවා, කෙහෙළිය රඹුක්වැල්ල ආරක්ෂා කළාට ජනතාවගෙන් ප්‍රසිද්ධියේ සමාව ගන්න කියලා. ඩී.වී. චානක, චාමර සම්පත් දසනායක කියන මන්ත්‍රීතුමන්ලාත් ජනතාවගෙන් සමාව ගන්න ඕනෑ. අපි මේ රටේ ජනතාවට පැහැදිලි පණිවුඩයක් දීලා තිබෙනවා. ජනතාව අපෙන් අපේක්ෂා කළේ මොනවාද, ඒ සියල්ල දැන් සිදු වෙන්න පටන් ගෙනයි තිබෙන්නේ. අපට යම් කාලයක් ඕනෑ මේ වර්ධනය හමුවේ ඉදිරියට ගමන් කරන්න. සෑම රටක්ම ආර්ථික වර්ධන ක්‍රියාවලියේ යම් කාලයක් ගමන් කරන්න ඕනෑ, යම් ආකාරයක ඉහළ තත්ත්වයක් අත් කර ගන්න. ඒකට ඉවසීමෙන්, සංයමයෙන් මේ ප්‍රතිපත්ති රාමුව ක්‍රියාත්මක කරගෙන යමු. ඒවා දරා ගන්න බැරි විපක්ෂය අපට අදාළම නැහැ. බොහොම ස්තූතියි.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාට කියන්න තිබෙන්නේ?

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සභාවේ Quorum එක නැහැ. පොඩ්ඩක් බලන්නකෝ Quorum එක තිබෙනවාද කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ගරු සභාවේ වැඩ කටයුතු පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය කරන Quorum එක මේ අවස්ථාවේ තිබෙනවා. අපි සභාවේ කටයුතු ඉදිරියට කරගෙන යමු.

මීළඟට, ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.34]

ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஸ்டெபனி பர்னாந்து)
(The Hon. Stepni Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ වූ නියෝගය සහ ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ගෙනෙන රෙගුලාසි පිළිබඳව කථා කරමින් විපක්ෂය කිව්වේ බදු ගැසීම ගැනයි. රුපියල් 1,000කට රුපියල් 10ක් කියලා තිබුණු බද්ද රුපියල් 20ක් කරපු එක ගැන තමයි විපක්ෂය මේ කඳුළු හෙළන්නේ. අපි දන්නවා, මේ විපක්ෂය බලයේ සිටියදී අවුරුදු ගණනාවක් තිස්සේ බදු මුදල්වලට මොකක්ද කළේ කියලා; බදු මුදල් කොහොමද පාවිච්චි කළේ කියලා; බදු මුදල් කොහොමද විනාශ කෙරුවේ කියලා. ප්‍රාදේශීය සභාවේ ඉඳලා, පළාත් සභාවේ ඉඳලා, පාර්ලිමේන්තුව දක්වා හිටපු ඒ හැම කෙනෙක්ම බදු මුදල් විනාශ කෙරුවේ කොහොමද කියලා අපි දන්නවා. නමුත්, මේ ජාතික ජන බලවේගය ආණ්ඩුව බලයට පත් වුණාට පසුව අපේ රටේ බදු මුදල් පරෙස්සම් කරගෙන මේ රජය ඉදිරියට ගෙන යන්නේ කොහොමද කියලා කාටත් පෙනෙනවා. අද බදු මුදල් වැඩි කිරීම ගැන කථා කරන විපක්ෂය, තමන් බලයේ සිටියදී බදු මුදල් ආරක්ෂා කිරීම ගැන කවදාවත් හිතුවේ නැහැ. බදු මුදල් ආරක්ෂා කරන්නේ කොහොමද, බදු මුදල්වල ප්‍රතිලාභ හරියාකාරව ජනතාව අතර බෙදා දෙන්නේ කොහොමද කියලා මේ විපක්ෂයේ කවුරුවත් එදා බලයේ සිටියදී කථා කෙරුවේ නැහැ. මේ විපක්ෂය එදා බලයේ සිටියදී මේවා අත්හැර දාලා තිබුණේ. ඒ අය තමන්ගේ ජීවිත ගැන විතරයි හිතුවේ; ජනතාවගේ ජීවිත ගැන අබමල් රේණුවක තරම් දෙයක්වත් හිතුවේ නැහැ. ජනතාව දන්නවා ඒ අය සීනි බදු වංචාව ආදී හැම වංචාවක්ම කරලා තමුන්ගේ වටේ ඉන්න ව්‍යාපාරිකයන් ශක්තිමත් කෙරුවේ කොහොමද කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා, මේ බදු මුදල් ජනතාවට ප්‍රතිලාභ ලැබෙන පරිදි බෙදා හරින්නේ කොහොමද කියලා. ඒ හින්දා අපි විපක්ෂයට කියනවා, විපක්ෂය ආණ්ඩු කරපු කාලයේ කරන්න බැරිව ගිය සියලු දේවල් අපේ ජාතික ජන බලවේගය ආණ්ඩුව යටතේ ජනතාවට කරලා දෙන්න අපි වග බලා ගන්නා බව.

පනත් දෙකකට අදාළව නියෝගයක් සහ රෙගුලාසි ගැන කථා කරන මේ අවස්ථාවේ විපක්ෂය දිගින් දිගටම කථා කළේ, පළාත් පාලන ආයතනවල බලය පිහිටුවීම පිළිබඳවයි. අපි දන්නවා මීට ඉස්සර පළාත් පාලන ආයතනවලට පත් වුණු මන්ත්‍රීවරුන් බිලී බා ගත්තේ කොහොමද කියලා. කෝටි ගණන්වලටයි මන්ත්‍රීවරුන් ගත්තේ. හැබැයි, අපි මන්ත්‍රීවරුන් එක්ක කථා කරන්නේ එහෙම නොවෙයි. අපි දන්නවා මේ අලුතින් පත් වුණු මන්ත්‍රීවරුන් කවුද කියලා. අපේ ගම්වලත් ඉන්නවා අලුතින් පත් වුණු වෙනත් පක්ෂවල මන්ත්‍රීතුමන්ලා. එතුමන්ලා මන්ත්‍රීකම ලැබෙන්න ඉස්සෙල්ලා තමයි ඇවිත් අපත් එක්ක කථා කළේ, ඔය විපක්ෂයේ කණ්ඩායම්වල තත්ත්වය මොකක්ද කියලා. "අපි මේ පක්ෂයෙන් ඡන්දය ඉල්ලන්නේ අපට ඡන්දය ඉල්ලන්න ඕනෑ හින්දා. නමුත්, ජාතික ජන බලවේගය වැඩ කරන්නේ කොහොමද කියා අපි දන්නවා" කියලා ඒ මන්ත්‍රීවරු ඒ දවස්වලම අපට කිව්වා; ඔවුන් අපත් එක්ක සාකච්ඡා කළා. එසේ සාකච්ඡා කළේ, ජාතික ජන බලවේගය ගෙන යන වැඩ පිළිවෙළ ඉතා හොඳ වැඩ පිළිවෙළක් කියලා එතුමන්ලා දන්නා නිසා. විපක්ෂයේ හිටියාට තමන් ඉන්නේ කොතැනද කියලා ඒ අය අපත් එක්ක කියා තිබුණා.

අපි දන්නවා, මේ රටේ සියලු ජනතාව ජාතික ජන බලවේගය ආණ්ඩුවට ළං වෙලා මේ ආණ්ඩුව රට කරගෙන යන විදිය දිහා බලාගෙන ඉන්න බව. මේ ආණ්ඩුව කාටවත් වට්ටන්න පුළුවන් ආණ්ඩුවක් නොවෙයි. මේ ආණ්ඩුව ඉතාම ශක්තිමත් ආණ්ඩුවක්. මේ ආණ්ඩුව වට්ටන්න නම් ජාතික ජන බලවේගය ගෙන යන වැඩ පිළිවෙළට වඩා එහා ගිය වැඩ පිළිවෙළක් විපක්ෂය ගෙන එන්න ඕනෑ. විපක්ෂය ගෙනෙන විවේචන මොනවාද කියලා අපි දන්නවා. ඒ විවේචනවලින් කවදාවත් ජාතික ජන බලවේගය ආණ්ඩුව පරද්දන්නත් බැහැ; වට්ටන්නත් බැහැ. එම නිසා විපක්ෂයේ කෑ ගහන අයට මම නැවතත් කියනවා, මේ ආණ්ඩුව ජනතාවගේ ආණ්ඩුවක් බව; ජනතාවත් එක්ක බද්ධ වුණු ආණ්ඩුවක් බව; ජනතාවට ඇහුම්කන් දෙන ආණ්ඩුවක් බව; ජනතාවගේ ප්‍රශ්න විසඳන ආණ්ඩුවක් බව. මේ ආණ්ඩුව මුද්දර ගාස්තු වැඩි කිරීමේ නියෝගය ආදිය ගෙන ආවේ ජනතාවගේ ජීවිත නැති කරන්න නොවෙයි. ඒ ගාස්තු වැඩි කරන තීරණ අරගත්තේ ජනතාවගේ ජීවිත නඟා සිටුවන්නයි. ජනතාවගේ ජීවිත නඟා සිටුවන්නේ කොහොමද? ලැබෙන බදු මුදල්වල ප්‍රතිලාභ ජනතාව අතර හරියාකාරව බෙදා හැරීමෙන්.

අපි දන්නවා මීට ඉස්සර හිටපු ආණ්ඩු යටතේ පළාත් පාලන ආයතනවලින් මුදල් අරගත්තේ කොහොමද කියලා. වෙසක් උත්සව පවත්වන්න කියලා නිකම් මුදල් අරගෙන ගිහින් තිබෙනවා. හැබැයි, වෙසක් උත්සවය කියලා පාරේ ලයිට් එකක්වත් දාන්නේ නැතුව එම මුදල් සාක්කුවේ දාගත්තු පළාත් පාලන ආයතන සභාපතිවරු හිටියා. අපි ඒවා ගැන හොඳටම දන්නවා. නමුත්, ජාතික ජන බලවේගය ආණ්ඩුව එහෙම ආණ්ඩුවක් නොව, ජනතාවගේ බදු මුදල් ආරක්ෂා කරන, ජනතාවගේ බදු මුදල් නිසියාකාරව පාලනය කරන ආණ්ඩුවක්.

විපක්ෂය දැන් දිගින් දිගටම කියනවා, මේ ආණ්ඩුව බදු මුදල් අය කරනවා වැඩියි කියලා. මේ ආණ්ඩුව බදු මුදල් වැඩියෙන් අය කරනවා නොව, බදු මුදල් හරියාකාරව maintain කිරීමයි කරන්නේ. අවුරුදු 20කින් තමයි මේ සංශෝධන ගෙනැවිත් තිබෙන්නේ. අවුරුදු 20කින් සංශෝධනය කරපු නීතියක් ගැන තමයි අප අද මේ කථා කරන්නේ. අවුරුදු 20ක් තිස්සේ හිතුවේවත් නැති දේවල් ගැන මේ වෙද්දී ජාතික ජන බලවේගය කථා කරමින් යනවා.

විපක්ෂය දැන් කථා කරනවා අපි නිලධාරින්ට සලකන විදිය ගැන, අපි රජයේ සේවකයන්ට සලකන විදිය ගැන. කිසි විටෙකත් රජයේ සේවකයන් ගස්වල බඳින, එහෙම නැත්නම් රජයේ සේවකයන්ගෙන් බලහත්කාරයෙන් වැඩ ගන්නා ආණ්ඩුවක් නොවෙයි මෙය. රජයේ සේවකයන් සමඟ බොහොම සුහදශීලීව, හරි දේ හරි විදියට කරන රජයේ සේවකයාත් එක්ක අත්වැල් බැඳගෙන යන ආණ්ඩුවක් මෙය. එහෙම ආණ්ඩුවකට තමයි මේ විපක්ෂය විවේචන ඉදිරිපත් කරන්නේ. අපි ඒ අයට කියනවා, මේ ආණ්ඩුව මේ යන ගමන කාටවත්, කිසිසේත් නවත්වන්න බැරි බව. මේ ආණ්ඩුව යන ගමන දිගින් දිගටම යනවා. ඒ ගමන ගැන මහත් විශ්වාසය පළ කරමින් මම මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මංජුල සුගත් රත්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.41]

ගරු මංජුල සුගත් රත්නායක මහතා
(மாண்புமிகு மஞ்சுல சுகத் ரத்நாயக்க)
(The Hon. Manjula Sugath Rathnayaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පනත් දෙකකට අදාළ නියෝග සහ රෙගුලාසි පිළිබඳව තමයි අද විවාදය පැවැත්වෙන්නේ. ඒ තමයි, මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ ගෙනෙන නියෝගය සහ ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ගෙනෙන රෙගුලාසි. ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ගෙනෙන රෙගුලාසි මඟින් භාවිත කරන ලද රෙදි පිළි ගෙන්වීමට අවසර ලැබෙනවා. ඒ මඟින් සීතල ප්‍රදේශවල සිටින ව්‍යාපාරිකයන්ට ඔවුන්ගේ ආර්ථිකය සවිමත් කර ගන්න අවස්ථාව ලැබෙනවා වාගේම, පාරිභෝගිකයන්ට සීතලට අවශ්‍ය ඇඳුම් සපයා ගැනීමටත් පුළුවන් වෙනවා.

අනෙක් පැත්තෙන් ගත්තොත්, මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්තයට අවශ්‍ය අමතර කොටස් ගෙන්වීමටත් මේ මඟින් අවසර ලැබෙනවා. දැනටමත් රටට මෝටර් රථ ගෙන්වමින් තිබෙනවා. ඒ ගෙන්වන මෝටර් රථවලට අලුත් අමතර කොටස් අවශ්‍ය වෙනවා. ඒ වාගේම ලංකාවේ වාහන එකලස් කිරීමේ කර්මාන්තය වැඩිදියුණු වෙමින් පවතිනවා. දැන් ඊට අදාළ ව්‍යාපාරික සංවිධාන බිහිවෙලා තිබෙනවා. ඒ අමතර කොටස් ගෙන්වීමට අවස්ථාව ලැබීම තුළින් ඒ වෙළෙඳ පොළටත් සහයෝගය සහ ශක්තිය ලැබෙනවා.

තවත් පැත්තකින් ගත්තොත්, විද්‍යුත් යතුරු පැදි ගෙන්වීමටත් මේ මඟින් අවසර ලැබෙනවා. තාක්ෂණය දියුණු වීමත් එක්කම විද්‍යුත් යතුරු පැදි සඳහා කැමැත්තක් දක්වන පිරිස් ඉන්නවා. ඒ සඳහා කැමැත්තක් දක්වන ව්‍යාපාරිකයන් වාගේම පාරිභෝගිකයන් ඉන්නවා. ඒ ඇතුළේ වෙළෙඳ මධ්‍යස්ථාන හැදෙනවා. ඒ නිසා විද්‍යුත් යතුරු පැදි ගෙන ඒමට අවස්ථාව ලබා දීම ඒ අයට ශක්තියක් වෙනවා. ඒ එක්කම, සංචාරක ප්‍රවර්ධනය සඳහා ඉඩ සලසන ක්‍රීඩා උපකරණ ගෙන්වීම සඳහාත් මෙයින් අවසර ලැබෙනවා. ඒ හා බැඳුණු ව්‍යාපාරිකයන් පිරිසක් වාගේම පාරිභෝගිකයන් පිරිසකුත් ඉන්නවා. මේ මඟින් ඒ අයට ආරක්ෂාව ලැබෙනවා වාගේම, රටේ දියුණුවට ආදායමක් ලැබෙනවා. විශේෂයෙන්ම සංචාරක ව්‍යාපාරය වැඩිදියුණු වීම තුළින් රටට ආදායම එනවා. ඒ නිසා ආනයන හා අපනයන (පාලන) පනත ඉතාම වැදගත් කියලා මම මේ වෙලාවේ මතක් කරන්නට අවශ්‍යයි.

අනෙක් පනතට අනුව, මුද්දර ගාස්තු බද්ද රුපියල් 10කින් වැඩි කිරීම මඟින් ඒ ලැබෙන ආදායම පළාත් පාලන ආයතනවලට

[ගරු මංජුල සුගත් රත්නායක මහතා]

යනවා. පළාත් පාලන ආයතන යටතේ සිදු වන සංවර්ධන කටයුතු සඳහා එය සහයෝගයක් වෙනවා. කලින් තිබුණු පළාත් පාලන ආයතන පැවතුණේ මොන විධියටද? සමහර ඒවා කොන්ත්‍රාත් සභා විධියට තිබුණේ. තවත් සමහර ඒවා කොමිස් සභා විධියට තිබුණේ. හැබැයි, දැන් ඒවා සැබෑ පළාත් පාලන ආයතන විධියට ජාතික ජන බලවේග ආණ්ඩුව යටතේ ස්ථාවර වෙලා තිබෙනවා.

බදු ගැන කථා කරනකොට, විපක්ෂයෙන් බදු සම්බන්ධ දෝෂාරෝපණ එනවා. හැබැයි, ඒගොල්ලෝ මොකද කළේ? ජනතාවගේ පහසුකම් වෙනුවෙන් වැය කරන්න තිබෙන බදු මුදල් ඒගොල්ලන්ගේ සුඛ විහරණය තකා තමයි පාවිච්චි කළේ. අනික් කාරණය තමයි, දැන් විවිධ කථා කියන අය විශාල වශයෙන් බදු පැහැර හැරීම් සිදු කළා. එම නිසා ජනතාවට දෙන සහන අඩු වුණා. මුළු රටම ආර්ථිකමය වශයෙන් කඩා දැම්මා. ඒ ආණ්ඩු කරපු නායකයෝ අධිකරණයෙන් පවා වැරදිකරුවන් බවට පත් කළා. ආර්ථිකය විතරක් නොවෙයි, දේශපාලනමය, සංස්කෘතිකමය වශයෙනුත් මේ රට කඩා පාත් කළා, බිමටම සමතලා කළා. ජාතිවාදය අවුස්සමින්, ජාතීන් අතර අසමගිය ඇති කරමින්, ආගම්වාදය ඇති කරමින් ජනතාව බෙදීමට ලක් කළා. බෙදලා බෙදලා, අවසාන වශයෙන් ලේවලිනුත් බෙදුවා. සිංහල ලේ, දෙමළ ලේ, මුස්ලිම් ලේ වශයෙන් ලේ වර්ගවලිනුත් බෙදුවා, මේ පාලකයෝ. හැබැයි, එහෙම ලේ වර්ග මේ ලෝකයේ කොහේවත් නැහැ. ඒක අපි මතක තියාගන්න ඕනෑ. විද්‍යාත්මකව ලෝකයේ ප්‍රධාන වශයෙන් තිබෙන්නේ ලේ වර්ග 4යි, A, B, AB සහ O විධියට. නමුත්, ජනතාව අතර, ස්වාමීන් වහන්සේලා අතර, කලාකරුවන් අතර, ආචාර්ය මහාචාර්යවරු අතර භේදභින්න ඇති කළා මේ එක් එක් ජාතිවාද, ආගම්වාද උලුප්පලා. ඒ නිසා එහෙම අයට අපි මේ කරුණු කියන්න කැමැතියි.

පසුගිය කාලයේ දිගාමඩුල්ලේ අපි පොසොන් උත්සවය කළා ඉතාම හොඳට. රාජ්‍ය සේවකයන්, ත්‍රිවිධ හමුදාව, පොලීසිය, ව්‍යාපාරිකයන් ඇතුළු අපි සියලුදෙනාම එකතු වෙලා සාමූහිකව උත්සවශ්‍රීයෙන් ඉතාම හොඳ පොසොන් උත්සවයක් කළා. ඒ උත්සවය නැරඹීමට අම්පාර නගරයට මුස්ලිම් ජනතාව, දෙමළ ජනතාව විශාල පිරිසක් සහයෝගයෙන් පැමිණියා. ඒ නිසා මින් මතුවට සිංහල, දෙමළ, මුස්ලිම් අපි අතර අසමගිය ඇති කරන්න කිසිම කෙනෙකුට කිසිදු අවස්ථාවක් නැති බව මතක තබාගන්න. ඒ සියලුදෙනාම ඉතා කැමැත්තෙන් පසු වෙනවා, සිංහල, දෙමළ, මුස්ලිම්, මැලේ, බර්ගර් අපි සියලුදෙනාම එක කොඩියක් යටතේ මේ ලංකාව දියුණු කරමු කියන සිතුවිල්ල පෙරදැරි කරගෙන. ඒ සඳහා ඒ සියලුදෙනා ජාතික ජන බලවේගය වටා එක්රැස් වී ඇති බව මතක තබාගන්න කියන කාරණය කියමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.49]

ගරු සංජීව රණසිංහ මහතා
(மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ)
(The Hon. Sanjeewa Ranasingha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වසර 20කට වැඩි කාලයක් කල් ඉකුත් වූ, නමුත් යාවත්කාලීන විය යුතුව තිබුණු කල් බදු මත වන මුද්දර ගාස්තු පිළිබඳවත්, ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ගෙනෙන රෙගුලාසිත් විවාදයට ගනු ලබන මේ අවස්ථාවේදී අපි විශ්වාස කරනවා, මූලික වශයෙන් මේ හරහා රටට අත්පත් වන යහපත් දේ පිළිබඳ බොහෝ කරුණු ප්‍රමාණයක් ඉස්මතු වුණා කියලා. විශේෂයෙන්ම නිශ්චල දේපළ සඳහා පමණක් ක්‍රියාත්මක වන මේ බදු ක්‍රියාවලිය හරහා රජය උත්පාදනය කර ගැනීමට බලාපොරොත්තු වන ආදායම් මේ මොහොතේදී අපට ඉතා වැදගත් වෙනවා. ඒකට හේතුව මේකයි. රාජ්‍ය මූල්‍ය වියදම් අවම කර ගැනීමත්, පළාත් සභාවලට ප්‍රතිපාදන වෙන් කර ලබා දීමත් ප්‍රධාන වශයෙන්ම අරමුණුකොටගෙන තමයි මෙම බදු ක්‍රියාත්මක වෙන්නේ. රුපියල් 1,000කට රුපියල් 10ක්ව තිබුණු මෙම බද්ද රුපියල් 20 දක්වා වර්ධනය වීම -වැඩි වීම- ඒ පළාත් පාලන ආයතන හරහා කෙරෙන කටයුතු සඳහා වැදගත් වෙනවා. පළාත් පාලන ආයතනවල අධීක්ෂණ ආයතනය ලෙස පළාත් සභාව ක්‍රියාත්මක වෙනවා. අපි මේ මොහොතේ උත්සාහ කරමින් ඉන්නේ පළාත් පාලන ක්‍රියාවලිය ඇතුළේ ඉදිරියේදී රට පුරා කරනු ලබන සියලු කටයුතුවලදී ඒ ප්‍රතිලාභ ජනතාවට ගලා යෑමේදී රජයේ මූල්‍ය දායකත්වය ඒ පිරිවැය අවම කරමින් කටයුතු කරන්නයි. පළාත් සභා හරහා සිදු කිරීමට යන මේ ක්‍රියාවලිය පිළිබඳව මේ රටේ ජනතාවට විශේෂ ධනාත්මක බලාපොරොත්තුවක්, අදහසක් තබාගන්න පුළුවන්කම තිබෙනවා.

රජය ඉදිරිපත් කළ මේ යෝජනා පිළිබඳව විපක්ෂය විසින් විවිධ කරුණු කාරණා ඉදිරිපත් කරනු ලැබුවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ අතර අද පළාත් පාලන ආයතනවල බලය පිහිටුවීම සම්බන්ධව විවිධ අදහස්, මතවාද ඉදිරිපත් කරන ආකාරය අපට ඇහෙනවා. තමන්ට බලය පිහිටුවා ගැනීමට නොහැකි වූ ආයතන සම්බන්ධයෙන් විවිධ චෝදනා ආණ්ඩු පක්ෂය වෙත ඉදිරිපත් කරමින් ඉන්නවා. ඊයේ දවසේ කළුතර දිස්ත්‍රික්කයේ, මතුගම ආසනයේ, දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ බලය ජාතික ජන බලවේගය විසින් පිහිටුවනු ලැබුවා. ඒ වෙනුවෙන් සහාය දැක්වූ, විශේෂයෙන්ම අප කෙරෙහි විශ්වාසය තබපු, ඒ වාගේම දේශපාලනය ඇතුළේ තිබෙන කුමන්ත්‍රණය පරාජය කරන්න මැදිහත්ව ඒ නිර්භීත තීන්දුව ගත් සියලු මන්ත්‍රීවරුන්ට අපේ කෘතඥතාව පුද කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විවිධ දේශපාලන පක්ෂවලට ඡන්දය දීලා වෙනත් පක්ෂවල නියෝජිතයන් පත් කරනු ලැබූ ජනතාව තුළ යම් වික්ෂිප්තබවක් තිබුණා. ඔවුන්ට කලකිරීමක් තිබුණා; දුකක් තිබුණා. ජාතික ජන බලවේගයේ ජනාධිපතිවරයකු සිටියදී, පාර්ලිමේන්තුවක් තිබියදී ඒ තුළින් තමන්ට වඩාත් ඵලදායී සේවාවක් ලබා ගැනීම සඳහා වන ක්‍රියාවලියක් රට පුරාම ක්‍රියාත්මක කරන්න ඔවුන්ට අදහසක් තිබුණා. හැබැයි, දැන් ප්‍රධාන වශයෙන් විපක්ෂය පෙන්වා දෙන්නේ ඔවුන්ගේ ජයග්‍රහණයක් පිළිබඳවයි, මාලිමාවේ ඡන්ද අඩුවීමක් පිළිබඳවයි. විපක්ෂය එසේ යම් ඡන්ද ප්‍රමාණයක් ලබා ගන්නේ පෞද්ගලික කරුණු කාරණා මතයි. ගම්වල වැඩ කරන ජනතාවත් එක්ක හිටපු, ජනතාවට සමීප වුණු ජනතා නියෝජිතයන්, ගමේ අය තමයි මේ ඡන්දයට ඉදිරිපත් වුණේ. හැබැයි, ඔවුන්ට ජනතාව එහෙම නෑදෑකමට, හිතවත්කමට ඡන්දය දුන්නාට, ඒ ජනතාවට නැවත ප්‍රශ්නයක් ඇති වුණා. මොකද, ප්‍රාදේශීය සභා මැතිවරණ ක්‍රමයේ තිබෙන සංයුතිය, ක්‍රමවේදය අනුව අපට තනි පක්ෂයක් ලෙස බලය පිහිටුවන්න බැහැ කියන ස්ථාවරය පිළිබඳව ඔවුන්ට අදහසක් එනකොට, ඔවුන් කම්පාවට පත් වුණා. ඊයේ දවස තුළ අපි ඒ දේ දැක්කා. නමුත් දැන් ඒ සියලුම ලාංකීය ජනතාව මාලිමාවේ නායකත්වයෙන්, අපේ සභාපති ධුර යටතේ පත් කරන ප්‍රාදේශීය සභා දිහා බලා ආස්වාදයක් ලබනවා. ඒකට හේතුව, ඒ අය මාලිමාවෙන් පිට තමන්ගේ හිතවතාට, ඥාතියාට, තමන්ගේ සහෝදරයාට ඡන්දය දුන්නාට, ඔවුන් හිතුවේ නැහැ, එහෙම දෙයක්. ඒ නිසා, "මාලිමාවට ජනාධිපති ධුරය තිබෙනවා, පාර්ලිමේන්තු බලය තිබෙනවා. හැබැයි, ප්‍රාදේශීය සභාවේදී අපි

ඥාතියාට, හිතවතාට ඡන්දය දුන්නාට කමක් නැහැ" කියලා ඔවුන් කල්පනා කළා. හැබැයි, ඔවුන්ට ගැටලුවක් ඇති වුණා. බලය පිහිටුවද්දී, ඒක නැවත දැනෙන්නට වුණා. ප්‍රාදේශීය සභා සභාපති ධුර පිහිටුවීමේදී මාලිමාවට; ජාතික ජන බලවේගයට ප්‍රශ්නයක් ඇති වුණා නේද කියලා ඔවුන් ඒ පිළිබඳව කම්පා වුණා. නමුත් මේ මොහොත වෙනකොට කොළඹ මහ නගර සභාවේ සිට ලංකාවේ සියලු පළාත් පාලන ආයතනවල බලය උපරිම මට්ටමින් අපි තහවුරු කර ගෙන තිබෙන නිසා ඒ ජනතාව සතුටු වෙමින් ඉන්නවා. ඒක නිසා මේ අවස්ථාවේදී අපිට කියන්න තිබෙන්නේ, ඒ වෙනුවෙන් අපි ඉතාම ශක්තිමත් ගමනක් යන මොහොතක ඉන්නවා කියන එකයි.

මේ රටේ ජනතාවට අපි කියන්න ඕනෑ, අපේ ඩීල් එක තිබෙන්නේ, අපි සන්ධානගත වෙන්නේ මේ රටේ ජනතාවත් එක්ක බව. අපිට ඔය කිසිදු දේශපාලන පක්ෂයක් එක්ක ඩීල් එකක් නැහැ. අපිට තිබෙන්නේ මේ රට හදන ඩීල් එක; මේ රට ගොඩනගන ඩීල් එක; මේ රට සංවර්ධනය කරන ඩීල් එක. අපි ඒ තුළ ගමනක් යමින් ඉන්නවා. ලංකා ඉතිහාසය ඇතුළේ වැඩිම කොටස් මිල දර්ශකය සනිටුහන් කළ වකවානුව බවට අපි මේ වකවානුව පත් කරගෙන තිබෙනවා. ඒ වාගේම වැඩිම සංචාරකයන් පිරිසක් පැමිණි වර්ෂය බවට මේ වර්ෂය සනිටුහන් කරන්න අපි ඉලක්කසහගතව කටයුතු කරමින් ඉන්නවා. ඒ වාගේම අපි අද දින විවාද කරනු ලබන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ වන නියෝගය ගත්තත්, ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි ගත්තත්, අද පවතින්නේ මේ රටේ බදු ගෙවන ව්‍යාපාරික ප්‍රජාව, මේ රටේ ජනතාව ඉතාම සතුටින් බදු ගෙවන මොහොතක් බව අපට සතුටින් කියන්න පුළුවන්. ඒ බදු ගෙවන ජනතාව, ව්‍යාපාරිකයන් අප කෙරෙහි විශ්වාසයෙන්, ඒ වාගේම අප පිළිබඳව ධනාත්මක, සුබවාදී අදහසකින් අද දවසේ බදු ගෙවමින් සිටිනවා.

එක පැත්තකින් එහෙම ක්‍රියාත්මක වෙද්දී, මම මීට පෙරත් ප්‍රකාශයට පත් කළ කාරණයක් ගැන නැවතත් මා සඳහන් කරන්නට කැමැතියි. පසුගිය සතියේ එක්තරා පුවත් පතක headline එකක සඳහන් වුණු කාරණයක් ගැනයි මම මේ කියන්නේ. මම පෞද්ගලිකව ඒ පිළිබඳව ප්‍රකාශ කරන්න කැමැතියි. නමුත් මම ඒ පිළිබඳව ගැඹුරින් අදහස් ප්‍රකාශ කරන්න කල්පනා කරන්නේ නැහැ. නමුත්, මේ පිළිබඳව මම යම් අදහසක් ප්‍රකාශ කරන්න ඕනෑ. පසුගිය දිනෙක වූ සිද්ධියක් පිළිබඳව සමාජ මාධ්‍යවල දිගින් දිගටම ප්‍රචාරණය වුණා; පැතිරුණා. එක්තරා පොලිස් ස්ථානයකට රැගෙන ආපු වූදිතයකු; විෂ මත්ද්‍රව්‍ය ව්‍යාපාරිකයෙකු අත්අඩංගුවට අරගෙන ඔහුව නිදහස් කරන්න පොලීසියේ යම් නිලධාරියෙක් කටයුතු කළා. ඒ අවස්ථාවේදී ඒ දූෂිත ව්‍යාපාරිකයා නිදහස් කර ගන්න ආපු පුද්ගලයාට මොකද වුණේ? අර කූඩුවේ හිටපු පුද්ගලයාව එළියට අරගෙන ඇප ලබා දෙන්න පැමිණි පුද්ගලයාව කූඩුව ඇතුළට දැම්මා. ඔහු තමන්ට වෙච්ච අසාධාරණය ප්‍රකාශ කළා. ඊට පස්සේ ඔහු, "ඇයි මම කූඩුවට යන්නේ?" කියලා අහද්දී, කනට ගහලා තමයි ඒ අදාළ නිලධාරියා ඒ අහිංසක මනුස්සයාව කූඩුව ඇතුළට දාලා තිබෙන්නේ. ඊට විනාඩි 20කට පස්සේ ඔහුව එළියට අරගෙන කොළයකට අත්සන් කරන්න කියලා ඔහුට බල කර තිබෙනවා. "ඇයි, මම අත්සන් කරන්නේ? මම මේක කියවන්න ඕනෑ" කියලා කිව්වාම, "උඹට ගෙදර යන්න ඕනෑ නම් අත්සන් කරපන්" කියන ප්‍රකාශය කර තිබෙනවා. ඔහුට කනට ගහලා තමයි කූඩුවට දාලා තිබෙන්නේ. ඔහුගේ කන පුපුරනවා. ඔහු රෝහල්ගත වෙනවා. ඔහු අහිංසක රියදුරෙක්. දරුවෝ තුන් දෙනෙකුගේ තාත්තා කෙනෙක්. ඒ අනීතික ක්‍රියාවට එරෙහිව අපි විමසීම් කරද්දී තමයි කසිප්පු ව්‍යාපාරිකයා නිදහස් කර ගැනීම වෙනුවෙන් අර අහිංසක පුද්ගලයාව හිර කූඩුවට දාලා කනට ගහලා හිස් කොළයකට අත්සන් අරගෙන තිබෙන්නේ. ඒ කරපු අනීතික ක්‍රියාවට එරෙහිව තමයි මම හඬ නැඟුවේ. මගේ බල ප්‍රදේශය, මගේ පොලිස් වසම තුළ එහෙම කථා කරන්න බැරිද? පොලීසියේ OIC මහත්තයාගේ ඉඳන් පුටුව උඩ නැඟපු දේශපාලඥයෝ හිටපු රටක්, මේක. අපේ දිස්ත්‍රික්කය ඇතුළේ මහා පරිමාණ කසිප්පු ජාවාරම් කරපු, මහා පරිමාණ ඉස්කාගාර පවත්වාගෙන ගිය දේශපාලකයෝ හිටපු - අදත් පාර්ලිමේන්තුවේත් ඉන්න - රටක්, මේක. ඒ නිසා, එවැනි දූෂිත ක්‍රියාවන්ට, එවැනි දූෂිත නිලධාරින්ට එරෙහිව හඬ නඟන්නේ නැත්නම්, ඒ වෙනුවෙන් පෙනී සිටින්නේ නැත්නම්, අහිංසකයන්ගේ අයිතිය වෙනුවෙන් අපි ඉදිරියට එන්නේ නැත්නම්, අපි හඬ අවදි කරන්නේ නැත්නම්, අපේ මේ පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරය මොකටද කියලා නැවත වතාවක් අපි එඩිතරව අහන්න කැමතියි. ඒ අනීතික ක්‍රියාවට එරෙහිව හඬ නඟපු අපි වෙනුවෙන් එවැනි headlines ලියන්න පුළුවන් නම්, ඒ headline එක මහා ප්‍රවෘත්තියක් බවට පත් කරන්න පුළුවන් නම්, ඒ මාධ්‍ය සදාචාරය පිළිබඳවත් මේ රටේ ජනතාව නැවත ප්‍රශ්න කළ යුතු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන හෝ නොදැන කරපු ඒ ප්‍රකාශයට මගේ කනගාටුව ප්‍රකාශ කරන බවත්, ඒ මාධ්‍ය සංස්කෘතියට පිළිකුළ හුවා දක්වන බවත් ප්‍රකාශ කරමින් මම නිහඬ වනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் அக்கிராசனத்திலின்று அகலவே, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. (PROF.) SENA NANAYAKKARA left the Chair, and THE HON. SANJEEWA RANASINGHA took the Chair.

[ප.ව. 4.01]

ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றையதினம் நடைபெறுகின்ற முத்திரைத் தீர்வை (விசேட ஏற்பாடுகள்) சட்டத்தின் கீழான கட்டளை, இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாட்டு) சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் என்பன தொடர்பான விவாதத்தில் கலந்துகொண்டு பேசுவதற்குச் சந்தர்ப்பம் அளித்தமைக்கு நன்றி கூறுகின்றேன்.

[ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා]

இந்த இரண்டு விடயங்கள் மூலமாகவும் இந்த நாட்டில் அபிவிருத்தி வேலைத்திட்டங்களை முன்னெடுப்பதற்கான ஏற்பாடுகளை இந்த அரசாங்கம் செய்திருக்கின்றது. இவற்றில் முத்திரைத் தீர்வை வரி அதிகரிப்புமூலம் கிடைக்கின்ற முழு வருமானமும் உள்ளூராட்சி மன்றங்களுக்கே உரித்தானதாகக் காணப்படுகின்றது. இந்த அரசாங்கம் ஆட்சிக்கு வந்த பிறகு, உள்ளூராட்சி மன்றங்களை மேம்படுத்துவதற்கான வேலைத்திட்டத்தை முன்னெடுத்து, அவற்றில் பணிபுரியும் உத்தியோகத்தர்களுக்கான சம்பளத்தை அந்தச் சபைகளே வழங்க வேண்டும் என்றதொரு திட்டத்தை இந்த நாட்டில் முதன்முதல் அறிமுகப்படுத்தியது. உள்ளூராட்சி மன்றப் பணியாளர்களுக்குச் சம்பளம் வழங்குவதற்காக மேற்கொள்ளப்பட்ட ஒரு விடயமாகவே நாங்கள் இந்த வரி அதிகரிப்பைப் பார்க்கின்றோம்.

2025ஆம் ஆண்டு முதல் உள்ளூராட்சி மன்றங்களில் பணிபுரிகின்றவர்களுக்கு அவர்களது சம்பளத்தில் 20 சதவீதத்தை அந்தந்தச் சபைகளே வழங்க வேண்டும் என்றதோர் எதிர்பார்ப்பு இருக்கின்றது. அதிகரிக்கப்பட்டு இருக்கின்ற இந்த வரி விதிப்பின்மூலம் கிடைக்கப்பெறுகின்ற வருமானம் அப்பணியாளர்களுக்குச் சம்பளம் வழங்குவதற்குப் போதுமானதாக இருக்குமா? என்ற கேள்வியை நான் இந்த இடத்தில் முன்வைக்க விரும்புகின்றேன். ஏனெனில், ஒவ்வொரு வருடமும் 20 சதவீதம் என்று அதிகரித்து, ஐந்து வருடங்களாகும்போது உள்ளூராட்சி மன்றங்களில் பணிபுரிகின்றவர்களுக்கு அவர்களுடைய முழுச் சம்பளத்தையும் உள்ளூராட்சி மன்றங்களே கொடுக்க வேண்டும். அரசாங்கத்தின் இந்தச் செயற்பாடு எவ்வாறு இருக்கின்றது என்றால், தலையைத் தடவிக் கண்களைப் பிடுங்குவதுபோல்தான் இருக்கின்றது.

உள்ளூராட்சி மன்றங்கள் என்பது, அந்தந்தப் பிரதேசங்களில் இருக்கின்ற மக்களுடைய தேவைகளை அந்தந்தப் பிரதேசங்களிலிருந்து கிடைக்கின்ற வருமானத்தை வைத்து நிறைவேற்றக்கூடிய, தேவையான செலவினங்களைச் செய்யக்கூடிய ஓர் அமைப்பாகக் காணப்படுகின்றது. அந்த வகையில், இவ்வாறான வரி விதிப்பின்மூலம் மாத்திரம் உள்ளூராட்சி மன்றங்களுக்குக் கிடைக்கின்ற வருமானத்தை வைத்து, அந்தச் சபைகளை முன்னெடுப்பது மிகக் கடினமான ஒரு விடயம் என்பதை நான் இந்தச் சபைக்குக் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

உள்ளூராட்சி மன்றங்களுக்கு இருந்த வருமான வழிகள் பல ஏனைய நிறுவனங்களுக்கு மாற்றப்பட்டு இருக்கின்றன. முன்னர் போக்குவரத்துக்காக துவிச்சக்கர வண்டிகள், மாட்டு வண்டிகள், குதிரை வண்டிகள் பயன்படுத்தப்பட்டன. அப்போது பாதைகளைப் பாவிப்பதற்காகவே அந்த வாகனங்களுக்கு வரி விதிக்கப்பட்டது. ஆனால், இப்போது அவ்வாறான வாகனங்கள் இல்லை. இப்போது வீதிகளில் வெவ்வேறு வகையான வாகனங்கள் பயணிக்கின்றன. அந்த வாகனங்களுக்கு விதிக்கப்படுகின்ற வரி பிரதேச செயலகங்கள் ஊடாக மத்திய அரசாங்கத்துக்குச் செல்கின்றது. ஏன் அந்த வரியை உள்ளூராட்சி மன்றங்களுக்கு வழங்கக்கூடாதென நான் இந்த இடத்தில் கேட்க விரும்புகின்றேன். தற்பொழுது உள்ளூராட்சி மன்றங்களை மேம்படுத்துகின்ற வேலைத்திட்டத்தை அரசாங்கம் மேற்கொண்டு வருகின்றது. அதற்காக நான் அரசாங்கத்துக்கு நன்றி கூறுகின்றேன்.

நடந்துமுடிந்த உள்ளூராட்சி மன்றங்கள் சம்பந்தமாக பல்வேறு விடயங்கள் இந்த அவையில் முன்வைக்கப்பட்டன. குறிப்பாக, உள்ளூராட்சி மன்றங்களில் ஆட்சி அமைக்கின்ற, அவற்றுக்கான தவிசாளர்கள், பிரதித் தவிசாளர்களைத் தெரிவுசெய்கின்ற விடயங்களில் இந்த அரசாங்கம் தனது கொள்கைகளை மறந்து அதிகாரத்தின்பால் சென்று கொண்டிருக்கின்றது. அதாவது, நாட்டு மக்களுக்கு வழங்கிய உறுதிமொழிகளை மீறி அரசாங்கம் செயற்படுவதை நாங்கள் பார்க்கின்றோம். இந்த நாட்டு மக்கள் கடந்த தேர்தல்களில் மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்களை மாத்திரம் நம்பித்தான் தேசிய மக்கள் சக்திக்கு வாக்களித்தார்கள். அரச தரப்பில் இருக்கின்ற 159 உறுப்பினர்களில் எவரையும் நம்பி அவர்கள் வாக்களிக்கவில்லை. சனாதிபதி அவர்கள்மீது கொண்ட நம்பிக்கையின் அடிப்படையில், அவருடைய வார்த்தைகளை நம்பியதன் பேரில் தேசிய மக்கள் சக்திக்கு மக்கள் வாக்களித்தார்கள். ஆனால், அத்தனை விடயங்களும் பொய் என்ற அடிப்படையில், கடந்த உள்ளூராட்சி மன்றத் தேர்தலில் 20 இலட்சத்துக்கும் அதிகமான மக்கள் இந்த அரசாங்கத்துக்கு எதிராகத் தங்களுடைய வாக்குகளை வேறு கட்சிகளுக்கு வழங்கி இருக்கிறார்கள். இந்த அரசின்மீது மக்களுக்கு இருக்கின்ற நம்பிக்கை குறைந்து வருகின்றது என்பது இதன்மூலம் தெளிவாகின்றது. குறிப்பாக, முஸ்லிம் மக்கள் இந்த அரசின்மீது வைத்திருந்த நம்பிக்கை வீணடிக்கப்பட்டு இருக்கின்றது. மேலும், ஏற்றுமதி மற்றும் இறக்குமதி சார்ந்த வரி விதிப்பும் அதிகரிக்கப்பட்டு இருக்கின்றது. அதாவது, இந்த நாட்டில் உற்பத்தி செய்யப்படுகின்ற பொருட்களை வெளிநாடுகளிலிருந்து இறக்குமதி செய்யும்போது விதிக்கப்படுகின்ற வரியும் இதில் உள்ளடங்குகின்றது.

இன்று ஈரானுக்கு எதிராக இஸ்ரேல் நடத்துகின்ற போரை மனிதாபிமானமுள்ள எந்தவொரு மனிதனாலும் ஏற்றுக்கொள்ள முடியாது. சில மாதங்களுக்கு முன்னர், இஸ்ரேல் பலஸ்தீன்மீது குண்டுத் தாக்குதல்களை நடாத்தி, அங்குள்ள குழந்தைகள், சிறுவர்கள், கற்பிணித் தாய்மாரை அழித்து ஒழித்ததை நாங்கள் பார்த்தோம். இப்போது இஸ்ரேலானது ஈரான்மீது கைவைத்திருக்கின்றது. கலிமா சொன்ன முஸ்லிம்களை அழித்தொழிக்க வேண்டும் என்பதற்காக சில நாடுகள் இஸ்ரேலைத் தூண்டிவிட்டு, பின்னால் இருந்து பார்த்துக்கொண்டு இருக்கின்றன.

இலங்கையானது கடந்த காலங்களில் ஈரானிடமிருந்து பல உதவிகளைப் பெற்றிருக்கிறது. உமா ஓயா பல்நோக்கு அபிவிருத்தித் திட்டத்தை 2024ஆம் ஆண்டு ஏப்பிரல் மாதம் 24ஆம் திகதி அப்போதிருந்த ஈரான் சனாதிபதி அவர்கள் எமது நாட்டுக்கு வருகை தந்து ஆரம்பித்து வைத்தார். பல கோடி ரூபாய் பெறுமதியான இந்தத் திட்டத்தினூடாக மின்சார உற்பத்தி மாத்திரமல்ல, விவசாயத்துறை உட்பட ஏனைய துறைகள் சார்ந்த அபிவிருத்தி விடயங்களும் மேற்கொள்ளப்படுகின்றன. அவற்றின்மூலம் வருமானத்தைப் பெறுவதற்கும் இத்திட்டம் ஊன்றுகோலாக அமைந்துள்ளது. மேலும், இந்த நாடு மிகவும் கஷ்டமான சூழ்நிலையில் இருந்த காலத்தில் மசகு எண்ணெயை கடனுக்கு வழங்கியது. அதுமாத்திரமன்றி, இந்த நாட்டில் புரையோடிப் போயிருந்த யுத்தத்தை முடிவுறுத்துவதற்கு ஆயுதங்களை வழங்கி, எமது நாட்டின் இறைமையைப் பாதுகாப்பதற்கும் பாதுகாப்பை உறுதிப்படுத்துவதற்கும் ஈரான் உதவி புரிந்தது.

தற்பொழுது நடைபெற்றுக் கொண்டு இருக்கின்ற யுத்தத்தால் ஈரான் நாட்டு மக்கள் மாத்திரமல்ல, அந்நாட்டின் பொருளாதாரமும் அழிவடைந்துகொண்டு இருக்கிறது. இந்த நிலையில், இலங்கை அரசாங்கமானது ஈஸ்ரேலுக்கு எதிராகக் கருத்துத் தெரிவிக்காவிட்டாலும், ஈரானுக்கு ஆதரவாகக்கூட

கருத்துத் தெரிவித்திருக்கலாம். அவ்வாறு கருத்துத் தெரிவிக்காமல் இந்த அரசாங்கம் நழுவல் போக்கைக் கடைபிடிக்கின்றது. இந்த நாட்டில் உங்களுக்கு வாக்களித்த ஒட்டுமொத்த முஸ்லிம் மக்களுக்கும் எதிரான ஒரு செயற்பாடாகவே நாங்கள் இதனைப் பார்க்கின்றோம். இவ்வாறு நீங்கள் இந்த நாட்டில் இருக்கின்ற முஸ்லிம் மக்களைத் தூரப்படுத்தி வருவதை இந்த அவையில் கூறவேண்டிய கடமைப்பாடு எனக்கு இருக்கின்றது. தலைவர் பதவியில் வெற்றிடம் ஏற்படும்போது, பிரதித் தலைவராக இருக்கின்றவர்தான் தலைவராக வரவேண்டும் என்றொரு மரபு இருக்கின்றது. ஆனால், அது இந்தப் பாராளுமன்றத்தில் இடம்பெறவில்லை. முன்னர் இருந்த சபாநாயகர் இராஜினாமா செய்த பின்னர், புதிய சபாநாயகர் தெரிவின்போது, பிரதிச் சபாநாயகராக இருந்தவரின் பெயர் அப்பதவிக்குச் சிபாரிசு செய்யப்படவில்லை. அதேபோல், நீதியரசரை நியமிக்கும் விடயத்திலும் இவ்வாறானதொரு தவறு நடந்தது. மேலும், அமைச்சரவையிலும் முஸ்லிம் சமூகத்தைச் சார்ந்த எவரும் நியமிக்கப்படவில்லை.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
මට විනාඩියක් දෙන්න.

அதுமாத்திரமன்றி, இஸ்ரேலின் செயற்பாட்டுக்கு எதிராக 'ஸ்டிகர்' ஒன்றை ஒட்டியதற்காக ருஷ்தி என்ற சகோதரர் பயங்கரவாதத் தடைச் சட்டத்தின்கீழ் கைது செய்யப்பட்டார். அப்போது, இந்தப் பாராளுமன்றத்தில் பலர் கூச்சலிட்டார்கள்; அதற்கு எதிராகப் பேசினார்கள். ஆனால், அவை எல்லாம் செவிமடுக்கப்படவில்லை. அந்தச் சகோதரர் கைதுசெய்யப்பட்டது தவறு எனக்கூறி, அவருக்கு இரண்டு இலட்சம் ரூபாய் நஷ்டஈட்டை வழங்குமாறு அண்மையில் சர்வதேச மனித உரிமைகள் ஆணைக்குழு கூறியிருக்கின்றது. எதிர்க்கட்சியில் இருக்கின்ற முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்கள் மாத்திரம்தான் இந்த அநியாயத்துக்கு எதிராக இந்தச் சபையில் பேசினார்கள். இந்த நாட்டில் இருக்கின்ற முஸ்லிம் மக்களுடைய வாக்குகளை உங்களுக்காகத் திரட்டித் தந்த எந்தவொரு பாராளுமன்ற உறுப்பினரும் அதற்கு எதிராகக் குரல் எழுப்பவில்லை. ஆனால், இன்று அவர்கள் உள்ளூராட்சி மன்றங்களில் ஆட்சி அமைப்பதற்காக ஏனைய கட்சிகளைச் சேர்ந்த முஸ்லிம் உறுப்பினர்களை அழைத்துப் பேசுவதையும் அதிகாரத்தைப் பெறவேண்டும் என்ற மோகத்தில் இரவு பகலாக அலைந்துதிரிவதையும் நாங்கள் அவதானிக்கக் கூடியதாக இருக்கின்றது. எனவே, எதிர்காலத்தில் முஸ்லிம் மக்களுடைய விடயங்களில் அரசு கூடுதலான கவனத்தைச் செலுத்தி, அவர்களுக்கு ஆதரவு வழங்க வேண்டுமெனவும், அபிவிருத்தி உட்பட ஏனைய விடயங்களில் அதிக கரிசனையுடன் செயற்பட வேண்டுமெனவும் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.12]

ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා සහ ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා අද මහජන ආරක්ෂක අමාත්‍යාංශය නියෝජනය කරන අපේ අමාත්‍යවරයා වන ආනන්ද විජේපාල සහෝදරයාව ඉලක්ක කරගෙන ඉදිරිපත් කරපු විවේචනය සම්බන්ධයෙන් පිළිතුරක් ලබා දෙන්න විශේෂයෙන් මම මේ කාල වේලාව යොදා ගන්නවා. චානක මාදුගොඩ මන්ත්‍රීතුමා සභාගත කළා, දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලයට අදාළව ගෙවන ලද වැටුප් හා දීමනා පිළිබඳ වාර්තාවක්. චානක මාදුගොඩ මන්ත්‍රීතුමා මුල් අවස්ථාවේදී ඒ වාර්තාව සභාගත කළේ නැහැ. පසුව මහින්ද ජයසිංහ සහෝදරයා විසින් කරන ලද ප්‍රකාශය නිසා එතුමාට එය සභාගත කරන්න සිදු වුණා. ඒ සභාගත කරපු ලේඛනය මම එවේලේම ලබා ගත්තා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දැන් මොකක්ද මේ කරන චෝදනාව? රුපියල් ලක්ෂ 12ක මුදලක් ආනන්ද විජේපාල සහෝදරයා එවකට දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂවරයා ලෙස ඉඳගෙන අරගෙන තිබෙනවාය කියන එක. ඔබතුමා දන්නවාද, අරගෙන තිබෙන මුදල කීයද කියලා? මාසයකට රුපියල් 45,115යි. එතුමා මාස 30ක් ඉඳලා තිබෙනවා. රුපියල් ලක්ෂ 12කට ආසන්න මුදලක් අරගෙන තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රුපියල් 45,115 ඇතුළේ තිබෙනවා දුරකථන දීමනාව වශයෙන් රුපියල් 5,000යි, පෙට්‍රල් ලීටර් 150කට යන මුදලයි. ඒ අයිතම දෙක එකතු කළාට පස්සේ රුපියල් දහඅටදහස් ගණනයි මේ දීමනාව ලැබෙන්නේ. එතකොට ඔබතුමා විශ්වාස කරනවාද, දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂවරයා රුපියල් 45,115ක් වැනි සොච්චම් මුදලක වැටුපක් ගත්තා නම් ඉඳීවි කියලා? බලන්න, මා ළඟ මේ තිබෙන්නේ ඒ පත්වීම් ලිපිය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවා ජනතාවට ඇහෙන්න කියන්න ඕනෑ. මොකක්ද, මේ පත්වීම් ලිපියේ තිබෙන්නේ? "The monthly salary of the officer should be paid continuously by your ʍinistry." ඒ කියන්නේ, ආනන්ද විජේපාල මහත්මයා එවකට වැඩ කරමින් හිටපු අමාත්‍යාංශයෙන් තමයි වැටුප ගෙවන්නේ. "And 50 per cent of the basic salary and the telephone allowance for the above post will be paid by this office." මම කලින් කිව්ව දුරකථන දීමනාව රුපියල් 5,000යි, පෙට්‍රල් ලීටර් 150යි. ඔන්න, මම කියන දේ අහගන්න නාමල් මන්ත්‍රීතුමා. වැඩේ තිබෙන්නේ මෙකයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ ගරු සභාවට ඇවිල්ලා පවයක් අත්හරිනවා. ඊට පස්සේ "යුරේකා, යුරේකා" කිය කියා අර දොරවල් දෙක දෙබෑ කරගෙන යනවා. මාර වැඩක් නේ. මොකක් හෝ අභියෝගයක් කළාම මේ සභාවේ ඉන්න ඕනෑ, ඒකට උත්තර දෙනකල්.

ඇන්ටන් පෙරේරා කියන්නේ දැන් ජාතික ලොතරැයි මණ්ඩලයේ සභාපතිවරයා. ඔහු අරගෙන තිබෙන්නේ රුපියල් 21,527යි. නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙක් රුපියල් 21,527කට වැඩ කරයිද? චානක මාදුගොඩ මන්ත්‍රීතුමා සභාගත කරපු ලේඛනයෙන්ම ඔප්පු වෙනවා, මේක දීමනාවක් කියන එක. ඔහුගේ පත්වීම් ලිපිය තුළ ඒ බව සඳහන්ව තිබෙනවා.

ගරු චානක මාදුගොඩ මහතා
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
Sir, I rise to a point of Order.

ගරු නීතිඥ සුනිල් වටගල මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
මගේ කථාවෙන් පසුව කියන්න, චානක මාදුගොඩ මන්ත්‍රීතුමනි. *[බාධා කිරීමක්]* ඔබතුමා කරුණාකර වාඩි වෙන්න. මගේ කථාවෙන් පසුව කියන්න. *[බාධා කිරීමක්]* දැන් මගේ කථාව කරගෙන යන්න ඉඩ දෙන්න, ගරු මන්ත්‍රීතුමා. There is no point of Order. I am answering to his allegations, Sir.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉස්සාගේ ඔළුවේ මොනවාද තියාගෙන "මම සුදනා, මම සුදනා" කියනවා. මිනිස්සු පොඩ්ඩක් දැනගන්න ඕනෑ, වීදුරු ගෙවල්වල ඉඳගෙන ගල් ගහනකොට තමන්ට මොකක්ද වෙන්නේ කියලා. දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලය කියන එකට එක්තරා කොමිෂන් එකකින් -ඒකට අමුතු නමකුත් කිව්වා- මොකක්ද කළේ? මේකට කියන්නේ දේශපාලන පළිගැනීම් කමිටුව කියලා. මේ කමිටුවට ආනන්ද විජේපාල සහෝදරයාවයි, අපේ පක්ෂයේ නායකයා වන අනුර කුමාර දිසානායක සහෝදරයාවයි අරගෙන ආවා. ඒ, මොකටද? ප්‍රජා අයිතිය අහෝසි කරන්න. අන්න ඒක තමයි තිබුණේ, චෝදනා පත්‍රය ඇතුළේ. ප්‍රජා අයිතිය අහෝසි කරන්න, අපේ දේශපාලනය නැති කරන්න තමයි අරගෙන ආවේ. ඊට පස්සේ මොකක්ද වුණේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අභියාචනාධිකරණය ඒක නිෂ්ප්‍රභ කළා; අර කොමිසම නිෂ්ක්‍රිය කළා. ඒ කොමිසමට කියපු නම මෙතැන කියන්න අමාරුයි. ඊට පස්සේ ආනන්ද විජේපාල සහෝදරයා ඒ කොමිසම ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ අභියෝගයට ලක් කළා. ඒ අනුව එම කොමිසම නිෂ්ක්‍රිය කළා; නිෂ්ප්‍රභ කළා, ඒ අදාළ පෙත්සම් දෙකෙන්ම මේ කොමිසම නීති විරෝධී කොමිසමක් කියලා. මෙතුමන්ලා පළි ගන්න ගෙනාවේ ඒක. ඒ පළිගැනීමේ කමිටුව සම්බන්ධයෙන් අධිකරණයට ගිහිල්ලා අපේ පක්ෂයේ නායකයාත්, ආනන්ද විජේපාල සහෝදරයාත් ශුද්ධ වෙලා තිබෙන්නේ. එවන් තත්ත්වයක් යටතේ,- *[බාධා කිරීමක්]* අහගන්න මේවා, අහගන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම තත්ත්වයක් යටතේ තමයි, මේ අභියෝගය ගෙන එන්නේ. මම ඒකයි කිව්වේ, වීදුරු ගෙවල්වල ඉඳගෙන ගල් ගහන්න එපා කියලා.

දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලයෙන් කරපු විමර්ශන මත රාජපක්ෂ පවුලේ උදවියගෙන් විතරක් මහා භාණ්ඩාගාරයට අපි අත් කරලා දීපු මුදල කොපමණද කියලා අහගන්න. *[බාධා කිරීමක්]* අහගන්න. ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමනි, ඔබතුමාට මේවා අහගෙන ඉන්න බැරිව ඇති. අනුන්ගේ පරිප්පු කන්න එපා, මන්ත්‍රීතුමනි. තේරුණාද? CSN නාළිකාව කාගේද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු නීතිඥ සුනිල් වටගල මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
මට තව විනාඩි තුනක් විතර දෙන්න පුළුවන්ද?

CSN නාළිකාවෙන් මහා භාණ්ඩාගාරයට අත් වූ මුදල රුපියල් මිලියන 152යි. ඊට පස්සේ ගෝඨාභය රාජපක්ෂ තමන්ගේ අම්මාගේ සහ තාත්තාගේ සොහොන් ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියෙන් අත්කර ගත් මුදල රුපියල් මිලියන 35යි. බැසිල් රාජපක්ෂ මල්වානේ ගෙදර මිලදී ගැනීම වෙනුවෙන් අත් කර ගත් මුදල රුපියල් මිලියන 208යි. ඔන්න, ගණන. ඒ, රාජපක්ෂවරුන්ගේ දූෂිත කාරණාවලින් එන මුදල් විතරක් එකතු කළාම එන ගණන, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එක දෙයක් අපි අද කියනවා. ඒක අහගන්න. මෙන්න අහගන්න, "සිරිලිය සවිය" ගිණුමට අත් වෙලා තිබෙන කල. අපි ඊට අදාළ ලේඛනය අරගෙන ආවා. අහගන්න මහත්මයෝ. අනුන්ගේ පරිප්පු කන්න එනකොට ඔහොම තමයි. තේරුණාද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තවත් විනාඩි තුනක අමතර කාලයක් ලැබෙනවා.

ගරු නීතිඥ සුනිල් වටගල මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ භාර්යාව වන ශිරන්ති රාජපක්ෂ විසින් "සිරිලිය සවිය" නමින් ව්‍යාජ ගිණුමක් පවත්වා ගෙන යෑම. මම කියන දේ අහගන්න.

"ශිරන්ති රාජපක්ෂ මහත්මිය විසින් 'සිරිලිය සවිය' නමින් ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කර සැක කටයුතු ගිණුමක් පවත්වා ගෙන යයි."

මේ, ලෝක ප්‍රසිද්ධ "සිරිලිය සවිය" ගිණුම.

"දැනට මෙම ගිණුම ව්‍යාජ ගිණුමක් බව සනාථ වී ඇත. ගිණුමේ මැන්ඩේට් පත්‍රය බැංකුවෙන් අස්ථානගත වී ඇත."

මාරයි නේ! ගිණුමක් විවෘත කරලා, මැන්ඩේට් පත්‍රය අස්ථානගත කරලා. කවුද කළේ? ඒවා අපි හොයනවා, පොඩ්ඩක් ඉන්න.

"කොළඹ 10, ඩාර්លි පාර, මහජන බැංකුව, සුදුවැල්ල ශාඛාවේ 'සිරිලිය සවිය' නමින් ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කරමින්, නීත්‍යනුකූලව ඉදිරිපත් කළ යුතු ලේඛන ඉදිරිපත් නොකර, 2006.11.14 දිනැතිව අංක 143-1-001-4-6235069 දරන ගිණුම ආරම්භ කොට ඇත. දැනට මෙම ගිණුමේ ගනුදෙනු අත්හිටුවා ඇති අතර, මේ වනවිට ගිණුමේ ශේෂය රුපියල් මිලියන 43කි."

කවුද අත්හිටවූයේ? අපි ඒවා හොයනවා.

"මෙම ගිණුමේ සභාපති, ශිරන්ති රාජපක්ෂ."

ඒ, කවුද? මහින්ද රාජපක්ෂගේ නෝනා.

"ලේකම්, සීතා කල්‍යාණි දිසානායක. භාණ්ඩාගාරික, නිරෝෂා ජීවනී යන අයවලුන් වේ.

දැනට මෙම ගිණුමට අවස්ථා 88කදී රුපියල් අටකෝටි විසිනවලක්ෂ අසූඅටක් තැන්පත් කර ඇති අතර, ආපසු ගැනීමේ අවස්ථා 129කදී රුපියල් තුන්කෝටි අනූලක්ෂ පහළොස්දහස් හයසියපනස්හයක මුදලක් ලබා ගෙන ඇත. ලක්ෂ 100ක ස්ථාවර තැන්පතුවක් ද මෙම බැංකුවේ 'සිරිලිය' නමින් ආරම්භ කර ඇත. මෙම ගිණුම සම්බන්ධයෙන් විමර්ශන මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය මඟින් සිදු කරනු ලබයි."

අවාසනාවකට, දැනට නීතිපති කාර්යාලයේ මේක බහා තබා තිබෙන්නේ. අපි මේ රටට කියනවා, ජනවරම ඇතුළේ තිබෙන්නේ මේ විමර්ශන ආරම්භ කරන්න කියන එක බව. ජාතික ජන බලවේගයේ රජයක් යටතේ මේ විමර්ශන කටයුතු යළි ආරම්භ කරනවා කියන එක අපි මේ රටේ ජනතාවට කියනවා. ඒ නිසා කොහේවත් යන නයි ඔඩොක්කුවේ දමාගෙන "කනවෝ, කනවෝ" කියා කෑ ගහන්න එපා. තේරුණාද? *[බාධා කිරීමක්]* ඔව්, රෙද්ද අස්සේ. ඒක තමයි. කොහේවත් යන නයි. දැන් ඔබතුමන්ලා තමයි මේ කොහේවත් යන නයි දමා ගත්තේ. ඒ නිසා අපි මේක ඉස්සරහට අරගෙන යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මේ අභියෝගයක් ලෙස ආපු තවත් කාරණයක්-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තවත් විනාඩියක් පමණයි තිබෙන්නේ, ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

ගරු නීතිඥ සුනිල් වටගල මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
හොඳයි. ඒ විනාඩිය ඇතුළේ මම මගේ අභියෝගය පැහැදිලි කරන්නම්. දැන් චිත්‍රාල් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා ඇවිල්ලා මෙතැන පොඩි කාරණයක් කිව්වා, මම අභියෝගයක් කළා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ළඟ තිබෙනවා, පළාත් පාලන මැතිවරණයට අදාළව,- මේ ගැන සෑහෙන සංවාද තිබෙනවා, විපක්ෂය ඇතුළේත්, අප අතරත්, රහස්‍ය ඡන්දයද, විවෘත ඡන්දයද කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන චක්‍රලේඛය; 2025.06.14 දින පැහැදිලි චක්‍රලේඛයක් නිකුත් කරලා පළාත් පාලන කොමසාරිස්වරයා තමන්ගේ ලිපියේ අවසානයට කියනවා, "ඡන්ද ක්‍රමය තෝරා ගැනීමේදී යොදා ගත යුතු කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් අදාළ පනත යටතේ පළාත් පාලන කොමසාරිස්වරයා වෙත පැවරී ඇති බලතල සහ වගකීම් ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, ඒ සම්බන්ධව තීරණ ගැනීමේ වගකීමද එකී නීතිය ප්‍රකාරව පළාත් පාලන කොමසාරිස්වරයා විසින් ඉටු කළ යුතුය" කියලා. මේ දිනය, 2025.06.14වන දා. අවසානයට ආපු ලිපිය ගැනයි මම කිව්වේ. මේකේ කොහේවත් ඒ ඡන්දය විවෘතද, රහස්‍යද කියලා නැහැ. ඒකයි මගේ අභියෝගය.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථාව අවසන් කරන්න, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි.

ගරු නීතිඥ සුනිල් වටගල මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් ඒ පළාත් පාලන කොමසාරිස්වරයාගේ අභිමතානුසාරී බලය යටතේ ඔවුන් දැන් සභාපති තෝරන්න විවිධ පළාත්වල ඡන්ද පවත්වාගෙන යනවා. මධ්‍යම පළාතේ එකක් කරනවා ලු. ඒක ඇත්ත. අභිමතානුසාරී බලය යටතේ කරන්නේ. බස්නාහිරට හැඟෙන විධියට තව එකක් යනවා ඇති, විවෘතද, රහස්‍යද කියන කාරණාව. එතකොට, ඒක අභිමතානුසාරී බලය. ඒ බලය මේ පැත්තේ ඉන්නා මන්ත්‍රීවරුන්වත්, කවුරුවත් ප්‍රශ්න කළ යුතු බලයක් නොවෙයි. ප්‍රශ්න කරන්න ඕනෑ නම් අධිකරණයට යන්න. අද මෙතැන එළියේ කෑ ගසමින් ඉන්න කවුරුවත් මේ කොමසාරිස්වරයාගේ බලය challenge කරලා ශ්‍රේෂ්ඨාධිකරණයට හෝ අභියාචනාධිකරණයට ගිහිල්ලා නැහැ. එහෙම නැතුව මෙතැනට ඇවිල්ලා බොරුවට කෑ ගහනවා, කොමසාරිස්වරයාට මේ සම්බන්ධයෙන් බලයක් නැහැ, වැරදියි කියලා. ඒ නිසා මගේ අභියෝගය මේකයි, අවසාන ලිපියේ හරි පැහැදිලිව තිබෙනවා, විවෘතද, රහස්‍යද කියලා නැහැ, පනත ප්‍රකාරව කටයුතු කරන්න කියලා බොහොම ස්තුතියි.

ගරු චානක මාදුගොඩ මහතා
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, කෙටියෙන් කියන්න. කාලය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු චානක මාදුගොඩ මහතා
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඇත්තටම මම පැනලා ගියේ නැහැ. මම දන්නවා, ගරු නියෝජ්‍ය ඇමතිතුමා මේ කාරණය විමසයි කියලා. ඒ නිසා මම හිටියා. පැනලා යන්න හේතුවක් නැහැ. ඇත්තටම මම වාදයකට යන්න කැමැත්තක් නැහැ. මම එම ලේඛනය සභාගත කළේත්, ඒ පැත්තෙන් ඉල්ලපු නිසා. එහෙම නැතුව අපි මේ කාරණා දිගින් දිගට ගෙනියන්න මේ සභාව පාවිච්චි කරන්න කැමැති නැහැ. හැබැයි, කියන්න ඕනෑ, ඊයේ දවසේ හැන්සාඩ් වාර්තාව අරගෙන බැලුවොත්, ඔබ තමුන්නාන්සේලා සියලුදෙනාටම පැහැදිලි වේවි, එතුමා පුනරුත්ථාපන අධිකාරියේ අධ්‍යක්ෂවරයා විධියට කටයුතු කරන ගමන් තමයි දූෂණ මර්දන කමිටුවේ අධ්‍යක්ෂවරයා විධියටත් කටයුතු කළේ කියන එක. එතකොට ඊයේ දවසේ පැහැදිලිව කිව්වා, අනුයුක්ත වෙලා හිටියේ, කිසිම දීමනාවක් ගත්තේ නැහැ කියලා. මම සුනිල් වටගල අපේ නියෝජ්‍ය ඇමතිතුමාට ආරාධනා කරනවා, ඊයේ හැන්සාඩ් වාර්තාව අරගෙන බලන්න කියලා. එහෙම නැතුව විපක්ෂය මේක බොරුවට චෝදනා කරන වෙලාවක් කර ගන්නේ නැහැ. අපි මේ දූෂණය, වංචාව කරේ තියාගෙන යනවාට වඩා මේ රටේ මිනිස්සු බලාපොරොත්තු වෙන්නේ ආණ්ඩුව කියපු දේවල් ඉෂ්ට කිරීම. ඔබතුමන්ලාට ආණ්ඩුව භාර දීලා තිබෙන්නේ දූෂණ, වංචා ගැන හොයන්න. ඒකට අපි අත් දෙකම ඔසවා එකඟයි කියන කාරණයත් මේ මොහොතේ සිහිපත් කරනවා.

ගරු නීතිඥ සුනිල් වටගල මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු මාදුගොඩ මන්ත්‍රීතුමනි, ඒකට මම පිළිතුරු දෙන්නම්. මගේ කන් දෙකට පැහැදිලිවම ඇහුණා, ඊයේ විෂය භාර අමාත්‍යවරයා කිව්වා දීමනාවක් ලබා ගත්තා කියලා. ඔබතුමා විශ්වාස කරනවාද, අධ්‍යක්ෂවරයෙක් රුපියල් 45,115ක මුදලකටයි වැඩ කර තිබෙන්නේ කියලා? *[බාධා කිරීමක්]*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔය සංවාදය පසුව කරගන්න. මෙය අවස්ථාව නොවෙයි. *[බාධා කිරීමක්]*

ගරු නීතිඥ සුනිල් වටගල මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
මොකක්ද, මොකක්ද? *[බාධා කිරීමක්]* හරි, හැන්සාඩ් වාර්තාව බලලා කථා කරන්නම්. මේකට වාදයක් ලැහැස්ති කරමුද? විෂයභාර අමාත්‍යවරයා මට කිව්වා. මේ සම්බන්ධයෙන් විතරක් වෙනම වාදයක් ගනිමු. දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලය ගැන- *[බාධා කිරීමක්]* වාදයක් ගනිමු. මේ සම්බන්ධයෙන් වාදයක් ගැනීමට අවස්ථාව ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි, අපි ගරු කථානායකතුමා එක්ක කථා කරලා මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කරමු.

ගරු අතුල වෙළඳගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.28]

ගරු අතුල වෙළඳගොඩ මහතා
(மாண்புமிகு அதுல வெலந்தகொட)
(The Hon. Athula Welandagoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ ගරු හර්ෂණ සූරියප්පෙරුම නියෝජ්‍ය ඇමතිතුමා විසින් මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය, ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි අනුමත කිරීමට මෙම ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ආණ්ඩු පක්ෂයෙන් කරුණු ඉදිරිපත් කරද්දී විපක්ෂය යැයි කියා ගන්නා - එහෙම තමයි කියන්න වෙන්නේ- පිරිස ඒකට කිසිම සම්බන්ධයක් නැති, එහෙන් මෙහෙන් අහුලා ගත්ත කෑලි ටිකක් අමුණනවා අපි දැක්කා.

මේ පළාත් පාලන මැතිවරණයේ ප්‍රතිඵලත් සමඟ තවත් ගුණාත්මක පරිවර්තනයක් අපේ රටේ දේශපාලනයට එකතු වෙමින් තිබෙනවා. මේ ගුණාත්මක පරිවර්තනය සම්බන්ධයෙන් වෙන විධියකට ඒකාබද්ධ ප්‍රකාශ කියමින් ඒ අය කටයුතු කරනවා. අපි "සුන්බුන්" කියලා කියන්නේ නැහැ. අපට ගරුත්වයක් තිබෙනවා. හැබැයි, ඒ සුන්බුන් තත්ත්වය තමයි අපට දැන් පේන්නේ. මොකද, අපි පළාත් පාලන ආයතන 151ක බලය පිහිටුවා තිබෙනවා. දැන් 180කට වැඩියි. අද -වර්තමානය- වෙනකොට තවත් පළාත් පාලන ආයතනවල බලය ජාතික ජන බලවේගයට ලැබෙමින් පවතිනවා. දැන් මේකත් විග්‍රහ කරගන්න බැහැ නේ. අපට 117යි ලැබුණේ. ඒක ඇත්ත. අපි පළාත් පාලන ආයතන 266ක් ජයග්‍රහණය කරනවා. හැබැයි, මේ දවස්වල පවතින සංවාදය මොකක්ද? මේ පාර්ලිමේන්තුවට වැදගත් අණ පනත් ඉදිරිපත් කරනවා. ඒ සඳහා කාලය වැය කරනවා. රටේ ජනතාවගේ ධනයෙන් විශාල මුදලක් වැය වෙනවා. හැබැයි, මෙතුමන්ලා සංවාදයට ලක් කරන්න හෝ මේ මතු කරන්න උත්සාහ කරන කාරණා ගැන බැලුවාම අපට හරි කනගාටුයි.

තනි තනි පුද්ගලයන් විධියට, තනි තනි ප්‍රතිරූප විධියට අපේ රටේ ඉතිහාසයේ එහෙම පැවතිච්ච දේශපාලනයක් -පක්ෂ නොවෙයි- තිබුණා. හැබැයි, ඒ තනි තනි ප්‍රතිරූප දැන් හොයාගන්න බැරි විධියට ඒවා පුංචි පුංචි කල්ලි, කණ්ඩායම් බවට පත් වෙලා තිබෙනවා. ඒ හමුවේ ජාතික ජන බලවේගය හුදු මහජනතාවගේ ශක්තිමත් දේශපාලන ව්‍යාපාරය බවට පත්වෙමින් රටේ අනාගතය භාර ගෙන තිබෙනවා. ඇත්තවශයෙන්ම කිව්වොත්, දැඩි සත්කාර ඒකකයේ හිටපු ලෙඩෙක් තමයි නැවත අපි සාමාන්‍ය වාට්ටුවට අරගෙන තිබෙන්නේ. තවම රෝගියා ගෙදර ගිහිල්ලා නැහැ. හොඳටම සුවපත් වෙලා නැහැ. හැබැයි, මාස 7ක් යනකොට ඒ අවදානම් සහගත පියවරෙන් අපි ඒ රෝගියා මුදාගෙන තිබෙනවා.

අදත් විපක්ෂයේ කිහිප දෙනෙක් කියනවා මට ඇහුණා, මොනවාද කරලා තිබෙන්නේ, මොකුත් කරලා නැහැ නේ කියලා. කරපුවා කියන්න ගියොත් ඒකට වෙනම විවාදයක් ඕනෑ. හැබැයි ආර්ථික වශයෙන් ගත්තත්, සමාජයීය, සංස්කෘතික වශයෙන් ගත්තත් රටක් විධියට අපි සෑම ක්ෂේත්‍රයකම පැහැදිලි ප්‍රගතියක් වාගේම ජයග්‍රහණ ගණනාවක් වෙනුවෙන් පියවර තබා තිබෙනවා. අපි භාරගත්ත මේ කඩාගෙන වැටිච්ච රටේ ආර්ථිකය විතරක් නොවෙයි, සමාජයීය, සංස්කෘතික වශයෙන් වේදනාවට පත් වෙච්ච මේ දේහයේ තිබෙන සියලුම තුවාල අපි සුවපත් කරමින් ඉන්නවා. සමාජ ජයග්‍රහණ ගැන අපට ඉලක්කම්වලින් කියන්නත් පුළුවන්; ඕනෑ තරම් කියන්න පුළුවන්. හැබැයි විපක්ෂයේ කෙඳිරිල්ල තමයි දැන් මේ තිබෙන්නේ. දැන් රට බලාපොරොත්තු වෙන්නේ මොකක්ද? පැහැදිලිවම බලාපොරොත්තු වෙන්නේ මෙවැනි එකක් නොවෙයි.

මාදුගොඩ මන්ත්‍රීතුමා තරුණයින්ගේ ප්‍රශ්නයක් ගැන කථා කළා. රතු තරුවක් ගෙනැල්ලා ගමේ යෞවන සමාජ, තරුණ සමාජවලට එකතු කරන්න හදනවාද, මොකක්ද එකක් එතුමා කියන්න හදනවා.

අපි එතුමන්ලාගෙන් අහනවා, තරුණයාගේ බලාපොරොත්තුව මොකක්ද කියලා. තරුණයින් සම්බන්ධයෙන් එදා එතුමන්ලාට තිබුණු වැඩ පිළිවෙළ මොකක්ද? "තාරුණ්‍යයට හෙටක්" කියන එක. දැන් කෝ ඒ හෙට? පසුගිය කාලයේ දරුවන්, තරුණයන් ආදි සෑම කෙනෙකුටම අදාළ කලාව, ක්‍රීඩාව ඇතුළුව සමාජ දේහයේ තිබිච්ච සෑම ක්ෂේත්‍රයකම තිබුණු ගරුත්වය නැති කළා; ඒ සියල්ල අභාග්‍යසම්පන්න ඉරණමකට ලක් කළා. මේ පාර්ලිමේන්තුවට නොගෙන්විය යුතු ක්ෂේත්‍රවල අය පවා ගෙන්නලා, හාමුදුරුවන් වහන්සේලාගේ ඉඳලා සෑම ක්ෂේත්‍රයකටම ඔබතුමන්ලා අත තියලා විනාශ කර තිබුණා. ඒ හැම දෙයක්ම නැවත ගොඩ නඟන වෙලාවක්, මේක. ඒ නිසා තරුණයා සංවර්ධනය කරන්නේ කොහොමද, තරුණයා සංවර්ධන ක්‍රියාවලියට දායක කර ගන්නේ කොහොමද කියන ප්‍රශ්න ද ඇතුළුව මේ වැටී තිබෙන තැනින් රට ගොඩ ගන්නේ කොහොමද කියන ප්‍රශ්නවලට විසඳුම් සහිත සංවර්ධන සැලැස්මක් අපට තිබෙනවා; සාර්ථක ඉලක්කයක් අපට තිබෙනවා. අන්න ඒ ඉලක්කය දිහා බලලා තමයි ජනතාව පළාත් පාලන මැතිවරණයේ ජයග්‍රහණය අපට ලබා දුන්නේ. එය මනින්නේ අංක, ඉලක්කම්වලින් නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා, අප මේ දේශපාලනයට ආවේ පළාත් පාලන ආයතනවලින් බව. මා නියෝජනය කළේ අම්බලන්තොට පළාත් පාලන ආයතනයක්. ඒ තමයි, අම්බලන්තොට ප්‍රාදේශීය සභාව. හැබැයි එතැන විපක්ෂයක් කියලා එකක් තිබුණේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් ඒ ගැන දන්නවා. එතැන සභාවක් තිබෙන්නේ. ඒ සභාවේ ඉන්න සභිකයන්ගෙන් තමයි සභාපතිවරයා තෝරන්නේ. ඒ, බහුතරයකගේ කැමැත්තෙන්. ඒකට වෙනත් ක්‍රමයක් නැහැ. අද බහුතරයේ කැමැත්ත කොතැනටද තිබෙන්නේ? මැතිවරණ එකින් එකට, හරි පිළිවෙළට මහ ජනතාවගේ කැමැත්ත ජාතික ජන බලවේගයට ලැබුණා. ඉලක්කම්වලින්ම බලනවා නම් සමහර තැන්වල සියයට 50ක ජනතා කැමැත්ත අපට ලැබුණා. හැබැයි පොදුවේ ගත්තොත්, අපට එරෙහිව ඡන්දය ඉල්ලපු, එහෙම නැත්නම් අපට එරෙහිව මතවාද දරන අයත් දන්නවා, ජාතික ජන බලවේගය මේ ගමන් කරන්නේ කොහේටද, මේ රට අරගෙන යන්නේ කොහේටද කියලා. ජනතාවගේ පැත්තෙනුත් ඡන්දය

ඉල්ලපු අය වෙත ඉල්ලීමක් තිබෙනවා, සංවර්ධනය වෙනුවෙන් එකතු වෙන්න කියලා. දැන් ගම අවශ්‍යයි රට හදන්න. අන්න ඒ තැනට බලය එකතු වන වෙලාවක්, මෙය. ඒ බලය නියෝජනය කරන අයට දැන් ගමේ ගරුත්වයක් හිමි වෙනවා. ඒක ඩීල් එකක් නොවෙයි. අපි ඒ අයට ආචාර කරනවා, ගෞරව කරනවා.

ගම හදන කටයුත්තට අදාළව ජාතික ජන බලවේගයේ වැඩ පිළිවෙළ හරියාකාරව තේරුම් ගත්තු ගමේ අනෙකුත් කොටස් දැන් පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව ජාතික ජන බලවේගයේ ගමන ශක්තිමත් කරනවා. හැබැයි කල්ලි, කණ්ඩායම් බවට පත් වෙලා, පුද්ගල ප්‍රතිරූප ගොඩ නඟාගෙන ඒ සභාවල බලය තමන් වෙතම තියා ගන්න උත්සාහ කරන, විපක්ෂයේ දේශපාලන පක්ෂ යැයි කියා ගන්නා අයට තවදුරටත් ජනතා වලංගුභාවය නැහැ. ඔවුන්ගේ පක්ෂවලින් ඡන්දය ඉල්ලපු ඒ සාමාජිකත්වයත් දන්නවා, ඒ පක්ෂවල හැසිරීම මොකක්ද කියලා. අද එම පක්ෂ ඉහළ සිට කුණු වෙලා ගඳ ගහමින් තිබෙන්නේ. ඒ නිසා ඒවා යාවත්කාලීන කරන්න බැහැ. ඒ තත්ත්වය පහළටත් කාන්දු වෙලායි තිබෙන්නේ. මේ අභියෝගය හමුවේ ජාතික ජන බලවේගය තමන්ගේ දේශපාලන සුජාතභාවය රැකගෙන කටයුතු කරනවා. ඩීල් දාලා නොවෙයි, ඒකාබද්ධව ප්‍රකාශ නිකුත් කරලා නොවෙයි අප කටයුතු කරන්නේ. හැබැයි රට හදන වැඩේට අපි අත් දෙකම ඔසවා පක්ෂපාති හැමෝටම ආරාධනා කරනවා. දැන් එතැනට එකතු වන ඒ ජන කැමැත්ත; ජන බලය තමයි අද පළාත් පාලන ආයතනවල අප ලබන ජයග්‍රහණ තුළින් පෙනෙන්නේ. අපි තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව මීට පෙර දෙවතාවක් ජයග්‍රහණය කළා. එය, ඒ කාලයේ අප බලය ලබා ගත්තු එකම එක ප්‍රාදේශීය සභාව. පසුව එයත් පවරා ගත්තා. ඉතිහාසයේ මහින්ද රාජපක්ෂලාගේ දේශපාලනය කොහේටද ගමන් කළේ කියලා අපි දන්නවා. අපි එහෙම දේශපාලනයක් නොවෙයි කරන්නේ. විපක්ෂයටත් ඒවායේ ඉඩ තිබෙනවා. අපි ඒ සංවර්ධන දිශාවටයි නැවත මේ රට ගමන් කරවන්නේ. ඒ ගමනට එක් වන ලෙසයි අප මේ රටේ සියලු ජනතාවට ආරාධනා කරන්නේ.

මේ පාර්ලිමේන්තුව ඇතුළු සියලු ආයතන පාවිච්චි කරලා රට පියවරෙන් පියවර ඉස්සරහට ගන්න පුළුවන් සෑම ව්‍යාපෘතියක් වෙනුවෙන්ම අපි ශක්තිය, ධෛර්යය ලබා දෙනවා. අපි හැමෝටම කියනවා, ජාතික ජන බලවේගයේ බලාපොරොත්තුව එය බව. අංක; ඉලක්කම් සහිතවත්, සමාජයීය, සංස්කෘතික, දේශපාලනමය වශයෙනුත් මේ රට ගොඩ නැඟීමේ ක්‍රියාවලිය වෙනුවෙන් අපි ඇප කැප වෙලා වැඩ කරනවා. දැන් ඒක ජන මතය බවට පත් වෙලා තිබෙනවා, ජන බලය බවට පත් වෙලා තිබෙනවා. ඒ ජන මතය, ජන බලය එක තැනකට එකතු වන වෙලාවක තනි තනි පුද්ගලයන්ගේ කෙඳිරිලිවලින් එය යටපත් කරන්න බැහැ කියලා අපි හිතනවා. අද පාර්ලිමේන්තුවෙනුත්, සෑම ආයතනයකිනුත් පෙනෙන්නේ ඒ මහජන ජයග්‍රහණයයි. අන්න ඒ ජයග්‍රහණය වෙනුවෙන් එකතු වෙච්ච සියලු ජනතාව ජාතික ජන බලවේගය විශ්වාස කරනවා. ඒ නිසා අපි විපක්ෂයට කියනවා, ඔබතුමන්ලාගේ මතය, ඔබතුමන්ලාගේ එකතුව, ඔබතුමන්ලාගේ ශක්තිය ඊට වඩා හොඳින් ප්‍රදර්ශනය කරන්න පුළුවන් වන විධියේ ප්‍රතිසංස්කරණයකට ඔබතුමන්ලා යන්න කියලා; ඒ ආකාරයට තමන්ගේ තැන නිර්මාණය කර ගන්න කියලා. එහෙම නැතුව අවලාද සහ මඩවලින් ඒක කරන්න බැහැ. මට කාලය ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.36]

ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அரசாங்கத்தின் வருமானத்தை அதிகரிக்கும் நோக்கில் இன்றைய தினம் கொண்டுவரப்பட்டுள்ள முத்திரைத் தீர்வை வரி (விசேட ஏற்பாடுகள்) சட்டத்தின் கீழான கட்டளை தொடர்பான விவாதத்தில் கலந்துகொள்வதையிட்டு நான் மகிழ்ச்சியடைகின்றேன்.

முத்திரைத் தீர்வை வரியை இரண்டு மடங்காக அதிகரிப்பதற்காகக் கொண்டுவரப்பட்டுள்ள இந்தப் பிரேரணைமூலம் அரசாங்கத்துக்கு நிறைய வருமானத்தை ஈட்டுவதற்குச் சந்தர்ப்பம் கிடைத்திருக்கின்றது. கடந்த மூன்று மாதங்களில் மட்டும் வாகன இறக்குமதிமூலம் அரசாங்கத்துக்கு 250 பில்லியன் ரூபாய் வருமானம் கிடைத்திருக்கிறது. அதேபோல், கடந்த 6 மாதங்களில் இலங்கை சுங்கத் திணைக்களத்தால் மட்டும் 975 பில்லியன் ரூபாய் வருமானம் கிடைத்திருக்கிறது. இந்த வருமானத்தின்மூலம் யுத்தத்தால் பாதிக்கப்பட்ட எங்களுடைய வடக்கு, கிழக்கு மாகாணங்களில் பல்வேறு அபிவிருத்தித் திட்டங்களை அரசாங்கம் மேற்கொள்ள வேண்டும் என்ற கோரிக்கையை நான் இங்கு முன்வைக்கக் கடமைப்பட்டு இருக்கின்றேன்.

கிழக்கு மாகாணம் என்பது பல்வேறு இயற்கை வளங்களைக்கொண்ட ஒரு மாகாணமாகும். இந்த ஆண்டு சமர்ப்பிக்கப்பட்ட வரவு செலவுத்திட்டத்தில்கூட, கிழக்கு மாகாணத்துக்கு மத்திய அரசால் நிதி ஒதுக்கீடு செய்யப் படவில்லை. இந்திய அரசாங்கத்தின் நிதி உதவியுடன் அங்கு அபிவிருத்தித் திட்டங்களை நடைமுறைப்படுத்துவதாகவே அதில் சொல்லப்பட்டு இருக்கின்றது. ஆனால், கிழக்கு மாகாணத்தில் இந்திய அரசாங்கத்தின் நிதி உதவிமூலம் எவ்வாறான அபிவிருத்திப் பணிகள் நடைபெறப்போகின்றன என்ற தகவல்களைக்கூட இதுவரை பெறமுடியாமல் இருக்கின்றது.

நமது நாட்டில் முக்கிய துறையாகக் காணப்படுகின்ற விவசாயத்துறை மூலம் அரசாங்கம் வருமானத்தைப் பெறக்கூடிய வழிமுறை ஒன்றை நான் சொல்கின்றேன். விவசாயத்துறையானது, நமது நாட்டுக்குப் பெருமளவு வருமானத்தை ஈட்டித்தரக்கூடிய ஒரு துறையாக விளங்குவது மாத்திரமல்ல, இலட்சக்கணக்கான ஏழை விவசாயிகள் பிரயோசனம் அடைகின்ற ஒரு துறையாகவும் காணப் படுகின்றது. எனவே, விவசாயத்துறைமூலம் ஈட்டப்படுகின்ற வருமானத்தைக்கொண்டு விவசாயிகள் பயன்பெறக்கூடிய திட்டங்களை மேற்கொள்ள வேண்டும். குறிப்பாக, வடக்கு, கிழக்கில் மாத்திரமல்ல, நாடு முழுவதும் வேளாண்மை அறுவடை செய்வதற்கு முன்னர், நெல் கொள்வனவுக்கான நிதியை திறைசேரி ஊடாக அரசாங்கம் ஒதுக்கிக் கொடுக்க வேண்டும். அத்துடன், அங்கு நெற்களஞ்சியசாலைகளை உருவாக்கி, விவசாயிகளின் நெல்லை நியாய விலைக்கு விற்பனை செய்யக்கூடியதொரு வேலைத்திட்டத்தையும் இந்த அரசாங்கம் மேற்கொள்ள வேண்டுமென நான் வட, கிழக்கு மாகாண விவசாயிகள் சார்பில் கேட்டுக் கொள்கின்றேன். ஏனெனில், சென்ற வருடம்கூட இரண்டு தடவை வெள்ளம் ஏற்பட்டதனால் எங்களுடைய விவசாயிகள் பாரியளவு நஷ்டம் அடைந்தார்கள். எதிர்வரும் யூலை மாத ஆரம்பத்தில்

[ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා]

எங்களுடைய அம்பாறை மாவட்டத்தில் நெல் அறுவடை இடம்பெற இருப்பதால், அரசாங்கமானது விசேட கவனத்தைச் செலுத்தி, நெல்லுக்குரிய உத்தரவாத விலையை நிர்ணயிக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

அம்பாறை மாவட்ட விவசாயிகளின் நெல்லை உலர்த்தி எடுப்பதற்கான இயந்திரங்களை நெல் சந்தைப்படுத்தும் சபைக்கு வழங்குவதற்கு அரசாங்கம் தீர்மானித்திருக்கிறது. வளத்தாப்பிட்டி மற்றும் உகன பிரதேசங்களுக்கு இந்த இயந்திரங்கள் கொடுக்கப்பட்டு இருக்கின்றதென நான் நினைக்கின்றேன். எங்களுடைய அம்பாறை மாவட்டம் விவசாயத்துறைக்குப் பெரும் பங்களிப்புச் செய்கின்ற ஒரு மாவட்டம் என்பதனால், நிதி அமைச்சினூடாக விசேட நிதியை ஒதுக்கி, நெல் உலர்த்தும் இயந்திரங்களை பொத்துவில், அக்கரைப்பற்று, அட்டாளைச்சேனை, திருக்கோவில் போன்ற பிரதேசங்களுக்கும் வழங்குவதற்கான ஏற்பாடுகளைச் செய்ய வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்தப் பாராளுமன்றத்தில் ஆளும் கட்சியில் இருக்கும் முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்கள் சிலர் கடந்த சில தினங்களாகப் பல்வேறு விமர்சனங்களை முன்வைத்து வருகின்றார்கள். முதலில் நாங்கள் இந்த நாட்டின் அரசியல் வரலாற்றைப் பார்க்க வேண்டும். இந்த நாட்டில் ஒவ்வொரு காலகட்டத்திலும் இருந்த முஸ்லிம், தமிழ் மற்றும் சிங்களத் தலைவர்கள் எல்லோரும் தங்களால் இயன்ற பணியைச் செய்திருக் கிறார்கள். எங்களுடைய முஸ்லிம் தலைவர்கள் கடந்த காலங்களில் எமது சமூகத்துக்கு எதுவும் செய்யாதவர்கள் போன்று புதிதாக வந்துள்ள ஆளும் கட்சியைச் சேர்ந்த முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்கள் இந்தச் சபையில் பேசியதைக் கேட்டு நான் மனவருத்தம் அடைந்தேன். மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்களின் ஆளுமை காரணமாகத்தான் 159 உறுப்பினர்கள் தேசிய மக்கள் சக்தி சார்பில் இந்தச் சபைக்குத் தெரிவானார்கள். நேற்று முன்தினம் மாண்புமிகு சனாதிபதி அவர்களின் தலைமையில் நடைபெற்ற கூட்டத்தின்போது, நான் அவரிடம் இதனைச் சொன்னேன். அவருடைய நாமத்தால் இந்தச் சபைக்கு வந்தவர்கள், இந்தச் சபையில் இருந்து பெரும் பணிகளைச் செய்த எங்களுடைய தலைவர்களை விமர்ச்சிக்கின்றார்கள்.

இந்த நாட்டில் பாரிய யுத்தமொன்று நடைபெற்றது உங்களுக்குத் தெரியும்! அதனால் 30 ஆண்டுகள் மூன்று சமூகத்தினரும் பாதிக்கப்பட்டார்கள். அதுமாத்திரமன்றி, இந்த நாட்டில் இனவாதமும் கட்டியெழுப்பப்பட்டது. கடந்த அரசாங்க காலத்தில் நாங்கள் இனவாதத்தின் உச்சத்தைக் கண்டோம். முஸ்லிம் சமூகமும் தமிழ்ச் சமூகமும் சிங்களச் சமூகமும் நிம்மதியாக வாழ முடியாத ஒரு சூழல் இந்த நாட்டில் இருந்தபோதெல்லாம், முஸ்லிம் தலைவர்கள்தான் எங்களுடைய முஸ்லிம் சமூகத்துக்காகப் பேசினார்கள் என்பதை மறைத்து, இங்கு சில புதிய பாராளுமன்ற உறுப்பினர்கள் பேசுவதையிட்டு நான் வேதனைப் படுகின்றேன்.

முன்னாள் சனாதிபதி கோட்டாபய ராஜபக்ஷ அவர்களுடைய ஆட்சிக் காலத்தில் முஸ்லிகளுக்கு எதிராகப் பாரியளவில் இனவாதம் கட்டியெழுப்பப்பட்டது உங்களுக்குத் தெரியும்! குறிப்பாக, ஆயிரம் பௌத்த மதத் தலைவர்களை ஒன்று திரட்டி, கண்டியிலிருந்து கொழும்பு வரை ஆர்ப்பாட்டமொன்றை முன்னெடுத்தார்கள். அப்பொழுது, அரசாங்கத்தில் இருந்த முஸ்லிம் அமைச்சர்கள், இராஜாங்க அமைச்சர்கள், பிரதி அமைச் சர்கள் என எல்லோரும் முஸ்லிம் சமூகத்துக்காக ஒற்றுமைப்பட்டு, ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸின் தலைவரான அல்ஹாஜ் ரஊப் ஹகீம் அவர்களுடைய தலைமையில் ஒன்றுகூடி, இதற்கு முடிவொன்றை எடுக்குமாறு சொன்னார்கள். இந்த நாட்டிலுள்ள பெரும்பான்மை முஸ்லிம்களின் ஆதரவைப் பெற்ற ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸின் தலைவர் உட்பட எல்லோரும் தங்களின் அமைச்சுப் பதவிகளை இராஜினாமா செய்வதாக முடிவு எடுத்தார்கள். அதன் அடிப்படையில், அவர்கள் தங்களது அமைச்சுப் பதவிகளை உடனடியாக இராஜினாமா செய்தார்கள். கோட்டாபய ராஜபக்ஷ அவர்களுடைய ஆட்சிக் காலத்தில் கட்டியெழுப்பப்பட்ட உச்ச இனவாதத்தை எதிர்த்து எங்களுடைய முஸ்லிம் அமைச்சர்கள் தங்களது பதவிகளைத் தூக்கி எறிந்தார்கள் என்பதை நான் உங்களுக்குச் சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

இங்கு விமர்சனங்களை முன்வைக்கின்ற முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்களிடம் நான் ஒரு விடயத்தைக் கூறிக்கொள்ள விரும்புகின்றேன். நாங்கள் மக்களுக்காகப் பேசுகின்றோம்; அவர்களுக்காகக் குரல்கொடுக்கின்றோம். அரசாங்கம் செய்கின்ற நல்ல பணிகளுக்கு ஆதரவு வழங்குகின்றோம். ஆனால், எங்களுடைய சமூகம் தொடர்பான விடயத்தில் அக்கறையுடன் இருக்கின்றோம். கடந்த காலங்களில் ஆட்சிக்கு வந்த எல்லோரும் முஸ்லிம், தமிழ் மக்களின் ஆதரவைப் பெற்றுத்தான் ஆட்சிக்கு வந்தார்கள். இந்த நாட்டினுடைய பாராளுமன்ற வரலாற்றை எடுத்துப் பாருங்கள்! முன்னாள் சனாதிபதி சந்திரிக்கா அம்மையார் தொடக்கம் தற்போதைய சனாதிபதி மாண்புமிகு அநுர குமார திஸாநாயக்க அவர்கள் வரையுள்ள அனைத்து சனாதிபதி களுக்கும் முஸ்லிம் சமூகம் ஆதரவளித்து இருக்கிறது. அதனை நாங்கள் மறுக்க முடியாது.

எனவே, எங்களுடைய தலைவர்களையும் பாராளுமன்ற உறுப்பினர்களையும் ஆளும் கட்சியிலுள்ள முஸ்லிம் உறுப்பினர்கள் இங்கு கொச்சைப்படுத்தக் கூடாதெனக் கேட்டுக் கொள்கின்றேன். எல்லோரும் ஒற்றுமையாக இருந்து நாட்டில் நல்லதொரு நிலைமையைக் கொண்டுவர வேண்டுமென்றுதான் மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள் சொல்கின்றார். ஆனால், அவருடைய தலைமையில் பாராளுமன்றத்துக்கு வந்த சிலர் எங்களுடைய பெரும் தலைவர்களை அவமானப்படுத்துவது எங்களைப் பொறுத்தவரை பாரிய அநீதியாகும். அப்படிச் செய்தால், சம்பந்தப்பட்டவர்களுடைய செயற்பாடுகளையும் நாங்கள் இங்கு சொல்லவேண்டி வரும். அம்பாறை மாவட்டத்தில் நடக்கின்ற விடயங்களை நாங்கள் தொகுத்திருக்கின்றோம். "நீங்கள் எதிர்க்கட்சியில் இருக்கும்போது எப்படி பணி செய்தீர்களோ அதேபோன்று, நாங்களும் எதிர்க்கட்சியில் இருந்து filesஐ வைத்துக்கொண்டு ஜனநாயக ரீதியில் பணி செய்கின்றோம்" என நேற்று நான் சனாதிபதி அவர்களிடம் சொன்னேன்.

இங்கு விமர்சனங்களை முன்வைக்கின்ற உறுப்பினர் களிடம் நான் ஒன்றைச் சொல்லிக்கொள்ள விரும்புகின்றேன். ருஷ்தி என்ற முஸ்லிம் இளைஞன் பயங்கரவாதத் தடைச் சட்டத்தின்கீழ் கைதுசெய்யப்பட்டது உங்களுக்குத் தெரியும்! அப்போது முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்களாகிய நாங்கள் அதற்கெதிராக இந்தச் சபையில் குரல் கொடுத்தோம். அவ்வாறு கைதுசெய்யப்பட்டது பிழையெனச் சொன்னோம். நீங்கள் அதற்கு எதிராகப் பேசினீர்களா? அவ்வாறு உங்களால் பேச முடியுமா? அப்போது உங்களுடைய குரல்கள்

நசுக்கப்பட்டிருந்தன. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு முன்வைத்திருக்கின்ற பரிந்துரையைப் பாருங்கள்! அது தொடர்பான ஆவணத்தை நான் இந்தச் சபையில் ***சமர்ப்பிக்கின்றேன்.**

இலங்கை மனித உரிமைகள் ஆணைக்குழுவின் பரிந்துரை:

பயங்கரவாதத் தடுப்புச் சட்டத்தின்கீழ் - PTA இன்கீழ் - முஹம்மது லியாவுதீன் முஹம்மது ருஷ்தியை கைதுசெய்து தடுத்து வைத்தது, அதைத் தொடர்ந்து அவருக்கு எதிராகத் தடுப்புக்காவல் உத்தரவு பிறப்பித்தது தொடர்பான முறைப்பாடு. முறைப்பாட்டு எண் 08-25.

திரு. ருஷ்தியை 22 மார்ச் 2025 அன்று இலங்கை காவல் துறையின் பயங்கரவாத எதிர்ப்பு மற்றும் புலனாய்வுப் பிரிவு கைதுசெய்து தடுத்து வைத்தது. 24 மார்ச் 2025 அன்று பாதுகாப்பு அமைச்சரான மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள் ருஷ்திக்கு எதிராக தடுப்புக்காவல் உத்தரவொன்றைப் பிறப்பித்தார். திரு. ருஷ்தி மீதான முதன்மையான குற்றச்சாட்டு, கொழும்பு நகர மையத்தில் "Fuck Israel" என்ற சொற்றொடரைக்கொண்ட இரண்டு stickersஐக் காட்சிப்படுத்தியது. இருப்பினும், PTAஇன்கீழ் அவர் ஏதேனும் குற்றத்தைச் செய்ததற்கான ஆதாரங்கள் இல்லாததால் 14 நாட்களுக்குப் பின்னர் அவருக்கு எதிரான தடுப்புக்காவல் உத்தரவு இடைநிறுத்தப்பட்டு, 07 ஏப்பிரல் 2025 அன்று விடுவிக்கப்பட்டார்.

இந்த விடயம் தொடர்பில் இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு 2025ஆம் ஆண்டு ஏப்பிரல் மாதம் 10ஆம், 21ஆம் திகதிகளில் விசாரணைகளை நடத்தியது. அதன்போது, திரு.ருஷ்திக்கும் அவரது பிரதிநிதிகளுக்கும் CTID அதிகாரி களுக்கும் ஆணைக்குழுவால் எழுப்பப்பட்ட கேள்விகளுக்கு பதிலளிக்கவும் சமர்ப்பணங்களைச் செய்யவும் வாய்ப்பு வழங்கப்பட்டது. விசாரணைகள் முடிவடைந்து, CTIDஆல் வழங்கப்பட்ட ஆவணங்களை முழுமையாக மதிப்பாய்வு செய்த பிறகு, இந்த முறைப்பாடு தொடர்பாக ஆணைக்குழு தனது பரிந்துரைகளை 12 யூன் 2025 அன்று முன்வைத்தது. அதன்படி, மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்களின் தடுப்புக்காவல் உத்தரவின்கீழ் திரு. ருஷ்தி அவர்கள் தடுத்து வைக்கப்பட்டமை தவறு என்றும் திரு. ருஷ்தி அவர்களுக்கு நஷ்டஈடாக NPP அரசாங்கம் இரண்டு இலட்சம் ரூபாயை வழங்க வேண்டும் என்றும் இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு பரிந்துரை செய்கின்றது.

இதை மாண்புமிகு சனாதிபதி அவர்களிடம் சொல்லுங்கள்!

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நாங்கள் இந்த நாட்டினுடைய தேசிய பாதுகாப்புக்கு எப்போதும் ஒத்துழைப்பு வழங்கி இருக்கிறோம். வடக்கு, கிழக்கிலே பாரிய யுத்தம் நடைபெற்ற காலத்திலே வாழ்ந்த வர்கள் நாங்கள். எங்களை இந்தப் பாராளுமன்றத்திலே 'சும்மா' நினைக்காதீர்கள்! எங்களுடைய உரிமைகள் மறுக்கப்பட்ட நிலைமையில்தான் இன்று நாங்கள் பாராளுமன்றத்துக்கு வந்திருக்கின்றோம். எங்களுக்கு நிறைய வேதனைகள் இருக்கின்றன. கடந்தகால நிலைமைகளை விடுங்கள்! கடந்த காலங்களில் யாரும் தவறு செய்திருந்தால் சட்டத்திற்குப் பொறுப்பான அமைச்சர் நடவடிக்கை எடுப்பதில், சம்பந்தப் பட்டவர்களுக்குத் தண்டனையை வழங்குவதில் எங்களுக்கு எந்தப் பிரச்சினையுமில்லை. ஆனால், மக்களுக்குரிய நல்ல விடயங்களைச் செய்வதற்கு நீங்கள் எல்லோரும் ஒத்துழைப்பு வழங்கவேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன்.

පුස්තකාලයේ තබා ඇත.
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

இலங்கையைப் பொறுத்தவரையிலே, ஈரான் பல உதவிகளைச் செய்துள்ளது. இதுதொடர்பாக நேற்றையதினம் கௌரவ உறுப்பினர் ஒருவர் பேசியிருந்தார். அதை நான் கேட்டுக் கொண்டிருந்தேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
කරුණාකරලා මට තව විනාඩියක් දෙන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා.

ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
ஈரான் நாடு நமது பொருளாதாரத்திற்கு மாத்திரமல்ல, நீர்ப்பாசனம் உட்பட பல விடயங்களுக்கும் எங்களுக்கு உதவி வழங்கியிருக்கின்றது. இஸ்ரேல் மனிதாபிமானமற்ற முறை யிலே ஈரானுடன் சண்டையிட்டு இன்று இந்த உலகத்திலே அமைதியில்லாத நிலைமையை ஏற்படுத்தியிருக்கின்றது. அதற்காக இங்கே எங்களுடைய முஸ்லிம் உறுப்பினர்கள் யார் குரல் கொடுத்தார்கள்? நாங்கள் உண்மை யைப் பேசுவோம். இந்த முக்கியமான காலகட்டத்திலே, இஸ்ரேலுடைய கொடுமைகளைப் பற்றி, இஸ்ரேல் பலஸ்தீனுக்குச் செய்த அநியாயங்களைப் பற்றி இலங்கை அரசாங்கம் குரல் கொடுக்க வேண்டுமென்று கேட்டு, வாய்ப்புக்கு நன்றிகூறி விடைபெறுகின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) අනිල් ජයන්ත ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.48]

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் பொருளாதார அபிவிருத்திப் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Economic Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද දින විවාදයට ගැනුණු මේ අතිවිශේෂ ගැසට් නිවේදන පදනම් කරගත් සාකච්ඡාවේදී ආදායම් කළමනාකරණය සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් වුණා. ඇත්තටම මෙහි පදනම වෙන්නේ, අපි 2025 වර්ෂයට ඉලක්කගත ආදායමක් ඉදිරිපත් කර තිබෙනවා, රුපියල් බිලියන 4,990ක. එය විධිමත් ආකාරයට අයකර ගැනීමේදී අය වැය කථාවේදී ඉදිරිපත් කළ ආකාරයටම ඒ ආදායම් එකතු කර ගැනීමේ ක්‍රියාවලියට සම්බන්ධ වෙන ක්‍රියාවක් තිබෙන්නේ. කෙසේ වෙතත්, මේ විවාදය ඇතුළේ මෙම ප්‍රස්තුත කාරණයට වඩා එහා ගිය කරුණු තමයි බොහෝදුරට ඉදිරිපත් වුණේ. මේ මුද්දර බදු වැඩි කිරීමත්, ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ඉදිරිපත් කරන ලද රෙගුලාසිවලින් පැන නැඟෙන කාරණාත් අපි තනි තනිව අරගෙන විශ්ලේෂණය කිරීමෙන්

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

නිවැරදි ආර්ථික විද්‍යාත්මක තත්ත්වය එළියට ගන්න බැහැ. අපි සමස්ත තත්ත්වය තේරුම් ගන්නට ඕනෑ. එකක්, අපි ආණ්ඩුව ගන්නකොට තිබුණු තත්ත්වය. මේ පිළිබඳව තනි තනි කාරණා අරගෙන පදනම් විරහිත වැරදි සහගත තොරතුරු ඉදිරිපත් කරන විපක්ෂයේ සිටින කණ්ඩායම් තමයි විශේෂයෙන් මේ තත්ත්වයට වග කියන්න ඕනෑ. හැබැයි, අපි ඒ වගකීම භාර අරගෙන ඉතාම කෙටි කාලයයි. ඒ කාලය ඇතුළතදී අපට තිබුණු ප්‍රධානම වගකීම තමයි ආර්ථිකය ස්ථාවර කර ගන්නේ කොහොමද, මේ රට ස්ථාවර කර ගන්නේ කොහොමද කියන එක. අපට ජයග්‍රහණය කරන්න අභියෝග ගණනාවක් තිබෙනවා. මේ වෙනකොට දේශීය වශයෙන් සහ ජාත්‍යන්තර වශයෙන් ඒ ස්ථායීකරණයේ පදනම වැටිලා ඉවරයි. ඒ පිළිබඳ ප්‍රාමාණික දැනුම තිබෙන අය, ආයතන, රාජ්‍ය තාන්ත්‍රික ආයතන සියල්ලක්ම මේ විශ්වාසනීයත්වය ගොඩ නඟනවා, ක්‍රමිකව ස්ථාවරව ඉදිරියට එනවා කියලා පෙන්වනවා.

ඔබ දකින්න ඇති, දවස් කිහිපයකට පෙර ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ශ්‍රී ලංකා මහ බැංකුව සහ මුදල් අමාත්‍යාංශය ඒකාබද්ධව විශේෂ සම්මන්ත්‍රණයක් සිදු කරනු ලැබුවා. එහිදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පළමු නියෝජ්‍ය කළමනාකාර අධ්‍යක්ෂිකා ගීතා ගෝපිනාත් ඉදිරිපත් කරපු කථාවත්, ඒ වාගේම අපේ අතිගරු ජනාධිපති අනුර දිසානායක මහතා ඉදිරිපත් කරපු කථාවත් ඇතුළේ මේ ස්ථායීකරණයේ පදනම ඔවුන් පිළිගත්තා. අපි දන්නවා, 2024 වර්ෂයේදී සියයට 5ක වර්ධනයක් අත්පත් කරගෙන තිබෙන බව. ඒ වාගේම 2025දීත් ඒ හා සමාන වර්ධනයක් බලාපොරොත්තුවෙන් ඉන්නවා. ඒ වාගේම ජනාධිපතිතුමා පැහැදිලිව කිව්වා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මේ තත්ත්වයට මැදිහත් වුණු නිසා දැන් වර්ධනයක් ඇති වෙලා තිබෙන බව. හැබැයි, අපට තිබෙන ස්වාධීනත්වය මත අපේ ආර්ථිකය ප්‍රසාරණය කරගෙන ඉදිරියට යනකොට, අපි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් මේ වාගේ විස්තීර්ණ ණය පහසුකමක් ලබා ගැනීමේ අවසානය මෙය විය යුතුයි කියලා සඳහනක් කළා. එය ඇත්තටම අනුමත කළා, ගීතා ගෝපිනාත්. ඒ වාගේම ඇයගේ කථාවේදී පෙන්නුම් කළා, අපි සියයට 5ක් විතර පුරෝකථනය කළාට ලංකාව මේ යන විදියට අපි ලබා ගත් ස්ථාවරත්වය, මේ දාලා තිබෙන පදනම, විශේෂයෙන්ම වංචා, දූෂණවලින් තොර කිරීමේ පදනමත් එක්ක ලංකාවට සියයට 7ක, 8ක වර්ධනයක් ලබා ගැනීමේ හැකියාවක් තිබෙනවා කියලා. ඒ අනුවම තමයි අපි පළමුවෙනි කාර්තුවේදී සියයට 4.8ක වර්ධනයක් පෙන්නුම් කරන්නේ. එය ප්‍රශ්නකාරීව පෙන්වූවා, ගිය අවුරුද්දේ සියයට 5ක් ගත්තා, මේ අවුරුද්දේ සියයට 4.8යි කියලා. නමුත් මේ ප්‍රවණතාව අවුරුද්ද පුරා යන හැටි තමයි අපට වැදගත් වෙන්නේ.

විශේෂයෙන්ම මේ පළමුවෙනි කාර්තුවේ සියයට 4.8ක් ලබා ගැනීමත් විශේෂ ජයග්‍රහණයක්. ඒකට හේතුව අපි කවුරුත් දන්නවා. අපි ආණ්ඩුව ගත්ත ගමන් අතුරු සම්මත ගිණුමක් මඟින් මුදල් වියදම් කළා. හැබැයි, අපට ප්‍රමාණාත්මකව අපේ ප්‍රාග්ධන වියදම් ඉදිරියට ගෙනියන්න බැරි වුණා, අය වැය සම්මත කර ගන්නකල්. අය වැය සම්මත කරලා දැන් ඉදිරි කටයුතු ඉස්සරහට යනකොට තවමත් අපේ සමස්ත ප්‍රාග්ධන වියදම්වලින් ටිකයි වියදම් වෙලා තිබෙන්නේ. එතකොට ප්‍රාග්ධන වියදම් ටිකක් නම් වියදම් වෙලා තිබෙන්නේ, අඩු වර්ධනයක් තමයි තිබෙන්නේ. එවැනි තත්ත්වයකදීත් සියයට 4.8ක් කියන්නේ, අනිවාර්යයෙන්ම අපි බලාපොරොත්තු වෙන ඉලක්කයට යන්න පුළුවන් ස්ථාවරත්වය පෙන්නුම් කරනවා. මේ ස්ථාවරත්වය ආණ්ඩුවේ ආදායම් එකතු කර ගැනීමේදී කැපී පෙනෙන ලෙස පෙන්නුම් කරනවා. එය සංඛ්‍යා දත්ත අනුව ගත්තොත්, රේගු දෙපාර්තමේන්තුවේ මැයි මාසයේ අග වෙනකොට ඔවුන්ගේ ඉලක්කගත ආදායම රුපියල් බිලියන 730ක් වුවත්, රුපියල් බිලියන 794ක් එකතු කරලා තිබෙනවා. ඒක රේගු දෙපාර්තමේන්තුවේ සියයට 109ක ප්‍රගතියක්. ඒ වාගේම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව රුපියල් බිලියන 907ක් එකතු කරලා තිබෙනවා. එය සියයට 1ක වර්ධනයක්. සුරාබදු දෙපාර්තමේන්තුව රුපියල් බිලියන 114යි, එය සියයට 103ක වර්ධනයක්. සමහර අවස්ථාවල විපක්ෂය මහජනතාව නොමග යවන, භය ඇති කරන දත්ත ඉදිරිපත් කරනවා. කලින් අදහස් දැක්වූ මන්ත්‍රීවරයා කිව්වා වාහන ආනයනය කරලා, වාහනවලට විශාල වශයෙන් බදු ගහලා මේ වෙනකොට අපි රුපියල් බිලියන 970ක් අය කරගෙන තිබෙනවා කියලා. ඇත්තටම, හරියටම රේගු දෙපාර්තමේන්තුව 2025 ජූනි 19වන දා වෙනකොට එකතු කර ගත් සියලු රේගු බදුවල එකතුව, -වාහන ඇතුළු අනෙකුත් සියලු දේවල්වලින්- රුපියල් බිලියන 919යි. එතුමා ඒ ප්‍රමාණය රුපියල් බිලියන 970ක් කිව්වා. ඒ දත්ත ඉදිරිපත් කිරීම වැරදියි. ඒවා ඉතාම නොමග යවනසුලු දත්ත.

මේ මොහොතේ විපක්ෂයේ කාර්යභාරය වී තිබෙන්නේ තමන්ගෙන් ගිලිහී ගිය බලය ආරක්ෂා කර ගැනීමට විවිධ වූ උපක්‍රම දරන ගමන් රට ඇතුළේ අවිශ්වාසය නිර්මාණය කිරීම, භය නිර්මාණය කිරීම සඳහා කතන්දර ගොතන එක කියලා මම හිතනවා. අපේ රට මුහුණ දීලා තිබුණු තත්ත්වයත්, රට වට්ටලා තිබුණු තත්ත්වයත් තේරුම් ගෙන, ඇත්තටම රට වට්ටපු අයටත් සැබෑ ලෙස මෙතැනට මැදිහත් වෙන්න ඕනෑ නම් ඉදිරිපත් වී මේ රට ගොඩ නැඟීමේ කාර්යයට දායක වීම තමයි වග කිව යුතු පුරවැසියකු හැටියට කළ යුත්තේ. එහෙම නැතිව අවිශ්වාසය නිර්මාණය කිරීම නොවෙයි කියන කාරණය මම සඳහන් කරන්න කැමැතියි.

ආයෝජකයන් ආපසු යනවා වාගේ විවිධ කතන්දර විපක්ෂය කිව්වා. ඇත්තටම ඒවා අසත්‍ය. පසුගිය කාලය ඇතුළත, අපේ ආණ්ඩු කාලය තුළ විශාල පරිමාණයෙන් ආයෝජන ආවා කියලා අපි කියන්නේ නැහැ. ඇත්තටම අපේ ආණ්ඩුව පත් වුණු දවසේ ඉඳලා පසුගිය මැයි මාසය දක්වා ඩොලර් මිලියන 650කට අධික විදේශ ආයෝජන ඇවිල්ලා තිබෙනවා. අපි දන්නවා, ඒක ප්‍රමාණවත් නැති බව. අපි හෙමින්, ක්‍රමිකව ඉදිරියට යමින් සිටිනවා. එහෙම නම් මේ මොහොතේ වගකීම වන්නේ තව තව විදේශ ආයෝජන කැන්දා ගැනීමට වැඩ කටයුතු කරන එක මිසක්, විදේශ ආයෝජන අධෛර්යවත් කරන්න කටයුතු කිරීම නොවෙයි. ජනතාවගේ පැත්තෙන් බැලුවොත්, ඒක එතරම් හොඳ දෙයක් නොවෙයි.

අද ප්‍රස්තුත කාරණයක් බවට පත් වෙනවා, මුද්දර බදු වැඩි කිරීම. ඇත්තටම 1982 අංක 43 දරන මුද්දර බදු පනත යටතේ, මුද්දර බදු තිබුණේ රුපියල් 1,000කට රුපියල් 20ක් ලෙස. ඊට පස්සේ කුමක් හෝ හේතුවක් නිසා 2006දී එය රුපියල් 10ක් බවට අඩු කරලා තිබුණා. ඇත්තටම අවුරුදු 20කින් එය වෙනස් කිරීමකට ලක් කරලා නැහැ. අපි මේ සිද්ධ කරන්නේ අතිරේකව බදු අය කිරීමක් නොවෙයි. Revenue-based fiscal consolidation කියන කාරණයේදී රටේ බදු අය කර ගත යුතු වන්නේ ඉතාම සාධාරණ, කාර්යක්ෂම පදනමකින්. එතැනදී පුළුවන් තරම් දුරට අපේ උත්සාහයක් තිබෙනවා, අනාගතයේදී වැට් වාගේම වක්‍ර බදු අඩු කර ගන්න. එහෙම නම් නිශ්චිතව හඳුනා ගත් ඉලක්කගත බදු වැඩි කර ගන්නට ඕනෑ. මෙතැනදී වැඩි කරලා තිබෙන්නේ සියලු මුද්දර බදු නොවෙයි. විපක්ෂයේ ගරු මන්ත්‍රීවරයෙක් කිව්වා, මුද්දර බදු දෙගුණයක් කරලා කියලා. මිනිස්සු භය වෙනවා. මුද්දර බදු අය කරන ක්ෂේත්‍ර 9ක් තිබෙනවා. ඒ ක්ෂේත්‍ර 9න් එක ක්ෂේත්‍රයක් වන දේපොළවලට විතරයි මේ මුද්දර ගාස්තු වැඩි කරන්නේ. ඒ වැඩි කරන්නෙත් කලින් තිබුණු තත්ත්වය වන, ඒ කියන්නේ 1982 පනතේ තිබුණු තත්ත්වය මිසක් අලුත් තත්ත්වයක් නොවෙයි. අපි උද්ධමනකාරී තත්ත්වයක අවුරුදු 20ක්, 30ක් ගිහිල්ලාත් අනවශ්‍ය බරක් මහ ජනතාවට පටවලා

නැහැ. ඒ වාගේම මෙතැනින් අපට වාසියක් ලැබෙනවා. මොකද, මේ ලබා ගන්නා මුදල් යන්නේ පළාත් සභාවලට. එතකොට පළාත් සභාවල වියදම් කළමනාකරණය කිරීමේදී මේවා යොදා ගන්නවා. තව භයක් හැදුවා, මේ මුද්දර ගාස්තු වැඩි කළේ මිනිස්සුන්ට පඩි ගෙවා ගන්න බැරිව කියලා. ඒක වැරදියි. මේ මුද්දර ගාස්තු අය කළත්, නැතත් මහා භාණ්ඩාගාරයෙන් පළාත් පාලන ආයතනවලට, පළාත් සභා සේවකයන්ට වැටුප් දෙන්න මුදල් සූදානම් කරලා තිබෙනවා. එය ඉතාම වැරදි සහගත තොරතුරක්.

අද විවාදයට ගැනෙන අනෙක් කාරණය තමයි ආනයන හා අපනයන (පාලන) පනත යටතේ වන රෙගුලාසි. ඒකත් මෙහෙම තේරුම් ගන්නට ඕනෑ. අපි ආනයන අපනයන සාමාන්‍ය පරිදි කරගෙන ආවා. ලංකාව ඇතුළේ ආනයනය කිරීමේදී ප්‍රධාන වශයෙන් අපට නිදහසේ ආනයනය කරන්න පුළුවන් භාණ්ඩ වර්ග තිබෙනවා. ඒ වාගේම ආනයන බලපත්‍ර යටතේ ආනයන කළ යුතු භාණ්ඩ තිබෙනවා. හැබැයි අපි කවුරුත් දන්නවා, මේ සියලු කාණ්ඩ 2020දී ඇති වුණු තත්ත්වයත් එක්ක තාවකාලික තහනමකට ලක් කළ බව. එසේ තාවකාලික තහනමට ලක් කරලා ක්‍රමයෙන් මේ ආර්ථිකය ගොඩ නඟනකොට, විශේෂයෙන්ම අපි ආණ්ඩුව ලබා ගත්තාට පසුව මේ ආර්ථිකය යථා තත්ත්වයට පත් කරන්නේ කොහොමද, මේ ආනයන සීමා ක්‍රමිකව ඉවත් කර ගන්නේ කොහොමද කියලා කල්පනා කරලා බැලුවා. වාහන ආනයනය හැර, සාමාන්‍ය තත්ත්වය යටතේ තිබුණු සියලු කාණ්ඩයන්ගේ ආනයන තහනම 2023 ඔක්තෝබර් මාසය වෙනකොට අයින් වෙලා තිබුණා. අපේ ආණ්ඩුව යටතේ ඒ වාහන ආනයන තහනමත් කාණ්ඩ 3ක් යටතේ ක්‍රමිකව අයින් කරලා දැම්මා. ඊට පස්සේ ඉතුරු වෙලා තිබුණේ විශේෂ ආනයන බලපත්‍ර යටතේ ආනයනය කරන කාණ්ඩ. ඒ යටතේ එම ක්ෂේත්‍රවල ඉල්ලීම, ව්‍යාපාරික තත්ත්වයන් සැලකිල්ලට භාජන කරමින් ක්‍රමිකවයි අපි තීන්දුව ගත්තේ. මොකද, රට තුළ විශ්වාසය ගොඩ නැඟෙන්න නම් ඇත්තටම ආනයනය එන්නට ඕනෑ; නිෂ්පාදනය වැඩි වෙන්නට ඕනෑ; ආර්ථිකය ප්‍රසාරණය වෙන්නට ඕනෑ. ඒ අනුව මේ පනත යටතේ දී ඉදිරිපත් කරලා තිබෙනවා, භාවිත කරන ලද උණුසුම් ඇඳුම්. එය උපායමාර්ගිකව වැදගත් එකක් නොවුණත්, පවතින තත්ත්වය යටතේ කලින් මේ තත්ත්වය පාවිච්චි කරපු නිසා අපි උපක්‍රමශීලිව මේ කාණ්ඩය අවුරුදු තුනක් ඇතුළතදී අවසාන කරනවා.

ඒ වාගේම, වාහන එකලස් කිරීමේ සහ අලුත්වැඩියා කිරීමේ උපකරණ පිළිබඳව ගත්තොත්, එතැනදීත් වැරදි තොරතුරක් ඉදිරිපත් කරනවා, ඩීසල් එන්ජින් විතරක් ගෙනෙන්න දෙනවා; පෙට්‍රල් එන්ජින් ගෙනෙන්න දෙන්නේ නැහැ කියලා. ඒක බොරු. පෙට්‍රල් එන්ජින්වලට එහෙම තහනමක් තිබුණේ නැහැ. ඒ වාගේම ක්‍රීඩා උපකරණ සඳහා මැෂින්, විද්‍යුත් පාපැදි වෙනුවෙන් මෙවැනි සංශෝධන ගණනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. මේ සෑම දෙයක්ම අපි ඉදිරිපත් කරලා තිබෙන්නේ ආර්ථිකය ස්ථායී කරගෙන ක්‍රමිකව ඉදිරියට යන ගමනක් සඳහායි. ඒ අනුව 2026 අය වැය ඉදිරිපත් කිරීම සඳහා වූ, ඒ කියන්නේ රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශනය අපි ඉදිරියේදී ඉදිරිපත් කරනවා. එහිදී ඔබට දැක බලා ගන්න පුළුවන් වෙයි, මේ කියන පනත් කෙටුම්පත් සියල්ල සම්පිණ්ඩනය කරලා, ඒක රාශි කරලා එක තැනකට ගෙනැල්ලා මේ වැඩකටයුතු කරන බව. ඒ නිසා ඒ කරුණුත් එක්ක එකතු වී ඉදිරියේදී වැඩ කටයුතු කරන්න කියලා යෝජනා කරමින් මගේ අදහස් දැක්වීම අවසාන කරනවා.

බොහොම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ආනයන හා අපනයන (පාලන) පනත: රෙගුලාසි
இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாட்டு) சட்டம்: ஒழுங்குவிதிகள்
IMPORTS AND EXPORTS (CONTROL) ACT: REGULATIONS

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 1),- 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 අප්‍රේල් 29 දිනැති අංක 2434/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.06.03 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

II

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 2),- 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 මැයි 05 දිනැති අංක 2435/02 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.06.03 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මන්ත්‍රීතුමා.

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු තීරණවල කාර්යක්ෂමතාව, වගවීම සහ නෛතිකභාවය
மாவட்ட ஒருங்கிணைப்புக் குழுக்களின் தீர்மானங்களின் செயற்திறன், பொறுப்புக்கூறல் மற்றும் சட்டபூர்வத்தன்மை
EFFECTIVENESS, ACCOUNTABILITY AND LEGAL CLARITY OF DECISIONS OF DISTRICT COORDINATING COMMITTEES

[5.00 p.m.]

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
Hon. Presiding Member, I move the following Adjournment Motion:

> "I rise today to draw the attention of this House to a matter of significant concern regarding the effectiveness, accountability and legal clarity surrounding the decisions made by District Coordinating Committees (DCCs).
>
> These committees serve as crucial forums where Members of Parliament, Provincial Governors and heads of relevant State institutions convene to deliberate on and decide matters critical to district-level development. Despite the importance of these committees, I have observed and received consistent complaints regarding several shortcomings that hinder their intended impact."

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அரசாங்கமானது பொதுமக்கள் மற்றும் நிறுவனங்களிடம் இருந்து அறவிடுகின்ற வரிகள்மூலம் திரட்டுகின்ற வருமானத்தை மக்களின் அபிவிருத்திக்காகச் செலவிடுகின்றது. குறிப்பாக, மாவட்ட மற்றும் பிரதேச அபிவிருத்திக்கென ஒவ்வொரு வருடமும் பல மில்லியன் ரூபாயை அரசாங்கம் செலவிடுகின்றது. எனினும், மக்களுடைய சமூக, பொருளாதாரத்தில் பாரிய மாற்றத்தை அவதானிக்க முடியவில்லை. இதற்குக் காரணம், அபிவிருத்தித் திட்டங்கள் முறையாகவும், பயனாளிகள் உச்ச பயனை அடையக்கூடிய வகையிலும் நடைமுறைப்படுத்தப்படாமையே ஆகும். இது பாரிதொரு குறைபாடாகக் காணப்படுகின்றது.

Sir, I brought in this Adjournment Motion before this House for a purpose. These DCC meetings have been held over a long period of time. As we are a people's Government, we would like to expedite the development of our country district-wise and region-wise.

Sir, I would like to mention the key issues pertaining to the implementation of the decisions of these DCCs. The Motion goes on to state, I quote:

> "The key issues are as follows:
>
> 1. Lack of a Monitoring Mechanism
>
>   There is currently no formal or standardized system in place to monitor or evaluate implementation of DCC decisions."

அதாவது, மாவட்ட மற்றும் பிரதேச அபிவிருத்திக் குழுக் கூட்டங்களில் மேற்கொள்ளப்பட்ட தீர்மானங்களைக் கண்காணிப்பதற்குச் சரியானதொரு பொறிமுறை இதுவரை இல்லை என்பதைப் பலரும் எங்களுக்குச் சுட்டிக்காட்டி இருக்கிறார்கள். அதை நாங்களும் ஏற்றுக்கொள்கின்றோம்.

> "2. Failure of Implementation
>
> Many decisions taken during DCC meetings are either inadequately implemented or, in some instances, entirely disregarded by relevant institutions, thereby undermining the very purpose of the committees."

DCC கூட்டங்களில் மேற்கொள்ளப்படுகின்ற தீர்மானங்களைச் சம்பந்தப்பட்ட நிறுவனங்கள் முழுமையாகவோ அல்லது பகுதியளவிலோ நடைமுறைப் படுத்தாமை மிகப் பெரிய குறைபாடாகக் காணப்படுகின்றது. ஏனெனில், நாங்கள் பல மணித்தியாலங்களை DCC meetingக்காகச் செலவிடுகின்றோம். அதேபோன்று அரச அதிகாரிகளும் செலவிடுகின்றார்கள்.

The Motion goes on to state, I quote:

> "3. Legal Ambiguity
>
> There is ongoing concern among stakeholders about the legal authority of DCC decisions. This ambiguity limits accountability and the responsiveness of State agencies.
>
> 4. Stakeholder Complaints
>
> I have received numerous complaints from public officials, local authorities and members of civil society regarding the lack of enforcement of DCC resolutions.
>
> In light of these issues, I respectfully propose that this House consider the following recommendations:
>
> - Establish a National Monitoring Framework to systematically track the implementation of DCC decisions, with progress reports submitted periodically to Parliament.
> - Review the Legal Framework governing DCCs, and where necessary, introduce legislative amendments to clarify and strengthen the binding nature of DCC decisions.
> - Assign responsibility for oversight to the District Secretary or an independent oversight body, to ensure regular reporting and follow-up at the district level.
> - Empower Members of Parliament to request and receive quarterly reports on the implementation status of DCC decisions within their constituencies.
>
> These steps are essential to enhance the operational effectiveness of DCCs and to ensure that development decisions made at the district level are implemented in a transparent and an accountable manner."

Thank you.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම, ගරු කන්දසාමි ප්‍රභු මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි තුනක කාලයක් තිබෙනවා.

[பி.ப. 5.05]

ගරු කන්දසාමි ප්‍රභූ මහතා
(மாண்புமிகு கந்தசாமி பிரபு)
(The Hon. Kanthasamy Prabu)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றையதினம் கௌரவ றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி அவர்களால் கொண்டுவரப்பட்டுள்ள மாவட்ட ஒருங்கிணைப்புக் குழுக்களின் தீர்மானங்களின் செயற்றிறன் மற்றும் சட்டக் கட்டமைப்புத் தொடர்பான ஒத்திவைப்புப் பிரேரணையை நான் வழிமொழிகின்றேன்.

உண்மையிலேயே மாவட்ட ஒருங்கிணைப்புக் குழுக்கள் - DCC - அந்தந்த மாவட்டங்களின் அபிவிருத்தி தொடர்பான தீர்மானங்களை மேற்கொள்கின்ற ஒரு களமாகக் காணப்படுகின்றது. பிரதேசங்களில் இருக்கின்ற குறைபாடுகளை நிவர்த்தி செய்யும் பொருட்டு, அந்தந்தப் பிரதேச அபிவிருத்திக் குழுக்களில் எடுக்கப்படுகின்ற தீர்மானங்கள் அடுத்த கட்டமாக மாவட்ட அபிவிருத்திக் குழுவுக்குக் கொண்டு செல்லப்படுகின்றன. அந்தக் குழுக் கூட்டத்தில் குறித்த விடயத்துடன் தொடர்புபட்ட திணைக்களத் தலைவர்கள், அந்தந்த மாவட்டத்தைப் பிரதிநிதித்துவப்படுத்து கின்ற ஆளும் கட்சி மற்றும் எதிர்க்கட்சிப் பாராளுமன்ற உறுப்பினர்கள், மாவட்டச் செயலாளர், ஆளுநர் எனப் பலரும் கலந்துகொண்டு, அந்தந்த மாவட்டத்தின் அபிவிருத்தி தொடர்பான முக்கிய பல தீர்மானங்களை மேற்கொள்வார்கள்.

இந்த DCC meetingsஐ வினைத்திறனாகவும் விளைதிறனாகவும் நடத்தினால், அந்தந்த மாவட்டங்களில் அபிவிருத்தித் திட்டங்களைச் சரியான முறையில் நடைமுறைப்படுத்தி, அவற்றினூடாக அங்குள்ள மக்களுடைய வாழ்க்கைத் தரத்தை முன்னேற்றலாம். அந்த வகையில், அந்தக் கூட்டங்களில் எடுக்கப்படுகின்ற தீர்மானங்களின் நடைமுறைப்படுத்தலை மிகச் சிறப்பாகக் கண்காணிக்க வேண்டும் என்பதோடு, அதற்கான சட்டக் கட்டமைப்பையும் உருவாக்க வேண்டும். அத்துடன், அதில் இன்னும் பல விடயங்களைச் சேர்த்து, அந்தக் கூட்டங்களில் எடுக்கப்படுகின்ற தீர்மானங்களை வலுப்படுத்த வேண்டும் என்பது ஆளும் கட்சி உறுப்பினர்களாகிய எங்களுடைய கருத்தாகும். மேலும், அந்தக் கூட்டங்களில் எதிர்க்கட்சி உறுப்பினர்களின் கருத்துகளையும் ஆலோசனைகளையும் பெற்றுக்கொண்டால் நல்ல தீர்மானங்களை மேற்கொள்ளக் கூடியதாக இருக்கும்.

மாவட்ட ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்தின் செயற்றிறனை மேம்படுத்தி, அபிவிருத்தி தொடர்பான தீர்மானங்களை வெளிப்படைத் தன்மையுடனும் வகைப் பொறுப்புடனும் மேற்கொள்ள வேண்டுமென எதிர்பார்க்கப்படு கின்றது. கடந்த அரசாங்க காலத்திலும் இவ்வாறான கூட்டங்களில் தீர்மானங்கள் மேற்கொள்ளப்பட்டன. எனினும், அந்தக் கூட்டங்கள் பல்வேறு கருத்து முரண்பாடுகளுக்கு மத்தியிலேயே நிறைவடைந்தன. அது தொடர்பில் நாங்கள் பலவிதமாக அறிந்து கொள்ளக்கூடியதாக இருந்தது. இப்போது நாங்கள் அந்த நிலைமையை மாற்றி, மாவட்டத்தின் அபிவிருத்திகளைச் செயற்படுத்துகின்ற, நல்ல தீர்மானங்களை எடுக்கின்ற சிறப்பானதொரு களமாக அதனை மாற்றி இருக்கின்றோம் என்று கூறி, வாய்ப்புக்கு நன்றி தெரிவித்து, விடைபெறுகின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[பி.ப. 5.08]

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

நன்றி, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

இன்றைய தினம் என்னுடைய அண்ணன் கௌரவ றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி அவர்கள் கொண்டுவந்துள்ள ஒத்திவைப்புப் பிரேரணையை ஆதரிக்காவிட்டால், நான் யாழ்ப்பாணத்திலிருந்து வந்ததில் எந்தவொரு பிரயோசனமும் இருக்காது. அவர் சொல்லவந்த விடயத்தை நான் ஒரு வசனத்தில் சொல்கின்றேன். இந்த DCC meeting என்பது தேவையற்ற ஆணி என்பதுதான் என்னுடைய கருத்து! நான் அவருடன் கதைத்துவிட்டுத்தான் இந்த விடயத்தைச் சொல்கின்றேன். கௌரவ நிசாம் காரியப்பர் அவர்கள் சொல்வதுபோல, இந்த DCC meeting ஆனது அரசியலமைப்பின் 13ஆவது திருத்தத்துக்கு எதிரானது. அது முதலாவது விடயம். இரண்டாவது, இப்போது மாகாண சபைகள் அமுலில் இல்லை. அவற்றைப் பிரதிநிதித்துவப்படுத்த முடியாத இந்த நேரத்தில், DCC meetingக்கு எந்தவொரு சட்ட வரையறையும் இல்லை. DCC meetingக்குத் தலைமை வகிப்பது யார் என்றால், குறித்த மாகாணத்தைச் சேர்ந்த ஒரு Cabinet அமைச்சர்தான். அதன் அடிப்படையில், எங்களுடைய யாழ். மாவட்டத்துக்குரிய DCC meetingக்கு Cabinet அமைச்சரான கௌரவ ராமலிங்கம் சந்திரசேகர் அவர்கள் தலைமை வகிக்கிறார். நான் அதை ஏற்றுக்கொள்கின்றேன். மூன்றாவது, DCC meetingக்கு குறித்த மாவட்டத்தைப் பிரதிநிதித்துவப்படுத்தும் பாராளுமன்ற உறுப்பினர்கள் சிலர் வருவார்கள்; சிலர் வரமாட்டார்கள். அதற்கு அரசாங்கத் தரப்பைச் சேர்ந்த பாராளுமன்ற உறுப்பினர்களும் வருவார்கள். நல்ல விடயம்! அதையும் நான் ஏற்றுக் கொள்கின்றேன். நாங்கள் அந்தக் குழுக் கூட்டத்தில் என்ன கதைக்கின்றோம், என்ன முடிவுகளை எடுக்கின்றோம், எடுக்கப்படுகின்ற முடிவுகள் அமுல்படுத்தப்படுகின்றனவா? அவற்றுக்குச் சட்டவலு இருக்கின்றதா என்று கேட்டால், இல்லை!

உதாரணத்துக்கு, யாழ்ப்பாணத்தில் இடம்பெறுகின்ற மணல் கொள்ளையை எடுத்துக்கொள்வோம். இதனைத் தடுத்து நிறுத்துவதற்கு நானும் சிறீதரன் ஐயாவும் கௌரவ றஜீவன் ஜெயச்சந்திரமூர்த்தியும் இன்னும் பலரும் இணைந்து ஒரு முடிவை எடுத்தாலும், அதில் ஏதாவது பிரயோசனம் இருக்கின்றதா? என்றால், இல்லை! ஏனெனில், அவ்வாறான தொரு முடிவை எடுத்தால், அடுத்தநாள் விடியற்காலையில் நாங்கள் Tipperக்குப் பயந்துதான் பாதையில் வாகனத்தை ஓட்ட வேண்டி ஏற்படும்.

தெல்லிப்பளை ஆதார வைத்தியசாலையில் நடந்த வைத்தியருடைய ஊழல் தொடர்பாக மல்லாகம் courtஇல் தாக்கல் செய்யப்பட்ட வழக்குக்குரிய "B" Reportஐப் பதியுமாறு நான் DCC meetingஇல் சொல்லிவிட்டு வந்தேன். ஆனால், 7 நாட்களாகப் பதியவில்லை. இப்பொழுது, அந்த வைத்தியர் வெளியே நின்று கொண்டு தெல்லிப்பளை வைத்தியசாலையைப் பாதுகாப்போம் என்று நீதிமன்றத்துக்கு எதிராக ஆர்ப்பாட்டம் செய்கின்றார். இன்னொரு விடயம் என்னவென்றால், அதனைச் செய்வது சைக்கிளை சின்னமாகக் கொண்டுள்ள கட்சிதான். தையிட்டி விகாரைக்கு எதிராக அரசியல் செய்த அதே கட்சிதான் அங்கேயும்போய் மறுபடியும் நீதிமன்றத்துக்கு எதிரான செயற்பாடுகளைச் செய்கின்றது.

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා]

றஜீவன் அண்ணா! நான் ஒரு விடயத்தைச் சொல்கின்றேன். தயவுசெய்து, கோபித்துக்கொள்ள வேண்டாம். வட மாகாணத்தில் DCC meetingக்குத் தலைமை வகிப்பது கௌரவ அமைச்சர் ராமலிங்கம் சந்திரசேகர் அவர்கள்! அவருக்கு அந்தக் கூட்டத்தை எப்படி நடத்துவது என்றுகூட தெரியாது. நான் அங்கு ஏதாவது கேள்வியைக் கேட்டால், அவர் உடனே பக்கத்திலுள்ள GA பிரதீபனிடம் கேட்டுத்தான், ஒன்றில் 'சரி' என்று சொல்வார் அல்லது 'இல்லை' என்று சொல்வார். ஆகவே, தயவுசெய்து யாழ். மாவட்ட DCC meetingக்கு படித்த ஒருவரை அல்லது எங்களுடைய றஜீவன் அண்ணாவை Chairmanஆக நியமியுங்கள்! அப்படிச் செய்தால் பிரயோசனமாக இருக்கும். ஏனெனில், அவர் அதிபராக இருந்திருக்கிறார். அதனால் நாங்கள் அவருடன் கதைக்கலாம்; நாங்கள் சொல்கின்ற விடயங்கள் அவருக்கு விளங்கும். அவருக்கு விடயங்களைச் சொல்லிக் கொடுக்கலாம் அல்லது அவரிடமிருந்து நாங்கள் படித்துக் கொள்ளலாம். அத்தகைய நல்ல மனிதர் அவர்.

அடுத்து, DCC meetingஇல் எடுக்கப்படுகின்ற தீர்மானங்கள் எவ்வாறு implement பண்ணப்படுகின்றன என்பது தொடர்பில் ஒரு தெளிவும் இல்லை. நாங்கள் 40,000 - 50,000 ரூபாயைச் செலவழித்து, கொழும்பிலிருந்து வந்து கதைத்துவிட்டுப் போகின்றோம், அவ்வளவுதான்! எந்தவொரு பிரயோசனமும் இல்லை! ஆகவே, நீங்கள் முதலில் DCC தொடர்பான சட்டமூலம் ஒன்றைக் கொண்டுவந்து, அதைச் சட்டமாக்குங்கள்! அப்போதுதான் அதன்மூலம் ஏதாவது பிரதிபலன் வரும்.

දෙවනුව, මම මේ කාරණය කියන්න කැමතියි. මේ සතියේ පාර්ලිමේන්තු රැස්වීම් අද දිනයෙන් ඉවර වෙන නිසා මට ඇත්ත කියන්න වෙනවා. සමහර විට ලබන රැස්වීම් සතියේ ඉඳන් මට පාර්ලිමේන්තුවට එන්න බැරි වෙයි. ඒ නිසා මම ඇත්ත කියන්නම්. මම පාර්ලිමේන්තුවට ආපු දවසේ ඉඳන් බිමල් රත්නායක මහත්මයා මට ඇති වෙන්න පහර ගැහුවා. අන්තිමට මගේ කථාව මාධ්‍යවල විකාශනය වන එක දවස් අටක් නවත්වලා තිබුණා. මට කරපු චෝදනාව මේකයි. මම මුස්ලිම් ජනතාව ගැන වැරදි විධියට කථා කරනවා කියලා සභානායකතුමාට කථාවක් දීලා, මගේ කථාව නැවැත්වුවා. ඔය කන්ටේනර් 323 ගැන කථා කරන එක ගැන මගේ කට කොහොම හරි වහන්න හැදුවා. මාව හිරේ දැම්මා, පොලීසියේ OICට කථා කරලා. මම VIP lights එක දාගෙන ගියා කියලා මාව කොහොම හරි හිරේ දැම්මා. කන්ටේනර් 323 ගැන මම එළියට කිව්වා කියලා මාව CID එකෙන් කැඳෙව්වා. CID එකෙන් ඒ ගැන විමර්ශනය කළා. මම ඔවුන්ට කිව්වා, "මම පාර්ලිමේන්තුව ඇතුළේ කියපු කථාවට කොහොමද ඔයගොල්ලන් එළියේ ඉඳන් අහන්නේ? එළියේ ඉන්න අයට මගෙන් ඒ ගැන ප්‍රශ්න කරන්න බැහැ. පත්තරේ කිව්වා නම් ඒ ගැන පත්තරෙන් අහන්න" කියලා. එහෙම නැත්නම් මේ පාර්ලිමේන්තුව විහිළුවක් වෙනවා. මම දැනගත්තා බිමල් රත්නායක ඇමතිතුමා, "ඔහුගේ කටින් මොනවා හරි එකක් ගන්න" කියලා කියා තිබෙන බව. මට කිව්වා, "අනේ, ඔබතුමාට තොරතුරක් තිබෙනවා නම් දෙන්න" කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමනි, යෝජනාවට අදාළව කථා කරන්න.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
අනිවාර්යයෙන්. මේ කාරණයත් කියලා මගේ කථාව අවසන් කරන්නම්. මොකද, මට පාර්ලිමේන්තුවට ආපසු එන්න බැරි වෙනවා. ඒ නිසා මම මේ කාරණය කියලා කථාව අවසන් කරන්නම්.

මට මාර දුකයි. මම මේ පාර්ලිමේන්තුවට ආවත්, නැතත් ආපසු දිගටම politics කරන්නේ නැහැ. හැබැයි, පාර්ලිමේන්තුව ඇතුළේ කියපු එකට බිමල් රත්නායක මහත්මයා,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, යෝජනාවට අදාළව කථා කරන්නකෝ.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම 26වැනි දා පාර්ලිමේන්තුවට එන්නේ නැහැ. ඔබතුමන්ලාට මම කරදරයක් වෙන්නේ නැහැ. හය වෙන්න එපා. අනික් එක, මම මේ ගැන සිංහලෙන් කියන්නේ. ඒ නිසා හය වෙන්න එපා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම hospital එකේ වැඩ කරපු කාලයේ nomination දුන්නා කියලා වැරදි නඩුවක් දාලා තිබෙනවා. ඔබතුමන්ලා හැම එකටම අත දාලා, දැන් නීතිපති දෙපාර්තමේන්තුවටත් අත දාලා ඉවරයි. මට කොහොමත් ඒ වෙඩිල්ල වදිනවා. හැබැයි, දැන් එළියට අරන් මගේ කටින් මොනවා හෝ විස්තරයක් ගන්න පුළුවන් ද කියලා බලනවා. හැබැයි, ඒක ටිකක් අමාරුයි. අපි අවුරුදු 30ක් යුද්ධය පැවති කාලයේදීවත් එච්චර හය වෙලා ජීවත් වෙලා නැහැ. මා ළඟ තොරතුරු තිබෙනවා. මට ඒ තොරතුරු ලබා දෙන්න පුළුවන්. හැබැයි, මම පාර්ලිමේන්තුවෙන් එළියට යන හින්දා මට ඒ ගැන කියන්න බැරි වෙයි. මම කවදා හරි පාර්ලිමේන්තුවට ආපසු එනවා. එහෙම එන දවසට මම සම්පූර්ණ details දෙන්නම්.

Thank you so much.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තුෂාරි ජයසිංහ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි තුනක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.14]

ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) துஷாரி ஜயசிங்ஹ)
(The Hon. (Mrs.) Thushari Jayasingha, Attorney-at-Law)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි දන්නවා, ජනතාව අපට බලය දුන්නේ දීර්ඝ කාලයක් තිස්සේ ජනතාවට තිබුණු ගැටලු විසඳා ගන්න කියලා. DCC, එහෙම නැත්නම් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සහ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවලට දිනකට ජනතා ගැටලු විශාල ප්‍රමාණයක් ලැබෙනවා. ඒ සියලු ජනතා ගැටලුවලට පිළිතුරු හොයන්න අපට අවස්ථාව ලැබිලා තිබෙන්නේ එතැනින්. අපි ජනතාව සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙනවා. මම මහනුවර

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සාමාජිකාවක්. ඒ වාගේම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු දෙකක සභාපති. දැන් මෙතැනදී කියැවුණා, කොළඹ ඉඳලා යාපනයට යනවා කියලා. එහෙම අවශ්‍ය නැහැ. පාර්ලිමේන්තු රැස්වීම් පවත්වන්නේ මාසයකට දවස් අටයි. අපි මහජන නියෝජිතයෝ. ඒ දවස් අට තමයි අපි පාර්ලිමේන්තු රැස්වීම් සඳහා සහභාගී වෙන්න කොළඹ ඉන්නේ. අපි අනික් දවස්වලට අපේ ගමේ ආසනයේ ජනතාව එක්කයි වැඩ කටයුතු කරන්නේ. ඒ අතරතුරේදී අපට ඒ සම්බන්ධීකරණ කමිටු සඳහා ගිහිල්ලා ජනතාවගේ වැදගත් ගැටලුවලට පිළිතුරු හොයන්න අවස්ථාව තිබෙනවා. දැන් මේ කියනවා වාගේ ගමට ගිහිල්ලා නිකම් හැරිලා එන්න නොවෙයි, අපට ගම්වල ඉතා විශාල වැඩ රාජකාරි කොටසක් පැවරිලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට මේ වැඩ කරන්න යෝජනා කළත්, නිලධාරින්ට මේ විධියට කටයුතු කරන්න කියලා මඟපෙන්වීම් කළත්, ඒවා ක්‍රියාත්මක කර ගන්න බැහැ. මම නීතිඥවරියක් විධියට වෘත්තියේ යෙදෙන නිසා දන්නවා, යම්කිසි දෙයකට අධිකරණ නියෝගයක් ලබා දුන්නොත්, ඒ නියෝගයෙන් පාර්ශ්වයන් බැඳී සිටිනවා ඒ අධිකරණ නියෝගය ක්‍රියාත්මක කරන්න. ඒ සඳහා උසාවියේ ක්‍රියාපටිපාටි තිබෙනවා. පොදුවේ මහ ජනතාවත්, මේ හැම දෙනාමත් දන්නා කාරණයක් තමයි, ඇස්කීසි ක්‍රියාත්මක කිරීම, එහෙම නැත්නම් ඒ නියෝගවලට පිටුපෑම හේතුවෙන් අධිකරණයට අපහාස කිරීම බලගන්වා ගැනීම සම්බන්ධයෙන් යම්කිසි රෙගුලාසි මාලාවක් තිබෙන බව. නමුත්, අපි ඉතා වෙහෙස මහන්සි වෙලා කරුණු කාරණා අධ්‍යයනය කරලා, ජනතාවගේ ගැටලුවලට තීන්දු තීරණ හොයා ගන්නවා. ඒ අවස්ථාවලදී ඒවා ක්‍රියාත්මක කර ගන්න බැරි වෙනවා නම් ඒකෙන් ඇති ඵලය මොකක්ද? හරියට දත් නැතුව වාගේ තමයි. මොකද, ඇල්ලුවාට හපන්න පුළුවන්ද? අපට එහෙම හරියන්නේ නැහැ. මේ ජනතාවගේ ගැටලුවලට අපට විසඳුමක් ඕනෑ වෙනවා. ඒ වාගේම ජනතාවගේ ගැටලුවලට හොයන විසඳුම් ක්‍රියාත්මක කරන්න අපට ක්‍රමවේදයක් අවශ්‍ය වෙනවා. අන්න ඒ ක්‍රමවේදය සඳහා තමයි මේ යෝජනාව අරගෙන ඇවිල්ලා තිබෙන්නේ. මුළු දිස්ත්‍රික්කයකම සංවර්ධන වැඩකටයුතු තීරණය කරන ඒ වාගේ වැදගත් බලඅධිකාරයක ගන්නා තීන්දු තීරණ සම්බන්ධයෙන් සොයා බැලීමක්, පසුවිපරමක්, ඒවා ඉදිරියට ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් සහ ක්‍රියාත්මක නොවීම සම්බන්ධයෙන් ගන්නා පියවර මොකක්ද කියන එක ගැන ඇති හිස්තැන පිරවීම තමයි මේ යෝජනාවේ අරමුණ වන්නේ. ඒ අනුව මේ යෝජනාව, ඉතාම කාලෝචිත, ඉතාම වැදගත් යෝජනාවක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි දන්නවා, මේ ක්‍රමවේදය මීට කලින් ක්‍රියාත්මක වුණේ මම නියෝජනය කරන නාවලපිටිය ආසනයේ කියන එක. අපි දන්නවා, ඒ ප්‍රදේශයේ හිටපු දේශපාලනඥයා මොකක්ද කළේ කියලා. දැන් ඔහු ඒ ආසනයේ නැහැ. ඔහු දැන් හිරේ හිටියත්, ඔහු හිටපු කාලයේ කළේ නිලධාරින් ගෙන්වලා කමිටුව ඉස්සරහ හිටවාගෙන බැණ අඬගහපු එකයි. එලෙස බැණ අඬගහනවාට භයේ ඒ නිලධාරින් ඒ කියන දෙයට අවනත වෙන්න ඇති. නමුත්, අපට ඕනෑ එහෙම නොවෙයි. නිලධාරින්ගේත් ගෞරවය රැකලා මේ ක්‍රමය ඉතාම හොඳින් ස්ථාපිත කිරීමයි අපේ අරමුණ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න කාලය ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[பி.ப. 5.17]

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

Hon. Presiding Member, கௌரவ றஜீவன் ஜெயச்சந்திர மூர்த்தி அவர்களால் கொண்டுவரப்பட்ட இந்தப் பிரேரணையில் ஒரு முக்கிய பிரச்சினை இருக்கின்றது. கௌரவ கந்தசாமி பிரபு அவர்கள் DCC என்பதை development committee என்று குறிப்பிட்டார். அது அவரை அறியாமல் வந்து விட்டது என்று நினைக்கிறேன். நானும் சில வேளைகளில் அப்படிச் சொல்வதுண்டு. இது மாவட்ட ஒருங்கிணைப்புக் குழு - District Coordinating Committee - ஆகும். பின்னர் அதைச் சரியாகச் சொன்னீர்கள். You are correct.

இதில் என்ன problem தெரியுமா? Sir, இதிலுள்ள விடயம் நல்லது. But, இதைப்போன்று அரசியல் மயப்படுத்தப்பட்ட கூட்டம் வேறெதுவும் கிடையாது. Be careful, this is a double-edged weapon. இதை ஆரம்பித்து வைத்தது ஜே. ஆர். ஜெயவர்த்தன அவர்கள்தான். மத்திய அரசாங்கத்துக்கு நேரடியாக எங்கெல்லாம் அரசியல் அதிகாரங்கள் இல்லையோ அங்கெல்லாம் இந்த நடைமுறை பின்பற்றப்பட்டது. அதன் ஓர் அங்கமாக கல்முனையைச் சேர்ந்த முன்னாள் அமைச்சர் ஏ. ஆர். மன்சூர் அவர்களை Mullaitivu Districtஇன் Chairmanஆக அன்று அவர் நியமித்தார். உள்ளூராட்சி மன்றங்களின் ஆட்சி அரசாங்கத்தின் கைகளில் இல்லாதபோது அல்லது அங்கு அரசாங்கக் கட்சியின் பாராளுமன்ற உறுப்பினர்கள் இல்லாதபோது அங்குள்ள முதலமைச்சர் தங்களுடைய அதிகார வரம்புக்குள் இல்லாதபோது அந்தப் பிரதேங்களில் அரசியல் அதிகாரத்தை அரசாங்கம் தனது கையில் வைத்துக் கொள்வதற்கு கையாண்ட ஒரு முறைமைதான் இந்த மாவட்ட ஒருங்கிணைப்புக் குழுக் கூட்டம். அதை மறந்து விடாதீர்கள்! ஏனென்றால், தமிழ் பேசும் எல்லோருக்காகவும்தான் நான் இதைப் பொதுவாகச் சொல்கின்றேன்.

මම හිතන විධියට, සිංහල කථා කරන මන්ත්‍රීවරුනුත් ඒක දන්නවා. DCC එක තමයි, දේශපාලනයේදී මධ්‍යම රජයට බලය පිහිටුවා ගන්න බැරි ස්ථානවල තමන්ට අවශ්‍ය බලය ලබා ගන්න භාවිත කරන අන්තිම දූෂිත මෙවලම.

கௌரவ பாராளுமன்ற உறுப்பினர் ரஜீவன் அவர்களால் கொண்டு வரப்பட்ட இந்தப் பிரேரனையில் நிறைய நல்ல விடயங்கள் இருக்கின்றன. ஆனால், அடிப்படைப் பிரச்சினை ஒன்று இருக்கின்றது. நான் இன்னொன்றைச் சொல்கின்றேன். You will be surprised. DCCஇல் யாரைத் தவிசாளராகப் போட்டிருக்கின்றீர்கள்? அதனூடாக என்ன செய்திருக்கின்றீர் கள்? என்று கேட்டு உங்களுடைய தற்போதைய அமைச்சர் கௌரவ நளிந்த ஜயதிஸ்ஸ அவர்கள் 2016ஆம் ஆண்டு இந்த DCCஐப் பற்றி தன்னுடைய வெறுப்பை வெளிப்படுத்தியுள்ளார். அதற்கு முன்பு எங்களுடைய டலஸ் அழகப்பெரும அவர்கள் DCCஐப் பற்றி கேள்வி கேட்டிருக்கிறார்.

எங்களுடைய கௌரவ பாராளுமன்ற உறுப்பினர் இராமநாதன் அர்ச்சுனா அவர்கள், 'எந்த நேரத்திலும் நான் போய்விடுவேன்' என்று சொன்னார். பயப்பட வேண்டாம், நீங்கள் இந்தப் பாராளுமன்றத்தில் இருப்பீர்கள்! We wish you all the best! Do not worry, you would not be thrown out of Parliament, not that easily.

[ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා]

ஆனால், இப்போது அவருடைய பக்குவம் அதிகம். மிகவும் நல்லது. He has been so nice and is turning out to be one of the best Parliamentarians with his rank in Manthri.lk keep going up, and that is perfectly fine.

நான் என்ன சொல்ல வருகின்றேன் என்றால், இதிலுள்ள problem என்னவென்று தெரியுமா? There is no structure as to who presides the DCC. ஜனாதிபதிக்குக் கீழ்த்தான் இது வருகின்றது. அங்கேயிருக்கின்ற எல்லாவற்றையும் நடைமுறைப்படுத்துவது, National Planning Departmentதான். என்ன தீர்மானத்தை எடுத்தாலும், NPDஇன் approval வரவில்லையா? என்று கேட்பார்கள். அங்கே Governor preside பண்ணலாம் அல்லது அந்தப் பிரதேசத்தில் இருக்கின்ற சாதாரண பாராளுமன்ற உறுப்பினர் preside பண்ணலாம். இன்றைக்கு அது அழகாக இருக்கும். ஏனென்றால் நீங்கள் அரசாங்கத்தில் இருக்கின்றீர்கள். நீங்கள் எதிர்க்கட்சிக்கு வருகின்றபொழுது, நீங்கள் பெரும்பான்மையாக இருக்கின்ற பிரதேசங்களில் அரசியல் அதிகாரத்தைத் தம் கையில் வைத்துக்கொள்வதற்கு அந்த அரசாங்கம் இதைப் பாவிப்பார்கள். ஆகவேதான் நாங்கள் சொல்கின்றோம், இந்த மாவட்ட ஒருங்கிணைப்புக் குழுக்கூட்டம் என்பது சிறுபான்மையினருக்கு அதிகாரப் பரவலாக்கத்திற்காக கொடுக்கப்பட்ட விடயத்தை மழுங்கடிப்பதற்காக, அதை இல்லாமல் செய்வதற்காகக் கொண்டு வரப்பட்ட விடயம் என்று.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
ஆகவே, DCC என்ற இந்த விடயத்தில் நீங்கள் விழ வேண்டாம். We have to know how its Chairman is going to be selected and what its composition is because we have to include provincial council members, the Chief Minister, the Governor and the local authorities' chairmen.

அவர்கள் மக்கள் பிரதிநிதிகள்! ஆகவே, do not do it in your enthusiasm. ஏனென்றால், நீங்கள் இப்பொழுது அரசாங்கத்தில் இருக்கின்றீர்கள். இதற்குப் பிறகு, DCCஇல் உங்களுக்குப் பெரிய frustration இருக்கும். இப்போது எங்களுக்கும் அதே பிரச்சினைதான்! அம்பாறையில் DCC meeting வைப்பார்கள். ஒன்றும் நடக்காது. Governor ஒரு நல்ல மனிதர். வசந்த பீரிஸ் அவர்கள் மிகவும் நல்ல மனிதர்.

ගරු නියෝජ්‍ය ඇමතිතුමා පොඩ්ඩක් හොඳයි අපිත් එක්ක. ඒකට පින් සිද්ධ වෙන්න වැඩක් කර ගන්නවා. හැබැයි, අපේ යෝජනා එකක්වත් approve වුණේ නැහැ. That is a different issue. நமுத், DCC என்ற விடயத்தில் composition பற்றிய பாரிய பிரச்சினை இருக்கின்றது. மக்களுடைய அபிலாஷைகளுக்கு எதிராக DCC உறுப்பினர்களை கோட்டாபய ராஜபக்ஷ, மஹிந்த ராஜபக்ஷ, ரணில் விக்கிரமசிங்க ஆகியோர் பாவித்தார்கள். தங்களுக்குத் தேவையான ஆட்களை DCC Chairman ஆக்குவதற்கும் Divisional Coordinating Committee Chairman ஆக்குவதற்கும் அதை ஒரு bribeஆகக் கொடுப்பார்கள். எங்களுடைய பாராளுமன்ற உறுப்பினர்களைத் தங்கள் பக்கம் வைத்துக் கொள்வதற்கு அவர்களுக்குக் கொடுக்கின்ற bribeதான் அது.

අපේ පක්ෂයේ ඉන්න පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තමන්ගේ පැත්තට ගන්න ඒගොල්ලන් පාවිච්චි කරන එක ක්‍රමයක් තමයි Divisional Coordinating Committee එකේ Chairman තනතුර දෙන්නම් කියන එක.

Therefore, please be careful and in your enthusiasm, do not rush into this.

Thank you very much.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.24]

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යාපනය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මැතිතුමා විසින් අද දින සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධයෙන් මම මේ අදහස් ඉදිරිපත් කරන්න කැමැතියි.

දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවලට අදාළව දැනට ක්‍රියාත්මක කරනු ලබන්නේ එවකට රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 02/2021 චක්‍රලේඛයයි. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු පිළිබඳව විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා විසින් ඉදිරිපත් කළ අදහස් පිළිබඳව අපි අවධානය යොමු කරනවා. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවලට වරප්‍රසාද ලබා දීලා රජයට කිසියම් අයුතු වාසියක් ගන්න කිසිසේත්ම ඒවා භාවිත කරන්නේ නැහැ කියන කාරණය අපි සහතික කරනවා. ඒ වාගේම තමයි අය වැයෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන වඩා ඵලදායී ලෙස භාවිත කිරීම සඳහා ඒ කටයුතු අධීක්ෂණය කිරීමේ වගකීම මේ කමිටුවට පැවරෙනවා. එතැනදී ආණ්ඩු පක්ෂය නියෝජනය කරන ඇමතිවරයෙක් හෝ මන්ත්‍රීවරයෙක් වාගේම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත්, ඒ වාගේම පළාත් පාලන ආයතන ප්‍රධානීන්ටත් මේ සඳහා සහභාගි වෙලා ඔවුන්ගේ අදහස්, යෝජනා, ඒ වාගේම ඔවුන්ගේ නිරීක්ෂණ ඉදිරිපත් කරන්න සහ විවේචන ඉදිරිපත් කරන්නත් අවස්ථාව තිබෙනවා. ඒ නිසා යාපනය දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ ආකාරයට, මෙය දකුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට පටහැනිව යනවා කියන කාරණයට මම එකඟ වෙන්නේ නැහැ. බලය බෙදා හැරීමේ ක්‍රියාවලියේම තවත් යම් ආකෘතියක් හැටියට තමයි මම මේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව දකින්නේ. විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාටත්, ඒ වාගේම පළාත් පාලන ආයතන ප්‍රධානීන්ටත් -ඒ ඔක්කෝම අය ආණ්ඩු පක්ෂය නොවෙයි

නියෝජනය කරන්නේ. විරුද්ධ පක්ෂය නියෝජනය කරන පළාත් පාලන ආයතන ප්‍රධානීන් ඉන්නවා. එතුමන්ලාටත්- මේවාට සහභාගි වෙලා මම කලින් කියපු ආකාරයට දිස්ත්‍රික්කයේ සංවර්ධනය සඳහා තමන්ගේ අදහස් යෝජනා, විවේචන සියල්ල ඉදිරිපත් කරන්න පුළුවන්. ඒ සියල්ල සැලකිල්ලට ගනිමින් වඩා යහපත් මහජන සේවයක් ඉටු කිරීම තමයි අපි මේකෙන් අපේක්ෂා කරන්නේ.

යෝජනාවේ අංක 1, 2 හා 4හි සඳහන් ප්‍රධාන ගැටලු අවම වන පරිදි රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය හා ජනාධිපති ලේකම් කාර්යාලය සමඟ සාකච්ඡා කරලා දැනට පවතින චක්‍රලේඛය සංශෝධනය කරමින් පවතින බවත්, එම චක්‍රලේඛයේ යම් ගැටලුවක් තිබුණා නම් එම ගැටලු ඉවත් කරමින් වඩා යහපත්, වඩා හොඳ චක්‍රලේඛයක් නිකුත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට සිදු වෙමින් පවතින බවත් මා සඳහන් කරන්න කැමැතියි. එම සංශෝධන තුළ මෙහි සඳහන් කළ කරුණු - විශේෂයෙන් විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා විසින් අද ඉදිරිපත් කරපු කරුණු- සැලකිල්ලට ගනිමින් අවශ්‍ය සංශෝධන කරන්න අපි කටයුතු කරන බවත් මා සඳහන් කරන්න ඕනෑ.

ඒ වාගේම මෙම චක්‍රලේඛය අමාත්‍ය මණ්ඩල ප්‍රතිපත්තිමය අනුමැතියකින් නිකුත් කිරීමට යෝජනා වෙලා තිබෙනවා. ඒ නිසා යම් ගැටලුවක් මෙතෙක් තිබුණා නම්, ඒ ගැටලුවත් අපට අවම කරගන්න හැකියාව තිබෙනවා. ඒ අනුව ඉදිරියේදී කලින් සඳහන් කරපු ගැටලු සඳහා සාධාරණ, යහපත් විසඳුම් ලැබෙන බව අපට තහවුරු කරන්න පුළුවන්, සහතික කරන්න පුළුවන්.

ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවේ අංක 3හි සඳහන් කරුණ සම්බන්ධයෙන් ද අවධානය යොමු වෙලා තිබෙනවා. සත්‍ය වශයෙන්ම මේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු හරහා අපේ රජයේ ප්‍රධානතම අරමුණ සභාපතිවරුන්ගේ හෝ දේශපාලන පක්ෂ නියෝජිතයන්ගේ, මන්ත්‍රීවරුන්ගේ බලපුළුවන්කාරකම පෙන්වීම නොවෙයි. සත්‍ය වශයෙන්ම ඒ ප්‍රදේශවල, ඒ දිස්ත්‍රික්කවල ජනතාවට උපරිම සේවයක් ලැබෙන පරිදි, උපරිම ඵලදායීතාවකින් මහජන මුදල්, අය වැයෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීම පමණයි අපේ අරමුණ. එතැනදී කෘෂි කර්මාන්තය වෙන්න පුළුවන්, මාර්ග සංවර්ධනය වෙන්න පුළුවන්, වාරි කර්මාන්තය වෙන්න පුළුවන්, සෞඛ්‍ය වෙන්න පුළුවන්, අධ්‍යාපනය වෙන්න පුළුවන්, ඒ වාගේම ඒ ඒ ප්‍රදේශවලට ආවේණික කර්මාන්ත තිබෙනවා; ධීවර කර්මාන්තය වෙන්න පුළුවන්, සත්ව නිෂ්පාදනය වෙන්න පුළුවන්, ඒ සියලු ක්ෂේත්‍රවල වර්ධනය පිළිබඳව සාකච්ඡා කරලා ඒ වර්ධනය සඳහා අවශ්‍ය කරන යෝජනා සැලසුම් ඉදිරිපත් කිරීමටත්, ඒ වාගේම මාසයෙන් මාසයට ඒ ක්ෂේත්‍රවල ප්‍රගතිය පිළිබඳව යම් සමාලෝචනයක් කර ගැනීමටත් අවස්ථාවක් තමයි මේකෙන් ලැබෙන්නේ. ඒ නිසා අදාළ නිලධාරින්ට අවස්ථාව ලැබෙනවා තමන්ගේ ක්ෂේත්‍රවල ලබා ගත්ත ප්‍රගතිය කුමක්ද කියලා වාර්තා කරන්න. ඒ අනුව වඩා ඵලදායී මහජන සේවයක් සැලසීම මෙමඟින් අපි අපේක්ෂා කරනවා. ඊට අදාළ නීතිමය රාමුව ශක්තිමත් කිරීම සඳහා කටයුතු කරනවා.

විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා පෙන්වා දුන්නු කරුණුත් සැලකිල්ලට ගනිමින් අපි ඔබට සහතික වෙනවා, මේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු තවත් එක් දේශපාලන බලය තහවුරු කර ගන්නා ආයතනයක් බවට පත් කරන්නේ නැහැ කියන එක. අපේ රජයට කිසිසේත්ම ඒ සඳහා අපේක්ෂාවක් නැහැ. වඩා යහපත් මහජන සේවයක් සැපයීම සඳහා පමණයි මේ ආයතන පාවිච්චි කරන්නේ කියන කාරණය මතක් කරමින්, මේ යෝජනාව ඉදිරිපත් කරපු ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මන්ත්‍රීතුමාටත්, මෙහිදී අදහස් දක්වපු මන්ත්‍රීවරු, මන්ත්‍රීවරියන් සියලු දෙනාටත් ස්තුතිය පළ කරමින් මම නිහඬ වෙනවා.

එකල්හි වේලාව අ.භා. 5.30 වූයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2025 ජූලි 08වන අඟහරුවාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේ ය.

அப்பொழுது, பி.ப. 5.30 மணியாகிவிடவே மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

அதன்படி பாராளுமன்றம், 2025 யூலை 08, செவ்வாய்க்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

It being 5.30 p.m., THE HON PRESIDING MEMBER adjourned Parliament without Question put.

Parliament adjourned accordingly until 9.30 a.m. on Friday, 08th July, 2025.

සැ.යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

NOTE

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

Contents of Proceedings :

Final set of manuscripts Received from Parliament :

Printed copies dispatched :

හැන්සාඩ් වාර්තා
කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.

මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில் பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau at the Department of Government Information, No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.